321 වන කාණ්ඩය - 15 වන කලාපය
தொகுதி 321 - இல. 15
Volume 321 - No. 15

2025 ඔක්තෝබර් 23 වන බ්‍රහස්පතින්දා
2025 ஒக்ரோபர் 23, வியாழக்கிழமை
Thursday, 23rd October, 2025

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
2025 නොවැම්බර් 07වන දින විශේෂ ආරක්ෂක විධිවිධාන [තීරුව 2483]

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා [තීරුව 2484]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 2487-2524]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
LANKA GOVERNMENT CLOUDහි මෑත කාලීන බිඳවැටීමේ බලපෑම [තීරුව 2524]

වරප්‍රසාද:
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තුළ ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතාගේ ක්‍රියා කලාපය [තීරුව 2534]

කල්තැබීමේ යෝජනාව:
මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ තුරන් කිරීම සහ නීතිමය රාමුව ශක්තිමත් කිරීම සඳහා වන ජාතික වැඩ පිළිවෙළ [තීරු 2541-2653]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [තීරු 2653-2664]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
2025 நவம்பர் 07ஆம் நாளன்று விசேட பாதுகாப்பு ஒழுங்குகள் [ப: 2483]

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள் [ப: 2484]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 2487-2524]

தனி அறிவித்தல் மூல வினா:
LANKA GOVERNMENT CLOUDஇன் சமீபத்திய சீர்குலைவின் விளைவு [ப: 2524]

சிறப்புரிமை:
அரசியலமைப்புப் பேரவையில் மாண்புமிகு சிவஞானம் சிறீதரனின் நடத்தை [ப: 2534]

ஒத்திவைப்புப் பிரேரணை:
போதைப்பொருள் மற்றும் ஒழுங்கமைக்கப்பட்ட குற்றச் செயல்களை இல்லாதொழிப்பதற்கும் சட்டக் கட்டமைப்பை வலுப்படுத்துவதற்குமான தேசிய திட்டம் [ப: 2541- 2653]

வினாக்களுக்கு எழுத்துமூல விடைகள் [ப: 2653 - 2664]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Special Security Arrangements on 07th November, 2025 [Col. 2483]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 2484]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 2487-2524]

QUESTION BY PRIVATE NOTICE:
Effect of Recent Collapse of Lanka Government Cloud [Col. 2524]

PRIVILEGE:
Conduct of Hon. Sivagnanam Shritharan at Constitutional Council [Col. 2534]

ADJOURNMENT MOTION:
National Programme to Eradicate Drugs and Organized Crime and Strengthening the Legal Framework [Cols. 2541-2653]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 2653-2664]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 ඔක්තෝබර් 23වන බ්‍රහස්පතින්දා
2025 ஒக்ரோபர் 23, வியாழக்கிழமை
Thursday, 23rd October, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

2025 නොවැම්බර් 07වන දින විශේෂ ආරක්ෂක විධිවිධාන
2025 நவம்பர் 07ஆம் நாளன்று விசேட பாதுகாப்பு ஒழுங்குகள்
SPECIAL SECURITY ARRANGEMENTS ON 07TH NOVEMBER, 2025

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 නොවැම්බර් 07 සිකුරාදා ගරු මුදල් අමාත්‍යවරයා විසින් 2026 වර්ෂය සඳහා අය වැය කථාව ඉදිරිපත් කිරීමට අදාළව පහත සඳහන් විශේෂ ආරක්ෂක විධිවිධාන ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා බව සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත මෙයින් දන්වනු කැමැත්තෙමි.

- 2025 නොවැම්බර් 04 අඟහරුවාදා, 2025 නොවැම්බර් 06 බ්‍රහස්පතින්දා සහ 2025 නොවැම්බර් 07 සිකුරාදා යන දිනයන්හිදී ආරක්ෂක වැඩ පිළිවෙළ පහත සඳහන් ආකාරයට සිදු කරනු ලබන බවද දන්වනු කැමැත්තෙමි.

  මන්ත්‍රීවරුන්ගේ විවේක කාමර, ඇඳුම් අල්මාරි ද ඇතුළුව සමස්ත පාර්ලිමේන්තු ගොඩනැගිල්ලම මෙම දිනවලදී ආරක්ෂක පරීක්ෂාවට ලක් කරනු ලැබේ.

- 2025 නොවැම්බර් 07 සිකුරාදා ආරක්ෂක වැඩ පිළිවෙළ පහත සඳහන් ආකාරයට සිදු කරනු ලබන බවද දන්වනු කැමැත්තෙමි.

  (අ) පාර්ලිමේන්තු ගොඩනැඟිල්ලේ හඳුනාගත් අධිආරක්ෂිත/විශේෂිත වූ ප්‍රදේශ, මෙදින ආරක්ෂක පරීක්ෂාවට ලක් කරනු ලැබේ.

  (ආ) මහජන ගැලරිය ආරාධිත අමුත්තන් සඳහා පමණක් සීමා කරනු ලැබේ. අමුත්තන් සඳහා වන ආරාධනා පත්‍ර මුදල් අමාත්‍යාංශය වෙතින් නිකුත් කරනු ඇත.

  (ඇ) මෙදින පාර්ලිමේන්තුවට පැමිණීමේ දී හැකිතාක් දුරට රියැදුරෙකු කැටුව පැමිණෙන ලෙස ද, අමුත්තන් කැටුව පැමිණීමෙන් වැළකී සිටින ලෙස ද, ගරු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

  (ඈ) තමන් විසින්ම, තම රථය පදවාගෙන එන මන්ත්‍රීවරුන්ගේ වාහන නියමිත රථගාලෙහි ගාල් කිරීම සඳහා මන්ත්‍රී පිවිසුමෙහි, කාර්ය මණ්ඩල පිවිසුමෙහි සහ මහජන පිවිසුමෙහි පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට අයත් රියැදුරන් සේවයේ යොදවන බව ද දන්වනු කැමැත්තෙමි.

  (ඉ) මහජන ගැලරිය ආරාධිත අමුත්තන් වෙනුවෙන් සීමා කර ඇති බැවින්, තමන් සමඟ ආරාධිත අමුත්තෙක් පැමිණෙන්නේ නම් ජයන්තිපුර පිවිසුමේදී සේවයේ නියුතු අදාළ පොලිස් නිලධාරීන් වෙත ආරාධනා පත්‍රය සමඟ තම අනන්‍යතාව තහවුරු කර මහජන පිවිසුම දක්වා පැමිණීමට හැකියාව පවතින බව දන්වා සිටිමි.

  (ඊ) පාර්ලිමේන්තු රථගාල මෙදින වසා තබන බැවින් මන්ත්‍රීවරුන් පැමිණෙන වාහන අදාළ රථගාල් වෙත යොමු කරනු ලැබේ.

  (උ) මෙදින රථ වාහන පොලීසිය සහ සමීප පොලිස් ස්ථාන මඟින් විශේෂ රථවාහන සැලැස්මක් ක්‍රියාත්මක කරනු ලැබේ.

ඉහත සඳහන් විශේෂ ආරක්ෂක විධිවිධාන සම්බන්ධව සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය අපේක්ෂා කරන බව ද කාරුණිකව දන්වනු කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

ගරු කථානායකතුමනි, 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 18(3) වගන්තියේ (ඊ) ඡේදය සමඟ කියවිය යුතු 50 වගන්තිය යටතේ ස්වේච්ඡා විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමයේ නියම සහ කොන්දේසි සම්බන්ධයෙන් බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 අගෝස්තු 26 දිනැති අංක 2451/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මම ඉදිරිපත් කරමි.

මෙම නියෝග බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන්, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද -

[ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා]

(i) 2023 හා 2024 වර්ෂ සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තා; සහ

(ii) 2022 හා 2023 වර්ෂ සඳහා ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන්, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2024 වර්ෂය සඳහා අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2023 වර්ෂය සඳහා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(iii) 2022 සහ 2024 වර්ෂ සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා; සහ

(iv) 2023 වර්ෂය සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන්, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2021 හා 2022 වර්ෂ සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලයේ වාර්ෂික වාර්තා සහ ගිණුම් ප්‍රකාශ; සහ

(ii) 2023 වර්ෂය සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව හි වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කුඹුක්කන, පාරවිලවත්ත යන ලිපිනයෙහි පදිංචි සින්නයියා සුප්පයියා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මොනරාගල, හිඳිකිවුල, රත්මල් මාවත, 23 කණුව යන ලිපිනයෙහි පදිංචි සුදර්මා චන්ද්‍රිකා කොණ්ඩදෙණිය මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පන්නිපිටිය, දුම්රිය හරස් පටුමඟ, අංක 14/11/බී යන ලිපිනයෙහි පදිංචි ධම්මික නිශාන්ත කරන්ගොඩ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) පන්නිපිටිය, බොරැල්ල පාර, දුම්රිය හරස් පටුමඟ, අංක ටී 1 යන ලිපිනයෙහි පදිංචි ඇල්විටිගලගේ පුංචි නෝනා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சாகரிகா அதாவுத)
(The Hon. (Mrs.) Sagarika Athauda, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, කෑගල්ල, නිල්වක්ක, "තුසිත" යන ලිපිනයෙහි පදිංචි කේ.ආර්.එස්.කේ. සේනානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු නිමල් පලිහේන මහතා
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කහටගස්දිගිලිය, මහමැස්සලාව, ඩිපෝවත්ත, අංක 47 යන ලිපිනයෙහි පදිංචි එච්.බී. කිංස්ලි ගාවින් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ගැටලාව, කොකාවැව, තිත්තැල්ලැව, අංක 84 යන ලිපිනයෙහි පදිංචි ආර්.එම්.එස්.පී. ජයන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

තච්චන්කුලම්-මූන්රුමුරිප්පු ප්‍රධාන මාර්ගය: මහජනතාව සඳහා විවෘත කිරීම
தச்சன்குளம் - மூன்றுமுறிப்பு பிரதான வீதி: பொது மக்களின் பாவனைக்காகத் திறத்தல்
TACHCHANKULAM-MOONRUMURIPPU MAIN ROAD: OPENING FOR THE PUBLIC

1084/2025

1. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් වවුනියාවේ, තච්චන්කුලම් ගුවන් තොටුපොළ පුළුල් කිරීම සඳහා ඒ අවට පෞද්ගලික ඉඩම් අත්පත් කර ගන්නා ලද අතර එහිදී දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රදේශයේ මහජනතාව විසින් භාවිත කරන ලද මාර්ග භාවිත කිරීමද තහනම් කර තිබෙන බවත්;

(ii) විශේෂයෙන්ම තච්චන්කුලම්-මූන්රුමුරිප්පු ප්‍රධාන මාර්ගය භාවිත කිරීම දීර්ඝ කාලයක් තිස්සේ මහජනතාවට තහනම් කර තිබෙන බවත්;

(iii) ඒ හේතුවෙන් තච්චන්කුලම් ගම්මානයේ ජීවත්වන ජනතාවට තමන්ගේ අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ග්‍රාම නිලධාරි කාර්යාලයට යාමට කිලෝමීටර දෙකක් වෙනුවට කිලෝමීටර දොළහක් ගමන් කිරීමට සිදුවී ඇති බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) එසේ නම්, ඉහත සඳහන් තච්චන්කුලම්-මූන්රුමුරිප්පු ප්‍රධාන මාර්ගය මහජනතාවගේ භාවිතය උදෙසා විවෘත කිරීමට පියවර ගන්නේද;

(ii) ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை விமானப் படைக்குச் சொந்தமான வவுனியாவின், தச்சன்குளம் விமான நிலையத்தின் விஸ்தரிப்பு நடவடிக்கைகளுக்காக அதனைச் சுற்றியுள்ள தனியார் காணிகள் சுவீகரிக்கப்பட்டதுடன், நீண்ட காலமாக பொது மக்களால் பயன்படுத்தப்பட்ட வீதிகளைத் தொடர்ந்தும் பயன்படுத்துவது தடை செய்யப்பட்டுள்ளது என்பதையும்;

(ii) குறிப்பாக, தச்சன்குளம் - மூன்றுமுறிப்பு பிரதான வீதி நீண்ட காலமாக பொது மக்களின் பாவனைக்குத் தடை செய்யப்பட்டுள்ளது என்பதையும்;

(iii) இதனால் தச்சன்குளம் கிராமத்தில் வசிக்கின்ற மக்கள் தமது தேவைகளுக்காக இரண்டு கிலோ மீற்றர் பயணித்து கிராம அலுவலரின் அலுவலகத்துக்குச் செல்வதற்குப் பதிலாக சுற்றுப்பாதையில் 12 கிலோ மீற்றர் வரை செல்ல வேண்டியுள்ளது என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ)(i) ஆமெனில், மேற்குறிப்பிட்ட தச்சன்குளம் - மூன்றுமுறிப்பு பிரதான வீதியை பொது மக்களின் பாவனைக்காகத் திறப்பதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(ii) அதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he accept that -

(i) the private lands in the vicinity of the Tachchankulam Airport in Vavuniya belonging to the Sri Lanka Air Force were acquired for the expansion of the airport and the public access to the roads that the local residents have long been using has been restricted;

(ii) in particular, the use of the Tachchankulam -Moonrumurippu main road has been prohibited to the general public for a long time; and

(iii) the people, living in the Tachchankulam village have had to travel 12 kilometers instead of the usual two kilometers to reach the Grama Niladhari office to get their needs fulfilled, as a result?

(b) Will he inform this House -

(i) if so, whether steps will be taken to open the Tachchankulam-Moonrumurippu main road concerned above for public use; and

(ii) the time that will be taken for it?

(c) If not, why?

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) වවුනියාව ගුවන් තොටුපොළ පුළුල් කිරීම වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත පවරා දී ඇති තච්චන්කුලම්, වවුනියාව, රම්බෙකුළම, කෝවිල්කුළම ගම්මානවලට අයත් පුද්ගලයන් 167කට අයත් අක්කර 446.68ක පමණ භූමිය වවුනියාව ප්‍රාදේශීය ලේකම් විසින් අදියර 3ක්

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

යටතේ අත්පත් කර ගැනීමට කටයුතු කර තිබෙනවා. ඒ අනුව ප්‍රදේශවාසීන්ට එම මාර්ගය භාවිත කිරීම සම්බන්ධව අවහිරතා ඇති වී ඇති බව නිරීක්ෂණය කර තිබෙනවා.

තවද, තව්වන්කුලම්-මූන්රුමුරිප්පු මාර්ගය මූන්රුමුරිප්පු මංසන්ධියේ සිට - යුද හමුදා වන්නි බල සේනා මූලස්ථානයේ පිවිසුම් දොරටුවේ සිට - මීටර් 550ක දුරක් වවුනියාව ගුවන් හමුදා කඳවුර සහ යුද හමුදා වන්නි ආරක්ෂක සේනා මූලස්ථානය - ඉහත සඳහන් ඉඩම් පවරාගත් මුල් කාලයේ - වර්ෂ කිහිපයක් පොදුවේ භාවිත කර ඇති අතර, 2012 මැයි මස 04වන දිනෙන් පසුව ගුවන් හමුදා ප්‍රධාන පිවිසුම් මාර්ගය A-9 මාර්ගය දෙසින් විවෘත වීමත් සමඟ විෂයගත මාර්ගය ගුවන් හමුදා භාවිතයෙන් සම්පූර්ණයෙන් ඉවත් කර ඇත.

ඒ අනුව, එතැන් පටන් මේ දක්වා වසර 13ක කාලයක් මෙම මාර්ගය යුද හමුදා වන්නි ආරක්ෂක සේනා මූලස්ථානය පමණක් පූර්ණකාලීනව භාවිත කරනු ලබයි.

(ii) (අ) (i) කොටසෙහි සඳහන් පිළිතුරම අදාළ වේ.

(iii) විෂයගත මාර්ගය හරහා තව්වන්කුලම් ප්‍රදේශවාසීන්ට සිය ග්‍රාමයේ සිට මූන්රුමුරිප්පු ප්‍රදේශයේ, එනම් A-9 මාර්ගය ආසන්නයේ පිහිටා ඇති තම ග්‍රාම නිලධාරි කාර්යාලය වෙත පැමිණීමට කිලෝමීටර 1.4ක පමණ දුරක් පැවතියද, එම මාර්ගය අවහිරවීම හේතුවෙන්, වර්තමානයේ තව්වන්කුලම් ගම්වාසීන් විසින් පහත සඳහන් පරිදි විකල්ප මාර්ග 03ක් භාවිත කරනු ලබයි.

සිවිල් ජනතාව භාවිත කරනු ලබන මාර්ගය 01 -

තව්වන්කුලම් සිට සමළන්කුලම් හරහා මූන්රුමුරිප්පු ග්‍රාම නිලධාරි කාර්යාලයට ගමන් කරන මාර්ගය.

තව්වන්කුලම් 8වන පටුමගේ සිට නැඟෙනහිර දිශාවට මීටර 900ක් පමණ ගමන් කර උමා මහේෂ්වරන් මාර්ගයෙන් දකුණු දිශාවට කිලෝමීටර 2.1ක් ගමන් කර සමළන්කුලම මාර්ගයට පිවිස ඒ හරහා බටහිර දිශාවට කිලෝමීටර 3ක් ගමන් කර නෝර්ත්වේ හෝටලය - Northway Hotel - අසලින් A-9 මාර්ගයට පිවිස මූන්රුමුරිප්පු ග්‍රාම නිලධාරි කාර්යාලයට ළඟාවීම සඳහා භාවිත කරනු ලබන අතුරු මාර්ගය. මෙම මාර්ගයෙහි සමස්ත දුර කිලෝමීටර 06ක් වන අතර සියලුම වර්ගයේ වාහන ගමනාගමනයට සුදුසු මට්ටමකින් ගමන් කිරීමට ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරමින් පවතී.

සිවිල් ජනතාව භාවිත කරනු ලබන මාර්ගය 02 -

තව්වන්කුලම් සිට වවුනියාව නගරය හරහා මූන්රුමුරිප්පු ග්‍රාම නිලධාරි කාර්යාලයට ගමන් කරන මාර්ගය.

තව්වන්කුලම් 8වන පටුමගේ සිට නැඟෙනහිර දිශාවට මීටර් 900ක් ගමන් කර උමා මහේෂ්වරන් මාර්ගයට පිවිස උතුරු දිශාවට කිලෝමීටර 2ක් ගමන් කර A-9 වවුනියාව - හොරොව්පොතාන මාර්ගයට පැමිණ නැවත බටහිර දෙසට කිලෝමීටර 2ක් ගමන් කර වවුනියාව නගරය හරහා කිලෝමීටර 3.1ක දුරක් A-9 මාර්ගය ඔස්සේ දකුණු දිශාවට පිවිසීමෙන් මූන්රුමුරිප්පු ග්‍රාම නිලධාරි කාර්යාලයට ළඟා වීම සඳහා භාවිත කරනු ලබන මාර්ගය වේ. මෙම මාර්ගයේ සමස්ත දුර කිලෝමීටර 8ක් වේ.

ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයේ සඳහන් කර තිබෙන්නේ කිලෝමීටර 12ක් කියලා. නමුත්, එය කිලෝමීටර 12ක් නොවෙයි, කිලෝමීටර 8යි.

සිවිල් ජනතාව භාවිත කරනු ලබන මාර්ගය 03 -

තව්වන්කුලම් සිට මූන්රුමුරිප්පු ග්‍රාම නිලධාරි කාර්යාලයට පැමිණීමට ඇති අතුරු මාර්ගය.

යුද හමුදා මාර්ග බාධකයේ සිට මීටර් 50ක් පමණ නැඟෙනහිර දෙසට ගමන් කර නැවත දකුණු දිශාවට ප්‍රසිද්ධ නොවන පටු මාර්ගය ඔස්සේ තව්වන්කුලම් වැව් බැම්ම මතින් කිලෝමීටර 1.5ක් පමණ දකුණු දිශාවට පිවිස සමළන්කුලම මාර්ගය ඔස්සේ නෝර්ත්වේ හෝටලය - Northway Hotel - අසලින් A-9 මාර්ගයට පිවිස මූන්රුමුරිප්පු ග්‍රාම නිලධාරි කාර්යාලයට ළඟා වීම සඳහා භාවිත කරනු ලබන අතුරු මාර්ගය. මෙම මාර්ගයේ සමස්ත දුර කිලෝමීටර 2ක් වන අතර යතුරුපැදි හා පාපැදි ගමන් කිරීමට හැකි මට්ටමේ පවතී.

(ආ) (i) තව්වන්කුලම් - මූන්රුමුරිප්පු මාර්ගය මහජනතාවගේ භාවිතය උදෙසා විවෘත කිරීමට පියවර ගන්නේද යන්න දැනට පවතින ආරක්ෂක තත්ත්වය පිළිබඳව විමසා බලා තීරණය කළ යුතු කරුණක් වන අතර, දැනට පවතින තත්ත්වය තුළ ගුවන් හමුදා කඳවුරේ සහ ආරක්ෂක සේවා මූලස්ථානයේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා එලෙස මහජනයාට විවෘත කිරීමට හැකියාවක් නොමැති බවයි අපේ විශ්ලේෂණවලින් සඳහන් වෙන්නේ.

(ii) අදාළ නොවේ.

(ඇ) මෙම මාර්ගය මහ ජනතාවට විවෘත කිරීම මෙම අවස්ථාවේදී ගැටලු සහගත විය හැකි බැවින් ප්‍රදේශවාසීන්ගේ මූඛ්‍ය අවශ්‍යතා ඉටු කිරීමේ හැකියාව සහ ඔවුනට වඩාත් අවහිරයක් ඇති නොවන පරිදි මෙන්ම පවතින ආරක්ෂක විධිවිධාන එලෙසම පවත්වාගෙන යෑමේ අවශ්‍යතාවද අපි සලකා බැලුවා. ඒ අනුව පහත දැක්වෙන විකල්ප මාර්ග පුළුල්කොට සංවර්ධනය කර ලබා දීම සුදුසු බව අපි යෝජනා කරනවා.

<u>විකල්ප මාර්ග 01</u> - තව්වන්කුලම් යුද හමුදා බ්‍රාවෝ දොරටුව - Bravo Gate - සමීපයේ ඇති මාර්ග බාධකයේ සිට ආරක්ෂක සේනා මූලස්ථානයේ ගිනිකොන දෙසින් පිහිටි ආරක්ෂක වැට අසලින් නව මාර්ගයක් ඉදිකර එය සමළන්කුලම් A-9 මාර්ගයට සම්බන්ධ කිරීම. මෙම මාර්ගයේ සමස්ත දුර කිලෝමීටර 1.8ක් වන අතර, ප්‍රශ්නගත මාර්ගය හා සැසඳීමේදී මීටර් 400ක පමණ දුර ප්‍රමාණයක් වැඩිපුර ගමන් කිරීමට ප්‍රදේශවාසීන්ට සිදු වේ. මෙය කිලෝමීටර 8ක දුරක් යෑම හා සසඳා බැලීමේදී වඩාත් ප්‍රායෝගික විකල්පයක් වේ.

<u>විකල්ප මාර්ග 02</u> - තව්වන්කුලම් ග්‍රාමයේ ඇති යුද හමුදා මාර්ග බාධකයේ සිට මීටර් 50ක් පමණ නැඟෙනහිර දෙසට ගමන් කර නැවත දකුණු දිශාවට ප්‍රසිද්ධ නොවන පටු මාර්ගය ඔස්සේ තව්වංකුලම් වැව් බැම්ම මතින් කිලෝමීටර 1.5ක් පමණ දකුණු දිශාවට පිවිස සමළන්කුලම මාර්ගය ඔස්සේ නෝර්ත්වේ හෝටලය අසලින් A-9 මාර්ගයට

පිවිසීමට භාවිත කරනු ලබන අතුරු මාර්ගය. මෙම මාර්ගය වර්තමානය වනවිට යතුරු පැදි හා පාපැදි ගමන් කිරීමට හැකි තත්ත්වයේ පවතින අතර, එය අනෙකුත් වාහන ගමන් කළ හැකි තත්ත්වයට පුළුල්කොට සංවර්ධනය කර ප්‍රදේශවාසීන්ගේ භාවිතයට ලබා දීම. මෙම මාර්ගයේ සමස්ත දුර කිලෝමීටර 2.3ක් වන අතර, ප්‍රශ්නගත මාර්ගය හා සැසඳීමේදී මීටර් 900ක පමණ දුර ප්‍රමාණයක් වැඩිපුර ගමන් කිරීමට ප්‍රදේශවාසීන්ට සිදු වේ. මෙය කිලෝමීටර 8ක දුරක් යෑම හා සසඳා බැලීමේදී තවත් ප්‍රායෝගික විකල්පයක් වේ.

ගරු මන්ත්‍රීතුමනි, අපි ඉදිරියේදී මේ කාරණය ආරක්ෂක කවුන්සලයට ඉදිරිපත් කරලා මේ තත්ත්වය නැවතත් සලකා බැලීමට කටයුතු කරනවා.

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, பதில் வழங்கியமைக்கு நன்றி!

உங்களுடைய பதிலில் குறிப்பிடப்பட்ட தூரங்களைப் பார்க்கும்போது, அவை அந்தக் கிராமத்தின் ஆரம்பப் பகுதியிலிருந்து அளக்கப்பட்டதா அல்லது முடிவுப் பகுதியிலிருந்து அளக்கப்பட்டதா? என்றதொரு சந்தேகம் எழுகின்றது. ஏனெனில், நீங்கள் குறிப்பிட்ட தூரங்கள் எல்லாம் mapஐப் பார்த்துச் சொன்னது போல்தான் எனக்குத் தெரிகின்றது. என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

பாதுகாப்புக் காரணங்களுக்காக தச்சன்குளம் - மூன்றுமுறிப்பு பிரதான வீதியை பொது மக்களின் பாவனைக்குத் திறக்க முடியாவிட்டால், நீங்கள் குறிப்பிட்ட bicycleஇலும் motor bikeஇலும் பயணிக்கக்கூடிய மாற்றுப் பாதைக்கூடாக கர்ப்பிணித் தாய்மாரோ, வயது முதிர்ந்தவர்களோ three-wheelerஇல் பயணிக்க முடியாத சூழல் இருப்பதனால், இது தொடர்பாக ஆராய்ந்து, 2026ஆம் ஆண்டுக்கான நிதி ஒதுக்கீட்டில் அந்த alternative roadஐ வாகனங்கள் பயணிக்கக்கூடிய வகையில் அபிவிருத்தி செய்வதற்கு விசேடமானதொரு பணிப்புரையை உங்களால் வவுனியா மாவட்ட அபிவிருத்திக் குழுவுக்கு வழங்க முடியுமா? எனக் கேட்கின்றேன்.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු මන්ත්‍රීතුමනි, මම ඉදිරිපත් කළ මාර්ගවල දුර ප්‍රමාණයන් සිතියම විතරක් බලලා නොවෙයි ඔබතුමාට ප්‍රකාශ කළේ. ප්‍රායෝගිකව අපේ නිලධාරි මහත්වරුන් ගිහිල්ලා, ඒ ගම්මානවල ග්‍රාම නිලධාරීන් එක්කත් සාකච්ඡා කරලා තමයි ඒ දුර ප්‍රමාණයන් සහ විකල්ප මාර්ග පිළිබඳව ඔබතුමා වෙත දැන්වූවේ. ඔබතුමාගේ අතුරු ප්‍රශ්නයට පිළිතුරු සපයනවා නම්, ඒ මාර්ගයේ බයිසිකල්වලට සහ ත්‍රී වීලරයකට අමාරුවෙන් යන්න පුළුවන් තත්ත්වයක් තමයි තිබෙන්නේ. පාපැදිවලට යෑමට හැකි වුණත් ත්‍රී වීලරයකට යෑමට අපහසුවක් තිබෙන බව අපි පිළිගන්නවා. නමුත්, ඒ මාර්ගය සංවර්ධනය කර ගත්තොත් අර දුර ප්‍රමාණය ගොඩක් අඩු වෙනවා. කිලෝමීටර 1.8ක් පමණ වෙන්නේ. ඒක නිසා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කරපු ආකාරයට දිස්ත්‍රික් ලේකම් එක්ක සම්බන්ධ වෙලා, මුදල් වෙන් කරගෙන ඉදිරි කටයුතු සලස්වන්න පුළුවන් බව මම දන්වන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

இவ்வாறான பிரச்சினை இந்த வீதி தொடர்பில் மாத்திரமல்ல, வவுனியாவில் காணப்படுகின்ற மிக முக்கியமான சில பிரதேசங்களிலும் காணப்படுகின்றன. அவை தொடர்பான விபரங்களை அடுத்த பாதுகாப்பு அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் தரலாம். உதாரணத்துக்கு, வவுனியா பொலிஸ் நிலையம் மாநகர சபையின் காணியில் அமைந்திருக்கின்றது. அதேபோல, ஈச்சங்குளத்திலுள்ள துயிலும் இல்லம் இப்போது இராணுவ முகாமாக இருக்கின்றது. செட்டிக்குளத்தில் இருக்கின்ற APCக்குச் சொந்தமான காணியில் STFஇன் முகாம் இருக்கின்றது. இந்த நாட்டில் யுத்தம் முடிவடைந்து 15 ஆண்டுகளாகிவிட்டது. இந்த இடங்களை விடுவிக்க முடியுமாக இருந்தால், இது தொடர்பான விடயங்களை அடுத்த மாவட்ட அபிவிருத்திக் குழு கூட்டத்துக்குக் கொண்டுவருவதற்கு ஆவன செய்ய முடியுமா? எனக் கேட்கின்றேன்.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු කථානායකතුමනි, වවුනියාව පොලීසිය පිහිටා තිබෙන ඉඩම ගැන ගරු මන්ත්‍රීතුමා පැවසුවා. ඒක නගර සභාවේ ඉඩමක පිහිටා තිබෙන්නේ. ඒ කාරණය මහජන ආරක්ෂක ඇමතිතුමාට මම යොමු කරන්නම්. ඒ වාගේම සෙට්ටිකුලම් STF කඳවුර සම්බන්ධවත් මහජන ආරක්ෂක ඇමතිතුමාට මම දන්වන්නම්. ඉච්චන්කුලම් ඉඩම සම්බන්ධයෙන් අපි කටයුතු කරන්නම්.

ඔබතුමාගේ දැන ගැනීම පිණිස කියනවා නම්, 2025 ජනවාරි 01වැනි දා ඉඳලා මේ දක්වා උතුරේ විතරක් රජයේ ඉඩම් අක්කර 586ක් හමුදා පරිහරණයෙන් නිදහස් කර තිබෙනවා. ඒ වාගේම පෞද්ගලික ඉඩම් අක්කර 86.24ක් මුදා හැර තිබෙනවා. මුළු එකතුව අක්කර 672ක්. ඔබතුමා ඉදිරිපත් කළ කාරණා අපි ආරක්ෂක කවුන්සලයට ඉදිරිපත් කරලා, ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවටත් ඉදිරිපත් කරලා මේ වසර තුළ පමණක් එම ඉඩම් ප්‍රමාණය නිදහස් කර තිබෙනවා.

ඊළඟට, නැඟෙනහිර පමණක් රජයේ ඉඩම් අක්කර 34.58ක් නිදහස් කර තිබෙනවා. අනිවාර්යයෙන්ම ඉච්චන්කුලම් ඉඩම සම්බන්ධවත් විශේෂ සැලකිල්ලක් යොමු කර ඔබතුමාගේ ඉල්ලීම උපරිම දුරකට ඉෂ්ට කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -1115/2025- (1), ගරු රොෂාන් අක්මීමන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

උතුර සහ නැඟෙනහිරට දුම්රිය සේවා: 2012-2019 දක්වා ආදායම

வடக்கு மற்றும் கிழக்குக்கான புகையிரத சேவைகள்: 2012-2019 வரையான வருமானம்

TRAIN SERVICES TO NORTH AND EAST: INCOME FROM 2012-2019

1181/2025

3. ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට උතුරු සහ නැගෙනහිර පළාත්වලින් විශාල ආර්ථික දායකත්වයක් ලැබෙන බව දන්නේද;

(ii) වර්ෂ 2012 සිට 2019 දක්වා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මුළු ආදායම සහ උතුරු හා නැගෙනහිර යන එක් එක් පළාතේ ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) උතුරු පළාතේ දුම්රිය ස්ථානවල ස්ථානාධිපතිවරුන් හා සේවකයන් සංඛ්‍යාව සිංහල හා ද්‍රවිඩ භාෂා මාධ්‍යයන් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) උතුරු හා නැගෙනහිර පළාත්වල ඇති මුළු දුම්රිය ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, ප්‍රධාන දුම්රිය ස්ථාන සහ උප දුම්රිය ස්ථාන අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වවුනියාවේ සිට කන්කසන්තුරෙයි දක්වා සහ මැදවච්චියේ සිට තලෛයිමන්නාරම දක්වා ඇති ප්‍රධාන දුම්රිය ස්ථාන සහ උප දුම්රිය ස්ථාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පළමුවන පන්තියේ නිදන මැදිරි පහසුකම් සහිත ගමනාන්ත කවරේද;

(v) යාපනය දුම්රිය සඳහා මේ දක්වා පළමුවන පන්තියේ නිදන මැදිරි පහසුකම් ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை புகையிரத திணைக்களத்துக்கு வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களிலிருந்து பாரிய பொருளாதாரப் பங்களிப்பு கிடைப்பதை அறிவாரா என்பதையும்;

(ii) 2012ஆம் ஆண்டு தொடக்கம் 2019ஆம் ஆண்டு வரை, இலங்கை புகையிரத திணைக்களத்தின் மொத்த வருமானமும் வடக்கு மற்றும் கிழக்கு ஆகிய மாகாணம் ஒவ்வொன்றினது வருமானமும், ஒவ்வோர் ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) வடக்கு மாகாண புகையிரத நிலையங்களில், சிங்களம் மற்றும் தமிழ் மொழிமூலமாகப் பணியாற்றும் புகையிரத நிலைய அதிபர்கள் மற்றும் பணியாளர்களின் எண்ணிக்கை வெவ் வேறாக யாது என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களிலுள்ள மொத்தப் புகையிரத நிலையங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அந்த எண்ணிக்கை, பிரதான புகையிரத நிலையங்கள் மற்றும் உப புகையிரத நிலையங்களின்படி வெவ்வேறாக யாது என்பதையும்;

(iii) வவுனியாவிலிருந்து காங்கேசன்துறை வரையும் மதவாச்சியிலிருந்து தலைமன்னார் வரையும் உள்ள பிரதான புகையிரத நிலையங்கள் மற்றும் உப புகையிரத நிலையங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iv) முதலாம் வகுப்பு உறங்கும் பெட்டி வசதிகளைக் கொண்ட பயண முடிவிடங்கள் யாவை என்பதையும்;

(v) யாழ்ப்பாண புகையிரதங்களுக்கு இதுவரை, முதலாம் வகுப்பு உறங்கும் பெட்டி வசதிகள் வழங்கப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he state -

(i) whether he is aware that the Sri Lanka Railways receives a substantial economic contribution from the Northern and the Eastern Provinces;

(ii) the total income of the Sri Lanka Railways and the income received from the Northern Province and the Eastern Province each in each year from 2012 to 2019, separately; and

(iii) the number of stationmasters and other employees working at the railway stations in the Northern Province, separately as Sinhala-speaking employees and Tamil-speaking employees?

(b) Will he also state the -

(i) total number of railway stations in the Northern and the Eastern Provinces;

(ii) breakdown of the said number, separately in terms of main railway stations and sub-railway stations;

(iii) number of main railway stations and the number of sub-railway stations from Vavuniya to Kankesanthurai and from Medawachchiya to Talaimannar, separately;

(iv) names of the destinations for which first-class sleeping compartment facilities are available; and

(v) reasons for not providing first-class sleeping compartment facilities to the Jaffna-bound trains so far?

(c) If not, why?

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (වැඩබලන ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பதில் அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Acting Minister of Transport, Highways and Urban Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්. 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා දත්ත සලකා බැලීමේදී දුම්රිය දෙපාර්තමේන්තුවේ මුළු ආදායමින් ආසන්න වශයෙන් සියයට 8ක පමණ අගයක් උතුරු සහ නැගෙනහිර පළාත්වලින් ලැබී ඇති බව නිරීක්ෂණය වේ.

(ii) 2012 වර්ෂයේ දුම්රිය දෙපාර්තමේන්තුවේ මුළු ආදායම රුපියල් මිලියන 4,851.87යි, දුම්රිය දෙපාර්තමේන්තුවේ උතුරු පළාත් ආදායම රුපියල් මිලියන 90.33යි, දුම්රිය දෙපාර්තමේන්තුවේ නැගෙනහිර පළාත් ආදායම රුපියල් මිලියන 132.28යි.

2013 වර්ෂයේ දුම්රිය දෙපාර්තමේන්තුවේ මුළු ආදායම රුපියල් මිලියන 5,423.29යි, දුම්රිය දෙපාර්තමේන්තුවේ උතුරු පළාත් ආදායම රුපියල් මිලියන 94.93යි, දුම්රිය දෙපාර්තමේන්තුවේ නැගෙනහිර පළාත් ආදායම රුපියල් මිලියන 149.16යි.

2014 වර්ෂයේ දුම්රිය දෙපාර්තමේන්තුවේ මුළු ආදායම රුපියල් මිලියන 5,909.31යි, දුම්රිය දෙපාර්තමේන්තුවේ උතුරු පළාත් ආදායම රුපියල් මිලියන 198.53යි, දුම්රිය දෙපාර්තමේන්තුවේ නැගෙනහිර පළාත් ආදායම රුපියල් මිලියන 170.87යි.

2015 වර්ෂයේ දුම්රිය දෙපාර්තමේන්තුවේ මුළු ආදායම රුපියල් මිලියන 6,334.60යි, දුම්රිය දෙපාර්තමේන්තුවේ උතුරු පළාත් ආදායම රුපියල් මිලියන 336.66යි, දුම්රිය දෙපාර්තමේන්තුවේ නැගෙනහිර පළාත් ආදායම රුපියල් මිලියන 169.09යි.

2016 වර්ෂයේ දුම්රිය දෙපාර්තමේන්තුවේ මුළු ආදායම රුපියල් මිලියන 6,623.37යි, දුම්රිය දෙපාර්තමේන්තුවේ උතුරු පළාත් ආදායම රුපියල් මිලියන 360.03යි, දුම්රිය දෙපාර්තමේන්තුවේ නැගෙනහිර පළාත් ආදායම රුපියල් මිලියන 160.34යි.

2017 වර්ෂයේ දුම්රිය දෙපාර්තමේන්තුවේ මුළු ආදායම රුපියල් මිලියන 6,477.11යි, දුම්රිය දෙපාර්තමේන්තුවේ උතුරු පළාත් ආදායම රුපියල් මිලියන 380.60යි, දුම්රිය දෙපාර්තමේන්තුවේ නැගෙනහිර පළාත් ආදායම රුපියල් මිලියන 165.79යි.

2018 වර්ෂයේ දුම්රිය දෙපාර්තමේන්තුවේ මුළු ආදායම රුපියල් මිලියන 7,412.51යි, දුම්රිය දෙපාර්තමේන්තුවේ උතුරු පළාත් ආදායම රුපියල් මිලියන 401.17යි, දුම්රිය දෙපාර්තමේන්තුවේ නැගෙනහිර පළාත් ආදායම රුපියල් මිලියන 166.43යි.

2019 වර්ෂයේ දුම්රිය දෙපාර්තමේන්තුවේ මුළු ආදායම රුපියල් මිලියන 7,901.32යි, දුම්රිය දෙපාර්තමේන්තුවේ උතුරු පළාත් ආදායම රුපියල් මිලියන 465.45යි, දුම්රිය දෙපාර්තමේන්තුවේ නැගෙනහිර පළාත් ආදායම රුපියල් මිලියන 162.07යි.

(iii) දුම්රිය ස්ථානාධිපතිවරුන්:

සිංහල භාෂා මාධ්‍යයෙන් 14යි.

ද්‍රවිඩ භාෂා මාධ්‍යයෙන් 68යි.

අනෙකුත් දුම්රිය ස්ථාන කාර්ය මණ්ඩලය:

සිංහල භාෂා මාධ්‍යයෙන් 52යි.

ද්‍රවිඩ භාෂා මාධ්‍යයෙන් 64යි.

(ආ) (i) උතුරු පළාතේ දුම්රිය ස්ථාන සංඛ්‍යාව 41යි

නැගෙනහිර පළාතේ දුම්රිය ස්ථාන සංඛ්‍යාව 14යි

ඒ අනුව උතුරු හා නැගෙනහිර පළාත්වල ඇති මුළු දුම්රිය ස්ථාන සංඛ්‍යාව 55යි.

(ii) උතුරු පළාත: ප්‍රධාන දුම්රිය ස්ථාන 23යි.
උප දුම්රිය ස්ථාන 18යි.
නැගෙනහිර පළාත: ප්‍රධාන දුම්රිය ස්ථාන 08යි.
උප දුම්රිය ස්ථාන 06යි.

(iii) වවුනියාවේ සිට කන්කසන්තුරෙයි දක්වා:
ප්‍රධාන දුම්රිය ස්ථාන 16යි
උප දුම්රිය ස්ථාන 13යි

මැදවච්චිය සිට තලෙයිමන්නාරම දක්වා:
ප්‍රධාන දුම්රිය ස්ථාන 07යි
උප දුම්රිය ස්ථාන 04යි

(iv) නිදන මැදිරි සහිත දුම්රියන් මේ වන විට කිසිදු ගමනාන්තයක් වෙත ධාවනය නොවේ.

(v) කොළඹ සිට යාපනය දක්වා මේ වන විට ධාවනය වන්නේ නව දුම්රිය මැදිරි වන අතර, පැවති නිදන මැදිරි ඉතා පැරණි බැවින් ධාවනයෙන් ඉවත් කර ඇත. ඒ වෙනුවට වායු සමනය කර ඇති මැදිරි යාපනය රාත්‍රී දුම්රිය සඳහා යොදවා ඇත.

පැවති පැරණි පළමු පන්තියේ නිදන මැදිරියක ගමන් කළ හැක්කේ මගීන් 12දෙනෙකුට පමණක් වුවද, නව පළමු පන්තියේ වායු සමනය කරන ලද මැදිරියක මගීන් 48ක් පමණ ගමන් කිරීමේ පහසුකම් ඇත.

ඒ නිසා වැඩි මගීන් පිරිසකගේ අවශ්‍යතා සපුරා ඇති අතර, අලුතින් ආනයනය කරන ලද මැදිරි කට්ටලවල නිදන මැදිරි ආනයනය කිරීම සිදු කර නැත.

(ඇ) අදාළ නොවේ.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நீங்கள் குறிப்பிட்ட முதலாம் வகுப்பு உறங்கும் பெட்டி வசதிகள் இனிவரும் காலங்களிலாவது வழங்கப்படுமா? அதற்குரிய வாய்ப்புகள் இருக்கிறதா? எனக் கேட்கின்றேன்.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු කථානායකතුමනි, නිදන මැදිරි දැම්මාම අපට අරගෙන යන්න පුළුවන් වන්නේ අඩු මගීන් සංඛ්‍යාවක්. උදාහරණයක් විධියට ගත්තොත්, නිදන මැදිරියක ප්‍රමාණය ලොකු නමුත් ඉන්න පුළුවන් මගීන් ප්‍රමාණය 12යි. නමුත් වායු සමනය කළ, සාමාන්‍ය මැදිරියට වඩා සුව පහසුවෙන් යුතු මැදිරියක මගීන් 48දෙනෙකු ප්‍රවාහනය කරන්න පුළුවන්. ඒ නිසා මේ අවස්ථාවේදී නිදන මැදිරි ආනයනය කිරීමට බලාපොරොත්තු වෙන්නේ නැහැ. වායු සමනය කරන්න පුළුවන්, adjustable seats සහිත මැදිරි තමයි අපි මේ වෙන විටත් යොදවා තිබෙන්නේ සහ ඉදිරියට යොදවන්න බලාපොරොත්තු වෙන්නේ.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

வவுனியா - கிளிநொச்சி - யாழ்ப்பாணம் - காங்கேசன்துறை வரை 1958ஆம் ஆண்டு அமைக்கப்பட்ட புகையிரதக் கடவைகள்தான் தற்போதும் இருக்கின்றன. புதிய புகையிரதக் கடவைகளை உருவாக்குவதற்கான விண்ணப்பங்கள் கோரப் பட்டும், இதுவரை அது நடைபெறவில்லை. அவை வர்த்தமானி அறிவித்தல் ஊடாக நடைமுறைப்படுத்தப்படுமா? அதற்கான வாய்ப்புக்கள் உண்டா? எனக் கேட்கின்றேன்.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

Please, repeat the Question.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

1958ஆம் ஆண்டு வர்த்தமானி அறிவித்தல்மூலம் அங்கீகரிக்கப்பட்டு உருவாக்கப்பட்ட புகையிரதக் கடவைகள் தான் இப்பொழுது வவுனியா - கிளிநொச்சி - யாழ்ப்பாணம் - காங்கேசன்துறை வரை உண்டு. இப்போது மக்கள் குடியேறி பல இடங்களில் பாதைகள் பயன்படுத்தப்படுகின்ற நிலையில், புதிய புகையிரதக் கடவைகள் அமைப்பது தொடர்பான வர்த்தமானி அறிவித்தல் எப்போது உங்களால் வெளியிடப்படும்? எனக் கேட்கின்றேன்.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු මන්ත්‍රීතුමනි, අපි ඒක සැලසුම් කරලා තිබෙනවා. ඉදිරියේදී අනිවාර්යයෙන්ම ඒ සැලසුම් ටික ක්‍රියාත්මක කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -1220/2025- (1), ගරු සුරංග රත්නායක මහතා-
[සභා ගර්භය තුළ නැත.]

වේප්පම්කුලම් සිට සිලාවතුරෙ දක්වා මාර්ගය: විස්තර
வேப்பங்குளம் தொடக்கம் சிலாவத்துறை வரையான வீதி: விபரம்
ROAD FROM WEPPAMKULAM TO SILAWATHURAI: DETAILS

1236/2025

5. ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ, මුසලි ප්‍රාදේශීය සභාවට අයත්, වේප්පම්කුලම් සිට සිලාවතුරෙ දක්වාවූ අභ්‍යන්තර මාර්ගය 2010 වර්ෂයේදී එවකට නැවත පදිංචි කිරීමේ හා ආපදා සහන සේවා අමාත්‍යාංශය විසින් ප්‍රතිසංස්කරණය කරන ලද බව දන්නේද;

(ii) ඉහත මාර්ගයේ දුර කොපමණද;

(iii) එම මාර්ගය කුමන ගම්මානයක් ඔස්සේ දිවෙන්නේද;

(iv) එහි ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන ලද දිනය සහ අවසන් කරන ලද දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ සමාගම සමඟ එළඹී ගිවිසුමේ පිටපතක් ඉදිරිපත් කරන්නේද;

(ii) ගිවිසුමට එළඹෙන අවස්ථාව වන විට සමාගමේ හිමිකරුවන් කවුරුන්ද;

(iii) එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සමාගමට වෙන් කරන ලද මුදල කොපමණද;

(iv) ඉහත මාර්ගය ප්‍රතිසංස්කරණය කර නොමැති බවත්, ඒ සඳහා වංචා සහගත ලෙස මුදල් ලබා ගෙන ඇති බවත් දන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மன்னார் மாவட்டத்தின் முசலி பிரதேச சபைக் குரிய, வேப்பங்குளம் தொடக்கம் சிலாவத்துறை வரையான உள்ளக வீதி, 2010ஆம் ஆண்டில் அப்போதைய மீள்குடியேற்ற மற்றும் அனர்த்த நிவாரண சேவைகள் அமைச்சினால் புனரமைக் கப்பட்டமையை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி வீதியின் தூரம் யாது என்பதையும்;

(iii) மேற்படி வீதி எந்தக் கிராமத்தினூடாகப் பயணிக் கின்றது என்பதையும்;

(iv) மேற்படி வீதியின் புனரமைப்புப் பணிகள் ஆரம்பிக்கப்பட்ட திகதி மற்றும் நிறைவு செய்யப் பட்ட திகதி வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி வீதியை புனரமைக்கும் பணிகளுக்கு ஏதுவாக சம்பந்தப்பட்ட கம்பனியுடன் செய்து கொண்ட உடன்படிக்கையின் பிரதியொன்றைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(ii) உடன்படிக்கை எட்டப்பட்ட சந்தர்ப்பத்தில் குறித்த கம்பனியின் உரிமையாளர்கள் யாவர் என்பதையும்;

(iii) மேற்படி வீதியை புனரமைப்பதற்காக கம்பனிக்கு ஒதுக்கப்பட்ட தொகை எவ்வளவு என்பதையும்;

(iv) மேற்படி வீதி புனரமைக்கப்படவில்லை என்ப தையும் அதற்காக மோசடியான முறையில் பணம் பெறப்பட்டுள்ளதையும் அறிவாரா என்பதையும்;

(v) ஆமெனில், அது தொடர்பில் மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) whether he is aware that the internal road from Weppamkulam to Silawathurai of the Musali Pradeshiya Sabha in the Mannar District was reconstructed in the year 2010 by the then Ministry of Resettlement and Disaster Relief Services;

(ii) the length of the aforesaid road;

(iii) the name of village through which the aforesaid road passes; and

(iii) separately, the dates of commencement and completion of its reconstruction work?

(b) Will he also inform this House -

(i) whether he will submit a copy of the agreement entered into with the company concerning the reconstruction of the aforesaid road;

(ii) the owners of the company at the time of entering into the agreement;

(iii) the amount of money allocated to the company for the reconstruction of that road;

(iv) whether he is aware that the road has not been reconstructed, but funds have been obtained fraudulently; and

(v) if so, the steps that will be taken regarding it?

(c) If not, why?

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) පළාත් සභාව හෝ ඒ යටතේ වූ ආයතනවලට අයත්, වේප්පම්කුලම් සිට සිලාවතුරෛ දක්වා අභ්‍යන්තර ඍජු මාර්ගයක් මන්නාරම දිස්ත්‍රික්කය තුළ නොමැති බැවින් එවැනි මාර්ගයක ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමක් සම්බන්ධයෙන් තොරතුරු අපේ ලිපිලේඛනවල අන්තර්ගත වන්නේ නැහැ. ඒ නිසා ඒ ගැන අදහසක් පළ කරන්න හැකියාවක් නැහැ.

(ii) ඉහත (i)ට ලබා දුන් පිළිතුර අනුව මේ ප්‍රශ්නයට පිළිතුරක් ලබා දෙන්න පුළුවන්කමක් නැහැ.

(iii) මාර්ගයක් නැති නිසා මේ ප්‍රශ්නයටත් පිළිතුරක් ලබා දෙන්න හැකියාවක් නැහැ.

(iv) මේ ප්‍රශ්නයටත් එසේමයි. මීට අදාළ පිළිතුරක් දෙන්න පුළුවන්කමක් නැහැ. හේතුව, (අ) යටතේ අසා තිබෙන කොටස් හතරටම අදාළව ගත්තොත් කියන්න තිබෙන්නේ, එහෙම මාර්ගයක් නැහැ කියලායි.

(ආ) (i) ගිවිසුමක පිටපතක් ඉදිරිපත් කරන්න විධියක් නැහැ. මොකද, එහෙම ගිවිසුමක් නැහැ.

(ii) ගිවිසුමක් නැති නිසා හිමිකරුවන් කවුද කියා කියන්න පුළුවන්කමක් නැහැ.

(iii) ඒ ප්‍රශ්නයටත් පිළිතුරක් දෙන්න පුළුවන්කමක් නැහැ. මොකද, (අ) (i) ප්‍රශ්නයට පිළිතුරක් නොමැති නිසා -එහෙම මාර්ගයක් නොමැති නිසා- අනෙක් කොටස් සියල්ලටම පිළිතුරු දෙන්න විධියක් නැහැ.

(iv) නොදනී.

(v) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
கௌரவ அமைச்சர் அவர்களே, நன்றி!

LRC ඉඩම්වලින් බෙදා දුන් විකල්ප ඉඩම්: නුවරඑළිය දිස්ත්‍රික්කය

LRC காணிகளில் மாற்றுக் காணிகள் பகிர்ந்தளிக்கப்பட்டுள்ள காணிகள்: நுவரெலியா மாவட்டம்

ALTERNATIVE LANDS DISTRIBUTED OUT OF LRC LANDS: NUWARA ELIYA DISTRICT

1253/2025

6. ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

[ගරු මංජුල සුරවීර ආරච්චි මහතා]

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඇති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාර කොපමණද;

(ii) එම ඉඩම් අතරින් මේ වන විට බෙදා දී ඇති විකල්ප ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාර කොපමණද;

(iii) එම විකල්ප ඉඩම් ලබා දී ඇති එක් එක් පුද්ගලයාගේ නම, ලබා දුන් ඉඩම් ප්‍රමාණය, ඉඩම් ලබා දීමේ පදනම සහ ඉඩම් ලබා දුන් කාල වකවානු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම විකල්ප ඉඩම් ලබා දුන් පුද්ගලයන්ගේ නාම ලේඛනයේ දේශපාලනඥයන්ගේ නම් සඳහන් වී තිබේද;

(v) එසේ නම්, එම දේශපාලනඥයන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காணிச் சீர்திருத்த ஆணைக்குழுவுக்குச் சொந்த மானதும் நுவரெலியா மாவட்டத்தில் காணப்படு கின்றதுமான காணிகளின் அளவு எத்தனை ஹெக்டெயார் என்பதையும்;

(ii) அத்தகைய காணிகளில் தற்போது பகிர்ந்தளிக் கப்பட்டுள்ள மாற்றுக் காணிகளின் அளவு எத்தனை ஹெக்டெயார் என்பதையும்;

(iii) அவ்வாறு மாற்றுக் காணிகள் வழங்கப்பட்டுள்ள ஒவ்வொரு நபரின் பெயர், வழங்கப்பட்டுள்ள காணியின் அளவு, காணி வழங்கப்பட்டுள்ளதன் அடிப்படை மற்றும் வழங்கப்பட்ட காலப் பகுதி வெவ்வேறாக யாது என்பதையும்;

(iv) அவ்வாறு மாற்றுக் காணிகள் வழங்கப்பட்டுள்ள நபர்களின் பட்டியலில் அரசியல்வாதிகளின் பெயர்கள் காணப்படுகின்றனவா என்பதையும்;

(v) அவ்வாறாயின், அந்த அரசியல்வாதிகள் யாவர் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the extent of land owned by the Land Reform Commission within the Nuwara Eliya District, in hectares;

(ii) the extent of alternative lands that have been distributed out of it up to now, in hectares;

(iii) the name of each of the persons who have been granted the alternative lands, the extent of land thus granted, the basis of granting the lands and the periods during which each land was granted, separately;

(iv) whether the list of names of the persons to whom such lands were granted, includes names of any politicians; and

(v) if so, those politicians?

(b) If not, why?

ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා. ගරු මංජුල සුරවීර ආරච්චි මන්ත්‍රීතුමා අසන ලද ප්‍රශ්නය නුවරඑළිය ප්‍රදේශයට අදාළ වැදගත් ප්‍රශ්නයක්.

(අ) (i) හෙක්ටෙයාර 29,965.41කි.

(ii) හෙක්ටෙයාර 97.21කි.

(iii) ඇමුණුම මඟින් ලේඛන ඉදිරිපත් කර ඇත. එය දීර්ඝ ඇමුණුමක්. පහසුව සඳහා මම එය **සභාගත*** කරනවා.

(iv) අමුණා ඇති ලේඛන අනුව දේශපාලනඥයන් වෙත කොමිෂන් සභාව විසින් නීතිමය බැඳීම් යටතේ ඉඩම් බැහැර කිරීමක් සිදු කර නොමැත.

(v) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු කථානායකතුමනි, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ජනතාවට පදිංචි වෙන්නවත් ඉඩමක් නැතුව ඉන්න වෙලාවක ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ පැත්තෙන් ඉදිරිපත් කරපු වාර්තාව ඇතුළේ අපට පිළිගන්න බැරි ගැටලුකාරී තත්ත්වයක් තිබෙනවා. විශේෂයෙන්ම අඹගමුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අදාළව "වේවැල්තලාව" කියන ප්‍රදේශයේ අක්කර 50කට අදාළ ඉඩම් ප්‍රමාණයක් අනිවාර්ය ලෙසම වඩිවේල් සුරේෂ් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා අත්පත් කරගෙන තිබෙනවා. දැනටත් එහි වැඩ කටයුතු සිද්ධ වෙමින් තිබෙනවා. ඒත් එක්කම, වේවැල්තලාවේ ඊට යාබද ඉඩමක් තිබෙනවා. උපාලි ලියනගේ, ලොතරැයි මණ්ඩලයේ හිටපු සභාපතිවරයා අක්කර 50ක ඉඩම් කෑල්ලක් වෙන් කරගෙන තිබෙනවා. ඊට අමතරව මම කියන්නම්, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවලට අදාළව දේශපාලනඥයන් විසින් ඉඩම් අත්පත් කරගත්තු විධිය.

එකක්, කොත්මලේ නැහෙනහිර කොටසට අදාළව. Frotoft කියන වත්තේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සතාසිවම් මහතා අක්කර 16කට ආසන්න ඉඩම් ප්‍රමාණයක් අත්පත් කරගෙන තිබෙනවා. ඊට අමතරව හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් සියඹලාපිටිය මහත්තයා තලවකැලේ අක්කර 50කට ආසන්න ඉඩම් ප්‍රමාණයක්

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

වෙන් කර ගෙන තිබෙනවා. මීට අමතරව, නුවරඑළිය මාගස්තොට වත්තට ආසන්නයේ මහින්දානන්ද අලුත්ගමගේ මහත්තයා අක්කර 10ක කැබලි තුනක් වෙන් කරගෙන තිබෙනවා. ඊළඟට, හාවාඑළියේ අශෝකාරාම පන්සලට පිටුපස අක්කර 10ක් වෙන් කරගෙන තිබෙනවා. "Lovers' Leap" දියඇල්ල පාමුල - ආසන්නයේ- අක්කර 10ක් වෙන් කරගෙන තිබෙනවා. මම ඔබතුමාගෙන් අහන්න කැමතියි මේ නම් ඇතුළත් ලේඛනය කොහේද තිබෙන්නේ කියලා.

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ඒ ප්‍රශ්නයට පිළිතුරක් විධියට ඔය කියන නාම ලේඛනය ඇතුළත් කරලා නැහැ. අපි ඒ ගැන සොයා බැලීමක් කරන්න ඕනෑ මෙවැනි සිදුවීම් රට පුරා වාර්තා වන නිසා. මම මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කරලා ගරු මන්ත්‍රීතුමාට ඉක්මනින් පිළිතුරක් ලබා දෙන්නම්. ඒ පිළිබඳව ඔබතුමාට දැනුම් දෙන්න කියලා මම අමාත්‍යාංශයට අවශ්‍ය උපදෙස් ලබා දෙන්නම්.

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ජනතාවට පදිංචි වෙන්න ඉඩමක් නොදී, මහා පරිමාණයෙන් කළ මේ ඉඩම් මංකොල්ලය සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කරන්නේ කවදාද, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි?

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමා, මේ වාගේ සිදුවීම් දිස්ත්‍රික්ක පුරාම පැවැති බවට ඉතිහාසය පුරා තොරතුරු තිබුණාට, නිල වශයෙන් වාර්තා වෙලා නැහැ. ඒ නිසා මේ පිළිබඳ විධිමත් පරීක්ෂණයක් කරන්න ඕනෑ. අපි අමාත්‍යාංශය විධියට මේ පිළිබඳ විධිමත් විමර්ශනයක් කරලා ඉක්මනින් ක්‍රියාමාර්ග ගන්නත්, පාර්ලිමේන්තුව දැනුවත් කරන්නත් බලාපොරොත්තු වෙනවා.

මහනුවර දිස්ත්‍රික්කයේ බදු දුන් LRC ඉඩම්: විස්තර

கண்டி மாவட்டத்தில் குத்தகைக்கு விடப்பட்டுள்ள LRC காணிகள்: விபரம்

LEASED OUT LRC LANDS IN KANDY DISTRICT: DETAILS

1254/2025

7. ගරු ඊ.එම්. බස්නායක මහතා
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ස්ථාපිත කරන අවස්ථාවේදී, එම කොමිෂන් සභාවට අත්පත් කරගන්නා ලද මහනුවර දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) එම ඉඩම් අතරින් නීත්‍යානුකූලව ඉඩම් බදු දී ඇති පුද්ගලයන් හා සමාගම්වල නම් සහ බදු දී ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පුද්ගලයන්ගෙන් සහ සමාගම්වලින් නියමිත පරිදි බදු අය කරන්නේද;

(iv) ඉහත (i)හි සඳහන් ඉඩම් අතරින් නීත්‍යානුකූල නොවන ආකාරයට ඉඩම් පරිහරණය කරන පුද්ගලයන් හා සමාගම්වල නම් කවරේද;

(v) එම පුද්ගලයන්ට/සමාගම්වලට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේ නම්, එහි වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காணிச் சீர்திருத்த ஆணைக்குழு உருவாக்கப் பட்டபோது, அந்த ஆணைக்குழுவுக்கு கண்டி மாவட்டத்திலிருந்து சுவீகரிக்கப்பட்ட காணி களின் அளவு ஏக்கர்களில் எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி காணிகளில் சட்டரீதியாக குத்தகை அடிப்படையில் காணிகள் வழங்கப்பட்டுள்ள நபர்கள் மற்றும் நிறுவனங்களின் பெயர்கள் மற்றும் குத்தகைக்கு வழங்கப்பட்ட காணிகளின் அளவு என்பன வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) மேற்படி நபர்கள் மற்றும் நிறுவனங்களிடமிருந்து உரிய முறையில் வரி அறவிடப்படுகின்றதா என்பதையும்;

(iv) மேற்படி (i) இல் குறிப்பிடப்பட்டவாறு குறித்த காணிகளில் சட்டரீதியற்ற வகையில் காணியை உபயோகப்படுத்துகின்ற நபர்கள் மற்றும் நிறுவனங்களின் பெயர்கள் யாவை என்பதையும்;

(v) இந்நபர்களுக்கு/நிறுவனங்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கை மேற்கொள்ளப்பட்டு இருப்பின், அதன் தற்போதைய முன்னேற்றம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the extent of land in acres acquired by the Land Reform Commission within the Kandy District when the Commission was established;

(ii) the names of the individuals and companies to whom such lands have been legally leased out and the extents of the lands leased out to each, separately;

(iii) whether taxes are collected from those individuals and companies properly;

(iv) the names of the individuals and companies which are illegally using the lands mentioned in (i) above; and

(v) if legal action has been taken against those individuals/ companies, the current progress of it?

(b) If not, why?

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i)

ඉඩම් ප්‍රතිසංස්කරණ සභාව වෙත පැවරුණු ඉඩම්	ප්‍රමාණය		
	අක්කර	රූඩ්	පර්චස්
ගොඩ ඉඩම්	76975	2	00
කුඹුරු ඉඩම්	100	0	04

(ii)

අනු අංක	ඉඩමේ නම	පුද්ගලයාගේ නම/සමාගමේ නම	ප්‍රමාණය		
			අක්	රූඩ්	පර්
1	අහුරුවැල්ල වත්ත	ෆැලිකන් වැලි හයිඩ්‍රොපවර් පුද්ගලික සමාගම	02	1	38.53
2	පෙනිලැන්ඩ් වත්ත	එම්.ආර්.එම්. අබ්දීන්	01	2	7.3
3	බෝහිල් වත්ත	වෙන්වුරි හයිඩ්‍රොපවර් (පුද්) සමාගම	00	2	10.7
4	ග්ලිස්ටන් වත්ත	එම්.එස්.එම්. රිෂාඩ්	16	1	31.3
5	ටිල්ටන් වත්ත	සී/ස නාවලපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය	00	0	12.5
6	බර්න්සයිඩ් වත්ත	දුම්බර එනර්ජි (පුද්) සමාගම	02	3	10.3
7	පහුරුගොල්ල වත්ත	සමාධි ප්‍රජා සංවර්ධන පදනම	05	0	00
8	ගලහ මල්බෙරිවත්ත	සරත් වීරරත්න	04	3	17.21
9	එරින් වත්ත	ඩබ්.ඩබ්.ඒ. චන්ද්‍රා	04	3	34.9
10	එරින් වත්ත	ඩී.ඩී.ජී. ගුණවර්ධන	04	3	34.9
11	මහකන්ද වත්ත	කේ.එල්. තිස්ස කුමාරසිරි	04	0	00
12	අම්බලමාන වත්ත	ජෙරමීරයන් රණසිංහ	05	0	00
13	කිරිමැටිය වත්ත	පැන් නිපෝන් ඩිවලොප්මන්ට් (පුද්) සමාගම	563	2	0.8
14	පට්ටිය වත්ත	එම්. ගනේෂන්	01	0	39.35
15	ලිට්ල්වැලි වත්ත	පී. විජයන්	00	3	00
16	නකල්ස් වත්ත	ආනන්ද තෙන්නකෝන්	03	0	00
17	හන්තාන වත්ත	පවර් හවුස් ලිමිටඩ්	00	0	20
18	බවිලාන වත්ත	විශ්වරේඛා (පුද්) සමාගම	10	0	0.3

(iii)

අනු අංක	ඉඩමේ නම	පුද්ගලයාගේ නම/ සමාගමේ නම	බදු මුදල් අයවේ	බදු මුදල් අය නොවේ
1	අහුරුවැල්ල වත්ත	ෆැලිකන් වැලි හයිඩ්‍රොපවර් පුද්ගලික සමාගම	✓	
2	පෙනිලැන්ඩ් වත්ත	එම්.ආර්.එම්. අබ්දීන්	✓	
3	බෝහිල් වත්ත	වෙන්වුනි හයිඩ්‍රොපවර් (පුද්) සමාගම		✓
4	ග්ලිස්ටන් වත්ත	එම්.එස්.එම්. රිෂාඩ්	✓	
5	ටිල්ටන් වත්ත	සී/ස නාවලපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය	✓	
6	බර්න්සයිඩ් වත්ත	දුම්බර එනර්ජි (පුද්) සමාගම	✓	
7	පහුරුගොල්ල වත්ත	සමාධි ප්‍රජා සංවර්ධන පදනම	✓	
8	ගලහ මල්බෙරිවත්ත	සරත් වීරරත්න	✓	
9	එරින් වත්ත	ඩබ්.ඩබ්.ඒ. චන්ද්‍රා		✓
10	එරින් වත්ත	ඩී.ඩී.ජී. ගුණවර්ධන	✓	
11	මහකන්ද වත්ත	කේ.එල්. තිස්ස කුමාරසිරි		✓
12	අම්බලමාන වත්ත	ජෙරමීරයන් රණසිංහ	✓	
13	කිරිමැටිය වත්ත	පැන් නිපෝන් ඩිවලොප්මන්ට් (පුද්) සමාගම		✓
14	පට්ටිය වත්ත	එම්. ගනේෂන්	✓	
15	ලිට්ල්වැලි වත්ත	පී. විජයන්		✓
16	නකල්ස් වත්ත	ආනන්ද තෙන්නකෝන්	✓	
17	හන්තාන වත්ත	පවර් හවුස් ලිමිටඩ්	✓	
18	බවිලාන වත්ත	විශ්වරේඛා (පුද්) සමාගම	✓	

(iv) දීර්ඝ කාලයක සිට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම්වල පුද්ගලයන් පදිංචි වී ඇත. ආයතනයට අදාළ නීති රාමුවලට අනුකූලව ඔප්පු ලබා දීමට කටයුතු කරමින් පවතී.

සමාගම් විසින් නීත්‍යානුකූල නොවන ආකාරයට භුක්ති විඳිනු නොලබයි.

(v) අනවසරකරුවන් නියමානුකූල කිරීමේ විෂයෙහිලා වරින් වර ගනු ලැබූ රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් අනුමත චක්‍රලේඛ හා විධිවිධානවලට යටත්ව, නේවාසික අරමුණු සඳහා හා බදු පදනම මත අනවසරකරුවන් නියමානුකූල කිරීම් සිදු කෙරේ.

(ආ) අදාළ නොවේ.

ගරු ඊ.එම්. බස්නායක මහතා
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මහනුවර දිස්ත්‍රික්කය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් තව තිබෙනවාද? තිබෙනවා නම් එම ඉඩම් ආයෝජන හා නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීමට පියවර ගෙන තිබේ ද?

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අපට ආයෝජන විශාල ප්‍රමාණයක් එමින් තිබෙනවා. එම නිසා අපට අලුත් ව්‍යාපෘති ආරම්භ කරන්න පුළුවන්. අපි දැනට දිස්ත්‍රික්ක ගණනාවක ඉඩම් හඳුනා ගනිමින් තිබෙනවා. ඒ අනුව ඔබතුමාගේ ප්‍රශ්නයට අදාළ මේ දිස්ත්‍රික්කයේ ඉඩම් සම්බන්ධයෙන් සමීක්ෂණයක් කරලා, සංවර්ධන කටයුතු සහ ආයෝජනය සඳහා යොදා ගත හැකි ඉඩම් හඳුනාගෙන ඉක්මනින් ආයෝජනය සඳහා යොමු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

ගරු ඊ.එම්. බස්නායක මහතා
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපේ රටේ ජනතාවට වාගේම ලෝකයේ සිටින සෑම මනුෂ්‍යයෙකුටම තමන්ගේ ඉඩම කියන එක ඉතාම සුවිශේෂී දෙයක්. විශේෂයෙන්ම මහනුවර දිස්ත්‍රික්කය

ඇතුළේත් දැන් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයිති ඉඩම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයිති ඉඩම්, මහවැලියට අයිති ඉඩම් ආදී වශයෙන් ආයතනවලට අයිති ඉඩම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. මේ ඉඩම්වල දැනට මිනිස්සු පදිංචි වෙලා ඉන්නවා; අවුරුදු ගණනක් තිස්සේ මේ ඉඩම්වල මිනිස්සු පදිංචි වෙලා ඉන්නවා. සමහර අය අවුරුදු 25ක්, 30ක් තිස්සේ, සමහර අය පරම්පරා 3ක විතර කාලයක් තිස්සේ නිදහසින් පසුවත් මේ ඉඩම්වල පදිංචි වෙලා ඉන්නවා. හැබැයි, තවමත් ඒ මිනිසුන්ට එම ඉඩම්වල අයිතිය ලබා දීමේ වැඩ පිළිවෙළක් තිබිලා නැහැ. මම අපේ ආණ්ඩුවෙන් අහන ප්‍රශ්නය මෙයයි. මේ ඉඩම්වල පදිංචි වෙලා ඉන්න පුරවැසියන්ට, ඒ මිනිසුන්ට ඉඩම් අයිතිය ලබා දීම සම්බන්ධව මේ වෙනකොට අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද?

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමනි, ඉඩමක ඔප්පුවක් කියන්නේ ඒ ඉඩම් හිමියාට ලොකු වස්තුවක්. අපේ රට ගත්තාම, ඉඩම් සම්බන්ධයෙන් තිබෙන්නේ වෙනමම වූ ආකල්පයක්. හැබැයි මේ සමාජ වෙනසට සාපේක්ෂව, පැවති ආණ්ඩු මේ ඉඩම් ප්‍රශ්න විසඳලා, ඒ අණ පනත් සංශෝධනය කරලා ජනතාවට උපරිම සහනයක් සලසන්න කටයුතු කරලා නැහැ. පසුගිය ජනාධිපතිවරණය ආසන්නයේ අපේ රටේ පෙර පැවති ආණ්ඩුව "උරුමය" කියලා වැඩ පිළිවෙළක් ගෙනෙන්න දැවැන්ත ප්‍රචාරයක් ගෙන යමින් කටයුතු කළා. හැබැයි, අද ඒක ජනතාව හඳුන්වන්නේ ජනතාවගේ "කරුමය" බවට පත් කළා කියලායි. මොකද, කිසිදු සැලැස්මක් නැතිව විවිධ ව්‍යාපෘති ගෙනැල්ලා අපේ රටේ මුදල් මිලියන ගණන් නාස්ති කර තිබෙනවා. හැබැයි, අපි ආණ්ඩුවක් විධියට මේ ගත වෙච්ච මාස 10 ඇතුළේ විවිධ වැඩසටහන් සූදානම් කරලා තිබෙනවා. ඒ වාගේම, ඔබතුමා අහපු ප්‍රශ්නයට ස්ථිරවම අපි උත්තරයක් දෙනවා. "හිමිකම" නමින් අපි ජනතාවට ඉතාම වටිනා ඔප්පුවක් ලබා දීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. එම නිසා අපට තිබෙන ඉදිරි අවුරුදු 4 ඇතුළේ ඉතාම විධිමත්ව සහ නීත්‍යානුකූල ක්‍රමවේද යටතේ කටයුතු කරමින් ජනතාවගේ ඉඩම් ගැටලු විසඳනවා වාගේම, ඔප්පු ලබා දීමේ වැඩ පිළිවෙළත් අපි ආරම්භ කර තිබෙනවා.

පසුගිය සතියේ ඒකට අදාළ චක්‍රලේඛය ඇතුළත් ගැසට් පත්‍රය නිකුත් කළා. ඒ පිළිබඳවත් ගරු මන්ත්‍රීතුමාව දැනුවත් කරන්න මම කැමතියි. අපි මේ ප්‍රශ්න විසඳනවාය කියන පණිවුඩය තමයි මම ඔබතුමාට ලබා දෙන්නේ.

එඬේරමුල්ල උප දුම්රිය ස්ථානය අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය: විස්තර
என்டேரமுல்ல உப புகையிரத நிலையத்தை பழுதுபார்க்கும் கருத்திட்டம்: விபரம்
PROJECT TO RENOVATE ENDERAMULLA SUBSTATION: DETAILS

1344/2025

8. ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළඹ-රඹුක්කන ප්‍රධාන දුම්රිය මාර්ගයේ, එඬේරමුල්ල උප දුම්රිය ස්ථානයේ, දුම්රිය වේදිකාව හා ගොඩනැඟිලි අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතියක් 2018 වර්ෂයේදී සිදු කර ඇති බව දන්නේද;

(ii) ඒ සඳහා වැය කර ඇති මුළු මුදල කොපමණද;

(iii) එහිදී නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය කර තිබේද;

(iv) ඊට අදාළ කොන්ත්‍රාත්කරු කවුරුන්ද;

(v) ඒ සඳහා තාක්ෂණික සහාය සහ අධීක්ෂණය කරන ලද ආයතන කවරේද;

(vi) මේ වනවිට අනතුරුදායක තත්ත්වයක පවතින තෙවන වේදිකාව සංවර්ධනය කිරීම සහ අබලන් තත්ත්වයේ පවතින ප්‍රධාන ගොඩනැඟිල්ල අලුත්වැඩියා කිරීම ඉහත ව්‍යාපෘතියට ඇතුළත්ව තිබුණේද;

(vii) ඉහත ව්‍යාපෘතියේ අරමුණ සාක්ෂාත් වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு - றம்புக்கன பிரதான புகையிரத வீதியின் என்டேரமுல்ல உப புகையிரத நிலையத்தில், புகையிரத மேடை மற்றும் கட்டிட பழுதுபார்ப்புக் கருத்திட்டம் 2018ஆம் ஆண்டில் மேற்கொள்ளப்பட்டு இருப்பதை அறிவாரா;

(ii) அதற்கெனச் செலவிடப்பட்டுள்ள மொத்தத் தொகை எவ்வளவு என்பதையும்;

(iii) அதற்காகச் சரியான பெறுகை வழிமுறை பின்பற்றப்பட்டுள்ளதா என்பதையும்;

(iv) அந்தப் பணியுடன் சம்பந்தப்பட்ட ஒப்பந்தக்காரர் யார் என்பதையும்;

(v) அதற்கான தொழில்நுட்ப உதவி மற்றும் மேற்பார்வை செய்த நிறுவனங்கள் யாவை என்பதையும்;

(vi) இன்றளவில் ஆபத்தை விளைவிக்கும் நிலையிலுள்ள மூன்றாம் மேடையை அபிவிருத்தி செய்தல் மற்றும் சேதமான நிலையில் காணப்படுகின்ற பிரதான கட்டிட பழுதுபார்ப்புப் பணி மேற்படி கருத்திட்டத்தில் உள்ளடக்கப்பட்டு இருந்ததா என்பதையும்;

(vii) மேற்படி கருத்திட்டத்தின் நோக்கம் நிறைவேறி உள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) whether he is aware that a project to renovate the railway platform and buildings at the Enderamulla Substation on the Colombo-Rambukkana main railway line was carried out in 2018;

(ii) the total amount of money spent on that project;

(iii) whether a proper procurement procedure had been followed there;

[ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා]

(iv) the name of the contractor involved in that project;

(v) the names of the institutions which had provided technical support and supervision for that project;

(vi) whether the development of the third platform, which is currently in a dangerous condition, and the renovation of the dilapidated main building were included in the above-mentioned project; and

(vii) whether the objective of the above-mentioned project had been achieved?

(b) If not, why?

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) රු.28,342,878.39)

(iii) ඔව්.

(iv) රෝයල් කන්ස්ට්‍රක්ෂන් (පුද්ගලික) සමාගම.

(v) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය හා බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය.

(vi) නැත.

(vii) ඔව්, අරමුණ සාක්ෂාත් වී තිබෙනවා. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර දුම්රිය වේදිකා ඉතා පහතින් පැවතීම නිසා මගීන් දැඩි අපහසුතාවට පත් වූ අතර, දුම්රිය වේදිකාවන්හි උස වැඩි කිරීමත් සමඟ ඉතා පහසුවෙන් දුම්රියට නැඟීමට හා බැසීමට මගීන්ට අවස්ථාව ලැබී ඇත.

ඒ අනුව මෙම ව්‍යාපෘතියේ අරමුණ සාක්ෂාත් වී ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)
ගරු කථානායකතුමනි, වර්ෂ ගණනාවක් පැරණි දුම්රිය තමයි දැනට අපේ රටේ තිබෙන්නේ. ඒ නිසා දුම්රිය ගමන් වාර බොහෝ ප්‍රමාණයක් cancel වන තත්ත්වයක් තිබෙනවා. එම නිසා අලුතින් දුම්රිය ලංකාවට ආනයනය කිරීම සඳහා මොකක් හෝ ක්‍රමවේදයක් තිබෙනවාද කියලා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මා දැන ගන්නට කැමැතියි.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
ගරු කථානායකතුමනි, දැනට තිබෙන දුම්රිය කට්ටල ගත්තොත්, බලවේග කට්ටල - power sets - සහ එන්ජින් කට්ටල ඔක්කෝම අවුරුදු 40ක්, 50ක් පමණ පැරණි ඒවා. අපි ඒවා repair කරලා එළියට දැම්මත්, ළඟ ළඟ නැවතත් repairs සඳහා එනවා. එම නිසා දවසකට සිදු වන දුම්රිය ගමන් වාර අවලංගු වීම් ප්‍රමාණය වැඩිවෙලා තිබෙනවා. ඒ අනුව අපි රජයක් විධියට වැඩක් පටන් ගත්තා, අලුත් බලවේග කට්ටල 5ක් ආනයනය කරන්න. එහි ටෙන්ඩර් කටයුතු අපි ආරම්භ කර තිබෙනවා. ඒ අනුව මේ අවුරුද්ද අවසන් වන විට tenders call කරන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා. සාමාන්‍යයෙන් අපි බස් එකක් හෝ වෙනත් වාහනයක් ගේනවා වාගේ දුම්රියක් ගේන්න බැහැ. දුම්රියක් tailor-made වෙන්න ඕනෑ. ඒ කියන්නේ, ලංකාවේ රේල් පීලිවලට සහ උමං පද්ධතියට ගැළපෙන විධියට අපි tailor-made package එකකට අනුවයි දුම්රිය හදන්න ඕනෑ. ඒ නිසා design part එකට ලොකු කාලයක් ගතවෙනවා. එම ඇණවුම ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ලබන අවුරුද්දේ මුල අපි ඒ ඇණවුම ලබා දුන්නත්, දුම්රිය කට්ටල 5 ලංකාවට එන්න දළ වශයෙන් අවුරුදු දෙකක, දෙකහමාරක වගේ කාලයක් ගතවෙනවා.

ඒ වෙනකම් අපි දුම්රිය සේවය පවත්වාගෙන යා යුතුයි. ඒ සඳහා අපි මානව සම්පත වැඩිකරගන්න ඕනෑ; භෞතික සම්පත වැඩිකරගන්න ඕනෑ. භෞතික සම්පත වැඩිකර ගැනීම පැත්තෙන් ගත්තාම 2022, 2023 අවුරුදුවල ඇණවුම් කරන ලද අමතර කොටස් - spare parts - සම්බන්ධව තමයි මේ වනවිට ප්‍රසම්පාදන කටයුතු සිදුවෙන්නේ. ප්‍රසම්පාදනය මීට වඩා ක්‍රමවත්ව සහ පිළිවෙළකට කරන්න, අවශ්‍යම දේවල් ගෙන්වා ගැනීම ඉක්මන් කිරීමේ වැඩ පිළිවෙළක් පටන් අරගෙන තිබෙනවා. තව මාස හයක් ඇතුළත වාගේ මේක අපට යම් කිසි තැනකට ගන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා. අපි විවිධ ක්‍රම උපාය පටන් ගත්තා. දැන් කරගෙන යනවා. නමුත් ප්‍රතිඵල ලැබෙන්නේ ඉතාම සෙමින්. මොකද, මේක ජාලයක් - network එකක් - වාගේ පැතිරුණු එකක්. ඒ නිසා අනෙක් දෙපාර්තමේන්තුවල, ආයතනවල වාගේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ක්ෂණික ප්‍රතිඵල ගන්න අපට අමාරුයි. අපි ඒක පිළිගන්නවා. අපි බලාපොරොත්තු වෙන තරම් ඉක්මනට අපේ targetsවලට යන්න බැරි වෙලා තිබෙනවා.

ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)
ගරු කථානායකතුමනි, කෝටි දෙකහමාරක විතර වියදමක් දරලා එඩේරමුල්ල උප දුම්රිය ස්ථානය නවීකරණය කරලා තිබුණාට එහි ප්‍රධාන දුම්රිය බිල්ඩින් එකේ ගැටලු රාශියක් තවම තිබෙනවා. ඒ එක්කම දැනටත් සනීපාරක්ෂක පහසුකම් කිසිම දෙයක් නැහැ. ඒවාත් ඉක්මනට නිවැරදි කරලා දෙන්න කියලා ගරු අමාත්‍යතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා.

දැනට එඩේරමුල්ල උප දුම්රිය ස්ථානයේ උදේ 7.20ට දුම්රියක් නැවැත්තුවාට පස්සේ නැවත දුම්රියක් නවත්වන්නේ උදේ 8.10ට. මේකට හේතු වශයෙන් අපට දැනගන්න ලැබිලා තිබෙන්නේ, "දුම්රිය රියදුරන්ගේ භීතියක් තිබෙනවා. ඒ නිසා දුම්රිය හුඟක් cancel වෙනවා. ඒ නිසා ඒ වෙලාවට දුම්රියක් ලබා දීමට හැකියාවක් නැහැ" කියන කරුණුයි. ගරු අමාත්‍යතුමාගෙන් අපි දැනගන්න කැමතියි, දුම්රිය රියදුරන්ගේ භීතිය නිසා දුම්රිය ගමන්වාර අවලංගු වීමට යම් විසඳුමක් විධියට දුම්රිය රියදුරන් බඳවා ගැනීමට යම් ක්‍රමවේදයක් මේ වනවිට සකස් කරලා තිබෙනවාද කියලා.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
ගරු කථානායකතුමනි, දුම්රිය දෙපාර්තමේන්තුවේ හැම ක්ෂේත්‍රයකම මානව සම්පතේ අඩුවක් තිබෙනවා. මට මතක විධියට දුම්රිය දෙපාර්තමේන්තුවට සේවකයන් බඳවා ගැනීම සඳහා

අපි ඉස්සෙල්ලාම ජනවාරි මාසයේ 22වන දා වාගේ තමයි කැබිනට් පත්‍රිකාව අනුමත කර ගත්තේ. එහි දුම්රිය රියදුරන් 162ක් බඳවා ගන්න තිබෙනවා. එහි විභාගය ලියලා සමත් වෙලා මේ දවස්වල - ඊයේ, අද සහ හෙට - සම්මුඛ පරීක්ෂණ පවත්වනවා. නොවැම්බර් මාසය අවසාන වෙනකොට වාගේ දුම්රිය රියදුරන් 162ක් බඳවා ගැනීමට හැකියාව ලැබෙයි කියලා අපි හිතනවා. හැබැයි, මානව සම්පත විතරක් වැඩි කළාට හරියන්නේ නැහැ. ඒ මානව සම්පත නිසියාකාරයෙන් කළමනාකරණය කරන්නත් ඕනෑ. ඒත් එක්කම භෞතික සම්පතත් අපට හෙමින් සීරුවේ තමයි ලබා දෙන්න සිදුවෙලා තිබෙන්නේ. මානව සම්පත අපට අවුරුද්දකින් සම්පූර්ණ - fulfil - කර ගන්න පුළුවන් වුණාට, භෞතික සම්පත සම්පූර්ණ කරගන්න ටික කාලයක් ගත වෙනවා. ඒ නිසා තමයි අපට මේ සේවාව බලාපොරොත්තු වෙන ප්‍රමිතියට - standard එකට - නියමිත විධියට දීගන්න තවම අපහසු වෙලා තිබෙන්නේ. හැබැයි, ඔබතුමා අහපු නිශ්චිත ප්‍රශ්නයට පිළිතුර මේකයි. ඔව්, අපි දුම්රිය රියදුරන් 162ක් බඳවා ගැනීමට කටයුතු කරලා තිබෙනවා. අද සහ හෙට සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙනවා; ඊයේ දිනයේදීත් පැවැත්වුණා. නොවැම්බර් මාසය අවසන් වන විට එම පත්වීම් ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

2021 සිට විශ්වවිද්‍යාලවලට ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය විද්‍යාව සඳහා ඇතුළත් කරගත් සිසුන්: විස්තර

2021இலிருந்து ஆயுர்வேதம், சித்த மற்றும் யுனானி மருத்துவத்துக்காக பல்கலைக்கழகங்களுக்கு இணைத்துக்கொள்ளப்பட்ட மாணவர்கள்: விபரம்

STUDENTS ADMITTED TO UNIVERSITIES FOR AYURVEDA, SIDDHA AND UNANI MEDICINE SINCE 2021: DETAILS

1361/2025

9. ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2021 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ රජයේ විශ්වවිද්‍යාලවලට ආයුර්වේද, සිද්ධ හා යුනානි වෛද්‍ය අධ්‍යාපනය හැදෑරීම සඳහා ඇතුළත් කරගනු ලැබූ සිසුන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ආයුර්වේද, සිද්ධ හා යුනානි වෛද්‍ය අධ්‍යාපනය හදාරා, සීමාවාසික පුහුණුව අවසන් කර, මේ වනවිට රැකියා අපේක්ෂාවෙන් සිටින වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) සිද්ධ රෝහල් සහ ආයුර්වේද රෝහල්වල ආයුර්වේද, සිද්ධ හා යුනානි වෛද්‍යවරුන් සඳහා අනුමත කාර්ය මණ්ඩලය, මේ වනවිට සේවය කරනු ලබන කාර්ය මණ්ඩලය සහ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) කාර්යක්ෂම දේශීය වෛද්‍ය සේවාවක් ලබා දීම සඳහා, මේ වනවිට රැකියා විරහිත දේශීය වෛද්‍ය උපාධිධාරින්ට රජයේ ආයුර්වේද රෝහල්වල පත්වීම් ලබා දීමට ඇති බාධාවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2021ஆம் ஆண்டு தொடக்கம் இதுவரை இலங்கையின் அரச பல்கலைக்கழகங்களுக்கு ஆயுர்வேதம், சித்த மற்றும் யுனானி மருத்துவக் கல்வியைக் கற்பதற்காக இணைத்துக்கொள்ளப்பட்ட மாணவர்களின் எண்ணிக்கை ஆண்டு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(i i) ஆயுர்வேதம், சித்த மற்றும் யுனானி மருத்துவக் கல்வியைக் கற்று, உள்ளகப் பயிற்சியையும் நிறைவு செய்து, தற்பொழுது தொழிலை எதிர்பார்த்துள்ள வைத்தியர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) சித்த மற்றும் ஆயுர்வேத மருத்துவமனைகளில் ஆயுர்வேத, சித்த மற்றும் யுனானி மருத்துவர்களுக்கான அனுமதிக்கப்பட்ட பணியாட்டொகுதியினர், தற்பொழுது சேவையாற்றும் பணியாட்டொகுதியினர் மற்றும் தற்பொழுது நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iv) செயற்றிறன் மிக்க சுதேச மருத்துவ சேவையைப் பெற்றுக்கொடுப்பதற்காக தற்பொழுது தொழில்வாய்ப்பற்ற சுதேச மருத்துவப் பட்டதாரிகளுக்கு அரசாங்க ஆயுர்வேத வைத்தியசாலைகளில் நியமனங்களை வழங்குவதிலுள்ள தடைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House the -

(i) number of students admitted to Government universities in Sri Lanka for Ayurveda, Siddha and Unani medical education from 2021 to date, separately for each year;

(ii) number of doctors who have completed their education in Ayurveda, Siddha and Unani medicine, finished their internship and are currently awaiting employment;

(iii) number of approved cadre, actual cadre and the number of existing vacancies of Ayurveda, Sidda and Unani doctors, at present in Sidda and Ayurveda hospitals, separately; and

(iv) obstacles to offer appointments to unemployed graduates of indigenous medicine in Government Ayurveda hospitals to enhance the efficiency of the indigenous medical service?

(b) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

වර්ෂය	කොළඹ විශ්ව විද්‍යාලය		ගම්පහ විශ්ව විද්‍යාලය	යාපනය විශ්ව විද්‍යාලය	නැගෙනහිර විශ්ව විද්‍යාලය	එකතුව
	ආයුර්වේද	යුනානි	ආයුර්වේද	සිද්ධ	සිද්ධ	
2021	198	80	121	122	77	598
2022	196	82	115	135	45	573
2023	180	48	108	90	35	461
2024	168	46	161	87	48	510
2025	209	63	134	103	58	567

(ii)

වර්ෂය	කොළඹ විශ්ව විද්‍යාලය		ගම්පහ විශ්ව විද්‍යාලය	යාපනය විශ්ව විද්‍යාලය	නැගෙනහිර විශ්ව විද්‍යාලය	එකතුව
	ආයුර්වේද	යුනානි	ආයුර්වේද	සිද්ධ	සිද්ධ	
2021	106	50	77	38	20	291
2022	150	37	81	25	31	612
2022	198	70			20	
2023	57	20	15	61	23	176
2024	270	75	63	60	46	514
2025	210	53	92		42	397

දැන් සීමාවාසික පුහුණුව අවසන් කරලා රැකියා අපේක්ෂාවෙන් සිටින වෛද්‍යවරුන් ගත්තොත්, ඔක්කෝම 1,990ක් ඉන්නවා.

(iii) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය සඳහා ආයුර්වේද, සිද්ධ සහ යුනානි උපාධිධාරීන් පොදුවේ ආයුර්වේද වෛද්‍ය නිලධාරි තනතුර සඳහා බඳවා ගෙන ඇත.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් පහත රෝහල් සඳහා පමණක් සිද්ධ සහ යුනානි තනතුරු වෙන වෙනම අනුමත කර ඇත.

	ආයතනය	තනතුර	සිද්ධ/ යුනානි	අනුමත සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
01	බොරැල්ල ආයුර්වේද ජාතික රෝහල	විශේෂඥ වෛද්‍ය	සිද්ධ	01	0	01
			යුනානි	01	01	0
		වෛද්‍ය නිලධාරි	සිද්ධ	05	05	0
			යුනානි	15	16	-1
02	කයිතඩි සිද්ධ ශික්ෂණ රෝහල	විශේෂඥ වෛද්‍ය	සිද්ධ	04	02	02
03	කෝනේෂ්වූර් සිද්ධ ශික්ෂණ රෝහල	විශේෂඥ වෛද්‍ය	සිද්ධ	02	0	02
04	බස්නාහිර පළාත් සභාව	වෛද්‍ය නිලධාරි	සිද්ධ	01	01	0
			යුනානි	01	01	0

ඉහත කාර්ය මණ්ඩලයට අමතරව ආයුර්වේද වෛද්‍ය නිලධාරි කාර්ය මණ්ඩලය තුළ පොදුවේ ආයුර්වේද, සිද්ධ හා යුනානි ලෙස උපාධි හදාරා ඇති වෛද්‍ය නිලධාරීන් රඳවා ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ 2025.06.30 දිනට වෛද්‍ය නිලධාරි කාර්ය මණ්ඩල තොරතුරු පහත පරිදි වේ.

අනුමත සංඛ්‍යාව	දැනට සේවයේ නියුතු සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
2,567	2,065	502

(iv) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය සඳහා දීප ව්‍යාප්තව අනුමත කර ඇති ආයුර්වේද වෛද්‍ය නිලධාරි තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීමට අනුමැතිය ලැබී තිබෙනවා.

ඒ අනුව 2024.06.30 දිනට අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු අතුරින් -මා කලින් සඳහන් කළ 502 අතුරින්- ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි තනතුරු 304ක් බඳවා ගැනීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය මේ වන විටත් ලැබී ඇති අතර, ඒ අනුව බඳවා ගැනීම් කටයුතු සිදු කරමින් පවතී.

ගරු මන්ත්‍රීතුමනි, මේ අනුමැතිය අනුව 2009/2010 අධ්‍යයන වර්ෂය, 2010/2011 අධ්‍යයන වර්ෂය, 2011/2012 අධ්‍යයන වර්ෂය කියන අධ්‍යයන වර්ෂ තුනේ ආයුර්වේද උපාධිධාරීන් 304දෙනෙකුට අපි නොවැම්බර් 03වැනි දා පත්වීම් ලබා දෙනවා. ඒ උපාධිධාරීන් 304දෙනාට පත්වීම් ලබා දුන්නාට පස්සේ ඉතිරි පුරප්පාඩුවලට අපි අනුමැතිය ලබාගෙන බඳවා ගන්න බලාපොරොත්තු වනවා.

(ආ) අදාළ නොවේ.

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ அமைச்சர் அவர்களே, மேலைத்தேய மருத்துவ சேவை வழங்கல் என்றாலும் சரி, சுதேச மருத்துவ சேவை வழங்கல் என்றாலும் சரி, எமது வன்னி மாவட்டத்துக்கான மருத்துவ சேவை வழங்கலைச் சமச்சீராக அணுகுங்கள் என்பதே எமது கோரிக்கை! சுதேச மருத்துவத் துறையில் முல்லைத்தீவு மாவட்டத்துக்குக் காணப்படவேண்டிய 14 சமூகநல மருத்துவர்களில் ஒருவர் மட்டுமே பணியாற்றுகின்றார். அங்கு 13 வெற்றிடங்கள் உள்ளன. மாவட்டம் முழுவதும் ஒரேயொரு சமூகநல மருத்துவரைக் கொண்டு எவ்வாறு வினைத்திறனான சேவை வழங்கலை மேற்கொள்ள முடியும்? இது எத்தகைய சமச்சீரற்ற நிலை!

எனது முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

இதுவரை ஆயுர்வேத, சித்த, யூனானி பட்டக் கற்கைநெறிகளைக் கற்று, உள்ளகப் பயிற்சியை நிறைவுசெய்து, நியமனங்களுக்காக 2,000க்கும் மேற்பட்டோர் காத்திருக்கின்றனர். தற்போது பல்கலைக்கழகங்களில் மேற்படி கற்றைநெறிகளை 3,000க்கும் மேற்பட்டோர் கற்று வருகின்றனர். தங்களுக்கு அரசு வேலைவாய்ப்பைத் தரும் என்று நம்பி இவர்களும் கற்கின்றார்கள். மேற்குறித்த 5,000க்கும் மேற்பட்டவர்களுக்கு நீங்கள் அளிக்கும்

உறுதிமொழி என்ன? படியுங்கள்! ஆனால், அரசிடம் வேலைவாய்ப்புக் கோர வேண்டாம் என்பதா? படித்து நீங்களாக தனியார் மருத்துவ சேவை நிலையங்களை நடாத்துங்கள் என்பதா? அல்லது ஒவ்வோர் ஆண்டும் இத்தனை எண்ணிக்கையிலான அரச நியமனங்கள்தான் வழங்கப்படும் என்பதா? இது தொடர்பான தெளிவானதோர் அறிவித்தலை அரசு இதுவரை அவர்களுக்கு வழங்கவில்லை என்றே எண்ணுகின்றேன். ஆகையால், உங்களிடமிருந்து இதற்கான பதிலை எதிர்பார்க்கின்றேன்.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, පවතින පුරප්පාඩු සංඛ්‍යාව ගණනය කරලා ඒ අනුව තමයි බඳවා ගැනීම් සිදු කරන්න වෙන්නේ. දැන් අපේ රෝහල් පද්ධතිය තුළ පවතින පුරප්පාඩු ප්‍රමාණයටම නොවෙයි, උපාධිධාරීන් එළියට එන්නේ. ගරු මන්ත්‍රීතුමනි, මම කියපු ආකාරයට පසුගිය කාලයේ පත්වීම් ලබා නොදීම නිසා 1,900ක් රැකියා විරහිතව ඉන්නවා. ඉන් අපි මුල් වටයේදී 304දෙනෙක් තෝරාගෙන පත්වීම් ලබා දෙනවා. එතැනදී ආයුර්වේද, සිද්ධ හා යුනානි කියන උපාධිධාරීන්ට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සකස් කරන ලද පොදු ලේඛනයකට අනුව තමයි පත්වීම් ලබා දෙන්නේ. මම ඔබතුමාට කලිනුත් කිව්වා, නොවැම්බර් 03වැනි දා මේ පත්වීම ලබා දුන්නාට පස්සේ අපි ඊළඟට ඉතිරි පුරප්පාඩු සඳහා අනුමැතිය ලබාගන්න ඉදිරිපත් කරන බව. අනුමැතිය ලැබෙන ප්‍රමාණය අනුව විටින් විට එම බඳවා ගැනීම් කරන්න තමයි අපි කටයුතු කරන්නේ. ඒ අනුව ඔබතුමාගේ ඉල්ලීම අනුව ආයුර්වේද, සිද්ධ හා යුනානි වෛද්‍යවරුන් විතරක් නොවෙයි, ඔබතුමා සඳහන් කළ ඉතිරි කාර්ය මණ්ඩලයත් හැකි ඉක්මනින් ලබා දෙන්න කටයුතු කරනවා. නමුත් මේවා අයදුම්පත් කැඳවලා, බඳවාගෙන, එසැනින් සේවයට යවන්න පුළුවන් රැකියා නොවෙයි. මේ අයට නිසි පුහුණුවක් අවශ්‍යයි. අපි දැන් මේ අය පුහුණු කරමින් ඉන්නවා. පුහුණු කාලය අවසන් වෙච්ච ගමන්ම විෂමතාවකින් තොරව මෙම පත්වීම් ලබා දෙන්න කටයුතු කරනවා.

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ அமைச்சர் அவர்களே, நன்றி! எனது இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

இலங்கை தழுவிய வகையில் முல்லைத்தீவு மாவட்டத்தில் அமைந்துள்ள மாவட்ட சித்த மருத்துவமனையானது, மருத்துவ சுற்றுலா வாய்ப்புகளுக்கும் கட்டண அலகுடனான மருத்துவ சேவை வழங்கலுக்கும் மூலிகைத் தோட்ட நடைமுறைப்படுத்தலுக்கும் மிகவும் பொருத்தமான இடமாகும். 2026ஆம் ஆண்டுக்கான நிதி ஒதுக்கீட்டில் சித்த மருத்துவம் சார்ந்து பொருத்தமான உட்கட்டமைப்பு விரிவாக்கங்களைத் தங்களுடைய அமைச்சு மேற்கொள்ளுமேயானால், வட மாகாணத்தில் சிறந்த சித்த மருத்துவச் சேவை வழங்கும் நிலையமாக மேற்படி மாவட்ட சித்த மருத்துவமனையை மாற்றலாம். மூலிகைத் தோட்ட வசதிப்படுத்தலுக்கும் சுற்றுச் சூழலுடனான சித்த மருத்துவச் சேவை வழங்கலுக்கும் சுகாதார சேவை வழங்கல் ஊடான சுற்றுலா வாய்ப்புகளுக்கும் ஏற்றதோர் ஆதார வைத்தியசாலையாக உருப்பெறும் வாய்ப்பு மேற்படி மருத்துவமனைக்கு உள்ளது. ஆண்கள், பெண்களுக்கான விசேட சிகிச்சை அலகு, மருந்தகம், மூலிகைத் தோட்டம், பாரம்பரிய உணவகம், கட்டண அலகுடனான சித்த மருத்துவச் சேவை வழங்கல், ஆய்வகம் உள்ளிட்ட வசதிகளுக்கான போதுமான இடவசதியையும் மேற்படி மருத்துவமனைச் சூழல் கொண்டுள்ளது. எனவே, முல்லைத்தீவு மாவட்ட சித்த மருத்துவமனையின் ஆளணி வள நிரப்பலுக்கு மேலாக உட்கட்டுமான விருத்தியிலும் கூடுதல் கரிசனைகொள்ளுமாறு தங்களைக் கேட்டுக் கொள்கின்றேன்.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ අදහස් සහ යෝජනාවට ස්තුතියි. විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරයත් එක්ක සිද්ධ, යුනානි ඇතුළු ආයුර්වේද වෛද්‍ය ක්‍රම සහ එම රෝහල් දියුණු කිරීමට ඔබතුමා ඉදිරිපත් කළ යෝජනාවත් අපි සැලකිල්ලට ගන්නවා. ඇත්තෙන්ම අපේ වැඩ පිළිවෙළ තිබෙන්නේත් ඒකට තමයි. අපි එම ප්‍රදේශවල ඉන්න මන්ත්‍රීවරු එක්කත් කථාබහ කරලා එම රෝහල් පද්ධතිය දියුණු කරන්නට කටයුතු කරන්නම්.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ: රක්ෂණ ආවරණය

இலங்கை போக்குவரத்துச் சபையின் பேருந்துகள்: காப்புறுதித் திட்டம்

BUSES OF SRI LANKA TRANSPORT BOARD: INSURANCE COVERAGE

1427/2025

10. ගරු තිළිණ සමරකෝන් මහතා
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මගී ප්‍රවාහන බස් රථ සඳහා ලබා ගන්නා රක්ෂණ ආවරණය කවරේද;

(ii) මගී ප්‍රවාහන බස් රථ සඳහා තෙවන පාර්ශ්ව රක්ෂණ ආවරණය ප්‍රමාණවත් වන්නේද;

(iii) ඉදිරියේදී එම රක්ෂණ ආවරණය වෙනුවට වෙනත් රක්ෂණ ආවරණයක් ලබා ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝවල මේ වනවිට සේවය කරනු ලබන කාර්මික නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණවත් වන්නේද;

(ii) එම ඩිපෝවල කාර්මික අංශ සඳහා පුහුණුවලත් කාර්මිකයන් සිටින්නේද;

(iii) නිසි පුහුණුවකින් පසු එම ඩිපෝ සඳහා කාර්මිකයින් බඳවා ගැනීමට විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iv) කාර්මික අධ්‍යාපනය ලබා දෙන ආයතන මඟින් ප්‍රායෝගික පුහුණුව සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ වෙත යොමු කරනු ලබන අභ්‍යාසලාභීන්, පුහුණු කාලයෙන් පසු ස්ථිර පදනම මත බඳවා ගැනීමට වැඩ පිළිවෙළක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை போக்குவரத்துச் சபைக்குச் சொந்தமான பயணிகள் போக்குவரத்து பேருந்துகளுக்காக பெறப்படும் காப்புறுதித் திட்டம் யாது என்பதையும்;

(ii) பயணிகள் போக்குவரத்து பேருந்துகளுக்கு மூன்றாம் தரப்புக் காப்புறுதித் திட்டம் போதுமானதா என்பதையும்;

[ගරු තිළිණ සමරකෝන් මහතා]

(iii) எதிர்காலத்தில் மேற்படி காப்புறுதித் திட்டத்துக்குப் பதிலாக பிறிதொரு காப்புறுதித் திட்டமொன்று பெறப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கை போக்குவரத்துச் சபைக்குச் சொந்தமான டிப்போக்களில் இன்றளவில் போதுமானளவு தொழில்நுட்ப அலுவலர்கள் சேவையாற்றுகின்றார்களா என்பதையும்;

(ii) மேற்படி டிப்போக்களின் தொழில்நுட்பப் பிரிவுகளுக்கு பயிற்சி பெற்ற தொழில்நுட்ப அலுவலர்கள் உள்ளனரா என்பதையும்;

(iii) உரிய பயிற்சியைத் தொடர்ந்து மேற்படி டிப்போக்களுக்கு தொழில்நுட்ப அலுவலர்களை ஆட்சேர்ப்புச் செய்வதற்கு முறையானதொரு வேலைத்திட்டம் காணப்படுகின்றதா என்பதையும்;

(iv) தொழில்நுட்பக் கல்வியை வழங்கும் நிறுவனங்களின்மூலம் செயல்முறை பயிற்சிகளுக்காக இலங்கை போக்குவரத்துச் சபையின் டிப்போக்களுக்கு ஆற்றுப்படுத்தப்படுகின்ற பயிலுநர்களை, பயிற்சிக் காலத்தின் பின்னர் நிரந்தர அடிப்படையில் ஆட்சேர்ப்புச் செய்வதற்கான வேலைத்திட்டமேதும் உள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development :

(a) Will he inform this House -

(i) the insurance coverage obtained for passenger transport buses of the Sri Lanka Transport Board;

(ii) whether the third party insurance coverage is sufficient for passenger transport buses; and

(iii) whether another insurance coverage will be obtained in the future in place of said insurance coverage?

(b) Will he also inform this House -

(i) whether the number of technical officers currently serving in the Sri Lanka Transport Board depots is sufficient;

(ii) whether there are trained technicians in the technical sections of the said depots;

(iii) whether a proper procedure will be implemented to recruit technicians for said depots after proper training; and

(iv) whether there is a procedure to recruit trainees who are attached to the Sri Lanka Transport Board depots for practical training by institutions providing technical education on a permanent basis after the training period?

(c) If not, why?

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මෑත කාලයේ මිලදී ගත් ආසන 32 බස් රථ හා අධිවේගී මාර්ගයේ ධාවනය වන සුඛෝපභෝගී බස් රථ සඳහා පූර්ණ රක්ෂණාවරණය ලබා දී ඇති අතර, අනෙකුත් බස් රථ සඳහා තෙවන පාර්ශ්ව රක්ෂණ ආවරණ ලබා දී ඇත.

(ii) තෙවන පාර්ශ්ව රක්ෂණ ආවරණ යටතේ බස් රථ සේවක කණ්ඩායම් වෙත කම්කරු වන්දි රක්ෂණ ආවරණය ලැබෙන අතර, මගීන් සඳහා සීමා රහිත රක්ෂණාවරණයක් ලැබේ. මේ යටතේ තෙවන පාර්ශ්වය සඳහා රුපියල් මිලියන දෙකක ආවරණයක් ලබා දෙනු ඇත. එබැවින් තෙවන පාර්ශ්ව රක්ෂණ ආවරණය ප්‍රමාණවත් වේ.

(iii) වෙනත් රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට අවශ්‍ය නොවේ.

(ආ) (i) ප්‍රමාණවත් නැත.

(ii) ඩිපෝවල සේවයේ නියුතු කාර්මික සේවක මහතුන් අතර, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ - Ceylon German Technical Training Instituteහි - හා ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ - NAITA, National Apprentice and Industrial Training Authorityහි - පූර්ණ කාලීන පාඨමාලා හදාරා සුදුසුකම් ලත් කාර්මික සේවක මහතුන් ද වේ.

(iii) බඳවා ගැනීමේ පටිපාටියට අනුව ජාතික වෘත්තීය කුසලතා NVQ - 04 මට්ටම මත බඳවා ගැනීම් සිදු කෙරේ.

(iv) එවැනි වැඩ පිළිවෙළක් නොමැත.

(ඇ) අදාළ නොවේ.

ගරු තිළිණ සමරකෝන් මහතා
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
ගරු කථානායකතුමනි, මම අතුරු ප්‍රශ්න දෙකම අහනවා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අමාත්‍යතුමනි, ටයර් සහ ටියුබ් මිලදී ගැනීම දීර්ඝ කාලයක සිට උතුරු මැද පළාතේ පවත්වාගෙන යන පෞද්ගලික සමාගමක් හරහා සිදු වන බවට තොරතුරු ලැබිලා තිබෙනවා.

ඒවායේ නිසි ප්‍රමිතියක් නැහැ කියලා සේවකයන්ගේ අදහසක් තිබෙනවා. විදේශීය නිෂ්පාදන තමයි මේ සමාගම හරහා සපයන්නේ. ප්‍රමිතියක් සහිත දේශීය නිෂ්පාදන සමාගමකට විශේෂයෙන් ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ සඳහා ටයර් සහ ටියුබ් සැපයීමට අවස්ථාවක් ලබා දීමට හැකියාවක් තිබෙනවාද කියලා මම අපේ ගරු ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
ගරු කථානායකතුමනි, අපට හැම ක්‍රියාවලියක්ම සිදු කරන්න වෙන්නේ නියමිත ප්‍රසම්පාදන ක්‍රමවේදයත් එක්කයි. මොකද, දේශීය වුණත්, විදේශීය වුණත් අපට එකක් තෝරලා දෙන්න බැහැ. අන්තර්ජාතික ප්‍රසම්පාදනවලට ගියත්, ලංකාව තුළ ප්‍රසම්පාදන කටයුතු කළත් මූල්‍ය විනය, මූල්‍ය කළමනාකරණය යටතේ අපට තනි ආයතනයක් තෝරලා දෙන්න බැහැ. නමුත්

අපට හැකියාව තිබෙනවා, නියමිත ප්‍රසම්පාදන රාමුව ඇතුළත ප්‍රසම්පාදන කැඳවලා අවශ්‍ය ටෙන්ඩරය පිරිනමන්න. මේ දීලා තිබෙන ටෙන්ඩරය අවසන් වූ පසු ඉදිරියේදී අපි අනිවාර්යයෙන්ම නියමිත ප්‍රසම්පාදන කටයුතුවලට තමයි යන්නේ.

උදාහරණයක් කිව්වොත්, ලංගම විසින් සිදු කරන ගෙවීම් cardsවලින් ගෙවන්න වැඩ පිළිවෙළක් පටන් ගන්න හදනවා. නමුත් ඒ ප්‍රසම්පාදන කටයුතු කරගෙන යනකොට ලංගමයේ සියලු accounts තිබෙන්නේ මහජන බැංකුවේ. නමුත්, ලංගමත් රජයේ ආයතනයක්, මහජන බැංකුවත් රජයේ කියලා ඒ card payment වැඩේ කරගෙන යන්න මහජන බැංකුවට විතරක් දෙන්න බැහැ. ප්‍රසම්පාදන කැඳවලා, ප්‍රසම්පාදන පටිපාටිය අනුව ලංගමට වැඩිම වාසිය එන විධියට තමයි අපට ඒක පිරිනමන්න වෙන්නේ. ඒ රාමුව ඇතුළත, පවතින ප්‍රසම්පාදනයේ කාලය පූර්ණ වූ පසු, නියමිත ප්‍රසම්පාදන කටයුතු අනුගමනය කරලා පිරිනමන්න පුළුවන්.

ගරු තිළිණ සමරකෝන් මහතා
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)

ගරු ඇමතිතුමනි, ප්‍රමිතිය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා කියලා සේවකයන්ගේ අදහසක් තිබෙනවා. ඒකයි මම ඒ ප්‍රශ්නය විශේෂයෙන්ම යොමු කළේ.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන් ඩිපෝ පරීක්ෂණවලදී අපට පෙනී ගිය දෙයක් තමයි, අමතර කොටස් මිලදී ගැනීම අවිධිමත් ආකාරයකින් සිදු වන බව. ඊට අමතරව විශේෂයෙන් bin card ක්‍රමය කියන ලෝකයේ තොග පාලනය සඳහා පවත්වාගෙන යන පැරණිම ක්‍රමය තමයි ඒ අය පවත්වාගෙන යන්නේ. විශේෂයෙන් අමතර කොටස් ආනයනය, මිලදී ගැනීම සහ සැපයීමට අදාළ කටයුතු ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය හරහාම සිදු කරන්න ක්‍රමවේදයක් නැද්ද කියන එක වාගේම එම අමතර කොටස් මිලදී ගැනීමේදී එන්ජින් කට්ටල මිලදී ගෙන පැරණි බස් බොඩි සඳහා ඒවා සවි කරලා නව බස් ප්‍රමාණයක් ප්‍රවාහනය සඳහා එක් කරන්න හැකියාවක් තිබෙනවාද කියලා ඔබතුමාගෙන් මම දැනගන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු කථානායකතුමනි, අමතර කොටස් වර්ග විශාල ප්‍රමාණයක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ එන්ජින් කට්ටලත් වර්ග කිහිපයක් තිබෙනවා. නමුත් ඒ එන්ජින් කට්ටල මිලදී ගැනීමේදී අපි ගොඩක් අන්තර්ජාතික ප්‍රසම්පාදන කටයුතුවලට තමයි යොමු වෙලා තිබෙන්නේ. නමුත් ඒ කටයුතුත් දිගටම සිදු කරමින් පවතිනවා. අමතර කොටස් සැපයීම දැන් කරන්නේ කලින් කොන්ත්‍රාත් පිරිනමපු සමාගම්. ඒ අයගේ කාල සීමාව අවසන් වෙලා නැහැ. ඒ කොන්ත්‍රාත් කාලය අවසන් වීමෙන් පසු නැවත කොන්ත්‍රාත් කැඳවනකොට අපි ඒවා evaluate කරලා, ඒ ලකුණු දෙන පටිපාටි අනුව ටෙන්ඩර් පටිපාටියෙන් පසුව අපි bid evaluation stage එකට යනවා. ඒකෙදි අපි බලාපොරොත්තු වන නියමිත ප්‍රමිතිය, මිල ගණන්, සැපයුම ක්‍රමවත්ව, අඛණ්ඩව පවත්වාගෙන යෑම කියන කරුණු සලකා බලා තමයි කොන්ත්‍රාත් පිරිනමන්නේ. ඉදිරියේදී දින වකවානු අවසන් වන කොන්ත්‍රාත් අලුතෙන් කැඳවනකොට ඒ කටයුතු ටික අනිවාර්යයෙන් සිද්ධ වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ඉඩම්: ත්‍රිකුණාමලය ප්‍රා.ලේ. කොට්ඨාසය
இலங்கை துறைமுக அதிகாரசபைக்குரிய காணிகள்: திருகோணமலை பிரதேச செயலாளர் பிரிவு
LANDS BELONGING TO SRI LANKA PORTS AUTHORITY: TRINCOMALEE DS DIVISION

1115/2025

2. ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය-

(1):

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්, ශ්‍රී ලංකා වරාය අධිකාරියට පවරා දී ඇති දිනය කවරේද;

(iii) ඊට අදාළ නීතිමය ප්‍රතිපාදනය කවරේද;

(iv) එම ඉඩම් භාවිත කළ හැකි අරමුණු කවරේද;

(v) පසුගිය කාලයේදී එම අරමුණුවලින් පරිබාහිර වෙනත් අරමුණු සඳහා ඉහත ඉඩම් බැහැර කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) திருகோணமலை பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள இலங்கை துறைமுக அதிகாரசபைக்குச் சொந்தமான காணிகளின் அளவு யாது;

(ii) மேற்படி காணிகள், இலங்கை துறைமுக அதிகாரசபைக்குச் சாட்டுதல் செய்யப்பட்ட திகதி யாது;

(iii) அது சம்பந்தமான சட்டரீதியான ஏற்பாடுகள் யாவை;

(iv) மேற்படி காணிகளை பயன்படுத்தக்கூடிய நோக்கங்கள் யாவை;

(v) கடந்த காலத்தில் மேற்படி நோக்கங்களுக்குப் புறம்பான வேறேதேனும் நோக்கங்களுக்காக அக்காணிகள் கையுதிர்க்கப்பட்டனவா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Civil Aviation :

(a) Will he inform this House -

(i) the extent of lands belonging to the Sri Lanka Ports Authority located in the Trincomalee Divisional Secretary's Division;

(ii) the date on which the lands concerned were transferred to the Sri Lanka Ports Authority;

(iii) the legal provisions applicable for that;

[ගරු රොෂාන් අක්මීමන මහතා]

(iv) the purposes for which the lands can be used; and

(v) whether the lands mentioned above have been disposed of recently for purposes other than those referred to above?

(b) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) a) 1979 වසරේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවා ඇත්තේ 1970 ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරි පනත මඟිනි. ඒ අනුව එකී පනතේ විධිවිධාන ප්‍රකාරව නීතිය ක්‍රියාත්මක වීම මඟින් වරාය අධිකාරිය වෙත හිමිව ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාර 12ක් පමණ වේ.

b) එකී වරායවල් පිළිබඳ අධිකාරි පනතේ ප්‍රතිපාදනයන් මත පළ කරන ලද අංක 314/10 දරන ගැසට් පත්‍රය මඟින් වරාය අධිකාරිය වෙත අත්පත් කරගෙන සතු වී ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාර 2063.0875කි.

(ii) a) 1979 අගෝස්තු 01.

b) 314/10 ගැසට් පත්‍රයේ දිනය - 1984.09.12

(iii) a) නීතිය ක්‍රියාත්මක වීම මඟින්.

b) වරායවල් පිළිබඳ අධිකාරි පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව පළ කරන ලද ගැසට් පත්‍රය මඟින්.

(iv) වරායවල් පිළිබඳ අධිකාරි පනතේ 6වන වගන්තිය මඟින් දක්වා තිබෙන අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා.

(v) මෙම ඉඩම් රජයේ ඉඩම් යැයි සලකා වරායේ අරමුණු නොවන වෙනත් රාජ්‍ය ආයතනවල කාර්යයන් සඳහා බැහැර කිරීමට කැබිනට් අනුමැතින් රාශියක් ලබාගෙන ඇතත් -වරාය අධිකාරියේ එකඟතාවකින් තොරව- එසේ බැහැර කිරීමක් සිදු කර නොමැත.

(ආ) පැන නොනඟී.

හොරවිපතාන අලි රැඳවුම් මධ්‍යස්ථානය: විස්තර
ஹொரவபொத்தானை யானைகள் தடுப்பு மத்திய நிலையம்: விபரம்
HOROWPOTHANA ELEPHANT HOLDING GROUND: DETAILS

1220/2025

4. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු සුරංග රත්නායක මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சுரங்க ரத்நாயக்க சார்பாக)
(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. Suranga Rathnayaka)

පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) හොරවිපතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයේ මේ වනවිට රඳවා සිටින වනඅලි සංඛ්‍යාව කොපමණද;

(ii) එයට අයත් භූමි ප්‍රමාණය අක්කර කොපමණද;

(iii) එම භූමිය තුළ තිබූ වගා ඉඩම් ප්‍රමාණය අක්කර කොපමණද;

(iv) එම ඉඩම් වෙනුවට අයිතිකරුවන්ට විකල්ප වගා ඉඩම් ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත මධ්‍යස්ථානය අලි මංකඩක පිහිටුවීම හේතුවෙන් ඒ හරහා ගමන් කරනු ලබන වනඅලි සඳහා විකල්ප මාර්ග නොමැති වීමෙන් වෙනත් වගා බිම් හරහා ගමන් කිරීම හේතුවෙන් වගා හානි සිදු වන බව දන්නේද;

(ii) ඒ සඳහා ලබා දෙන විසඳුම් කවරේද;

(iii) වනඅලි සිදු කරනු ලබන වගා හානි සඳහා වන්දි ලබා දීමට ගත වන කාලය කොපමණද;

(iv) තම ඉඩම් සඳහා ඔප්පු හෝ අවසර පත්‍ර නොමැති ගොවීන්ට වගා හානි වෙනුවෙන් වන්දි නොගෙවන්නේද;

(v) එසේ නම්, ඔවුන්ට සාධාරණයක් ඉටු කරන ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஹொரவபொத்தானை யானைகள் தடுப்பு மத்திய நிலையத்தில் இன்றளவில் தடுத்து வைக்கப்பட்டிருக்கும் காட்டு யானைகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி நிலையத்துக்குச் சொந்தமான நிலப்பரப்பு எத்தனை ஏக்கர் என்பதையும்;

(iii) அந்த வளாகத்தில் இருந்த பயிர்ச்செய்கை நிலங்களின் அளவு எத்தனை ஏக்கர் என்பதையும்;

(iv) அந்தக் காணிகளுக்குப் பதிலாக உரிமையாளர்களுக்கு மாற்று பயிர்ச்செய்கை நிலங்கள் வழங்கப்பட்டுள்ளனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி மத்திய நிலையம் யானைகளின் வழித்தடமொன்றில் அமைத்துள்ளதால், அதனூடாக பயணிக்கும் காட்டு யானைகளுக்கு மாற்று வழிகள் இன்றி, அவை வேறு பயிர்ச்செய்கை நிலங்களூடாகச் செல்வதனால் பயிர்ச் சேதங்கள் ஏற்படுவதை அறிவாரா என்பதையும்;

(ii) அதற்காக வழங்கப்படும் தீர்வுகள் யாவை என்பதையும்;

(iii) காட்டு யானைகளால் ஏற்படும் பயிர்ச் சேதங்களுக்காக இழப்பீடு வழங்க எடுக்கும் காலம் எவ்வளவு என்பதையும்;

(iv) தமது காணிகளுக்கான உறுதிகள் அல்லது அனுமதிப்பத்திரம் இல்லாத விவசாயிகளுக்கு பயிர்ச் சேதங்களுக்கான இழப்பீடு செலுத்தப்படாதா என்பதையும்;

(v) ஆமெனில், அவர்களுக்கு நீதி நிலைநாட்டப்படும் விதம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) the number of wild elephants currently kept at the Horowpothana Elephant Holding Ground;

(ii) the extent of land belonging to it in acres;

(iii) the extent of agricultural lands that were located there in acres; and

(iv) whether alternative agricultural lands have been provided to the owners in place of the lands they had owned?

(b) Will he also inform this House -

(i) whether he is aware that since the above facility has been established across an elephant pass, wild elephants have been compelled to cross other lands due to the unavailability of alternative routes, resulting in damage to crops;

(ii) the solutions that will be provided to this issue;

(iii) the time that will take to pay compensation for crop damages caused by wild elephants;

(iv) whether farmers without deeds or permits for their lands will not be paid compensation for damages to their crops; and

(v) if so, the method through which justice is to be accorded to such farmers?

(c) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මේ වනවිට හොරොව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානය වෙත පීඩාකාරී වනඅලි 73දෙනෙකු නිදහස් කර ඇත. මෙම හොරොව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානය තුළදී මිය ගොස් විධිමත් පරිදි පශ්චාත් මරණ පරීක්ෂණ සිදු කර ඇති වනඅලි සංඛ්‍යාව 21කි. මෙම අලි රැඳවුම් මධ්‍යස්ථානය හෙක්ටෙයාර 997ක භූමි ප්‍රමාණයක පවතින අතර, මෙම ප්‍රදේශය තුළ නිදහස් කර ඇති දැනට ජීවත් වන වනඅලින්ගේ සංඛ්‍යාව සමීක්ෂණය කර නොමැත. පීඩාකාරී වනඅලි සැරිසරන මෙම ප්‍රදේශය තුළ සාමාන්‍ය පරිදි වනජීවී නිලධාරින් ඇතුළු වී සමීක්ෂණය කිරීම නිලධාරින්ගේ ජීවිත අවදානමකට ලක් විය හැකි බැවින් එම සමීක්ෂණ කටයුතු සිදු කර නොමැති බව සඳහන් කරමි.

(ii) හෙක්ටෙයාර 997කි. (අක්කර 2463.64)

(iii) වගා ඉඩම් නොමැත. රජයේ ඉඩම් පමණක් හොරොව්පතාන ජාතික උද්‍යානය ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

(iv) ඔව්. රජයේ ඉඩම් පමණක් හොරොව්පතාන ජාතික උද්‍යානය ලෙස ප්‍රකාශයට පත් කර ඇති බැවින් විකල්පයක් වශයෙන් ඉඩම් ලබා දී නොමැත.

(ආ) (i) හොරොව්පතාන ජාතික උද්‍යානය හෙක්ටෙයාර 2,570ක පමණ භූමි ප්‍රමාණයක පවතී. එම ප්‍රමාණයෙන් හෙක්ටෙයාර 997ක ප්‍රමාණයක හොරොව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානය පිහිටා ඇති අතර, ඉතුරු හෙක්ටෙයාර 1,573ක ප්‍රමාණය තුළ වනඅලි සංචරණයට බාධාවක් නොමැත. මෙම ජාතික උද්‍යානය අවට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පාලනය වන භූමි ප්‍රමාණයක්ද පවතින අතර එම භූමියද වනඅලින්ගේ සංචරණය සඳහා භාවිත කිරීමේ හැකියාවක් ඇත. කෙසේ නමුත් දිස්ත්‍රික්කය පුරා පවතින පොදු ගැටලුවක් ලෙස වනඅලි වගාවන්ට හානි සිදු කිරීම් එම ප්‍රදේශයේද සිදු වන බව නිරීක්ෂණය වේ.

(ii) ප්‍රදේශයේ පවතින ඉඩම් පරිහරණ රටාව හඳුනාගෙන විසඳුමක් වශයෙන් විදුලි වැට ඉදි කිරීමට යෝජිත විදුලි වැට මාර්ග හඳුනා ගැනීම සඳහා මේ වනවිට කටයුතු කරමින් පවතී.

(iii) වනඅලි විසින් සිදු කරන වගා හානි සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වන්දි නොගෙවන අතර කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් වන්දි ගෙවීම් සිදු කරයි. ඒ සඳහා අදාළ ගොවි මහතුන් තමන්ගේ වගා රක්ෂණය කර ගත යුතු වේ.

(iv) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් වගා 06ක් (වී, බඩ ඉරිඟු, අර්තාපල්, ලොකු ලූනු, සෝයා සහ මිරිස්) සඳහා වන්දි ගෙවන බැවින් වන්දි ගෙවීමට අදාළ කොන්දේසි අනුව වගා හානි සඳහා වන්දි ගෙවීම් සිදු කර ඇත.

(v) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් පනවා ඇති විධිවිධාන අනුව කටයුතු කරයි.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

LANKA GOVERNMENT CLOUDහි මෑත කාලීන බිඳවැටීමේ බලපෑම
LANKA GOVERNMENT CLOUDஇன் சமீபத்திய சீர்குலைவின் விளைவு
EFFECT OF RECENT COLLAPSE OF LANKA GOVERNMENT CLOUD

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, I seek permission to ask this Question relating to a matter of urgent national importance from the Minister of Technology under Standing Order No. 27 (2).

In recent months, Sri Lanka's digital backbone - the very infrastructure that sustains governance, commerce and citizen services - has come under severe strain. The sudden collapse of the Lanka Government Cloud - LGC - on 14th October, 2025, which crippled eight major State institutions including the Registrar of Companies, the Department of Commerce and the Police Clearance System, has exposed the alarming fragility of the nation's digital framework. That was not an isolated incident, but

[ගරු රවී කරුණානායක මහතා]

the culmination of systemic neglect, technical decay and institutional complacency. While the Sri Lanka Computer Emergency Readiness Team- SLCERT - has described the disruption as an "internal technical issue", the absence of transparency and accountability has only deepened public anxiety and suspicion.

Over the past six to ten months, Sri Lanka has faced an unprecedented wave of cyber intrusions, targeting banks, State agencies and financial intermediaries. People of repute like the Chairman of BoI, Mr. Arjuna Herath, was also intercepted. These repeated attacks have shaken public confidence in the country's ability to protect sensitive personal and financial data. Yet, instead of fortifying defences, there has been an alarming silence from the authorities with no comprehensive cyber audit, national digital risk assessment or unified command structure for crisis response. The latest incident has revealed not just a technological failure, but a failure of governance and foresight.

The Information and Communication Technology Agency - ICTA - and the Sri Lanka Computer Emergency Readiness Team - SLCERT- the two core institutions entrusted with safeguarding and maintaining the nation's digital ecosystem, now appear to be operating without synchronization or shared security protocol. Citizens, deprived of essential digital services such as obtaining birth, marriage and death certificates or e-revenue licences, have been forced to revert to manual processes, a humiliating regression for a country which once aspired to be a digital hub of South Asia. The contradiction between ICTA's silence and SLCERT's assertions has further eroded public trust, suggesting institutional disarray at the highest levels of digital administration.

More than temporary inconvenience, what is at stake is the sovereignty of the nation's data. The Cloud infrastructure that hosts sensitive records of millions of citizens and thousands of State institutions is now under question. A breach or compromise of this scale could have devastating implications for national security, financial integrity and international confidence in Sri Lanka's digital ecosystem. In an era where cyber warfare and digital espionage have become the new battlegrounds of statecraft, this episode must serve as a national wake-up call.

Sri Lanka cannot afford to treat this as a transient technical glitch. It must recognize that its digital government infrastructure is now a strategic national asset requiring the same vigilance, investment and oversight as its physical borders or defence installations do. Parliament, therefore, has an urgent duty to demand full accountability, ensure a comprehensive forensic audit of the Lanka Government Cloud and to establish a National Cyber Security Command Authority with powers to secure, monitor and defend all critical digital assets of the State.

Sir, I can understand the situation because this is something new that has happened. But, I thought it was necessary - the Hon. Deputy Minister is technologically very competent - to gain insight into it, to extract the correct situation because we are going on a journey to achieve one hundred per cent digitalization.

Sir, Accordingly, I wish to ask the Hon. Minister of Technology the following questions:

1. Can the Hon. Minister inform this House what specific technical or administrative failure led to the collapse of the Lanka Government Cloud - LGC - on 14th October 2025 and whether any preliminary investigation or forensic audit has identified accountability within the ICTA or its service providers?
2. Will the Hon. Minister confirm whether the incident was purely an internal systems failure, as stated by the Sri Lanka Computer Emergency Readiness Team - SLCERT, or whether there is any evidence of external cyber intrusion or data compromise?
3. How many similar system breakdowns, service disruptions or cyber incidents have occurred in the key government digital platforms over the past 12 months and what lessons have been learnt or corrective measures have been instituted thereafter?

Sir, the reason I am asking this is because at the Committee on Public Finance, when we asked the Central Bank officials, "Are you ready for cryptocurrency, digital currency?", no less a person than the Governor of the Central Bank said, "No, that is not a problem for us. We have not looked at it. It is neither legal nor against the law." So, when we ask these types of things in advance and get answers, which would seem absolutely stupid, they would become relevant one day. So, that is the same reason why I am asking about these futuristic problems but which are being encountered today, through you, Sir, from the Minister. So, ensure that we get a proper answer, assuring that these types of things would not happen as a disaster in the future.

4. What was the total financial and economic loss to the nation as a result of this digital infrastructure collapse, including disruptions to e-Revenue Licences, police clearance certificates and other Government revenue streams?
5. What is the Government's fallback or disaster-recovery mechanism in the event of such system-wide digital failure? Does Sri Lanka maintain a secure, real-time backup facility either onshore or offshore to safeguard citizen and institutional data?
6. Can the Hon. Minister assure Parliament that all sensitive citizens' and Government data hosted on the Lanka Government Cloud remain intact and uncompromised, and will the Government table a cyber security audit report before this House?

Sir, you know that a person of repute like the BoI Chairman Arjuna Herath had his personal information leaked on to social media due to a cybercrime. That happened at a bank and I can name the bank, the Cargills

Bank, because they have gone to the Securities and Exchange Commission, mentioning that there has been an invasion into their privacy. So, these are not matter that could be swept under the carpet.

7. What steps are being taken to restore public and international confidence in the security of Sri Lanka's e-Government systems, particularly given the increasing frequency of cyber attacks on banks, public institutions and digital payment networks in the last six to ten months?

Now, the question that arises, Sir, is this. Sometimes owing to digitalization, we might be paying taxes far more than what is required because it had become holier-than-thou, that when a thing comes in digitized form, everything is believed to be one hundred per cent correct. Now, whether it is the actual situation or not is being questioned. Where does that go in? How did the audit fail on this? These are matters I am asking about not only as a normal citizen, but as a professional accountant who knows the danger of having everything fully-digitalized without having backup trails.

8. Will the Government consider the establishment of a legally empowered National Cyber Security Command Authority to coordinate, monitor and defend all national digital assets under a unified structure?

9. As Sri Lanka accelerates its transition towards full digital governance - I fully appreciate that and the quicker we do that, far more beneficial it would be to the country and there should be no retardation of that, taking necessary precautions to ensure that while doing so it would not affect, harm or compromise the people of this country - what legislative policy and institutional safeguards are being introduced to prevent future cyberattacks or system collapses of this magnitude? Specifically, when will the Government bring before Parliament a comprehensive Digital Transformation Act and a Cyber Security Protection Law to ensure national preparedness and resilience?

10. Finally, what assurance can the Hon. Minister give to the people of Sri Lanka that such a collapse of the nation's digital backbone would never recur and that the Government possesses the readiness, expertise and resilience to withstand future cyber threats of this magnitude?

Sir, may I just add one more thing. This was something that we have been trying to achieve from 2015 when I was Minister of Finance, but resistance from government servants retarded the success story. The Eastern European countries have managed to come up with their success story owing to the fact that they digitized their economy. I know the Deputy Minister is a very competent person, and my request to you is, while becoming a digitalized economy, ensure that we fast-track it with proven ability so that we would not suffer in the future.

Thank you, Sir.

ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)

Hon. Speaker, firstly, let me correct the Hon. Ravi Karunanayake about the name of the Ministry concerned. It is the Ministry of Digital Economy.

Sir, now, I answer the Question on behalf of the Minister of Digital Economy.

1. This incident has been identified as a technical failure. One of the hard disks reached 100 per cent utilization, which in turn caused a portion of the Lanka Government Cloud system to go offline. This automatic shutdown is a fail-safe mechanism designed to protect system integrity and prevent potential data corruption.

We have taken immediate steps to restore the online services. Since last Saturday night, the services have been available online and all the issues in the system had been fully resolved.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Minister, in such an environment, one hour is too long. So, imagine the duration it took, 24 hours into seven days. Had it been a cyber attack, would you be happy with the system that exists is my question. I am asking this on behalf of everybody and for national security of this country.

ගරු එරංග වීරරත්න මහතා
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)

Hon. Ravi Karunanayake, the reason it took one week was to ensure that the data was fully protected. There is no issue with regard to data integrity and also, the data will be restored fully without affecting any of the government services because we understand that those services are very crucial to the Government and that they contain critical public information. So, to ensure protection of all those data, it took some time because we wanted to do a full assessment before executing any kind of proactive action to restore the system.

Now, I will continue with the Answer.

2. Yes, I confirm that that was a failure in the internal system. There is no evidence of any external cyber intrusion, and at no point during the incident was the security or integrity of the data compromised. Throughout the restoration process, we strictly adhered to the highest standards of data protection and system security. Therefore, thereby no data loss has been reported, and also all the services are currently up and running.

3. Over the past 12 months, there have been no major or prolonged system outages impacting on the critical government digital platforms hosted on the Lanka Government Cloud. However, approximately two months ago, a brief service

[ගරු එරංග වීරරත්න මහතා]

disruption occurred due to an issue within one of the network components. That issue was rectified within a couple of hours' time, getting all the affected services back online. At that time also, there was not any cyber security-related incident reported, but the service restoration and allowing proper access to the services has been done within a couple of hours' time.

Also, following that incident, ICTA initiated enhanced monitoring of the previously affected components. We took those lessons learnt as a mechanism to go for the procurement of a new LGC 2.5 so that all the shortcomings available in the current LGC could be addressed.

4. In response to the system outage, all those institutions temporarily reverted to manual processing of their services. Therefore, they did not face any kind of service delivery issue. Up to now, no precise estimates of the financial or economic impact to those institutions have been given to the ICTA or to the Ministry of Digital Economy.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Minister, under the ASYCUDA system, 21 Government institutions would be interconnected -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you can get a clarification after the Hon. Deputy Minister answers.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
He can give an answer later. He has knowledge of technology. My knowledge of technology is not as sound as his. So, when your ASYCUDA system interconnects 21 Government institutions, if one bank or the Department of Registrar of Companies is not connected, then the entire network breaks down.

So, the financial implication would not be able to be computed in this manner. When you say "not possible", it is not correct because if one institution goes back to manual processing, there would not be any interconnection.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Deputy Minister, you may proceed.

ගරු එරංග වීරරත්න මහතා
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
Hon. Member, systems like ASYCUDA are run by separate data centres. Therefore, those systems were not affected. I understand that certain government services had been affected. However, since they reverted to manual processing, no service delivery had been affected during the collapse which prolonged for one week. Therefore, we have not received any information about any financial or economic impact to any of these institutions up to this moment.

5. In the current LGC platform, which was established in 2018, data backups are managed by the external entities - individual organizations. Therefore, it does not have a centralized backup system and this is one of the main reasons for us to go for the new Lanka Government Cloud procurement - LGC 2.5 - to have a secure, centralized backup at a central location along with a geo-redundant system architecture so that the system will ensure high availability, resilience and disaster recovery readiness. It will be taking daily incremental backups, weekly full backups and monthly full backups and those backups will be maintained for a one-year period. Thereby, we will be able to ensure that system data is 100 per cent protected. Geo-redundancy will ensure that there is no single point of critical failure. Data will be replicated and backups will be maintained off-site so as to address any sort of system downtimes. Also, this new system will have real-time network monitoring and system monitoring tools, enabling continuous oversight of infrastructure and the health of backup systems. These tools will automatically trigger alerts in response to anomalies, performance degradation or failures, allowing rapid restoration of any incident in the system and to mitigate it fast. This level of proactive monitoring and built-in redundancy is essential for the Government and therefore, we opted for Lanka Government Cloud - LGC - 2.5.

6. I can confirm that the data hosted on Lanka Government Cloud remained fully intact and uncompromised throughout the incident.

   The National Cyber Security Operations Centre - NCSOC - was actively monitoring several services running on the LGC during this period and no cyber incidents were detected or reported. All monitoring logs confirmed the absence of any unauthorized access or breach attempts, ensuring that both data security and system integrity were preserved at all times.

7. We acknowledge that incidents of this nature affect confidence. However, we have taken the following initiatives - some completed, some ongoing and some nearing completion - which will serve to establish a trusted environment and a far more robust system than ever.

   i. Implementation of the National Cyber Security Policy

      This will have all the systems assessed through a Vulnerability Assessment and Penetration Test and the respective institutions informed to rectify them.

   ii. Critical Information Infrastructure - CII

      We have identified Critical Information

Infrastructure across key sectors such as finance, health, energy, public administration and so on to ensure that we give focus to those systems to prevent any kind of cyber security attacks and to be resilient on them.

iii. Establishment of the National Cyber Security Operations Centre - NCSOC

We have established a month ago - in September - the National Cyber Security Operation Centre. This will centrally monitor all these Critical Information Infrastructure - CII - 24/7 and that monitoring will ensure that there will be no external cyber attacks on those systems. This centralized monitoring will also enable us to respond to any such breach attempts much proactively and in real time.

iv. AI-powered Threat Detection at NCSOC

We are going to enhance the NCSOC with AI-powered threat detection along with malware and threat-hunting software to enable predictive detection of evolving cyber threats and early prevention of capabilities to safeguard national digital infrastructure.

v. Drafting of a New Cyber Security Law

Also, we are drafting a new cyber security law to establish Cyber Security Regulatory Authority, which will be empowered both with regulatory oversight and enforcement authority across critical public and private infrastructure to ensure that those infrastructure will uphold all the security standards.

vi. International Cybercrime Cooperation via UN Convention

Then, we are going to become a signatory to the United Nations Convention against Cybercrime to strengthen cross-border collaboration on cybercrime investigations and to secure evidence sharing and legal cooperation. This is a strategic step to bolster global trust in the security of Sri Lanka's e-government systems.

vii. Joint Cybersecurity Task Force for Financial Sector Protection

A collaborative mechanism has been initiated by the Ministry of Digital Economy, Sri Lanka CERT, and TRCSL in partnership with CBSL and all licensed banks to proactively counter cyber threats-particularly phishing and digital fraud targeting the financial systems.

8. Yes, the Cabinet process to initiate a comprehensive Cybersecurity Law is currently underway to address this critical requirement. A Cybersecurity Regulatory Authority will be established, as I mentioned before, to critically monitor all the critical digital infrastructure of the Government.

Also, we have established the National Cybersecurity Operations Centre to monitor 37 key government institutions initially and currently, four institutions have already been connected and another six are in the process of integration.

9. In response to Question Nos. 7 and 8, I provided details about the cybersecurity measures that have been taken. Other than that, I want to highlight the fact that the Digital Economy Blueprint outlines Sri Lanka's strategic road map for digital transformation. It is anchored in a layered architecture comprising core digital infrastructure, Digital Public Infrastructure and a suite of platforms and applications which deliver services to citizens and businesses.

The entire system has various layers and we will ensure that each layer is supported by trust and governance framework and that cyber Security measures are being implemented to protect data and the accountability of each and every layer of the system.

And also, the Cabinet has directed the initiation of legislative processes to establish two critical institutions. One is the Digital Economy Authority - DEA - to drive and govern the digital economy agenda. The other one is the Cybersecurity Regulatory Authority - CSRA - to enforce the implementation of security in all the Government digital platforms.

10. The Government is taking comprehensive steps to ensure that such a disruption does not recur, strengthening both the technical infrastructure and the governance systems that underpin national digital services. The ICTA is currently in the process of migrating workloads to the new LGC 2.5 from the Legacy system so that we will not have reliance on the old system. The new one will have geo-redundant system architecture, centralized backup systems and so on.

The disk utilization was brought down to 88 per cent or below and also, as and when the workloads are migrated to the new LGC, those will be removed from the current Legacy to free more space. And the National Cybersecurity Operations Centre - NCSOC - will monitor the LGC 2.5, 24/7.

The SLT Data Centre - NOC, Network Operations Centre - will monitor the new system 24/7 to ensure that it maintains all the KPIs round the clock, ensuring service integrity and performance.

Additionally, the Government is preparing to establish a second cloud platform and we are hoping to initiate the tendering process towards the end of the year and this multi-cloud strategy will enable the Government not to rely on a single-cloud platform, but the data will be replicated in multi-cloud environment so that the availability, resilience and security of data will be upheld at the highest standard.

Sir, that concludes my Answer.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Ravi Karunanayake, now you can get a quick clarification from the Hon. Deputy Minister.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I appreciate the professional Answer that has been given. Hon. Deputy Minister, your knowledge of technology is far superior to mine. So, my question is more from a practical point of view. Even Bill Gate's personal accounts were hacked by a 21-year old Asian. Therefore, I guess we have to take ultra-precautionary action. White-collar crimes are becoming more realistic than could be avoided. As a result, you do not know when digital frauds would be committed. You know that the Central Bank and other banks of Bangladesh were hacked and that the Philippines had the same issue four years ago. So, considering those particular issues, there is a necessity to ensure that we are ultra-safe when we are going ahead with digitization.

Hon. Deputy Minister, you say that no revenue erosion had taken place. My mind goes to the Registrar of Companies, the Department of Commerce and the Police Clearance Centre, which come under ASYCUDA. When they check whether their companies are registered or not or if it has broken down, then, there is no competency factor for the Sri Lanka Customs to see whether it is working or not. Then, you would not be able to calculate whether there has been a revenue loss or not. So, Hon. Deputy Minister, I leave it to your judgement.

Sir, the next matter I need to check out is, the cyber authority -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, make your clarification short.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
That is also something that needs to be done because an ADB professional in Sri Lanka says, "Cybercrime costs Sri Lanka up to US Dollars 1 billion a year." US Dollars 1 billion a year! When we are talking of a total GDP of US Dollars 78 billion, the Government's revenue from exports is only US Dollars 20 billion, which is 5 per cent of it. So, it is not something that you can ignore. Also, you have gone on record saying that you want to have this digital governance in order to ensure that we capture the market tier and that international players such as MIT and others are trying to restore confidence here.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, would you please make your clarification according to the Answer given? Now, you have already taken two minutes for your clarification.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, this is not something which can be asked in an easy manner.

Hon. Deputy Minister, all I want to say is, if you are trying to restore confidence here, please ensure there are system backups as well as cloud protection not only in this country, but also outside because one area of erosion would ruin the entire 20 billion digitalized economy you are trying to build in five years.

Thank you.

ගරු එරංග වීරරත්න මහතා
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
Hon. Member, financial crimes are happening mostly at citizenry level as citizens do not place much emphasis when sharing their PIN numbers and so on. Therefore, awareness programmes are being planned as well as being carried out by the Central Bank, the SLCERT and the Ministry of Digital Economy.

Then, with regard to availability of backups and systems, we understand the importance of having them. That is the main reason why we went ahead with the procurement of the new LGC 2.5 with all these facilities because the existing one - the Legacy - which was created in 2018 does not allow us to have real uptime availability for Government systems. Also, as I mentioned, the procurement of a second cloud platform will enable us to have much broader resilience on all these digital public infrastructure. So, we understand the importance of having those in place and we are taking steps and are also in the process of getting them executed.

Thank you.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, ගරු චාමර සම්පත් දසනායක මහතා.

වරප්‍රසාද: ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තුළ ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතාගේ ක්‍රියා කලාපය

சிறப்புரிமை: அரசியலமைப்புப் பேரவையில் மாண்புமிகு சிவஞானம் சிறீதரனின் நடத்தை

PRIVILEGE: CONDUCT OF HON. SIVAGNANAM SHRITHARAN AT CONSTITUTIONAL COUNCIL

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයේ තිබෙන සුවිශේෂ කරුණු ටික විතරක් මම ඉදිරිපත් කරන්නම්. මොකද මේකේ කොළ තුනක් තිබෙනවා. නැත්නම් මේක කියවන්නත් පැය ගණනක් යයි.

ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ප්‍රධාන විරුද්ධ පක්ෂයට අනුබද්ධ නොවන කුඩා විරුද්ධ පක්ෂවල නියෝජිතවරයා ලෙස කටයුතු කරන පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ශ්‍රීතරන් මහතාගේ හැසිරීම හරහා පාර්ලිමේන්තු වරප්‍රසාද බරපතළ ලෙස උල්ලංඝනය වීමක් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය උල්ලංඝනය වීමක්ද සිදුව ඇති බව ඔබතුමාගේ අවධානයට යොමු කිරීම සඳහා මෙම ලිපිය මා ඉදිරිපත් කරමි.

පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත මඟින් මෙම ආයතනයේ ගරුත්වය සහ ස්වාධීනත්වය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පදනම සපයනු ලබයි. 29වන වගන්තිය යටතේ, "පාර්ලිමේන්තුවේ හෝ එහි කිසියම් මන්ත්‍රීවරයෙකුගේ කාර්යයන් ඉටු කිරීමට බාධා කරන, එම කටයුතුවලට බාධාකාරී ලෙස අතරමැදිහත්වන හෝ ඒවා වළක්වන ආකාරයෙන් මන්ත්‍රීවරයෙකු විසින් සිදුකරනු ලබන ඕනෑම ක්‍රියාවක් හෝ ප්‍රකට කරනු ලබන ඕනෑම හැසිරීමක් වරප්‍රසාද උල්ලංඝනයක් වන අතර නීතියෙන් පනවන ලද පරිදි විමර්ශනයකට සහ සම්බාධකයකට යටත් වේ."

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට නාම යෝජනා ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියේදී පාර්ලිමේන්තු සාමූහික බලාධිකාරිය නොසලකා හරින සහ මන්ත්‍රීවරුන්ගේ නියෝජන කාර්යය දුර්බල කරනසුලු වූ ගරු ශ්‍රීතරන් මහතාගේ ක්‍රියාවන් සම්පූර්ණයෙන්ම මෙම අර්ථ දැක්වීම තුළට ගැනෙන ඒවා වේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය තුළ තවදුරටත් මන්ත්‍රීවරුන් වෙතින් සදාචාරාත්මක සහ අපක්ෂපාතී හැසිරීමක් පැහැදිලිවම අපේක්ෂා කරනු ලබයි. ගරු ශ්‍රීතරන් මහතාට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් වී ඇති අතර, එම පැමිණිල්ලට අදාළ කරුණු විභාග වීම හා සොයා බැලීම වළකාලනු පිණිස එතුමා විසින් සිය පුද්ගලික අභිලාෂයන් පෙරටු කරගත් ක්‍රියාමාර්ගයකට අවතීර්ණව සිටී. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අදාළ පත් කිරීම සිදු කරනු ලබන්නේද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් වන අතර, ශ්‍රීතරන් මහතා විසින් තමාට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පැමිණිල්ලක් ඉදිරිපත්ව ඇත්තේය යන කරුණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත හෙළි කිරීමෙන් තොරව එම සභාවෙන් සිදුකරන පත්වීම් සඳහා සිය ඡන්දය භාවිත කරමින් සිටී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පාර්ලිමේන්තුව යටතේ පාලනය වන ආතයනයක් නොවන්නේ නමුදු මෙහිදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය එතුමා වෙත අදාළ වනුයේ එතුමා අදාළ සභාව නියෝජනය කරනුයේද සුළු පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වෙත ලබා දෙන ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනයකට අනුව වීම හේතුවෙනි.

එබැවින්, පෙර කී චර්යා ධර්ම සංග්‍රහයේ 7වන වගන්තිය අනුව, මන්ත්‍රීවරුන් තීරණ ගැනීමේදී මහජන යහපත උදෙසා ක්‍රියා කළ යුතු අතර, මූල්‍ය හෝ පුද්ගලික ප්‍රතිලාභ උදෙසා කටයුතු කිරීමෙන් වැළකී, බාහිර බලපෑම්වලින් තොර වෙමින්, පොදු රාජකාරි මුළුමනින්ම කුසලතා මත සිදු කරන බව සහතික කළ යුතු අතර, වගවීමට බැඳී සිටිමින් මහජන විමර්ශනයට විවෘත විය යුතුය යන අවශ්‍යතාවට හා විධිවිධානයට පටහැනි අයුරින් එතුමා විසින් කටයුතු කරමින් පවතී.

මෙම ව්‍යවස්ථාපිත වරමට පටහැනිව ක්‍රියා කිරීමෙන්, ගරු ශ්‍රීතරන් මහතා මා සහ මගේ පක්ෂයේ මන්ත්‍රීවරුන් පමණක් නොව ප්‍රධාන විරුද්ධ පක්ෂයට අනුබද්ධ නොවන අනෙකුත් විරුද්ධ පක්ෂ නියෝජනය කරන මන්ත්‍රීවරුන් විසින් ද එතුමා කෙරෙහි තබා තිබූ විශ්වාසය අහිමි කරගෙන ඇත. එතුමාගේ හැසිරීම විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයෙකුට අවශ්‍ය විශ්වාසය, අවංකභාවය සහ අපක්ෂපාතීත්වය දුර්බල කරනු ලැබ ඇති අතර, එමඟින් පැහැදිලි ලෙසම වරප්‍රසාද උල්ලංඝනයක් සහ චර්යා ධර්ම සංග්‍රහය උල්ලංඝනය කිරීමක් ද සිදු කර ඇත.

ගරු කථානායකතුමනි, මගේ මේ වරප්‍රසාද ප්‍රශ්නය ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා ඉදිරිපත් කරනවා. ඔබතුමා ඊයේ මෙක ප්‍රතික්ෂේප කළා. ඔබතුමා කිව්වා නිශ්චිතව කාරණය ඉදිරිපත් කරන්න කියලා. ඒ අනුව තමයි අද මෙය ඉදිරිපත් කළේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඊයේ ඉදිරිපත් කළ ප්‍රශ්නය තුළ අඩුපාඩුකම් තිබුණා. ඒකයි නැවත ලබා දෙන ලෙස කිව්වේ. ඔබතුමා අද නිශ්චිත කාරණාව සඳහන් කර තිබෙනවා.

ඒ අනුව ගරු චාමර සම්පත් දසනායක මහතා විසින් මතු කරන ලද මෙම වරප්‍රසාද ප්‍රශ්නය තුළින් දක්වා ඇති පරිදි වරප්‍රසාද කඩවීමක් සිදු වී තිබෙදැයි යන්න ඒ පිළිබඳව අධ්‍යයනය කිරීමෙන් අනතුරුව තීරණය කරනු ලබන බව ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 28 (ඊ) යටතේ වරප්‍රසාද පිළිබඳ වූ කාරණයක් සම්බන්ධ යෝජනාවක් ඉදිරිපත් කරන්න පුළුවන්. ස්ථාවර නියෝග 28 යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "ස්ථාවර නියෝග අන් කිසි නියමයක් කර ඇතොත් මිස, මතු සඳහන් යෝජනා සම්බන්ධයෙන් හැර, ඉදිරිපත් කිරීමට අදහස් කරන කවර හෝ යෝජනාවක් සම්බන්ධයෙන් දැනුම්දීමක් කරනු ලැබිය යුත්තේ ය."

ඒ කියන්නේ මේ කියන කාරණා හැර, ඔබතුමාට කලින් දැනුම් දුන්නොත් අවස්ථාව දිය යුතුයි. හැබැයි, වරප්‍රසාද පිළිබඳ කාරණයක් සම්බන්ධව දැනුම් දිය යුතු නැහැයි කියන කාරණය තමයි මේ ස්ථාවර නියෝග 28 අනුව මට හැඟී යන්නේ. ස්ථාවර නියෝග 28 (අ), (ආ), (ඇ), (ඈ), (ඉ) යටතේ දක්වා ඇති කාරණා සියල්ල අනුව හැඟී යන්නේ ඒකයි. ඒ අනුව ගත්තාම, ඊයේ ඒ මන්ත්‍රීතුමාට නැගිටලා එම වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ හැකියාව තිබෙනවා. ඒ කියන්නේ ලිඛිතව දැනුම් දීමෙන් තොරව යෝජනා කිරීමට අවශ්‍ය කාරණා තමයි මෙම ස්ථාවර නියෝගය යටතේ සඳහන් වන්නේ.

ඒ නිසා මම ගරු ලේකම් මණ්ඩලයෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, ගරු මන්ත්‍රීතුමන්ලාගේ වරප්‍රසාද කඩවෙන විධියට මුලසුනට නියෝග දෙන්න එපා කියලා. ඒ මොහොතේ ගරු මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද කැඩිලා තිබෙනවා නම්, ඒක මේ පාර්ලිමේන්තුවට දැනුම් දෙන්න පුළුවන්. ඒක ලිඛිතව දැනුම් දෙන්න ඕනෑ කියන කාරණය සඳහන් වෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. මම ඊයේ දිනයේ හිටියේ නැහැ. චාමර සම්පත් මන්ත්‍රීතුමාට ඒ අවස්ථාව **ලබා නොදී** මුලසුන අනීතිකව කටයුතු කිරීම පිළිබඳව අපි කනගාටු වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක, ස්ථාවර නියෝග 118ත් එක්ක කියවන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ස්ථාවර නියෝග 28හි පැහැදිලිව තිබෙනවා නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 118ත් එක්ක කියවන්න. ඒ සම්බන්ධයෙන්,-

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මුලසුනට වැරදුණේ වැරදි මාර්ගෝපදේශවලට අනුව කටයුතු කරපු නිසා. ඒ නිසා ඒක කරන්න දෙන්න බැහැ, ගරු කථානායකතුමනි. මේකේ පැහැදිලිව තිබෙනවා නේ මෙන්න මේ යෝජනා ඉදිරිපත් කරන්න පුළුවන් කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සම්බන්ධයෙන් අධ්‍යයනය කර, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා සම්බන්ධයෙනුත් ඒ ආකාරයෙන්ම තීරණය කරලා දැනුම් දීලා තිබෙනවා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
එහෙම තිබියදී මේ විධියට නොමඟ යවලා තිබෙනවා. ඒ වරප්‍රසාද කවදාහරි අපටත්,- මන්ත්‍රීවරු හැටියට අපට ඒ අයිතිය තිබෙනවා. විවිධ වගන්ති පෙන්වලා ඒ අයිතිය කෙළෙසන්න හදන්න එපා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉදිරිපත් කරන කාරණයට අදාළව වරප්‍රසාදයක් තිබෙනවාද, නැද්ද කියන එක සම්බන්ධයෙන් කථානායකතුමා සෑහීමකට පත් වෙන්න අවශ්‍යයි, ගරු මන්ත්‍රීතුමනි.

ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(4)හි විධිවිධාන ප්‍රකාරව, 2025 නොවැම්බර් 08 සෙනසුරාදා, 10 සඳුදා, 11 අඟහරුවාදා, 12 බදාදා, 13 බ්‍රහස්පතින්දා සහ 14 සිකුරාදා "විසර්ජන" පනත් කෙටුම්පත (2026) සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

II

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධාන ප්‍රකාරව 2025 නොවැම්බර් 08 සෙනසුරාදා, 10 සඳුදා සිට 13 බ්‍රහස්පතින්දා දක්වා "විසර්ජන" පනත් කෙටුම්පත (2026) සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද සහ අ.භා. 1.00 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ.භා. 6.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.30 ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

III

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, "විසර්ජන" පනත් කෙටුම්පත (2026) සලකා බැලීම සඳහා වෙන් කළ 2025 නොවැම්බර් 14 සිකුරාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 6.00 දක්වා ද විය යුතු ය. අ. භා. 6.00ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා ඉදිරිපත් කරපු යෝජනාව සම්බන්ධයෙන් කාරණයක් කියන්න ඕනෑ. සුමානයකට ඉස්සෙල්ලා විසර්ජන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කැබිනට් සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබුණා. ඊට පසුව, තිබුණු විසර්ජන පනත් කෙටුම්පත වෙනස් වුණා. ඒක පාර්ලිමේන්තුවට නැවත ඉදිරිපත් කර නැහැ. ඉතින්, අය වැය ලේඛනය ඉදිරිපත් කරන නොවැම්බර් මාසයේ 7වැනිදා එම විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න අවශ්‍යයි. ඒකට දවස් 30ක් අවශ්‍ය නැහැ. නමුත්, වෙනස් වුණු Heads යටතේ වෙනස් වී තිබෙන මූල්‍ය ප්‍රමාණය පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් කරන්න අවශ්‍යයි. ඒක තවම කරලා නැහැ. ඉතින්, ඒ කටයුත්ත හෙට දිනයේ කළේ නැත්නම් අපි නැවත හම්බ වෙන්නේ කවදාද කියන එක නිශ්චිත නැති නිසායි මම මේ ප්‍රශ්නය අහන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, මම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති හැටියට වචනයක් කියන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම හිතන විධියට ගරු මන්ත්‍රීතුමා කියපු කථාව හරි. මොකද, ඒක වෙනස් කළේ, subsequent to the presentation of the original Appropriation Bill. ඉතින්, ඒ නිසා අපි අද රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී Appropriation Bill එක ගන්නවා. ඒ අවස්ථාවේ දී, ඒක ඒ ආකාරයට ගෙනාවොත් සම්මත කර ගන්න අපට පුළුවන්. මොකද එහෙම නැති වුණොත්, මේක නැවතත් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී අරගෙන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න අපට වෙලාවක් නැති වෙනවා, ගරු ඇමතිතුමනි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, අපි -

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, අපි ඊයේ ඒ පිළිබඳව ලිඛිතවම ගරු සභානායකතුමාට දැනුම් දුන්නා. අපි වැඩසටහන් ටික ඔක්කෝම සකස් කරලා තිබෙනවා. මේ වෙනස්කම් ටික ඉක්මනින් නිරාකරණය කරලා දෙන්න කියලා ඉල්ලනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, ඒක Debate එකට වඩා නෛතිකමය ප්‍රශ්නයක් වෙනවා නේ. මොකද, මාරු කර තිබෙන Headsවලට අදාළ වන විධියට allocations මාරු කරන්න සිද්ධ වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, අපි - සභානායක කාර්යාලය - දහවල් 2.00ට මුදල් අමාත්‍යාංශයත් කැඳවලා මේ සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වනවා. විපක්ෂයේ සංවිධායකතුමා සහ අපි ඒකට සම්බන්ධ වෙනවා. ඒ අනුව මේ ගැටලුව නිරාකරණය කර ගන්න පුළුවන්.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, - *[බාධා කිරීමක්]*

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එක අමාත්‍යාංශයකට දීලා තිබෙන ප්‍රමාණය වෙනස් වෙලා තිබෙන නිසා මේක අත්‍යවශ්‍යයි. හෙටට ඉස්සෙල්ලා මෙය ලබා දිය යුතුයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා, ඒ පිළිබඳව අද සවස 2.00ට සාකච්ඡාවක් පැවැත්වෙනවා.

The Hon. Darmapriya Wijesinghe to move the Adjournment Motion. You have ten minutes.

මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ තුරන් කිරීම සහ නීතිමය රාමුව ශක්තිමත් කිරීම සඳහා වන ජාතික වැඩ පිළිවෙළ

போதைப்பொருள் மற்றும் ஒழுங்கமைக்கப்பட்ட குற்றச் செயல்களை இல்லாதொழிப்பதற்கும் சட்டக் கட்டமைப்பை வலுப்படுத்துவதற்குமான தேசிய திட்டம்

NATIONAL PROGRAMME TO ERADICATE DRUGS AND ORGANIZED CRIME AND STRENGTHENING THE LEGAL FRAMEWORK

[පූ.භා. 11.13]

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"සංවිධානාත්මක අපරාධ කල්ලි, මත්ද්‍රව්‍ය ජාවාරම සහ දේශපාලනය මෑතක් වනතුරුම එකිනෙකා මත යැපෙන සහ එකිනෙකා පෝෂණය කරන්නා වූ සමාජ සංස්ථාව විනාශ කරන්නා වූ ව්‍යාධියක් විය. නමුත් 2024 වසරේ දී සිදු වූ ජනතා ජයග්‍රහණයත් සමඟ මෙම විෂම චක්‍රයට ලැබුණු දේශපාලන සහය ඉවත් වූ අතර නීතිය ක්‍රියාත්මක කරන ආයතන සැබෑ ලෙසටම ස්වාධීන විය.

නමුත් එමඟින් පමණක් මෙම අභියෝගය ජයගත හැකි යැයි සිතීම සතුරා අවතක්සේරු කිරීමක් මෙන්ම සතුරා විනාශ කිරීමට වැඩි කාලයක් යෙදවීමට සිදුවන්නකි. සංවිධානාත්මක අපරාධ කල්ලි ක්‍රියාකාරකම් සහ මත්ද්‍රව්‍ය ජාවාරම් හරහා උපයාගෙන තිබෙන බිලියන ගණනක නීති විරෝධී ධනය අත්පත් කර ගැනීමටත්, එම අපරාධකරුවන් අත් අඩංගුවට ගැනීමට අදාළ කටයුතුවලටත් වර්තමාන සහ අනාගත අභියෝගයන්ට ගැළපෙන පරිදි නීති වෙනස් විය යුතුව ඇත.

එසේම රට පුරා විසිරී සිටින සංවිධානාත්මක අපරාධ කල්ලිවලට සහ මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ පුද්ගලයන් කඩිනමින් හඳුනා ගනිමින් නීතිය ක්‍රියාත්මක කරමින් සමාජය වඩා සුරක්ෂිත ස්ථානයක් බවට පත් කිරීම සියලු පුරවැසියන්ගේ ද වගකීමක් සහ යුතුකමක්ව තිබේ.

ඒ අනුව රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන "රටම එකට" වැඩ පිළිවෙළට මෙම ගරු සභාවේ සියලු දෙනාගේ මෙන්ම රටේ මුළු මහත් ජනතාවගේ සහය ලබාදිය යුතු යැයි යෝජනා කරමි."

ගරු කථානායකතුමනි, අපේ රටේ ජනතාව නොයෙක් විධියට තාඩන පීඩනවලට ලක් කරලා, සූරා කෑමට ලක් කරලා, අපේක්ෂා භංගත්වයට පත් කරලා, ඔවුන්ගේ වුවමනා එපාකම් ඉටු නොවන තත්ත්වයට පත් කරලා, ඔවුන්ට ජීවිත බිය, මරණ බිය දනවපු ඒ දශක හතරහමාරකට වැඩි කාලය අවසන් කරලා නව ගමනකට, පුනරුදයක් දෙසට ගමන් කරමින් සිටින කාල වකවානුවක් තමයි අපි මේ ගෙවමින් සිටින්නේ. ඒත් අපි සියලු දෙනාම දන්නවා, අපි සියලු දෙනාම තේරුම්ගත යුතුව තිබෙනවා, මේ විනාශකාරී ගමන්මඟ වෙනස් කළා වාගේම මේ එහි ආරම්භය පමණයි; එහි පටන් ගැන්ම පමණයි කියන එක. අපි තව බොහෝදුර ගෙවා ගෙන මේ ගමන යා යුතුව තිබෙනවා. අපි පසු කරන ලද ඒ දශක හතරහමාරක කාල වකවානුවේ ජාවාරම්කාර, පාතාල, මජර දේශපාලනය හැසිරුණු ආකාරයක් තිබෙනවා. ඒ වාගේම ඒ දේශපාලනය කටයුතු කරපු ආකාරයක් තිබෙනවා. ඒ වාගේම ඒ දේශපාලනය සහ ජාවාරම්කාර පද්ධතිය කටයුතු කරපු තල ගණනාවක් තිබෙනවා.

එයින් එකක් තමයි, අද මම යෝජනා කළ කුඩු, පාතාලය සහ ඔවුන්ට රැකවරණය සපයන ලද දේශපාලනය. ඒ කියන්නේ, 2024 නව පාලනය විසින් අවසන් කරන ලද දේශපාලනය. හැබැයි, ඒ අවසන් කිරීම සිදු වුණු පමණින් සියල්ල කණපිට හැරෙන්නේ නැහැ. පසුගිය දිනවල මේ පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ සිට විපක්ෂයේ සියලු මන්ත්‍රීවරුන් තැන තැන වෙඩි තැබීම්, තැන තැන සිදුවන ඝාතන පිළිබඳව පාර්ලිමේන්තුව තුළ ලොකු ඝෝෂාවක් නැඟුවා. අප සියලුදෙනා දන්නවා, මේකට සම්බන්ධ ජාවාරම්කාර කණ්ඩායමක්, පාතාලය සහ ඒකට අනුබල දීපු දේශපාලනය පිළිබඳව. ඒ මත තමයි මේ ඝාතන රැල්ල ක්‍රියාත්මක වෙමින් ඉස්සරහට ආවේ. දේශපාලනය වෙනස් වුණු පමණින් ඒ ඝාතන රැල්ල, ඒ ගමන් මඟ වෙනස් වෙලා නැහැ. ඒ නිසා තීරණාත්මක ලෙස මේ ගමන් මඟ වෙනස් කළ යුතුව තිබෙනවා. අන්න ඒ වෙනුවෙන් නව වැඩ පිළිවෙළක් රට තුළ ක්‍රියාත්මක කළ යුතුව තිබෙනවා. ඒ වෙනුවෙන් වර්තමාන ආණ්ඩුව පියවර ගනිමින් තිබෙනවා. මේ කුඩු ජාවාරම එක්ක, මේ පාතාලය එක්ක, මේ දේශපාලනය එක්ක බැඳුණු කර්තව්‍යයන්ට හේතුවක් තිබෙනවා, එහෙම නැත්නම් මේ මරා ගැනිල්ලට හේතුවක් තිබෙනවා. ඒ සම්බන්ධව කරන ලද සමීක්ෂණයක තොරතුරු ටිකක් මම ඒ සඳහා උදාහරණයක් ලෙස මේ සභාවට ඉදිරිපත් කරනවා.

මම මේ ගන්නා උදාහරණය අදාළ වන්නේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ප්‍රදේශයටයි. මෙය ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුවේ ඉපදිලා, මීගමු වැල්ලේ හැදුණු වැඩුණු ධීවරයෙකුගේ පුතෙකු වෙච්ච වෛද්‍යවරයෙක් කරන ලද සමීක්ෂණයක්. ඔහු වෛද්‍ය වෘත්තියේ යෙදෙන ගමන්, වෛද්‍ය වෘත්තියට එහා ගිහින් මේ විෂ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා වන ස්වේච්ඡා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. ඒ වැඩ පිළිවෙළට සම්බන්ධ වන දෙමව්පියන් සමඟ ඒ ඇබ්බැහිවූවන් මූලික කරගෙන ඔහු මේ සමීක්ෂණය කරනවා. ඒ සමීක්ෂණයේදී ඔහු හඳුනා ගන්නවා, මූලික වශයෙන් පාතාලය මෙතරම් මරාගන්නේ ඇයි කියන කාරණය. ඔහුගේ සමීක්ෂණයට ඔහු යොදා ගන්නවා, තමන් ළඟට රැගෙන එන ඇබ්බැහිවූවන්.

ඔහුගේ සමීක්ෂණයට අනුව 2018 වසරේදී පුනරුත්ථාපනය සඳහා ඔහු ළඟට එන තරුණයන් අතරින් එක ග්‍රාම නිලධාරි වසමකින් සියදෙනෙක් තෝරා ගන්නවා. ඔහු වෛද්‍යවරයෙක්. ඔහුගේ නම හෙන්රි රොසාරියෝ. ඒ නමත් මම මෙතැනදි කියන්න ඕනෑ. මොකද, ඔහු එක්සත් ජාතික පක්ෂයේ හිටපු නාගරික මන්ත්‍රීවරයෙක්. ඔහු පසුකාලීනව අපි එක්ක වැඩ කරන්න පටන් ගන්නවා. ඔහු කරපු සමීක්ෂණයක තොරතුරුයි මම මේ ඉදිරිපත් කරන්නේ. ඔහු කියනවා, දැන් මේක දෙගුණ තෙගුණ වෙලා තිබෙන්නේ කියලා. 2018 වසරේදී පුනරුත්ථාපනය සඳහා ඔහු ළඟට එන තරුණයන් අතරින් එක ග්‍රාම නිලධාරි වසමකින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සියදෙනෙක් හඳුනාගන්නවා. මේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණු පුද්ගලයෙක් සහ අලුතින් මේ මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වුණු පුද්ගලයෙක් කෑලි විධියට තමයි ඒවා මිලදී ගන්නේ. 2018 වසරේදී ඒ එක කෑල්ලක් රුපියල් 2,000ක් වුණා. ඔහුගේ සමීක්ෂණයට අනුව අලුතින් මේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ කෙනෙක් අවම වශයෙන් දවසකට කෑලි 2ක් මිලදී ගන්නවා, රුපියල් 4,000කට. එක ග්‍රාම නිලධාරි වසමක මේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සියදෙනෙක් හඳුනාගන්නවා. ඒ වාගේ ග්‍රාම නිලධාරි වසම් 39ක් ඔහු හඳුනාගන්නවා, මීගමුව ප්‍රදේශය තුළ. ඒ වසම් තුළ අඩු වැඩි වශයෙන් 100කට ආසන්න ප්‍රමාණයකින් එහෙම ඇබ්බැහි වූ අය ඉන්නවා.

ඔහු මේක තවත් විශ්ලේෂණය කරගෙන යද්දි හඳුනාගන්නවා, මේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් අතර කෑලි 2 සිට 6 දක්වා පරිහරණය කරන අය සිටින බව. කෑලි 6ක් පරිහරණය කරන කෙනාත් දවසකට රුපියල් 2,000 ඒවා 6ක් හොයන්න ඕනෑ. මෙහිදී මධ්‍යන්‍යය ලෙස රුපියල් 2,000 ගත්තොත්, මීගමුව

ප්‍රදේශයේ විතරක් මේකෙන් කොතරම් මුදලක් සංසරණය වෙනවාද කියන එක බලාගන්න පුළුවන්, මේක විශ්ලේෂණය කරද්දි. එක කෑල්ලක් රුපියල් 2,000යි. එක්කෙනෙක් ඒ වාගේ කෑලි දෙකක් පාවිච්චි කළොත් රුපියල් 4,000ක්. ඒ වාගේ එක ග්‍රාම නිලධාරි වසමක සියදෙනෙක් මේවා පාවිච්චි කළොත් රුපියල් ලක්ෂ 4ක්. ඒ අනුව රුපියල් ලක්ෂ 4ක මුදලක් එක දවසකට සංසරණය වනවා, එක ග්‍රාම නිලධාරි වසමක. රුපියල් ලක්ෂ 4 ගණනේ ග්‍රාම නිලධාරි වසම් 39ක පාවිච්චි වුණොත් එක දවසක සංසරණය වන මුදල රුපියල් එක්කෝටි පණස්හයලක්ෂයක්.

ඒ වාගේ මාසයක් පාවිච්චි කළොත්, මේ කණ්ඩායම තුළ මීගමුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ විතරක් සංසරණය වෙනවා, රුපියල් හතළිස් හයකෝටි අසූලක්ෂයක්. මේක තමයි මේ මරා ගැනිල්ලට හේතුව. මම මේ කිව්වේ අවමය. ඔහු කියනවා, මධ්‍යන්‍යය 3,000ක් කියලා. මම අරගෙන තිබෙන්නේ මධ්‍යන්‍යය 2,000ක් කියලා. ඒ නිසා බරපතළ මුදල් සංසරණයක් සිදු වෙනවා කුඩු සහ පාතාලය ඇතුළේ. මේ වෙනුවෙන් කුඩු සහ පාතාලයට මැදිහත් වෙච්ච කණ්ඩායම් බෙදිලා, වෙන් වෙලා ඉන්නේ, මරා ගනිමින් ඉන්නේ. ඔවුන් අත ආයුධ තිබෙනවා. විරුද්ධ කණ්ඩායම් අතර ආයුධ හුවමාරු වෙනවා. ඔවුන් ඒ විධියට මරාගෙන තමන්ගේ ආර්ථිකය නහාසිටුවා ගැනීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ තමයි මේ ක්‍රියාත්මක කරමින් තිබෙන්නේ. තමන්ගේ පාතාල ආර්ථික කටයුතු පවත්වා ගෙන යාම සඳහා තමයි මේ මරා ගැනිලි තිබෙන්නේ. මේකේ විශේෂත්වය තමයි, මේ වෙනුවෙන් උදව් කරපු, මේ වෙනුවෙන් රැකවරණය දීපු දේශපාලන අධිකාරියක් පැවතීම.

ඔබට මතක නම්, එක මොහොතක මීගමුව ප්‍රදේශයේ මේ කුඩු ජාවාරමට සම්බන්ධ දේශපාලකයෙකුගේ නිවස විශේෂ කාර්ය බලකායෙන් වටලපු වෙලාවේ මේ රටේ එවකට හිටපු විධායක ජනාධිපති ගිහිල්ලා ඔහු බදාගෙන කිව්වා, "මේ, මගේ මිනිහෙක්" කියලා. ඒ විධියට තමයි මේ පාතාලය, කුඩු ජාවාරම සහ දේශපාලනය සම්බන්ධ වෙලා තිබුණේ. පාතාලය, කුඩු ජාවාරම, මේ දේශපාලනය නතර කළ යුතුව තිබෙනවා. අන්න ඒ වෙනුවෙන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුව තිබෙනවා.

ඒ වෙනුවෙන් මේ ආණ්ඩුව දරමින් තිබෙන ප්‍රයත්නය එළඹෙන 30වෙනි දා ගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී "රටම එකට" යන තේමාව යටතේ ආරම්භ වෙනවා. එම ජාතික මෙහෙයුම, ඒ විෂ මත්ද්‍රව්‍ය විරෝධී වැඩ පිළිවෙළට මේ ගරු සභාවේ සිටින සියලුදෙනාට එකතු වෙන්න කියලා මා ආරාධනා කරනවා. ඒ වාගේම රටේ සියලු ජනතාවටත් ඒ සඳහා එකතු වෙන්න කියාත්, ඒ වෙනුවෙන් සියලු හැකියාවන් යොදවන්න කියන ආරාධනාවත් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තූතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Roshan Akmeemana. You have nine minutes.

[පූ.භා. 11.25]

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
බොහොම ස්තූතියි, ගරු කථානායකතුමනි.

විෂ මත් ද්‍රව්‍යයට එරෙහි ජාතික වැඩ පිළිවෙළක් විධියට "රටම එකට" වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී ඒ සඳහා පාර්ලිමේන්තුවේ වාගේම රටේ සියලු ජනතාවගේ සහයෝගය ලබා දෙන ලෙස යෝජනා කරමින්, ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීවරයා ඉදිරිපත් කළ යෝජනාව අනුමත කරමින්, එය ස්ථිර කරමින් මගේ අදහස් දැක්වීම ආරම්භ කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීවරුනි, මත්ද්‍රව්‍ය සමාජයට ඇතුළු වුණාට පසුව එමගින් විනාශ වෙන්නේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයා පමණක් නොවෙයි. ඒ තුළින් සමස්ත පරම්පරාවම විනාශයට ඇද දමනවා. එමගින් මේ රට ගොඩනඟන්න තිබෙන ශ්‍රමය අඩපණ කරනවා. අලුත් අදහස්, නවෝත්පාදන ගේන්න පුළුවන් මොළ අක්‍රිය කරනවා. ආදරය කරන්න පුළුවන් හදවත් වෛරයෙන් පුරවනවා. ඒ නිසා මත්ද්‍රව්‍යයට එරෙහි සටන, මත්ද්‍රව්‍ය මර්දනය කිරීම සහ ඒ ආශ්‍රිත අපරාධ මැඩලීමේ සටන නීතියේ ආධිපත්‍යය සම්බන්ධ ප්‍රශ්නයක් විධියට විතරක් මම දකින්නේ නැහැ. ඒක අපි මුහුණ දෙන ශිෂ්ටාචාරමය අභියෝගයක් සහ මේ සමාජයේ සදාචාරාත්මක පදනම, බුද්ධිමය පදනම ආරක්ෂා කිරීම වෙනුවෙන් දේශපාලන නායකයන් විධියට අපට තිබෙන හැකියාව පිළිබඳ පරීක්ෂණයක් ලෙසත් මම දකින්න කැමතියි. අද වනවිට අපට පැහැදිලිව පෙනෙනවා, විශේෂයෙන් අයිස්, හෙරොයින්, කොකේන්, කුෂ් වාගේ මත්ද්‍රව්‍ය පරිභෝජනවාදී භාණ්ඩයක් බවට සමාජය තුළ පත් වෙලා තිබෙන ආකාරය. ඒ නිසාම මේ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වෙළෙඳ පොළක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒක විශාල වෙළෙඳ පොළක් බවට පත් වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ වෙළෙඳ පොළත් එක්ක යම් ආර්ථිකයක් ගොඩනැඟෙනවා; ආර්ථික ක්‍රියාවලියක් ගොඩනැඟෙනවා; ඉල්ලුමක් හා සැපයුම් යන්ත්‍රණයක් ගොඩනැඟෙනවා.

පසුගිය කාලයේ මත්ද්‍රව්‍යවලට එරෙහි සටන විධියට හැම වෙලාවේදීම හඳුන්වා දුන්නේ මෙන්න මේ සැපයුම් ජාලයට එරෙහිව කටයුතු කරන එකයි. මොකද, පසුගිය ආණ්ඩු හැම එකක්ම මත්ද්‍රව්‍යවලට එරෙහිව කටයුතු කරනවා කියලා පෙන්නුවේ මෙන්න මේ මත්ද්‍රව්‍ය සම්බන්ධ ආර්ථිකයේ සැපයුම් ජාලයත් එක්ක යම් යම් අභිමුඛවීම් සිදු කරන එකයි. උදාහරණ විධියට වැටලීම් කිරීම, යම් මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් අත්අඩංගුවට ගැනීම සහ සොයා ගත්ත ආයුධ ප්‍රමාණයක් ප්‍රදර්ශනය කිරීම දක්වන්න පුළුවන්. මොකද, ඒක දේශපාලනික වශයෙන් කෙටි කාලීන වාසි ගන්න පුළුවන් ක්‍රමයක්; යම් සන්දර්ශනාත්මක ක්‍රමවේදයක්. හැබැයි, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වෙළෙඳ පොළක් බිහි වුණු නිසාම, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් යම් පාතාල ආර්ථිකයක් බිහි වෙලා තිබීම නිසාම ඒ සැපයුම් ජාලයත් එක්ක විතරක් කටයුතු කරලා, ඒ සැපයුම් ජාලයට එරෙහිව විතරක් ක්‍රියාන්විතයක් දියත් කරලා අපට මේ මත්ද්‍රව්‍ය සම්බන්ධ සටන අවසන් කරන්න හැකියාවක් නැහැ. ජාත්‍යන්තර වශයෙන් මත්ද්‍රව්‍ය සම්බන්ධ ප්‍රශ්නයත් එක්ක සටන් කරපු, යම් ආකාරයක ජයග්‍රහණයක් දිනා ගත්ත රටවල අත්දැකීම්වලිනුත් පෙන්වන්නේ ඒකයි. මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සංඛ්‍යාව එන්න එන්නම වැඩි වෙලා; ඉල්ලුම වැඩි වෙලා.

ඒ නිසා මේ මත්ද්‍රව්‍යවලට එරෙහි සටනේදී ඒ සැපයුම් ජාලය අඩපණ කරන්න, සැපයුම් ජාලය මර්දනය කරන්න නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක කරනවා වාගේම දිනෙන් දින වැඩිවන ඉල්ලුම, දිනෙන් දින මේකට පෙළඹෙන පාරිභෝගිකයන් සංඛ්‍යාව වැඩි වන එකටත් අපට උත්තරයක් හොයන්න වෙනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා මෙන්න මේ ප්‍රශ්නය අහලා මගේ අදහස් දැක්වීම ඉදිරියට කරගෙන යන්න මම කැමැතියි. මිනිස්සු මත්ද්‍රව්‍ය භාවිත කරන්නේ ඇයි? මෙච්චර ස්වයං විනාශකාරී බව දැන දැනත්, ඒ ගැන සමාජයේ උදාහරණ ඕනෑ තරම් පෙනෙන්නට තිබියදීත් විශේෂයෙන්ම තාරුණ්‍යයට මත්ද්‍රව්‍ය අවශ්‍ය වෙන්නේ ඇයි?

[ගරු රොෂාන් අක්මීමන මහතා]

ගරු කථානායකතුමනි, මිනිසුන්ට භෞතික සහ අධ්‍යාත්මික කියලා අවශ්‍යතා දෙකක් තිබෙන බව අපි වර්තමානය වනකොට හඳුනාගෙන තිබෙනවා. ආහාර, ඇඳුම් පැළඳුම්, නිවාස වාගේම මිනිසුන්ට අධ්‍යාත්මික අවශ්‍යතාවකුත් තිබෙනවා. ගරු කථානායකතුමනි, දාර්ශනික අර්ථයෙන් ගත්තොත්, මිනිස් ජීවිතය වේදනාකාරීයි. මිනිසුන්ට මේ වේදනාකාරී ජීවිතයෙන් මිදෙන්න ඔවුන් මේ ජීවිතයේ ගැඹුරු අර්ථයක්, අරමුණක් හොයා ගන්න ඕනෑ. ඒක පෞද්ගලිකව වෙන්න පුළුවන්, සමාජයීය වශයෙන් වෙන්න පුළුවන්. මිනිස් ජීවිතයට ගැඹුරු අර්ථයක් හොයා ගන්න වෙනවා. මනුෂ්‍යයෙකුට අරමුණක් හොයා ගන්න වෙනවා, ජීවිතයේ තිබෙන වේදනාකාරී බවෙන් මිදෙන්න. මිනිස් සමාජය කාලාන්තරයක් තිස්සේ සාමූහිකව පරිශ්‍රමයක් දරලා ඒ මිනිස් ජීවිතවල ගැඹුරු අර්ථයක් හොයා ගන්න, අරමුණු සහගත බවක් හොයා ගන්න නිපදවා ගත්ත දේවල් ටිකක් තිබෙනවා. පවුල, ආදරය, මිත්‍රත්වය, සමාජ සම්බන්ධතා, සමාජ ආයතන ව්‍යුහය, සංස්කෘතිය කියන්නේ අපේ පැවැත්මට අප අර්ථයක් හොයා ගන්න ගොඩනඟා ගත් දේවල්. හැබැයි, කාලයක් තිස්සේ සමාජයේ පවතින මෙන්න මේ මිනිස් පැවැත්මට අර්ථයක් දෙන දේවල් විනාශයට පත් වෙමින් ගියා. ඒවා සම්බන්ධයෙන් තිබිච්ච විශ්වාසය බිඳ වැටුණා. විශේෂයෙන්ම තාරුණ්‍යයට අපේක්ෂාභංගත්වයක් ඇති වුණා. ඔවුන්ට අනාගතය පිළිබඳව දීප්තිමත් ආලෝකයක් පෙනුණේ නැහැ. ඒ නිසා තාරුණ්‍යය, ආදරය, පවුල ආදී දේවල් මත ජීවිතයේ අර්ථය හොයනවා වෙනුවට, සමාජ සම්බන්ධතා මත, සමාජ ආයතනවල ව්‍යුහයන් මත සමාජ අර්ථය හොයනවා වෙනුවට, කෘත්‍රිම රසායනික ක්‍රියාවලියක් හරහා ලැබෙන කෙටි කාලීන සතුටක් හොයාගෙන ගියා.

ගරු කථානායකතුමනි, වැරැද්ද තිබෙන්නේ තාරුණ්‍යය සතුට හඹා යෑමේ නොවෙයි. එම නිසා මත්ද්‍රව්‍යවලට එරෙහිව තාරුණ්‍යය වෙනුවෙන් කරන මේ සටනේදී, අපි තරුණයන් අක්‍රිය කිරීමක් කරන්න හොඳ නැහැ. අපි, තරුණයන් සතුට සොයා යෑම වළක්වන්න හොඳ නැහැ. ඔවුන් මේ මත්ද්‍රව්‍ය හොයා යන අරමුණ, මත්ද්‍රව්‍ය මඟින් තරුණයන් අපේක්ෂා කරන්නේ කුමක්ද කියන එකයි අපි හොයන්න ඕනෑ. එහෙම නැතුව අපට කවදාවත් මේ මත්ද්‍රව්‍ය ජාලයට අදාළ වන ඉල්ලුම පාලනය කරන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මම කැමැතියි, මෙන්න මේ සම්බන්ධව වැඩිපුර අදහස් දැක්වීමක් කරන්න. මොකද, ආදරය වෙනුවට හුදෙකලා තත්ත්වය ඇති වනකොට, අපේක්ෂාව සහ සාමූහිකත්වය වෙනුවට තරගකාරිත්වයේ පීඩාව එනකොට තරුණයෝ හොයන්නේ මත්ද්‍රව්‍ය නොවෙයි; තරුණයෝ මත්ද්‍රව්‍ය මඟින් ලබා දෙනවා කියන සහනය - relief එක - තමයි හොයන්නේ. වර්තමාන තරුණ පරම්පරාවට සතුට හොයා ගන්න, පැවැත්මේ අර්ථය හොයා ගන්න අසිරිමත් දේවල් කිහිපයක් තිබෙනවාය කියලා අපි හිතනවා, ගරු කථානායකතුමනි. අපි ඒවා නැවත හඳුන්වා දිය යුතුයි. ඒ හරහා තාරුණ්‍යය නැවත දිශාගත කළ යුතුයි. අපි දන්නවා, ක්‍රීඩාව, කලාව, සාහිත්‍යය, සංස්කෘතිය, සමාජීය ආයතන කියන මෙන්න මේ දේවල්වලින් තමයි මිනිස් සමාජයක් විධියට අපේ අධ්‍යාත්මයට උත්තර හොයන්නේ කියන එක. ඒ හරහා තමයි අපේ අධ්‍යාත්මය අපි සන්තෘප්ත කරන්නේ. එම නිසා අපේ තරුණ පරම්පරාවට පසුගිය කාලය පුරාවටම මඟ හැරිලා තිබෙන්නේ මෙන්න මේවායි.

විශේෂයෙන්ම 1980න් පස්සේ අපේ රටේ ආර්ථික ක්‍රියාවලිය සහ රාජ්‍ය මූල්‍ය ක්‍රියාවලිය තුළ ක්‍රීඩාව, කලාව, සාහිත්‍ය සම්බන්ධයෙන් අවධානය යොමු වුණේ අඩුවෙන්. මොකද, අපි හැම වෙලාවේදීම උත්සාහ කළේ මේ භෞතික අවශ්‍යතා සම්බන්ධයෙන්, පරිභෝජනවාදී භෞතික ජීවිතය සම්බන්ධයෙන්. ආර්ථික ක්‍රියාවලිය හැඩගස්වන්න, සමාජ ක්‍රියාවලිය හැඩගස්වන්න තමයි පසුගිය කාලයේ පැවති සෑම ආණ්ඩුවකම ආර්ථික ප්‍රතිපත්ති සකස් වෙලා තිබුණේ. අන්න ඒ නිසා තමයි, අද වනවිට අපේ තාරුණ්‍යය අතරමං වෙලා තිබෙන්නේ, තාරුණ්‍යයට අනාගතය පිළිබඳව විශ්වාසයක් නැති වෙලා තිබෙන්නේ. මේ මත්ද්‍රව්‍ය තුරන් කිරීම සම්බන්ධයෙන් අපි අවංකව, ඉතාම වුවමනා සහගත වැඩ පිළිවෙළක් සකස් කරනවා නම්, ඒ වැඩ පිළිවෙළ තුළින් මත්ද්‍රව්‍ය සම්බන්ධ සැපයුම් ජාලය මර්දනය කිරීම සඳහා වන නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීම, ඒ නීතියේ ආධිපත්‍යය වෙනුවෙන් ක්‍රියාත්මක වන ආයතන ශක්තිමත් කිරීම, නීතිය දේශපාලන පක්ෂග්‍රාහීත්වයකින් තොරව ක්‍රියාත්මක කිරීම ආදී කටයුතු සිදු කළ යුතු වෙනවා. මේ වාගේ ක්‍රියාත්මක වීම්වලින් මත්ද්‍රව්‍ය සම්බන්ධ සැපයුම් ජාලය පාලනය කරනවා, මර්දනය කරනවා. ඒ වාගේම, මේ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වුවමනාවක්, ඉල්ලුමක් ඇති වෙන්න අවශ්‍ය කරන ඒ සමාජීය සාධක වළක්වන්න වාගේම ඒවා ඇති නොවන ආකාරයෙන් කටයුතු කරන්න නම් ක්‍රීඩාව, සාහිත්‍යය, සමාජ සංවිධාන මේ තාරුණ්‍යය බලගන්වන්න, තාරුණ්‍යයට විශ්වාසයක් ඇති වන ආකාරයට කටයුතු කරන්න ඕනෑ.

ඒ වාගේම ක්‍රීඩාවට, සාහිත්‍ය කටයුතුවලට සම්බන්ධ වෙන්න කියලා අපි නැවත ආයාචනය කරන්න ඕනෑ. එම නිසා ගරු ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා ගෙනා යෝජනාවට අපි සියලුදෙනා සහයෝගය දෙන්න ඕනෑ. ආගමික සංස්ථාව, පාසල් ඇතුළු සමාජයේ සියලුදෙනා ඒකාබද්ධ කර ගත් වැඩ පිළිවෙළකට අපි යන්න ඕනෑ. ඒ හරහා මිසක්, නැත්නම් යම් කාල රාමුවක් ඔස්සේ සැලසුම්සහගතව කරන මැදිහත් වීමක් හරහා මිසක් අපට මේ මත්ද්‍රව්‍ය ජාලය මැඩ පවත්වන්න පුළුවන් වෙයි කියලා, අපේ තරුණ පරම්පරාව බේරා ගන්න පුළුවන් වෙයි කියලා අපි හිතන්නේ නැහැ. නමුත්, මේ සමාජයේ සියලු දෙනාගේම සහයෝගය ලබා ගන්න යාමේදී අපට පොඩි ප්‍රශ්නයක් මතු වෙනවා. ඒ වාගේම, මේ ක්‍රියාවලිය සඳහා අපට පාර්ලිමේන්තුව ඇතුළේ විපක්ෂයේ සහයෝගය ලබා ගන්නවාද, නැද්ද කියන එක සම්බන්ධයෙනුත් අපට නැවත හිතන්න වෙනවා. මොකද, පසුගිය කාලයේ කරපු වැටලීම්වලින් අත්අඩංගුවට ගත් අපරාධකරුවන්ගෙන් කළ ප්‍රශ්න කිරීම්වලින් හෙළිදරව් වුණු කාරණා අනුව, පසුගිය වැඩි කාලයක් ආණ්ඩු කරපු පොහොට්ටුවේ හිටපු මන්ත්‍රීවරු, අපේක්ෂකයෝ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පවා ඒවාට යම් ආකාරයක සම්බන්ධයක් තිබෙනවාදෝ කියන සැකය අද වෙනකොට ජනතාව අතර මතුවෙලා තිබෙනවා. ඒ වාගේම මෑතකදී වුණු සිදුවීම් එක්ක සමගි ජන බලවේගයටත් පාතාලය එක්ක සම්බන්ධකම් තිබෙනවාද, සමගි ජන බලවේගයත් පාතාලය ආරක්ෂා කර තිබෙනවා නේද කියන එක ගැන නැවත පොඩ්ඩක් හිතන්න වෙනවා මේ ක්‍රියාවලියට සම්බන්ධ කරගැනීමේදී. මොකද, පාතාලය ප්‍රාදේශීය සභාව තුළටත් එන තැනට පත්වෙලාය කියනවා ඊයේ අපි මාධ්‍යවල දැක්කා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over.

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

ප්‍රාදේශීය සභාවටත් පාතාලය එන තැනට පත්වෙලාය කියනවා මම දැක්කා. *[බාධා කිරීමක්]* ප්‍රාදේශීය සභාවට පාතාලය ගෙනාවේ ඔබතුමන්ලා. ප්‍රාදේශීය සභාවේ සභාපති පුටුවේ පාතාල නායකයෙක් වාඩි කරවලා, දැන් කියනවා ප්‍රාදේශීය සභාවටත් පාතාලය එනවා කියලා. එම නිසා මීට වඩා වගකීම් සහගතව කටයුතු කරන ලෙස මම ගරු විපක්ෂ නායකතුමාගෙනුත් ඉල්ලනවා. සමාජයට වගකීම් සහගතව වැඩ කරන්න. අපි ලබන

30වැනිදා ජනාධිපතිතුමාගේ සහ මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් මේ කාර්යය ආරම්භ කරනවා. අපි මේ රටේ තරුණ පරම්පරාව ඒක රාශි කරගෙන මෙම ජාතික වැඩ පිළිවෙළ ආරම්භ කරනවා. පසුගිය කාලයේ අරගළයට සම්බන්ධ වුණු තරුණ පරම්පරාවට අපි මේ අවස්ථාවේ විවෘත ආරාධනයක් කරනවා. ඔබ මේ රටේ දැවැන්ත දේශපාලන වෙනසක් කරන්න සම්බන්ධ වුණා. අපි ඒ පරම්පරාවට නැවත ආරාධනයක් කරනවා. අපට කරන්න තව අරගළයක් තිබෙනවා. එහෙම නම්, අපේ රටේ තරුණ පරම්පරාව වෙනුවෙන් නව අනාගතයක් ගොඩනැඟීම සඳහා මත්ද්‍රව්‍ය ජාලය එක්ක හැප්පෙන්න, ඒක විනාශ කරන්න, තරුණ පරම්පරාවට නව දිශානතියක් ඇති කිරීම සඳහා වන අරගළයක් තිබෙනවා. එම නිසා අපි අරගෙන යන මේ වැඩ පිළිවෙළත් එක්ක එකතු වෙන්න කියන ඉල්ලීමත් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තූතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Mujibur Rahuman. You have 12 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

[පූ.භා. 11.36]

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අද ආණ්ඩු පක්ෂය විසින් ගෙනාපු සංවිධානාත්මක අපරාධ කල්ලි සහ මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහිව ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් වන යෝජනාව ගැන කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මෙම යෝජනාව සම්බන්ධයෙන් කථා කරනකොට තවත් නොයෙක් කථා මතු වුණා. අපිට දැන ගන්න ලැබුණා, ඊයේ පෙරවරුවේ වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති, සමගි ජන බලවේගයේ ලසන්ත වික්‍රමසේකර මැතිතුමාව ඝාතනය කළ බව. ලසන්ත වික්‍රමසේකර මැතිතුමා රාජකාරියේ යෙදී සිටියදී -ඔහුගේ මහජන දිනය පවත්වනකොට- ඔහුගේ කාමරයට ඇවිල්ලා ස්වයංක්‍රීය ගිනි අවියකින් මහ දවල් ඝාතනය කර තිබෙනවා. මන්ත්‍රීවරයෙක් සහ ප්‍රාදේශීය සභා සභාපතිවරයෙක් හැටියට ඉන්නකොට තමයි ඔහුව ඝාතනය කළේ. ඒ ඝාතනය තුළ අපට පෙනෙන හුඟක් දේවල් තිබෙනවා.

අපි දැක්කා, ඒ ඝාතනය සිදු වුණාට පස්සේ මේ ආණ්ඩුවේ මහජන ආරක්ෂක ඇමතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථාව පටන් ගත්තේ පාතාලය ගැන කියලා. මනුෂ්‍යයෙක් ඝාතනය වුණාම සාමාන්‍යයෙන් ශිෂ්ට සම්පන්න සමාජයක නම් ඉස්සෙල්ලාම ඔහු වෙනුවෙන් ශෝකය පළ කරලා තමයි කථාව පටන් ගන්නේ. නමුත් එතුමන්ලා ළඟ අඩුම ගණනේ ඒ ශිෂ්ට සම්පන්න ගති ගුණයවත් තිබුණේ නැහැ. කථාව පටන් ගත්ත තැනම එතුමා පාතාලයට සම්බන්ධයි කියලා හංවඩු ගහමින් කථා කළා. ඒ විතරක් නොවෙයි, ඒ ඝාතනය සාධාරණීකරණය කළා. ඒක තමයි භයානක තත්ත්වය. මම ලජ්ජා වෙනවා, ඇමතිතුමනි, ඔබතුමා වාගේ ඇමතිවරයෙක් එක්ක මේ පාර්ලිමේන්තුවේ වාඩි වෙලා ඉන්න සිද්ධ වීම ගැන. ඔබතුමා ඇවිත් ඒ ඝාතනය සාධාරණීකරණය කළා. ලසන්ත වික්‍රමසේකරව ඝාතනය කරපු ඝාතකයන් වෙනුවෙන් තමයි ඔබතුමා ඇවිත් පාර්ලිමේන්තුවේ අදහස් දැක්වුවේ. එහෙම නැතිව ඒකට විරුද්ධව නොවෙයි. ඔහුට විරුද්ධව අපරාධ චෝදනා තිබෙනවා නම්, නඩු තිබෙනවා නම්, වෙනත් ආකාරයේ ක්‍රියා පිළිබඳ චෝදනා තිබෙනවා නම් ඒවා උසාවියට දාලා ඔහුට දඬුවම් දෙන්න පුළුවන්. එහෙම නැතිව කවුරුවත් ඝාතනය කරන්න කාටවත් අයිතියක් නැහැ.

ජනාධිපතිතුමා කලින් මේ පාර්ලිමේන්තුවේදී මොකක්ද කිව්වේ? කලින් ආණ්ඩු කාලවල ඝාතන සිද්ධ වෙනකොට ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ කරපු පරණ කථා අහලා බලන්න. එතුමා හැම දාම නැඟිටලා කිව්වේ, "කාවවත් මරන්න බැහැ. ඒ මරණයට පත් වන කෙනාගේ ඉතිහාසය වැඩක් නැහැ. ඇයි ඔහුව මැරුවේ, කොහොමද මැරුවේ" වැනි කාරණා. ඇයි මරන්න ඉඩ දුන්නේ, කියන එක තමයි අනුර කුමාර දිසානායක මැතිතුමා හැම දාම මේ පාර්ලිමේන්තුවේ කථා කරමින් ඇහුවේ. එහෙමයි එතුමා කථා කළේ.

මොකක්ද, දැන් තමුන්නාන්සේ ඇවිත් කථා කළේ? තමුන්නාන්සේ කියනවා, එතුමා ළඟ තුවක්කු තිබෙනවා කියලා අර කොහෙන්ද ගෙනාපු සංවිධානාත්මක අපරාධකරුවන් කිව්වාය කියලා. දැන් ඔවුන් ගෙනැල්ලා සුමාන දෙකක් වෙනවා නේ. එතුමාව අත්අඩංගුවට ගන්න තිබුණා නේ, එහෙම තුවක්කු තිබෙනවා නම්. එතුමා නාම යෝජනා දීලා, සභාපතිවරයෙක් හැටියට පත් වෙලා මාස හයක් වෙනවා. එතුමා අපරාධකාරයෙක් නම්, එතුමාට නොයෙකුත් ආකාරයේ චෝදනා තිබෙනවා නම්, එතුමා ගැන තිබෙන චෝදනා ඔප්පු කරන්න පුළුවන් නම් අත්අඩංගුවට අරගෙන උසාවියට දමන්න තිබුණා නේ. ඇයි, එතුමාව ඝාතනය කළාට පස්සේ එතුමා ගැන නොයෙක් කථා කියන්නේ? මොකක්ද ඒකෙන් පෙන්වන්නේ? ඒකෙන් පෙන්වන්නේ, තමුන්නාන්සේලා ශිෂ්ට සම්පන්න නැහැ, තමුන්නාන්සේලා බොරු කරන්නේ, වෛරය, 1988-89 කාලයේ තිබුණු මානසිකත්වය තවම තමුන්නාන්සේලාගේ හිත්වල තිබෙනවා කියන එකයි. 1988-89 කාලයේ තිබුණු මානසිකත්වය තමයි ඊයේ ඇමතිතුමා ඇවිත් එළියට දැම්මේ. වෙන මොකක්ද? ඒක තමයි එතුමා කිව්වේ.

අපි අහන්නේ මේකයි. එතුමා නාම යෝජනා දීලා මාස තුනක් හිටියා, සභාපති වෙලා මාස තුනක් හිටියා. එතුමා එහෙම වැරැදි කරලා තිබෙනවා නම්, අත්අඩංගුවට අරගෙන උසාවියට ඉදිරිපත් කරන්න තිබුණා. එහෙම කරන්නේ නැතිව එතුමාව ඝාතනය කරන්න අවශ්‍ය පරිසරය තමුන්නාන්සේ හැදුවා කියන සැකය අපට තිබෙනවා. තමුන්නාන්සේ වගකියන්න ඕනෑ. මොකද, තමුන්නාන්සේගේ ඊයේ කථාවෙන් ඒක තමයි තේරුණේ. අර කථාවක් තිබෙනවා නේ, "හොරාට කලින් කෙහෙල් කැන වැට පනිනවා" කියලා. අන්න ඒ වාගේ කථාවක් තමයි ඊයේ මෙතැනට ඇවිත් කළේ. හොඳට මතක තියාගන්න, හොරාට කලින් කෙහෙල් කැන වැට පැන්නා. තමුන්නාන්සේ ඊයේ ඇවිල්ලා ඒ ඝාතනය සාධාරණීකරණය කළා. ශිෂ්ට සම්පන්න සමාජයක ඕක බලාපොරොත්තු වෙන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. ශිෂ්ට සම්පන්න සමාජයක් නම්, මිනිහෙක් මැරුණාම ඔහු මොන අපරාධකාරයෙක් වුණත් ඒ මනුෂ්‍යාගේ මරණයට ගෞරව කරනවා. එහෙම තමයි ශිෂ්ට සම්පන්න සමාජය.

තමුන්නාන්සේලා ආවේ ලස්සන රටක් හදන්න; පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් හදන්න; ශිෂ්ට සම්පන්න රටක් හදන්න. අලුත් දේශපාලන සංස්කෘතියක් හදනවා කිව්වා. ජනාධිපතිතුමා

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

හැම දාම කථා කළේ අලුත් සංස්කෘතියක් ගැනයි. මේකද, ඔබතුමන්ලා ඉදිරිපත් කළ අලුත් සංස්කෘතිය? මේ සංස්කෘතිය හදන්නද තමුන්නාන්සේලාට මේ රටේ ජනතාව බලය දුන්නේ? මේ සංස්කෘතිය හදන්නද? තමුන්නාන්සේලා 2005දී බලයට ගෙනාපු අය අවුරුදු 10ක්, 15ක් ගෙනාපු සංස්කෘතිය තමයි තමුන්නාන්සේලාත් ඉදිරියට ගෙනියලා තිබෙන්නේ. ඒක මතක තියාගන්න. දැන් කියනවා නේ, මේක අපරාධ රාජ්‍යයක් කියලා. ඔය සංස්කෘතිය තමයි 2005දී බලයට ආපු අය හදපු සංස්කෘතිය. ඒ සංස්කෘතිය තමයි තමුන්නාන්සේලා ඉදිරියට අරගෙන යන්නේ. ඊයේ කථාවත් එක්ක තමුන්නාන්සේ ඇවිත් කැලෑ නීතිය වෙනුවෙන් පෙනී සිටියා. තමුන්නාන්සේ ඊයේ කැලෑ නීතිය ආරක්ෂා කළා. තමුන්නාන්සේ ඇමතිවරයෙක් හැටියට අඩුම ගණනේ පාර්ලිමේන්තුවට කියන්න තිබුණා, "මේ සාතනය කරපු අය කවුද කියලා අපි හොයනවා, අපි ඒ අයව වහාම අත්අඩංගුවට ගන්නවා" කියලා. මේ පිළිබඳ නීතිය ක්‍රියාත්මක කරනවා කියන එක ඊයේ නීතිය පිළිබඳ ඇමතිවරයාගේ කටින් ආවේ නැහැ. ඒවා ආවේ නැහැ. නීතිය පිළිබඳ ඇමතිවරයා ඇවිල්ලා ඒ මැරුණු මනුෂ්‍යයාගේ ඉතිහාසය ගැන කිව්වා. මරපු අයව අල්ලන එක ගැන නොවෙයි කථා කළේ. මැරුණු මනුෂ්‍යයාගේ ඉතිහාසය කිව්වා. ලජ්ජා වෙන්න ඕනෑ ජනාධිපතිතුමනි, මේ වාගේ ඇමතිවරු පත් කළාට.

ඊළඟ කාරණය මේකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ජනාධිපතිතුමාගේ මාධ්‍ය අංශයෙනුත් මේක campaign කරනවා. ලජ්ජයි. අන්න අර උවිඳු කුරුකුලසූරිය ඔහුගේ ෆේස්බුක් පිටුවේ දාලා තිබෙනවා, එයාත් ලජ්ජා වෙනවා කියලා. ඒ, ආණ්ඩුව ආරක්ෂා කරන්න ඉන්න අය. උවිඳු ඔහුගේ ෆේස්බුක් පිටුවේ දාලා තිබෙනවා "ලජ්ජයි" කියලා. ජනාධිපතිතුමාගේ මාධ්‍ය අංශයත් දැන් ඒ මනුෂ්‍යයා ගැන campaign එක කරනවා. තමුන්නාන්සේලා සල්ලි දීලා ලොකු team එකක් හදලා තිබෙනවා, campaign කරන්න. අපටත් ගහනවා. මගේ ජාතිය ඇදලා බණිනවා. මගේ ආගම ඇදලා බණිනවා. ඒවා තමයි commentsවල තිබෙන්නේ. මම කථාවක් කරපු හැම වෙලාවකම මට බණිනවා. මගෙන්, කොන කපලාද කියලා අහනවා; ඌරු මස් කනවාද කියලා අහනවා. ඔව්, මගේ කොන කපලා තමයි තිබෙන්නේ. කොන කැපුවාම ඔයගොල්ලන්ට පාන්ද? ඒ comments දාන කට්ටියට ඒක කියන්න. මේවා ඔයගොල්ලන්ගේ කට්ටිය දාන comments. ජාතිවාදයට විරුද්ධයි කිව්වා. මොන විරුද්ධද? ඒ අය තමුන්නාන්සේලාගේ ගෝල බාලයෝ. මඩ ගහන බලකායවල් හදලා. ජාතිවාදය නැති කරන්න ආවා කිව්වාට අපි කථාවක් කළාම තමුන්නාන්සේලාගේ කට්ටිය ඔක්කෝම දාන comments මොනවාද කියලා පහළට ගිහිල්ලා බලන්න, පුනරුදයේ profile photos දමාගෙන, ජනාධිපතිතුමාගේ photo දමාගෙන. ඒ ඔක්කෝම ජාතිවාදී comments. ඇයි ඒ? උත්තර දී ගන්න බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සංස්කෘතිය නැති කරන්න කියලායි මෙතුමන්ලා බලයට ආවේ. මේ සංස්කෘතිය නැති කරන්න කියලා ආපු උදවිය, 2005දී තමුන්නාන්සේලා විසින්ම බලයට ගෙනාපු උදවියගේ සංස්කෘතිය තමයි මේ ඉස්සරහට අරගෙන යන්නේ. ඒක මතක තියාගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිතුමා දැන් හැම තිස්සේම කියනවා, අපරාධ රාජ්‍යයක් ගැන. මොකක්ද අපරාධ රාජ්‍යය? එතුමා කියනවා, භාර ගත්තේ අපරාධ රාජ්‍යයක් කියලා. අපරාධ රාජ්‍යය භාර අරගෙන, දැන් මේ යන්නේත් අපරාධ රාජ්‍යයක් තමයි. දැනුත් අපරාධ සිදු වෙනවා. මහ දවල් උසාවිය ඇතුළට ඇවිල්ලා වෙඩි තියලා යනවා. මහ දවල් ප්‍රාදේශීය සභාව ඇතුළට ඇවිල්ලා වෙඩි තියලා යනවා. පාර්ලිමේන්තුව ඇතුළේ විතරයි වෙඩිල්ලක් පත්තු නොවුණේ. සමහර විට පාර්ලිමේන්තුව ඇතුළේත් ඒක වෙයිද දන්නේ නැහැ. මොකද, 1987 කාලයේ මේ පාර්ලිමේන්තුවට ග්‍රෙනේඩ් එකක් ගහපු උදවිය තමයි අද බලයේ ඉන්නේ. මොකක්ද තිබෙන සහතිකය, පාර්ලිමේන්තුවේ එහෙම වෙන්නේ නැහැ කියන්න? එදා ඉන්දු-ලංකා ගිවිසුම එනකොට පාර්ලිමේන්තුවට ග්‍රෙනේඩ් එකක් ගැහුවා. ඒ ග්‍රෙනේඩ් එක ගහපු උදවිය තමයි අද බලය අරගෙන තිබෙන්නේ. කොහොමද, එහෙම වෙන්නේ නැහැ කියන්නේ? ඒකත් වෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ අපරාධ රාජ්‍යය බරපතළ තැනකට අරගෙන ඇවිල්ලා තිබෙනවා. ජනාධිපතිතුමා කියන මේ අපරාධ රාජ්‍යය හැදුවේ කවුද? මේ ජනාධිපතිතුමන්ලා 2005දී බලයට ගෙනාපු උදවියට නේද, දැන් තමුන්නාන්සේලා දෝෂාරෝපණය කරන්නේ? එහෙම නම් තමුන්නාන්සේලා 2005දී බලයට ගෙනාවේ, God Father කෙනෙක්. මොකද, ඒගොල්ලන් නේ අපරාධ රාජ්‍යය හැදුවේ. තමුන්නාන්සේලා අපරාධ රාජ්‍යයක් ගැන කියනවා නේ; ඒගොල්ලන්ට නේ බණින්නේ. තමුන්නාන්සේලා ඒකේ හවුල්කාරයෝ. එහෙම නම් මහින්ද රාජපක්ෂ God Father. ඒ God Father බලයට ගෙනාවේ ඔයගොල්ලෝ. අපි නොවෙයි. ඔහු බලයට ගෙනැල්ලා දැන් ඇවිල්ලා නහයෙන් අඬනවා, "අපි අපරාධ රාජ්‍යයක ඉන්නේ" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "සිරස" මාධ්‍යවේදී සුරංග සේනානායක මහත්මයා Dr. Shafi ගැන පොතක් නිකුත් කළා. ඒ පොත එළි දැක්වීමේ උත්සවයට ජනතා විමුක්ති පෙරමුණේ ලේකම් ටිල්වින් සිල්වා මැතිතුමා, බිමල් රත්නායක ඇමතිතුමා, නලින්ද ජයතිස්ස ඇමතිතුමා ඇතුළු අය සහභාගි වෙලා හිටියා. ඒක හොඳ දෙයක්. ඒ සහභාගි වීම ගැන ගැටලුවක් නැහැ. නමුත් වෙනත් ගැටලුවක් තිබෙනවා. මොකක්ද තිබෙන ගැටලුව? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ මගේ අතේ තිබෙන්නේ, 2019 මැයි මාසයේ 23වැනි දා "දිවයින" පුවත් පත. මොකක්ද බලන්න, මේ headline එක? "සිසේරියන් සැත්කම්වලින් පසු තව්හිද් ජමාත් දොස්තර සිංහල බෞද්ධ මව්වරුන් 4,000ක් වද කරලා. සාක්ෂි සහිතව තොරතුරු හෙළිවේ. දොස්තර අල්ලන්න පුළුල් පරීක්ෂණ" මෙය වාර්තා කරලා තිබෙන්නේ, රන්දුනු කියන වාර්තාකරු. මේක 2019 මැයි මාසයේ 23වැනි දා "දිවයින" පුවත් පතේ headline එක. ඒ පිළිබඳව පරීක්ෂණයක් කළා. ඒ පරීක්ෂණ වාර්තාවෙන් මොකක්ද කියන්නේ? ඒ නඩුව යනකොට මා හිතන විධියට සී.ඩී. වික්‍රමරත්න මැතිතුමා එදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට -ශානි අබේසේකරටයි, රවී සෙනෙවිරත්නටයි - කිව්වා පරීක්ෂණයක් කරන්න කියලා. එතුමන්ලා පරීක්ෂණයක් කළා. එතුමන්ලා පරීක්ෂණයක් කරලා, කුරුණෑගල මහෙස්ත්‍රාත් උසාවියට වාර්තාවක් ඉදිරිපත් කළා. ඒ වාර්තාව මම සභාගත කරන්නම්. ඒ පරීක්ෂණ කණ්ඩායමේ නායකත්වය දැරුවේ, එදා හිටපු පොලිස් අධිකාරි තිසේරා මැතිතුමා. ඒ වාර්තාවේ තිබෙනවා, එදා දොස්තර ෂාෆි අත් අඩංගුවට ගන්න කුමන්ත්‍රණය කළා කියලා එදා හිටපු කොට්ඨාස භාර නිලධාරි SP මහින්ද දිසානායකයි, - දැන් මෙතුමන්ලා එතුමාව promote කරලා තිබෙනවා - එදා හිටපු DIG කිත්සිරි ජයලත් මැතිතුමායි කූට ලේඛන හදලා කුමන්ත්‍රණයක් කළා කියලා. ශානි අබේසේකරයි, රවී සෙනෙවිරත්නයි, තිසේරා මැතිතුමායි එකතු වෙලා වාර්තාවක් හදලා කුරුණෑගල මහෙස්ත්‍රාත්තුමාට ඉදිරිපත් කර තිබෙනවා. මේ, එම වාර්තාව. මම මේ වාර්තාව සහ අනෙකුත් ලේඛන **සභාගත*** කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

මේ වාර්තාවේ තිබෙනවා, ඒක කුමන්ත්‍රණයක් කියලා. ඒ ඉදිරිපත් කරපු වාර්තාවට අනුව, කූට ලේඛන හදලා ඒ කුමන්ත්‍රණය කරපු අයට දැන් promotions දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahuman, you have only two minutes remaining of the time allotted to you.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
හොඳමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ අයට promotions දීලා තිබෙනවා. ඒ, SP මහින්ද දිසානායකට promotion එකක් දීලා තිබෙනවා; මහින්ද දිසානායකව DIG කරලා තිබෙනවා. ඒ කවුද? ඒ, Dr. Shafiව ඇතුළට දමන්න කුමන්ත්‍රණය කරපු SP. මේ තිබෙන්නේ ඒ වාර්තාව; ශානිලාගේ වාර්තාව; ශානියි, රවී සෙනෙවිරත්නයි හදපු වාර්තාව. දැන් මම අහනවා ශානිගෙන් හා රවීගෙන්, "ලජ්ජා නැද්ද ශානි? ලජ්ජා නැද්ද රවී?" කියලා. තමුන්නාන්සේලා වැරැදිකාරයා කියපු කෙනාටම දැන් මේ ආණ්ඩුව යටතේ promotion එකක් දීලා DIG කරලා තිබෙනවා. කොහොමද? අරහේ යනවා, ෂාෆිගේ පොත නිකුත් කරන එකට. මෙහේ, අපරාධ රාජ්‍යයේ කොටස්කාරයන්ට promotions දෙනවා. කොහොමද, අපරාධ රාජ්‍යය? ලජ්ජයි නේද? ජනාධිපතිතුමනි, ලජ්ජා වෙන්න. බොරු කියන්න එපා. ඔබතුමාගේ යාළුවා පොලිසිය භාර ඇමති කරලා. මේක උසාවියට ඉදිරිපත් කරපු වාර්තාවක්.

ඒ විතරක් නොවෙයි. මේ වාර්තාවේ තවත් දෙයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ මාධ්‍යවේදියාව CID එකට ගෙනැල්ලා ප්‍රශ්න කරනවා, "කවුද ඔයාට මේ තොරතුරු දුන්නේ?" කියලා. එයා මොකක්ද කියන්නේ? රන්දුනු කියන මාධ්‍යවේදියා කියනවා, එදා කුරුණෑගල DIG කිත්සිරි ජයලත් මැතිතුමා තමයි මට මේ කථාව කිව්වේ කියලා. ඒක මේ වාර්තාවේ කියනවා. ඔහු දැන් දකුණු පළාතේ Senior DIG. කොහොමද පුනරුදය? කොහොමද අපරාධ රාජ්‍යය? අපරාධ රාජ්‍යය නැති කරනවා කියලා නේ තමුන්නාන්සේලා ආවේ. ඒ විතරක් නොවෙයි, තව දෙයක් තිබෙනවා. ඊයේ පෙරේදා දවසක කිත්සිරි ජයලත් මැතිතුමාට විරුද්ධව මාධ්‍යවේදියෙක් ගිහිල්ලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පැමිණිල්ලක් දැම්මා. ඒ පැමිණිල්ල දාපු ගමන් වර්තමාන IGP මහත්මයා මොකක්ද දන්නවාද කළේ? CID එකට ලියුමක් යවනවා, මාධ්‍යවේදියාව අත්අඩංගුවට ගන්න කියලා. ශානි කිව්වා, බැහැයි කියලා. මාධ්‍යවේදියාව අත්අඩංගුවට ගන්න කියලා, අලුත් IGP, CID එකට ලියුමක් යවනවා. ශානි කිව්වා, බැහැයි කියලා. කටඋත්තරයක් අරගෙන මාධ්‍යවේදියාව යැව්වා. මේවා අපරාධ රාජ්‍යයක ගමන් මඟ නොවෙයිද? අපරාධ රාජ්‍යය තවම ආරක්ෂා කරන්නේ නැද්ද?

එදා, දොස්තර ෂාෆිගේ ප්‍රශ්නය නිසා මේ රටේ හිටපු මුස්ලිම් දොස්තරලා රට දාලා ගියා. ඒ ඇයි? සිංහල කාන්තාවෝ ඒ දොස්තරලා ළඟට බෙහෙත් ගන්න ගියේ නැහැ. මුළු රටම කැලඹුවා, ඒ ප්‍රශ්නය උඩ. එදා මේ රටේ පාරේ බැහැලා යන්න බැරි වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේත් ඒක දන්නවා. එහෙම තත්ත්වයක් මේ රටේ නිර්මාණය වුණා. ඒ තත්ත්වය නිර්මාණය කරපු SP මහත්මයාටයි, DIG මහත්මයාටයි මේ ආණ්ඩුව ඇවිල්ලා promotions දීලා, අරහේ යනවා ෂාෆි ගැන පොත් නිකුත් කරන උත්සවයට. මොන ලජ්ජා නැති වැඩක්ද, මැතිතුමනි! එක්කෝ ෂාෆි එක්ක ඉන්න, එක්කෝ DIG එක්ක ඉන්න. දෙපැත්තේ කකුල තියාගෙන ඉන්න එපා. මේ වාගේ ඩබල් ගේම් ගහන්න එපා. "අපරාධ රාජ්‍යය නැති කරනවා, නැති කරනවා" කිය කියා තමුන්නාන්සේලා අපරාධ රාජ්‍යයේ කොටස්කාරයන්ව ආරක්ෂා කළා විතරක් නොවෙයි, ඒ අපරාධ රාජ්‍යයේ කොටස්කරුවන්ට තමුන්නාන්සේලා උසස්වීම් පවා ලබා දීලා තිබෙනවා. ඒක තමයි ඇත්ත කථාව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ළඟ තවත් ලියුමක් තිබෙනවා. මොකක්ද මේ ලියුම? මේ ලියුම 2019.07.27වැනි දා ලියපු එකක්; එදා හිටපු DIG සී.ඩී. වික්‍රමරත්න මැතිතුමා පොලිස් කොමිසමට යවපු ලියුමක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahuman, you have completed the additional two minutes given to you.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Okay, Sir.

මොකක්ද, මේ යවපු ලියුම? කුරුණෑගල ප්‍රශ්නය සම්බන්ධව එදා හිටපු SP මහින්ද දිසානායකවයි, කිත්සිරි ජයලත්වයි වහාම එතැනින් මාරු කරන්න, මොකද, මේ පරීක්ෂණ කරන්න ඕනෑ, මේ වාර්තාව අනුව මේ පරීක්ෂණ කරනවා නම්, ඒ නිලධාරින් එතැන ඉන්න බැහැ කියලා ඒකේ සඳහන් කරනවා. එහෙම තමයි එදා ලියලා තිබෙන්නේ. එතකොට මෙච්චර ලියකියවිලි තිබියදීත්, එච්චර අපරාධයක් කරපු අපරාධකාරයන්ව ආරක්ෂා කරනවා නේද,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ආරක්ෂා කරනවා. ජනාධිපතිතුමා එක පැත්තකින් ඇවිල්ලා කියනවා, අපරාධ රාජ්‍යය නැති කරන්න ඕනෑ කියලා. ඒ කියන ගමන් තමන්ගේ ආණ්ඩුව ඇතුළේ ඉන්න තමන්ගේ හිතවත් අයව, තමන්ගේ මැති ඇමතිවරුන් එක්ක ඉන්න හිතවත් අයව තමුන්නාන්සේලා ආරක්ෂා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahuman, your time is up. Would you please wind up?

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Sir, give me only a minute. මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

ලසන්ත වික්‍රමතුංගගේ නඩුව තවම දැම්මේ නැහැ, කීත් නොයාර්ගේ නඩුව තවම දැම්මේ නැහැ, පෝද්දල ජයන්ත ගැන විමර්ශනවත් නැහැ. පෝද්දල ජයන්ත තවම කඩේ යනවා, ඒ වුණාට තවම එයාට විමර්ශනවත් නැහැ. ඊළඟට, "සිරස" මාධ්‍ය ආයතනයට ක්ලේමෝ බෝම්බ ගැහුවා. ඒකට පරීක්ෂණ ආරම්භ කළේත් නැහැ. Lanka eNews එකට ගිනි තිබ්බා. ඒ පරීක්ෂණ ආරම්භ කළේ නැහැ. "සියත"ට ගිනි තිබ්බා; පරීක්ෂණ ආරම්භ කළේ නැහැ. "උදයන්" පුවත් පත් කාර්යාලයට ගැහුවා; පරීක්ෂණ

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ආරම්භ කළේ නැහැ. ජනාධිපතිවරණයේදී තමුන්නාන්සේලා මේ රටේ ජනතාවට පොරොන්දුවක් දුන්නා මේ හැම අපරාධයක්ම එළියට ගන්නවා කියලා. නමුත්, අද අපට පෙනෙන්න තිබෙනවා, ඒ අපරාධකාරයෝ ටික එකතු වෙලා මේ ආණ්ඩුව අල්ලාගෙන ඉන්න නිසා ඒ සියලු අපරාධ ජනාධිපතිතුමාගේ වචනයෙන් බැලුවොත් කාලයේ වැලි තලාවේ යට හංගන්න තමුන්නාන්සේලා වැඩ කරනවාය කියන එක. ඒ කාරණය මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Ananda Wijepala. You have 16 minutes.

[පූ.භා. 11.54]

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ගරු ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා මේ සභාවට ඉදිරිපත් කළා, මත්ද්‍රව්‍ය උවදුර තුරන් කිරීම සඳහා රජය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන "රටම එකට" ජාතික මෙහෙයුමට අදාළ යෝජනාවක්. ඒ පිළිබඳ විවාදයේදී මට කථා කරන්න අවස්ථාවක් ලබා දීම ගැන ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. ඔබතුමා දන්නවා, මත්ද්‍රව්‍ය ව්‍යසනය රට පුරා ප්‍රබල ව්‍යසනයක් බවට පත් වෙමින් තිබෙන බව. මේ ව්‍යසනය සෑම සමාජ තීරුවකම ඔඩු දුවලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොලීසියේ, හමුදාවල මත්ද්‍රව්‍ය භාවිත කරන පිරිස් ඉන්නවා. ඒ විතරක් නොවෙයි, පාසල් සිසුන්, විශ්වවිද්‍යාල සිසුන් මත්ද්‍රව්‍ය භාවිත කරනවා. මේක සමාජ ව්‍යසනයක් බවට පැතිර යමින් යනවා. අපි කාලයක් තිස්සේ හඳුනාගෙන හිටියේ මේ මත්ද්‍රව්‍ය මේ රටට විදේශ රටවලින් පැමිණෙනවා කියලායි. නමුත්, අපි මෑතකදී හඳුනා ගත්තා, මේ රට තුළත් මත්ද්‍රව්‍ය නිෂ්පාදනය වන බව. ප්‍රබල ලෙස ව්‍යාප්ත වෙලා තිබෙන මේ ව්‍යසනය වළක්වා ගැනීම සඳහා අපි ආණ්ඩුව හැටියට තීන්දුවක් ගත්තා. විශේෂයෙන් පසුගිය දවසක අපේ අමාත්‍ය මණ්ඩලය තීන්දු කරලා, ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික සභාවක් මේ වෙනුවෙන් නිර්මාණය කළා. සියලු ආගමික නායකතුමන්ලා ඒ සභාවේ ඉන්නවා. ඊට අමතරව, අධ්‍යාපන ක්ෂේත්‍රය, සෞඛ්‍ය ක්ෂේත්‍රය, පුනරුත්ථාපන ක්ෂේත්‍රය යන සියල්ල ඒකාබද්ධ ව්‍යුහයක් ලෙස සකස් කරලා, මත්ද්‍රව්‍ය ව්‍යසනයෙන් මේ රටේ අනාගත පරපුරත්, මේ රටේ පුරවැසියනුත්, තරුණ පරපුරත් බේරා ගැනීමේ දැවැන්ත වැඩ පිළිවෙළකට අපි යොමු වෙලා තිබෙනවා. ඒ සඳහා වූ ජාතික උත්සවය ලබන 30වැනි දා සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයෙන් ඇරඹෙනවා. මහජන ආරක්ෂක කමිටු, පොලීසිය, ත්‍රිවිධ හමුදා සාමාජිකයන්, රාජ්‍ය නිලධාරීන්, පළාත් පාලන ආයතන සහ පළාත් සභා නිලධාරීන් යන මේ සියලුදෙනාගේ ඒකාබද්ධතාවෙන් යුතුව රටම එකට එකතු වෙලා සිදු කරන මේ ජාතික වැඩ පිළිවෙළට මෙහෙයුම් යන්ත්‍රණයක් හැටියට දිස්ත්‍රික් මෙහෙයුම් යන්ත්‍රණයක් මේ වනකොට අපි ක්‍රියාත්මක කරමින් පවතිනවා.

තල 4ක් ඔස්සේ මේ මෙහෙයුම අපි ක්‍රියාත්මක කරනවා. ඉහළින්ම ජාතික සභාව. දෙවනුව, දිස්ත්‍රික් මෙහෙයුම්. තුන්වනුව, ප්‍රාදේශීය මට්ටමේ මෙහෙයුම්. අවසාන එක ලෙස මහජන ආරක්ෂක කමිටු 14,000ක් හදලා තිබෙනවා. ඒ 14,000ට සම්බන්ධ වන ව්‍යුහාත්මක වැඩ පිළිවෙළක් දියත් කරලා මේ රටින් සඳහටම මත්ද්‍රව්‍ය තුරන් තුරන් කිරීමේ කාර්යභාරයට මේ වනකොට අපි අත ගහලා තිබෙනවා.

ඒ නිසා අද අපේ ගරු මන්ත්‍රීතුමා ගෙනාපු මේ යෝජනාව අතිශයින්ම කාලෝචිතයි. මත්ද්‍රව්‍ය ගැන කථා කරනකොට අපට කියන්න තිබෙන්නේ මේකයි. සංවිධානාත්මක අපරාධ මේ මත්ද්‍රව්‍ය හා ඍජු සබඳතාවක් තිබෙනවා. මේක හරියට කාසියේ දෙපැත්ත වාගෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආරම්භයේ ඉඳලාම මේ රට අපරාධකරුවන්ගේ දේශයක් බවට පත් වෙලා තිබුණා. හැම වෙලාවේම මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ ඍජුවම එකිනෙකට සම්බන්ධ වෙලා තිබුණා. ඔබතුමන්ලා කවුරුත් දන්නවා, මේ රටේ ජනතාව දන්නවා, පසුගිය වකවානු පුරාම පැවති රජයන් මේවා පෝෂණය කළ බව.

ගෝනවල සුනිල්ගෙන් ආරම්භ කළොත්, ඔබතුමන්ලා දන්නවා ඔහුට මුළු දිවයිනට බලපාන පරිදි සාම විනිසුරුකමක් දුන් බව. ඒ වෙලාවේ රනිල් වික්‍රමසිංහ මහත්මයා බියගම මන්ත්‍රීවරයා හැටියට ඔහුගේ නම නිර්දේශ කරලා මුළු දිවයිනට බලපාන විධියට සාම විනිසුරුකම් දුන්නා. මේ අය පාතාල කණ්ඩායම් හරහා තමයි තම බලය පවත්වා ගෙන ගියේ. මේවාට මත්ද්‍රව්‍ය සම්බන්ධ වෙලා තිබුණා. ඊළඟට, බැද්දගානේ සංජීව කවුරු ළඟ ද හිටියේ කියලා කවුරුත් දන්නවා. ඔහු හිටපු ජනාධිපතිවරයෙකුගේ bodyguard හැටියට හිටියා; ආරක්ෂාවට හිටියා. අවසානයේ පාතාල ක්‍රියාකාරකම් සහ මත්ද්‍රව්‍යවලට සම්බන්ධ වෙලා හිටියා. ඊළඟට, සොත්ති උපාලි. කවුරුත් දන්නවා සොත්ති උපාලි කා ගාවද හිටියේ කියලා. ඒක මේ රටම දන්නවා. අද සොත්ති උපාලිගේ පුතා කා ගාවද ඉන්නේ කියලා හොයලා බලන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ පාතාල ක්‍රියාකාරින් අදත් ඒ විධියටම ක්‍රියාත්මක වනවා. බලයේ ඉන්න දේශපාලනඥයෝ ළඟ නැති වුණාට, අනිත් අය ළඟ අඩු වැඩි වශයෙන් ඉන්නවා. මම කියන්නේ නැහැ මෙතැන ඉන්න මේ හැමෝම ඒවාට සම්බන්ධයි කියලා. යම් අය යම් සබඳතා පවත්වා ගනිමින් ඉන්නවා. මම ඊයේත් මේ පිළිබඳ ප්‍රකාශයක් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ ගරු විපක්ෂ නායකතුමා මතු කරපු ප්‍රශ්නය සම්බන්ධයෙන් තමයි මම ඊයේ පැහැදිලි කිරීම කළේ. මම ඒ වෙලාවේත් කිව්වා, කිසිදු ජීවිතයක් අවතක්සේරු කරන්නේ නැහැ, අපි සියලුදෙනාගේ ජීවිත සම වටිනාකමක් සහිතව අගය කරන දේශපාලන ව්‍යාපාරයක් බව. මම ඊයේත් කිව්වා, ඒ සිද්ධිය සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් කරනවා කියලා. ඊයේ ඒ සිද්ධිය අනාවරණ වූ වහාම මම ඍජු නියෝගයක් දුන්නා පොලිස්පතිවරයාටත්, CID එකේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කරවිට මහතාටත්, වහාම නීතිය ක්‍රියාත්මක කරලා, මෙහෙයුම් යන්ත්‍රණය දියත් කරන්න කියලා. ඒකට පොලිස් කණ්ඩායම හතරක් යෙදෙව්වා. ඒ පොලිස් කණ්ඩායම් හතර ක්‍රියාත්මක වෙලා තිබෙනවා. මේ වනකොට සාර්ථක තොරතුරු ලැබිලා තිබෙනවා. අපි දින දෙක තුනක් ඇතුළත එම සිද්ධියට සම්බන්ධ සියලුදෙනා අත්අඩංගුවට ගන්නවා. ඒ සඳහා වූ නියෝග දීලා තිබෙනවා. ඒ තොරතුරු ලැබෙමින් තිබෙනවා. එතුමා එවැනි ඝාතනයකට ලක් වීම ගැන අපි කනගාටු වෙනවා. මම ඊයේත් ගරු සභාවේදී මෙය ප්‍රකාශ කළා. ඔවුන් පාතාලයේද, වෙනත් කණ්ඩායමකද, නීති විරෝධී කටයුතු කරන කෙනෙක්ද කියන කාරණා අපට අදාළ නැහැ, අපි හැම ජීවිතයක්ම- *[බාධා කිරීම්]* හැම ජීවිතයක්ම සුරක්ෂා කරන්න අපි බැඳිලා ඉන්න බව. *[බාධා කිරීම්]* හැම ජීවිතයකම වටිනාකම අපි හොඳින් තේරුම් අරගෙන තිබෙනවා. *[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහරු බියට පත් වෙලා තිබෙනවා. සමහරු කලබල වෙලා තිබෙනවා. සමහරු බියට පත් වෙලා, කලබල වෙලා දඟලනවා. ඒවා අපට කිසිදු අදාළත්වයක් නැහැ. අපි මේ රටේ ජනතාවට දීපු පොරොන්දුවක් තිබෙනවා, මේ රටේ නීතිගරුක සමාජයක් හදනවා කියලා.

අපි පොලීසිය දේශපාලනීකරණයෙන් නිදහස් කරලා තිබෙනවා. සමහර අය දන්නේ නැහැ promotions දෙන විධිය. සමහර අය හිතාගෙන ඉන්නේ අර පරණ ක්‍රමයට ඇමතිවරයාගේ ලැයිස්තුවට තමයි පොලීසියේ promotions දෙන්නේ කියලා. එහෙම නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. [බාධා කිරීම්] ජාතික පොලිස් කොමිසම හරහා තමයි, පොලීසියේ උසස්වීම් ඇතුළු සියල්ල සිද්ධ වෙන්නේ. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි හැම වෙලාවේම පොලීසිය දේශපාලනීකරණයෙන් නිදහස් කරලා, සක්‍රියව වැඩ කරන දිශානතියකට යොමු කර තිබෙනවා. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Members of the Opposition, would you please listen to the Hon. Minister?

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
නීතිය නීතිය ක්‍රියාත්ම කරනකොට සමහර අය භය වෙලා තිබෙනවා. අල්ලස් හා දූෂණ, මූල්‍ය අවභාවිත පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරනකොට සමහරු කලබල වෙලා තිබෙනවා. අපි ඒවා නිසා කිසිසේත්ම පසුබට වෙන්නේ නැහැ. අපි ඕනෑම අභියෝගයක්- *[බාධා කිරීම්]* අපි ඕනෑම අභියෝගයෙන් භාරගෙන මත්ද්‍රව්‍ය උවදුර සහ පාතාල ක්‍රියාකාරකම් මේ රටින් තුරන් කිරීමට කටයුතු කරනවා. ඒ සඳහා හොඳ සැලැස්මක්, දැක්මක් සහ වැඩ පිළිවෙළක් මේ වනකොට බිමේ එළලා තිබෙනවා. තවම අවුරුද්දයි ගත වුණේ. මේ අපරාධකරුවන්ගේ දේශයට, මිනිසුන්ට සාධාරණව ජීවත්වෙන්න අයිතියක් නැතුව තිබුණු දේශයට අපි යුක්තිය ගෙනැල්ලා තිබෙනවා, සාධාරණත්වය ගෙනැල්ලා තිබෙනවා. නීතියේ ආධිපත්‍යය අපි හදනවා. ඒ වෙනුවෙන් අපි කැප වෙනවා. කොතරම් අවලාද, අපහාස අපට ආවත් ඒවාට නොබියව මුහුණ දී අපි මේ කටයුත්ත කරනවා කියලා ගරු සභාවට පොරොන්දු වෙනවා.

මත්ද්‍රව්‍ය ව්‍යසනය වැළැක්වීමේ ජාතික වැඩසටහන මේ මස 30වැනි දා අපි මේ රටේ ආරම්භ කරනවා. දැනටමත් ඒ මෙහෙයුම් යන්ත්‍රණය ශක්තිමත් ලෙස අපි මේ වනකොට දියත් කර තිබෙනවා. මේ වනකොට පොලිස් දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් බොහෝ තීන්දු තීරණ අරගෙන, කටයුතු කරලා තිබෙනවා වාගේම, මේ මෙහෙයුම් යන්ත්‍රණය තුළ අවි ආයුධ 1,947ක් 2025 වර්ෂය තුළ පමණක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. මේ පාතාල ක්‍රියාකාරකම් සහ මත්ද්‍රව්‍ය ජාලයට ආයුධත් සම්බන්ධයි. තැන තැන වන සිදුවීම්වලට හේතු වෙලා තිබෙන්නේ, සංවිධානාත්මක අපරාධකරුවන් සතුව තවමත් ආයුධ තිබීමයි. අපි ආයුධ 1,947ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. මේ විධියට සමාජයේ ආයුධ සංසරණය වීම වළක්වලා එම ආයුධ එකතු කිරීමේ කාර්යය අපි භාර අරගෙන තිබෙනවා. එක්තරා හමුදා කඳවුරකින් පාතාලයට ටී-56 රයිෆල් 78ක් දීලා තිබෙනවා. ඒකෙන් 36ක්, 37ක් විතර මේ වනකොට අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ, පසුගිය කාලයේ ආණ්ඩුවලින්. එහෙම තත්ත්වයක තිබුණු රටක් තමයි අපි මේ ක්‍රමක්‍රමයෙන් ගොඩනඟාගෙන යන්නේ.

දවසකින් දෙකකින් මේ සියල්ල යථා තත්ත්වයට පත් කරන්න පුළුවන් කියලා අපි කියන්නේ නැහැ. මම අර කාරණා පවා මතු කළේ ඒකයි, මේක අපරාධකරුවන්ගේ දේශයක් බවට පත් වෙලා තිබුණේ. අපට තවත් ඕනෑ තරම් උදාහරණ තිබෙනවා. ජුලම්පිටියේ අමරෙට තිබුණා, අධිකරණ වරෙන්තු 110ක්. හැබැයි ඒ කාලයේ කවුරුත් ඔහුව අත්අඩංගුවට ගත්තේ නැහැ. 2002 රනිල් මහත්මයාගේ කාලයේ තංගල්ල උසාවිය ජුලම්පිටියේ අමරෙ අත්පත් කර ගත්තා. බන්ධනාගාර නිලධාරින් ප්‍රාණ ඇපයට ගත්තා, දවස් දෙකහමාරක් ඒක පාලනය කළා. කවුද ගිහින් කිව්වේ, "අමරෙ මම ආවා, එළියට එන්න" කියලා? කටහඬ අහලා - *[බාධා කිරීම්]* එහෙම තමයි. මේ රටේ ජනතාව දන්නවා පාතාලයට, අපරාධකරුවන්ට සම්බන්ධ වුණේ කවුද කියලා. *[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කවුද පාතාලය? *[බාධා කිරීමක්]* දැන් මේ කට්ටිය ඔක්කෝම එකතු වෙලා සන්ධාන හදාගෙන සුදනෝ වෙන්න උත්සාහ කරනවා. එහෙම නායකයෝ ලජ්ජා වෙන්න ඕනෑ. එහෙම නායකයෝ තමයි මේ රට පාතාල රාජ්‍යයක් බවට පත් කරලා, සංවිධානාත්මක අපරාධකරුවන්ට ධෛර්යය, ශක්තිය දීලා තමන්ගේ බලය පවත්වාගෙන යන්න කටයුතු කළේ. හැම වෙලාවේම ඒ අය බලය පවත්වාගෙන ගියේ මෙන්න මේ ආකාරයට. දැන් එවැනි තත්ත්වයක් මේ රටේ ඇති කරන්න අපි කිසිසේත්ම ඉඩ දෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාතාල ක්‍රියාකාරිකයෝ දැනගත්තා අපි බලයට එනකොට ඔවුන්ගේ සියලු දේශපාලන සම්බන්ධතා ඉවරයි කියලා. ඒ අය උත්සාහ කරමින් සිටියා, ඒ සඳහා දේශපාලන ව්‍යාපාරයක් හදන්න. පාතාල අපරාධකරුවන්ගේ ප්‍රකාශ හරහා දැන් **ඒවා** හෙළි වෙනවා. මොකද, තවදුරටත් දේශපාලනය හා සම්බන්ධ පාතාලයක් මේ රටේ නැහැ. යම් ප්‍රමාණයකට තිබෙනවා, පෙර පැවති දේශපාලනය. මම මේ සභාවට මැයි 21වෙනි දා කිව්වා වාගේම, අවශ්‍ය නම් තවදුරටත් විමර්ශන කරලා මේකට සම්බන්ධ අයව මේ සභාවට හෙළි කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ජනතාව මේ සිද්ධ වෙන ක්‍රියාදාමයන් පිළිබඳව හොඳ අධ්‍යයනයකින් ඉන්නවා. කවුරුත් දන්නවා, මේ රටේ සිද්ධ වෙන දේ. ඒ නිසා ජනතාව සතුටුයි. මත්ද්‍රව්‍ය නිවාරණය, නැත්නම් මත්ද්‍රව්‍ය පාලනය සඳහා අපි ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. විශේෂයෙන් සැපයුම් ජාලය අඩාළ කිරීම සඳහා අපි මේ වෙනකොට ගත්ත ක්‍රියාමාර්ග සාර්ථක වෙලා තිබෙනවා. පසුගිය සති කිහිපය පුරාම මත්ද්‍රව්‍ය විශාල වශයෙන්; නැව් පිටින් අත්අඩංගුවට ගන්න, කිලෝ හත්අටසීය අත්අඩංගුවට ගන්න අපට හැකියාව ලැබුණා. ඒ සැපයුම් ජාලය අඩාළ කිරීම අපි එක පැත්තකින් සිද්ධ කරනවා. ඒ සඳහා නාවික හමුදාවට, පොලිස් විශේෂ කාර්ය බලකායට සහ ශ්‍රී ලංකා පොලීසියට අපි මේ අවස්ථාවේදී විශේෂ ස්තුතියක් පුද කරන්නට ඕනෑ. ඒ කාර්යයන් ඉෂ්ට වෙමින් පවතිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. මත්ද්‍රව්‍ය, එහෙම නැත්නම් නීති විරෝධී ආකාරයෙන් අත්පත් කර ගන්නා වත්කම් අක්‍රිය කරන්න අපි කටයුතු කරමින් සිටිනවා. ඊයේ දිනයේත් එවැනි කටයුත්තක් සිද්ධ කළා. ඒ ආකාරයෙන් මත්ද්‍රව්‍ය සැපයුම අඩාළ කිරීමට අදාළ සියලු ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒ සඳහා විමර්ශන ඒකක අපි ස්ථාපිත කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අනෙක් පාර්ශ්වයෙන් මත්ද්‍රව්‍ය සඳහා තිබෙන ඉල්ලුමත් අඩාළ කරන්න අවශ්‍යයි. *[බාධා කිරීමක්]* වතුර බොන එක වරදක් නොවෙයි.

විශේෂයෙන් මත්ද්‍රව්‍ය ඉල්ලුම අවම කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ හදලා තිබෙනවා. අපි මේ රටේ සියලු ජනයා දැනුවත් කරන්න අවශ්‍යයි. විශේෂයෙන් පාසල් පද්ධතිය, විශ්වවිද්‍යාල පද්ධතිය, පළාත් පාලන ආයතන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන සහ ආගමික සංස්ථාව ඇතුළු සියලුදෙනා ඒකාබද්ධ කරගත් දැනුවත් කිරීමේ වැඩසටහන් අපි සැලසුම් කරලා තිබෙනවා. ඒ සඳහා ග්‍රාමීය මට්ටමෙන් මහජන ආරක්ෂක කමිටු පිහිටුවා තිබෙනවා. ප්‍රාදේශීය කමිටුව ඉදිරියේදී පිහිටුවනවා, දිස්ත්‍රික් කමිටුව පිහිටුවනවා, ජාතික සභාව පිහිටෙව්වා. ඒ සඳහා විශේෂ කාර්යාලයක් අපි ආරම්භ කරනවා. මේක නිල ව්‍යුහයක් විධියට සකස් කරලා මත්ද්‍රව්‍ය සඳහා තිබෙන ඉල්ලුම අඩු කරනවා. පුනරුත්ථාපන වැඩසටහන් ශක්තිමත් කරනවා. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය -

[ගරු ආනන්ද විජේපාල මහතා]

NDDCB - යටතේ පුනරුත්ථාපන මධ්‍යස්ථාන 4යි තිබෙන්නේ. අපි පුනරුත්ථාපන මධ්‍යස්ථාන 25ක් නිර්මාණය කරන්න බලාපොරොත්තු වෙනවා. මේ රටේ තරුණ පරපුර මේ උවදුරෙන් මුදා ගන්න අවශ්‍යයි. දඬුවම් දීලා විතරක් පාතාලය හෝ මත්ද්‍රව්‍ය අපට පාලනය කරන්න බැහැ. ඒ නිසා මේ රටේ සියලු ජනයාට අපි කියන්නේ ස්වේච්ඡාවෙන් පුනරුත්ථාපනය වෙන්න, අපි මේ මධ්‍යස්ථාන විවෘත කරනවා කියන එකයි. ඒ වාගේම මත්ද්‍රව්‍ය සඳහා ඇති ඉල්ලුම අඩු කරන්න අවශ්‍ය සියලු පියවර අපි ගන්නවා. ඒ සඳහා 2026 අය වැයෙන් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. පුනරුත්ථාපන මධ්‍යස්ථාන 25ක් හැම දිස්ත්‍රික්කයකම ස්ථාපිත කරනවා. ඒ සඳහා උපදේශකවරුන් - counsellors - බඳවා ගැනීමේ කටයුතු මේ වනකොටත් ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම දැනුවත් කිරීමේ වැඩසටහන් 6,250ක් මේ අවුරුද්ද තුළ සිදු කරනවා. මේ වැඩසටහන් ප්‍රමාණය විශාල වශයෙන් වැඩි කරලා මත්ද්‍රව්‍ය සඳහා තිබෙන ඉල්ලුම සම්පූර්ණයෙන් ඉවත් කරන්න අපි කටයුතු කරනවා. එක පැත්තකින් supply chain එක අඩාළ කරනවා වාගේම, මත්ද්‍රව්‍ය සඳහා තිබෙන demand එක ක්‍රමක්‍රමයෙන් අඩාළ කරලා මේ රටේ අනාගත පරපුර මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඉවත් කරලා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" සහිතව ජීවත් වෙන්න අවශ්‍ය වටපිටාව මේ රටේ මිනිස්සුන්ට හදා දෙන පොරොන්දුව මේ සභාවට අපි ලබා දෙනවා.

බොහොම ස්තූතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Chamara Sampath Dasanayake. You have four minutes.

[අ.භා. 12.10]

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොලීසිය භාර අමාත්‍ය ගරු ආනන්ද විජේපාල මැතිතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. ඊයේ ආනන්ද විජේපාල මහත්මයා ඇවිල්ලා විනාඩි 5ක කථාවක් කථාවක් කළා, වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ සාතනය පිළිබඳව. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, ලසන්ත වික්‍රමසේකර කියන නම නොහොත් "ලසා" කියලා. එතුමාගේ සාතන criteria එක කෙළින්ම පාතාල criteria එකට දමලා තමයි ඔබතුමා කථා කළේ.

එහෙම නම්, යටගිය දවස ගැනත් මම ඔබතුමාට කියන්න කැමැතියි. ඒ ගැන කියනවා නම්, ඔබතුමා ගැනත් කියන්න පුළුවන්. ඔබතුමා 1988දී තමයි පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුණේ. එසේ බැඳුණේ පුහුණු නිලධාරියෙක් හැටියට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා SI කෙනෙක් හැටියට පොලිස් දෙපාර්තමේන්තුවට බැඳිලා, SI කෙනෙක් හැටියට පුහුණුව ලබමින් සිටි කාලයේ තමයි බුද්ධි වාර්තා සහ CID වාර්තා අනුව මෙතුමාව පොලීසියෙන් නෙරපුවේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාව පොලීසියෙන් ඉවත් කළේ - *[බාධා කිරීම්]* ඔබතුමාව ඒ කාලයේ පොලීසියෙන් ඉවත් කළේ - *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ඒ කාලයේ පොලිස් දෙපාර්තමේන්තුවෙන් නෙරපුවේ. *[බාධා කිරීම්]*

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

හැටියට කටයුතු කළ නිසා තමයි ඔබතුමාව ඒ කාලයේ පොලීසියෙන් නෙරපුවේ. ඔබතුමාගේ ජීවිත කථාව අපි දන්නවා. ඔබතුමා දැන් හැංගි හොරා ගේම් ගහන්න එපා. එහෙම නම් ඔබතුමාටත් අනාගතයේ කියන්න වෙන්නේ මොකක්ද? ආනන්ද විජේපාල නොහොත් *[බාධා කිරීම්]* ආනන්ද විජේපාල නොහොත් - ඒ නම අපි කියන්නේ නැහැ. *[බාධා කිරීමක්]*

ආනන්ද විජේපාල නොහොත් - ඒ නම අපි කියන්නේ නැහැ. පසුගිය කාලයේ ඒවා ෆේස්බුක් එකේ ගියා. අපි ඒ තරම් පහළ තත්ත්වයට වැටෙන්නේ නැහැ. ආනන්ද විජේපාල නොහොත් - ඒ නම අපි කියන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමාව පොලීසියෙන් එළෙව්වේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

හැටියට කටයුතු කළ නිසායි. CID වාර්තාව සහ බුද්ධි අංශයේ වාර්තාව අනුව තමයි මෙතුමාව පොලීසියෙන් නෙරපුවේ. *[බාධා කිරීම්]* අද පොලිස් දෙපාර්තමේන්තුවට උපදෙස් දෙන, පොලිස් දෙපාර්තමේන්තුව ආරක්ෂා කරන, පොලිස් ඇමතිවරයා හැටියට කටයුතු කරන්නේ කවුද? පොලීසියේ SI කෙනෙක් හැටියට වැඩ කරද්දී CID වාර්තා අනුව, බුද්ධි වාර්තා අනුව පොලීසියෙන් නෙරපා, පොලීසියෙන් එළියට දමපු කෙනෙක් තමයි අද රටේ පොලිස් ඇමති. මේක රටේ මිනිස්සු කවුරුවත් දැනගෙන හිටියේ නැහැ.

ගරු ඇමතිතුමනි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව, අඹන්පොළ පැතිවලත්, තඹුත්තේගම පැත්තේත් මිනිස්සු සියලු දෙනාම ඔබතුමා ගැන දන්නවා. මම ඔබතුමාට මීට කලිනුත් කිව්වා, 1989දී අඹන්පොළ පොලීසියට ගහපු එක ගැන කියන්න, තඹුත්තේගම පොලීසියට ගහපු එක ගැන කියන්න, කැකිරාව පොලීසියට ගහපු එක ගැන කියන්න කියලා. මම එදාත් පාර්ලිමේන්තුවේදී කිව්වා. ඔබතුමා ජූලම්පිටියේ අමරේලා ගැන කිව්වා. ඔය ඔක්කෝම ගැන කිව්වා. ඔය ඔක්කෝම; අපි ඔයගොල්ලන් එකට හිටපු ආණ්ඩුවේ - *[බාධා කිරීම්]* 2005 ජූලම්පිටියේ අමරේලා - *[බාධා කිරීම්]* අර මිනිස්සු නැහැ. ජූලම්පිටියේ අමරේලා, ඔය ඔක්කෝම හිටියේ අපි දෙගොල්ලන්ම හිටපු ආණ්ඩුවේ; මහින්ද රාජපක්ෂ මහත්මයාව ජනාධිපති කළේ ඔයගොල්ලන් සහ අපි. අරගොල්ලන් නැහැ. අර කථා කරන කට්ටිය කවුරුවත් නැහැ. අපි-ඔයගොල්ලන් තමයි 2005 මහින්ද රාජපක්ෂ ගෙනාවේත්. *[බාධා කිරීම්]* නම කියලාම මම කියන්නම් කෝ. ඉතින් ඔයා ජූලම්පිටියේ අමරේ ගැන නම නොකියා කිව්වාට, මේ රටේ ඕනෑ කෙනෙක් දන්නවා ජූලම්පිටියේ අමරේ කියන්නේ කවුද, කවුරු ළඟද ඔහු හිටියේ කියලා.

මම තවත් දේවල් කියන්නම්. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කිත්සිරි ජයලත් ගැන කිව්වා නේ.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔව්.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

DIG කිත්සිරි ජයලත් 1990දී වැලිඔය, ඇතාවැටුණු වැව පොලීසියේ රාළහාමි. ඊට පසුව පැලියගොඩ mess එකේ සිටිද්දී තමයි message එක ආවේ, directly ASP කරලා කියලා. Message එක ආවේ පැලියගොඩට. ඔහු තමයි directly ASP වෙච්ච එකම රාළහාමි; directly ASP වෙච්ච එකම රාළහාමි තමයි ඔය කිත්සිරි ජයලත්. කිත්සිරි ජයලත් ගත්තේ කවුරු හින්දාද? *[බාධා කිරීමක්]* ඒ කාලයේ IGP කෙනෙකුගේ පුතෙක් ASP ලැයිස්තුවේ හිටියා. කිත්සිරි ජයලත් ගත්තේ අර IGPගේ පුතා ASP කරන්න ඕනෑ හින්දා. පොලීසිය ගැන නම් අපට කියන්න එන්න එපා. අද ඔබතුමා පොලීසියේ DIGලා ගැන, උසස්වීම් ගැන අපට කියන්න එන්න එපා. දැන් ශානි අබේසේකර මහත්තයාට, රවී සෙනෙවිරත්න මහත්තයාට ඇවිදින්න පුළුවන්ද කියලා ඔබතුමා බලන්න. ඔබතුමා ඔය promotion දීලා තියාගෙන ඉන්නේ. පොලීසිය හරියට වැඩ කරනවා නම්, පොලීසිය හරියට වැඩ කළා නම්, මෙහෙම වෙනවාද? පොලීසිය ගැන හරියට බලලා රාජකාරිය කරන්න. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කියපු ටික ඔළුවට ගන්න. මෙතැනට ඇවිල්ලා නිකම් සද්දෙ දාලා අපිව බය කරන්න හදනවා. අපට කියනවා, අපි බය වෙලා ලු, ඉන්නේ. මම එකක් කියන්නම්. පොලීසිය භාර ඇමතිතුමනි, පුළුවන් නම් අපි මරන්න. මැරුවොත් හොල්මනක් වෙලා හරි ඇවිල්ලා අපිත් පළි ගන්නවා. අපිව මරන්න තමයි plan කරන්නේ, අපේ ආරක්ෂාවත් අයින් කරලා. ඔබතුමාට පුළුවන් නම් අපිව මරන්න. මැරුවොත් හොල්මනක් වෙලා හරි අපි ඔබතුමාගේ පස්සෙන් ඉන්නවා. ඒවාට අපි භය නැහැ. මැරුවත් පස්සෙන් ඉන්නවා. ඒක හිතේ තියාගන්න. අපේ ආරක්ෂාව අයින් කරලා ඔබතුමා හිතාගෙන ඉන්නේ මොකක්ද?

වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති මැරුවා කියලා ඔබතුමා කිව්වා, " ඒ, ... නොහොත් ලසා" කියලා. ඔබතුමා ඒ මනුස්සයාව පාතාලයට දැම්මා. *[බාධා කිරීම්]* ඔබතුමාගේ නමත් දාන්නේ,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

අපි හැමෝටම මීට වැඩිය කථා කරන්න පුළුවන්, යටගිය දවස ගැන කථා කරන්න ඕනෑ නම්. ඒවා ගැන අපට ඕනෑ තරම් කියන්න පුළුවන්. අපි වැඩිය කියන්නේ නැතිව හිටියේ ඒකයි. එහෙම කරන්න එපා. ඒ මනුස්සයා ඡන්දය ඉල්ලලා දිනලා තමයි ප්‍රාදේශීය සභාවේ සභාපති වුණේ. දිනලා සභාපති වෙච්ච මිනිහාව වෙඩි තියලා ඝාතනය කළාට පස්සේ ඊයේ ඔබතුමා සභාවට ඇවිල්ලා විනාඩි තුනක් අරගෙන ඔහුව පාතාලකාරයෙක් හැටියට දාලා කථා කළා. එහෙම දාන්න එපා. එහෙම කරන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chamara Sampath Dasanayake, your time is up.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මට තව විනාඩියක් දෙන්න.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට අභියෝග කරනවා, වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිව මරපු වෙඩික්කරු අල්ලන්න. වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිව මැරුවේ මෙන්න මේ පාතාල සිද්ධියටයි කියලා එම වෙඩික්කරු කිව්වොත්, එදාට අපි එය පිළිගන්නම්. එහෙම නැතිව දේශපාලනය කරලා මැරිච්ච මනුස්සයෙකුව ඒ විධියට පාතාලයට දාලා කථා කරන්න එපා. ඔබතුමා හැම වෙලාවේම හැමෝටම කියන්නේ ඒකයි

ඔබතුමාට වගකීමක් තිබෙනවා, යම් ඝාතනයක් වුණා නම් ඒ ඝාතනය කළේ කවුද කියලා අල්ලා මේ රටට හෙළි කරන්න. එහෙම කරන්නේ නැතිව ඔබතුමා මැරිච්ච කෙනාට, ඔහුගේ පවුලට අසාධාරණයක් වන විධියේ කථාවක් තමයි ඊයේ සිදු කළේ. *[බාධා කිරීම්]* ඔවුන්ට අසාධාරණයක් වන විධියට තමයි ඔබතුමා කථා කළේ. මම මීට වැඩිය කථා කරන්නේ නැහැ. *[බාධා කිරීම්]* මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Minister?

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කවදත් සිංහයෝ වාගේ මේ රටේ වැඩ කළා. *[බාධා කිරීම්]* 1989 ඉඳලා එතුමන්ලාගේ ආණ්ඩු 4ක්, 5ක්, 6ක් තිබුණා. අපි කිසි දවසක ත්‍රස්තවාදී කටයුතුවල නිරතව හිටපු මිනිස්සු නොවෙයි. අපි පොලීසියේ හොඳ විධියට කටයුතු කරලා මගේ පෞද්ගලික හේතුවක් මත මම පොලීසියෙන් ඉවත් වුණා. *[බාධා කිරීම්]* මෙතුමා කියන කාරණා සම්පූර්ණයෙන් අසත්‍යයි, ද්වේෂ සහගතයි. මෙතුමා හැම වෙලාවේම එක එක නගරවල නම් කියනවා. මෙතුමා දන්නේ නැහැ, මට ඔය කියන නගරවලින් 150,000කට ආසන්න ඡන්ද ගානක් ලැබිලා තමයි මම මේ රටේ මන්ත්‍රීවරයෙක් විධියට පත් වුණේ කියලා. *[බාධා කිරීම්]* අපට අවශ්‍ය නැහැ, කවුරුවත් මරන්න. අපේ ආණ්ඩුව මේ රටේ මිනිස්සු මරන ආණ්ඩුවක් නොවෙයි; මිනිස්සුන්ගේ ජීවිත ආරක්ෂා කරන ආණ්ඩුවක්. ඒ හින්දා ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමනි, ඔබතුමා බය වෙන්න ඕනෑ නැහැ. *[බාධා කිරීමක්]* අපි ඔබතුමාගේ ආරක්ෂාවත් සහතික කරනවා. *[බාධා කිරීමක්]* අපි කිසි දවසක ඒ විධියේ ආණ්ඩු කරන්න ආවේ නැහැ. එතුමන්ලාගේ පරණ පුරුදු තමයි මෙතැන ප්‍රකාශ කරන්න උත්සාහ කරන්නේ. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ප්‍රකාශ කළ සියලු දේ මම ප්‍රතික්ෂේප කරනවා. *[බාධා කිරීම්]* අපි නීතිගරුක සමාජයක් හදනවා, යුක්තිගරුක සමාජයක් හදනවා. *[බාධා කිරීම්]* අපි නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කරනවා. ඕනෑ තරම් කෑ ගහන්න පුළුවන්, බියට පත් වෙන්න පුළුවන්, කලබල වෙන්න පුළුවන්. නමුත්, අපි නීතියට අනුව කටයුතු කරනවා. නීති විරෝධීව කටයුතු කරපු සියලුදෙනා නීතියේ රැහැනට ගෙනෙනවාමයි කියන කාරණය පිළිබඳව දෙගිඩියාවක් නැහැ, විවාදයක් නැහැ. ඔබතුමන්ලා ඕනෑ තරම් දේවල් කියන්න. අපි මේ කිසිවක් සම්බන්ධයෙන් සැලෙන්නේ නැහැ. ඕනෑම අභියෝගයක් භාරගෙන, ඕනෑම අභියෝගයක් ජයගෙන නොබියව ඉදිරියට කටයුතු කරනවා කියන එක මම නැවත නැවතත් මේ සභාවට සහතික කරනවා.

අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තූතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Harshana Nanayakkara. You have 12 minutes. Your time starts now.

[අ.භා. 12.19]

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

Hon. Deputy Speaker, today's Debate is about prevention of drugs and bringing law and order to the country.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විවාදය තිබෙන්නේ 30වෙනි දා ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කිරීමට නියමිත මත් ද්‍රව්‍යවලට එරෙහි වූ සටන; පාතාලය සහ රටේ ආරක්ෂාව පිළිබඳව. අද අපේ ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා කථා කරන වෙලාවේ මම කල්පනා කළා, මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ සමහර පුටුවල -හැම පුටුවේම නොවෙයි- ඉත්තෑවෝ ඉන්නවාද කියලා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, එතුමාගේ කථාව අහගෙන ඉන්න බැරිව උඩ පනින කිහිප දෙනෙක් හිටියා. හැබැයි, හැමෝම නොවෙයි. ඉතින් මම හිතන්නේ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය යොදවා හෝ එහෙම ඉත්තෑවෝ ඉන්නවා නම් අයින් කර ගන්න ඕනෑ. හේතුව, අපි පාතාලය නවත්වනවා, පාතාලය මර්දනය කරනවා කිව්වාම, ගුණ සම්පන්න, ශිෂ්ට සම්පන්න පුරවැසියෝ නම් කලබල වන්න ඕනෑ නැහැ. එහෙම කලබල වනවා නම්, ඒ අය ගැන වෙනම කියවීමක් අපි හදාගනිමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෙසේ වෙතත් තවත් සමහරු කියන්න යෙදුණා, "අපිව මරන්න යනවා" කියලා. කවදාවත් නැහැ. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හොල්මනක් වෙලා නම් එන්න එපා. සැබෑ ජීවිතයේ දැක්කාමත් බය හිතෙන මුහුණක් තිබෙන්නේ. හොල්මනක් නම් වෙන්න එපා. *[බාධා කිරීමක්]* හොල්මනක් නම් වෙන්න එපා. උදේට දැක්කාමත් බය හිතෙනවා. ඒ නිසා හොල්මනක් වෙන්න එපා. අපි ඔබතුමාව ආරක්ෂා කරනවා. *[බාධා කිරීමක්]* බය වෙන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නැවත මාතෘකාවට පිවිසෙන්නම්. අපි කවුරුත් එළියේ paying lip service, මත් ද්‍රව්‍ය නවත්වන්න ඕනෑය කියනවා. It is one point. ඒක එක දෙයක්. නමුත්, සත්‍ය වශයෙන්ම ක්‍රියාත්මකවීම තමයි අනික් එක. 1977න් පස්සේ මේ රටේ බලයට ආ හැම ආණ්ඩුවක්ම පාහේ එක්කෝ මේක දිහා බලන්නේ නැතුව අහක බලාගෙන හිටියා. එහෙම නැත්නම් පසුකාලීනව තමන්ගේ ගෝලයෝ හරහා නොයෙකුත් විධියට පාතාලය සමඟ සම්බන්ධ වෙමින්, මත් ද්‍රව්‍යවලට සම්බන්ධ වෙමින් ඒවායෙන් ප්‍රතිලාභ ලැබුවා. හැම ආණ්ඩුවක්ම එහෙමයි. ඒක තමයි ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා පැහැදිලිව කිව්වේ. "ගෝණවල සුනිල්" සම්බන්ධ කොයි ආණ්ඩුවටද, "සොත්ති උපාලි" සම්බන්ධ කොයි ආණ්ඩුවටද, සමහර ජනාධිපතිවරුන්ගේ ආරක්ෂාවට හිටපු "බැද්දගානේ සංජීව", "වම්බොට්ටා" කියන්නේ කවුද? මේ ඔක්කෝම දශක ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක වුණේ පාතාලය එක්ක තමයි. මත් ද්‍රව්‍ය සහ පාතාලය එකට ගැට ගැහිලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔය දෙක එකට තිබෙන්නේ.

නමුත් අද මේ රජය ඒ පාතාලවලට සම්බන්ධත් නැහැ; උදවු කරන්නේත් නැහැ. ඒ නිසාම තමයි මේ ජාතික මෙහෙවර අපි ආරම්භ කරන්නේ, ඒ සැපයුම් ජාලය සම්පූර්ණයෙන්ම නැති කිරීමේ අරමුණින්. නමුත් අපි ඒක කරනකොට මොනවාද කියන්නේ? දැන් අපි කවුරුහරි arrest කළා කියලා ඒ කවුරුවත් මැරෙන්නේ නැහැ. අපේ ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා සභාවේ ඉන්නවා නේද? චාමර සම්පත් මන්ත්‍රීතුමනි, මම අහනවා, මදුෂ් පොලිස් භාරයේ සිටියදී මැරෙනකොට ඔබතුමා හිටියේ කොයි ආණ්ඩුවේද කියලා. *[බාධා කිරීමක්]* ඒ වාගේම මම අහනවා, කලින් ආණ්ඩුවේ, මිනී මරලා වැරදිකාරයෝ වෙච්ච මිනිස්සු මේ පාර්ලිමේන්තුවේ හිටියේ නැද්ද, කැබිනට් මණ්ඩලයේ ඉඳලා කප්පම් ගත් ඇමතිලා මේ පාර්ලිමේන්තුවේ හිටියේ නැද්ද කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිටියා. අපි ඒක වෙනස් කරනවා. ඒ වාගේම මම පිළිගන්නම්, වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිගේ මරණය සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම නීතිය ක්‍රියාත්මක කරලා වැරදිකරුවෝ අල්ලලා දඬුවම් කරන්නට ඕනෑය කියන කාරණය. පුද්ගලයෙක් මැරෙන එක අපට පිළිගන්න පුළුවන් දෙයක් නොවෙයි. නමුත් අපි විමර්ශන කරලා වැරදි කරපු මිනිස්සු අහුවෙනකොට ඒකට විතරක් විරුද්ධ වෙන්න එපා. මොකද, මේ මත් ද්‍රව්‍යවල තිබෙන ප්‍රශ්නය මෙයයි.

අපේ කාලයේදී යම් පුද්ගලයෙක් අත්අඩංගුවට ගත්තාම මැරෙන්නේ නැහැ. හැබැයි, ඒ කාලයේ අත්අඩංගුවේ ඉන්නකොට මදුෂ්ලා මැරෙනවා. එහෙම මැරුණාම, ඒගොල්ලන්ට අනික් අයගේ නම් කියාගන්න බැහැ. නමුත් මතක තියාගන්න, දැන් ඔවුන් අනික් අයගේ නම් කියනවා. ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා නියම වෙලාවට ඒ නම් ටිකත් කියාවි. හැබැයි, මේ හැම දේශපාලනඥයාම නොවෙයි, සම්බන්ධකම් තිබෙන අය බය වුණාම ඇති. අනික් අය ඉත්තෑවෝ ටික බේරාගෙන ඉන්නයි තිබෙන්නේ. හරිද? අනික් අයට බය වෙන්න දෙයක් නැහැ. මොකද, අපි නීතිගරුක ආණ්ඩුවක් ගෙනියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තත්ත්වය වෙනස් කරගන්න නම් අපට පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් හදාගන්න අවශ්‍යයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඒ පොහොසත් රට, ලස්සන ජීවිතය හදන්නේ මේ රටේ සෑම පුරවැසියාටම. හැබැයි, පාතාලයට, නීති විරෝධී වැඩ කරන අයට අපි හදන්නේ පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් නොවෙයි, හොඳ හිරගෙයක්. මොකද, ඒගොල්ලන් මෙතැන ඉන්න ඕනෑ නැහැ. මේ රටේ සිටින සෑම යුක්තිගරුක, නීතිගරුක පුරවැසියෙකුටම පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් හැදීමේ ප්‍රධාන අරමුණ විධියට තමයි 30වැනි දා සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී මත් ද්‍රව්‍ය විරෝධී වැඩසටහන ආරම්භ කරන්නේ. ඒක අපි කැපවීමෙන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ බහුතරයක් දෙනා කෑ ගහන්නේ භයට. ආණ්ඩුව හරි වැඩේ කරන්නේ නැත්නම්, අපි අනා ගන්නවා නම්, වැරදි වැඩ කරනවා නම් මේගොල්ලන් එහා පැත්තේ ඉඳගෙන "well-done!" කියයි. ඔය දඟලන්නේ, කෑ ගහන්නේ භයට. ඒගොල්ලන් භය වෙන්නේ ඇයි? අපි දන්නේ නැහැ, මේ සමහර අය කරලා තිබෙන්නේ මොනවාද කියලා. ඒගොල්ලන් කරපු දේවල්, ඒ අය දන්න හින්දා භයයි. නමුත්, අපේ ආණ්ඩුව නීතියට පිටින් වැඩ කරන ආණ්ඩුවක් නොවෙයි. අපට එහෙම කරන්න ඕනෑ නැහැ, අපට ලැබිලා තිබෙන ජන වරමත් එක්ක.

ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා පැහැදිලිව කිව්වා, මත් ද්‍රව්‍ය සැපයුම නැවැත්වීම ගැන. මත් ද්‍රව්‍ය සැපයුම නැවැත්වීම සම්බන්ධයෙන් ඉතා අගනා කාර්ය භාරයක්, වැඩ කොටසක් අපේ ආනන්ද විජේපාල ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් සිද්ධ වෙනවා. ඒ සම්බන්ධයෙන් පොලීසිය, ත්‍රිවිධ හමුදාව කරන කැපවීමට අපි ගරු කරනවා. ඔබතුමන්ලා දන්නවා, ඒ කැපවීම නිසා මේ වනවිට මත් ද්‍රව්‍ය කිලෝ ගණන් හොයා ගන්නවා කියලා. මේ රටේ අයිස් මත් ද්‍රව්‍ය තිබෙනවා. "අයිස්ලන්තයක්" තිබෙනවා කියලා අපි හොයා ගත්තේ ඒ කැපවීම නිසායි. ඒ "අයිස්ලන්තයේ" අගනුවර මිද්දෙනිය කියලා දැන ගන්නේත් පසුවයි. කෙසේ වෙතත් දකුණු පළාතටම ආවේණික වුණු අයිස් අල්ලන්න අපි පටන් ගන්නවා.

ඊට අමතරව ඉතා විශාල ප්‍රමාණයන්ගෙන් හෂිෂ් කුඩුත් අල්ලනවා, පුද්ගලයන් අත්අඩංගුවට ගන්නවා. ඒක තමයි සැපයුම නැවැත්වීමේ ක්‍රමවේදය. ඒවා නවත්වන්න අපි මහන්සි වෙනකොට, කවුරු හරි අපිව සමච්චල් කරනවා නම්, වචනයක් අල්ලාගෙන දඟලනවා නම්, බොරු කතන්දර කියනවා නම්, එහෙන් මෙහෙන් පාට් දමනවා නම් අපි කියනවා, "sorry" කියලා. මොකද, අපි ඒවා පයිසයකට ගණන් ගන්නේ නැහැ. අපේ ගමන අපි යනවා. ආනන්ද විජේපාල ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුතු ත්‍රිවිධ හමුදාව මේවාට සම්බන්ධ හැම කෙනාවම අල්ලලා ඇතුළට දමලා තමයි පසුපස බලන්නේ කියන කාරණාව මම කියනවා. ඒ වෙනුවෙන් මට ලබා දෙන්න පුළුවන් සහාය මම ලබා දෙනවා.

අපි මේ සම්බන්ධයෙන් අලුත් පනත් සංශෝධනයක් කැබිනට් මණ්ඩලයට ගෙනෙනවා. මේ වෙනකොට අපේ territorial waters ඇතුළත විතරයි arrest කරලා මෙහේ නඩු අහන්න පුළුවන්. ඒ නිසා අපි සංශෝධනයක් ගේනවා, මහ මුහුදේ කුඩු ගෙනෙන නැව්වල විදේශිකයෙක් හිටියොත් ඔහුවත් මෙහේ ගෙනැල්ලා නඩු අහන්න පුළුවන් වන විධියට. අපි ඒ විධියට නීතිය සංශෝධනය කරනවා. ඒ කියන්නේ, මොකක්ද? එතකොට මේ රට ඇතුළේ මත් ද්‍රව්‍ය විකුණන්නත් බැහැ, ඔයගොල්ලන් අපේ මුහුද පැත්ත පළාතේවත් එන්න එපා, අපි අත්අඩංගුවට ගන්නවා. ඒක තමයි නීතිය කියන්නේ.

ඒ නිසා අපි මේ රටට ආදරය කරන පුරවැසියන්ට කියනවා - වැරදීමකින් වාගේ විපක්ෂයේත් එහෙම එක් කෙනෙක්, දෙන්නෙක් ඇති- අපිත් එක්ක එකතු වෙන්න කියලා. අපි මේ සටන් කරන්නේ පෞද්ගලිකව ඔබතුමන්ලාට එරෙහිව නොවෙයි. අපි මේ සටන් කරන්නේ ඔබතුමන්ලාගේත්, අපේත් දරුවන්ට මත් ද්‍රව්‍ය නැති යහපත් සමාජයක් හදන්න. හැම එකම දේශපාලනයට ලඝු කර ගන්න එපා. ඒ නිසා අපි මේ කරන වැඩේටත්, පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් හදන වැඩේටත් දේශපාලනයම රිංගවා ගන්නේ නැතුව මත් ද්‍රව්‍යවලට එරෙහි සටන වෙනුවෙන් ජනාධිපතිතුමා 30වැනි දා ආරම්භ කරන වැඩසටහනට ඔබතුමන්ලාගේ සහාය ලබා දෙන්න කියලා අපි ඔබතුමන්ලාට ආරාධනා කරනවා.

ඒ වාගේම ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා කිව්වා වාගේ සැපයීම නැවැත්වීම මඟින් පමණක් මේ මත් ද්‍රව්‍ය නවත්වන්න බැහැ. අලුතින් නීතියක් ගෙනාවා, අලුතින් ආණ්ඩුවක් ගෙනෙනවා කියලා මේක නවතින්නේ නැහැ. ඒ නිසා මේ කටයුත්තට ජනතාවත් සම්බන්ධ වෙන්න ඕනෑ. කොහොමද ජනතාව සම්බන්ධ වෙන්නේ? කලාකරුවන්ට තමන්ගේ ගායන හැකියාව, කුසලතාව යොදා ගෙන මේකට සම්බන්ධ වෙන්න පුළුවන්. ඔවුන්ට මේ ගැන ගීත ලියන්න, කවි ලියන්න පුළුවන්. ගමේ ආගමික නායකයින් සම්බන්ධ වෙන්න, ගමේ ජනතාවට මේ පණිවුඩය ගෙනයන්න. මම මුහුණු පොතේ දැක්කා, මුස්ලිම් පල්ලිවල පූජ්‍ය නායකයින් ගෙවල්වලට ගිහිල්ලා මේ ගැන කථා කරලා මේවා නවත්වන්න වැඩ කරනවා. අන්න ඒ වාගේ සිවිල් සමාජයටත් මෙතැනදී වගකීමක් තිබෙනවා. නීතිඥවරු වේවා, වෛද්‍යවරු වේවා මේක රටේ පුරවැසියන්ගේ වගකීමක්. අපි මේ බේරා ගන්න හදන්නේ අපේ රටේ කට්ටිය.

අපේ රටේ නරක පුරුදු තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. තමන්ට ලාභ ලබන්න වෙන කෙනෙකුගේ ජීවිතය විනාශ කරන වැඩ කරන්න එපා කියලා මම කියනවා. Construction sitesවල සමහර වෙලාවට වැඩ කරන කුලීකරුවන්ට දෙන්නේ පඩිය නොවෙයි, අයිස්. අයිස් ටික, කුඩු ටික දුන්නාම ඒ අය පඩි හොයන්නේත් නැහැ, කන්න හොයන්නේත් නැහැ, වැඩ කරනවා. එක්තරා පොළක එළවලු මිටි බඳින කට්ටියට කන්න දෙන්න ඕනෑ නැති බව අපි දන්නවා. ඒ අයට අයිස් ටිකක් දුන්නාම, කුඩු ටිකක් දුන්නාම වැඩ කරනවා. මනුස්සයෙක් තමන්ට ලාභ ලබන්න තවත් මනුස්සයෙකු විනාශ කරනවා නම්, මේක මොන මිලේච්ඡ සමාජයක්ද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? අපි අලුත් නීති ගෙනාවාට, මිනිස්සුන්ව අල්ලලා හිරේ දැම්මාට මිනිස්සු වෙනස් වුණේ නැත්නම් අපට කිසිසේත්ම මේ උවදුරෙන් මේ රට ගලවා ගන්න බැහැ. අන්න ඒකට අවශ්‍ය ජාතික වැඩ පිළිවෙළ තමයි අපි 30වැනි දා සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී ආරම්භ කරන්නේ. හැබැයි, මේ අවස්ථාවේදී මම මේ කාරණයත් කියනවා. මේ කටයුත්ත නවතින්නේ නැහැ; මේ කටයුත්ත අපි දිගටම කරගෙන යනවා. මේ රටේ මත් ද්‍රව්‍ය සියල්ල අවසන් කරලා, සුවපත් වෙච්ච සමාජයක් එනකල් මේ මෙහෙයුම යනවා. මොකද, අපට ආරක්ෂා කරන්න කුඩුකාරයෝ අපි ළඟ නැහැ. මම දන්නවා, විපක්ෂයේ සමහර වැදගත් මන්ත්‍රීවරු ඉන්න බව. ඔවුන්ට එහෙම සම්බන්ධකම් නැහැ. නමුත්, අපට සිද්ධ වෙනවා තත්ත්වය, බලය කුමක් වුවත් අනිවාර්යයෙන්ම මේ වැඩේ නවත්වන්න. ඒ වාගේම, ගරු ආනන්ද විජේපාල ඇමතිතුමාත් මේ කාරණය ගැන කිව්වා.

මමත් එක් පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් සේනපුර විවෘත කළා. අපේ රටේ ප්‍රශ්නයක් තිබෙනවා. කුඩු බොන කෙනා ගැන බිම් මට්ටමින් සමාජය බලන්නේ ඒ පුද්ගලයා හොරෙක්, මහ වැරදි වැඩක් කරන කෙනෙක් හැටියටයි. නමුත්, කුඩු බොන කෙනා ඇත්තටම රෝගියෙක්. එතැන තිබෙන්නේ සෞඛ්‍ය ප්‍රශ්නයක්. ඔහු වින්දිතයෙක්; ඔහුට ප්‍රතිකාර අවශ්‍යයි. කුඩු විකුණන කෙනාව අපි හිරේ දමන්න ඕනෑ; අයිස් විකුණන කෙනාව අපි හිරේ දමන්න ඕනෑ. නමුත්, සමාජයෙන් මම ඉල්ලා සිටිනවා, ඔයගොල්ලනුත් හිතන විධිය, දකින විධිය පොඩ්ඩක් වෙනස් කරන්න කියා. Basically, those who are addicted to substance abuse are actually patients. They are sick, and need medical help, not condemnation from the society.

එහෙම නම්, මේ ආණ්ඩුව මේ වැඩේ කරගෙන යනකොට ජනතාවගෙන් අපි මොකක්ද ඉල්ලන්නේ? සැපයුම නවත්වන වැඩේ අපි කරන්නම්. භය නැතුව තොරතුරු ගෙනැත් දෙන්න. පොලීසිය සුද්ද කරලා හදලා තිබෙන්නේ. ඉස්සර වාගේ පොලීසියේ තොරතුරු දැන් පාතාලයට යන්න අපි ඉඩ දෙන්නේ නැහැ. ඒ වාගේම, දවසේ වෙඩිල්ලක් ඔයගොල්ලන්ට දැන් ඇහෙන්නේත් නැහැ. දවසේ ඇඩිල්ල පොඩ්ඩක් තිබෙනවා, වෙඩිල්ල නැහැ. නමුත්, ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා යටතේ තිබෙන පොලීසිය සහ ත්‍රිවිධ හමුදාව මේ වැඩේ කරන ගමන්, අපට සිද්ධ වෙනවා ජනතාවගෙන් ඉල්ලන්න,- සමාවෙන්න, පොලීසිය විතරයි, ත්‍රිවිධ හමුදාව එතුමා යටතේ නැහැ. එහෙම කිව්වාය කියා ගරු අරුණ ජයසේකර ඇමතිතුමා තරහ වෙන එකකුත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනතාවගෙන් අපි ඉල්ලා සිටින්නේ මොකක්ද? ඔබත් පෙරට එන්න. ඔබේ ගෙදර කුඩු බොන්න අරගෙන අසනීප වෙච්ච දරුවෙක් ඉන්නවා නම් ස්වේච්ඡාවෙන් සලකන අපේ පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත එන්න. අපි රජයක් වශයෙන් පිළිගන්නවා, ඔබේ මතට ඇබ්බැහි වෙච්ච දරුවා හොරෙක්, මංකොල්ලකාරයෙක් නොවෙයි රෝගියෙක් බව. මම ජනතාවගෙන් ඉල්ලනවා, අන්න ඒ ආකාරයට සානුකම්පිතව ඒ මිනිස්සු දෙස බලන්නය කියලා. මේ ගමන සාර්ථකව අවසන් කරලා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් ප්‍රධාන පොරොන්දුව වන මේ රට මත් ද්‍රව්‍ය උවදුරින් ගලවා ගැනීමේ මෙහෙයුම අපි 30වැනි දා ආරම්භ කරනවා. ඒ කටයුත්ත අනිවාර්යයෙන්ම සාර්ථක වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Leader of the Opposition. You have been allotted seven minutes.

[අ.භා. 1.00]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ඇති කරනවා කියලා රටට පොරොන්දු වෙලා අද රටත්, ජන සමාජයත් මිලේච්ඡත්වයට, මිනීමරු සංස්කෘතියකට, සාතන සංස්කෘතියකට යොමු වෙමින් තිබෙන අවස්ථාවක මම අහන්න කැමැතියි, මේ සාතන රැල්ල, මේ මිනීමරු රැල්ල රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් කියන කාරණාව අදටත් පිළිගන්නේ නැද්ද කියලා. ඒක ජාතික ආරක්ෂාවට ප්‍රශ්නයක් කියලා පුන පුනාම කියනකොට එය බැහැර කරන්නට මේ රජය කටයුතු කළා. ප්‍රජාතන්ත්‍රවාදී රටක නීතියේ ආධිපත්‍යය, යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ඉතාම වැදගත් අංශ. නමුත් අද වන විට නීතිය වල් බිහි වෙලා. කැලෑ නීතිය ක්‍රියාත්මක වෙනවා. මහජන නියෝජිතයකුට මහජන දිනයක් හරහා තමන්ව පත් කරපු ජනතාවට සේවය කරන්නට බැරි වාතාවරණයක් අද රටේ නිර්මාණය වෙලා තිබෙනවා.

ලසන්ත වික්‍රමසේකර කියන්නේ, වැලිගම ප්‍රාදේශීය සභාවේ, මිදිගම - බටහිර කොට්ඨාසයේ සියයට 67.3ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගෙන, විවිධ අභියෝග මැද්දේ වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට විපක්ෂයේ සියලුදෙනාම එකතු කරගෙන නායකත්වය ලබා දුන්න පුද්ගලයෙක්. ඒ පුද්ගලයා තමන්ගේ රාජකාරිය ඉෂ්ට සිද්ධ කරමින් සිටින මොහොතේ වෙඩි පිට වෙඩි පහරවලට ලක් කර ඔහුව සාතනය කර තිබෙනවා. දැන් රටේ නිර්මාණය වෙලා තිබෙන මේ සාතන රැල්ල, මේ මිනීමරුවන්ගේ රජදහන නිර්මාණය වීම සම්බන්ධයෙන් තිබෙන සංඛ්‍යා ලේඛන දිහා පොඩ්ඩක් බලන්න. 2025 ජනවාරි 01වැනි දා ඉඳලා ඔක්තෝබර් මාසයේ 22වැනි දා දක්වා වෙඩි තැබීම් 101ක්, මරණ 52ක්, තුවාල ලැබූවන් 56ක් වාර්තා වෙනවා. ඇත්තවශයෙන්ම මේ රජය පොරොන්දු වුණු පුනරුදය මේකද?

මම විශේෂයෙන්ම පෙන්වා දෙන්න කැමැතියි, කවුරුත් වැඩිය නොකිව්ව කාරණාවක්. ලසන්ත වික්‍රමසේකර වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා 2025.08.29 දින පොලිස්පතිවරයාට ලිපියක් ලියනවා, "මාගේ ජීවිත ආරක්ෂාව සලසා ගැනීම සම්බන්ධයෙනි" යන ශීර්ෂය යටතේ. ඔහු මේ ගැන පොලීසිය දැනුවත් කරනවා. පෙරළා පොලීසිය ඔහුට කියනවා, අවධානයෙන් කටයුතු කරන්න කියලා. ඔහු කියා තිබෙනවා, අධිකරණයට පැමිණෙන අවස්ථාවකදී හෝ ප්‍රාදේශීය සභාවට පිටත්ව යන අවස්ථාවකදී සාතනය කරන්නට සැලැස්මක් තිබෙනවා කියන එක. ඔහු එය කෙළින්ම පොලිස්පතිවරයාට ලියලා තිබෙනවා, දිවුරුම් ප්‍රකාශයකුත් එක්ක. ".. මාගේ රාජකාරි වෙලාවේදී සහ පසුවත් සුදුසු ආරක්ෂාවක් මා වෙත ලබා දීමට කටයුතු සලස්වා දෙන ලෙස මා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිමි" යනුවෙන් එම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් වෙනවා. ලසන්ත වික්‍රමසේකර වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා පොලිස්පතිවරයාට යවපු ලිපිය සහ දිවුරුම් ප්‍රකාශය මේ අවස්ථාවේ මා **සභාගත*** කරනවා.

මේ වාගේ තත්ත්වයක් තිබියදීත්, ඔහුට නිසි ආරක්ෂාව, රැකවරණය ලබා දෙන්න රජය අපොහොසත් වුණේ ඇයි? මේ රටේ මෙච්චර පාතාල කල්ලි, කුඩු කල්ලි, මැර කණ්ඩායම්, මිනීමරුවන්, සාතකයන් මර්දනය කරන්නට රජය සමත් වෙලා තිබෙනවා නම්, ප්‍රාදේශීය සභාවක සභාපතිවරයකුට තමන්ගේ සභාවට ඇවිල්ලා ජනතාවට සේවය කිරීමේ නිදහසක් නැද්ද, මේ පුනරුදය තුළ? ඇති කරනවා කිව්ව පොහොසත් රට සහ ලස්සන ජීවිතය මේකද? පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් නොවෙයි නිර්මාණය වෙලා තිබෙන්නේ, මිනීමරු සංස්කෘතියක්, සාතන රැල්ලක්, මිලේච්ඡ සංස්කෘතියක්. ඒ නිසා අපි අහන්න කැමැතියි, පොලිස්පතිවරයා ප්‍රමුඛ පොලීසියට මෙහෙමත් ලිපියකින් ඉල්ලීම් කරලා තිබෙන මොහොතක ඇයි ඔහුට ආරක්ෂාව සපයන්නට කටයුතු නොකළේ කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවංකවම ඔබතුමාත් දන්නවා නේ, බොහොම අමාරුවෙන් නේ විපක්ෂය මේ ප්‍රාදේශීය සභාවේ බලය ලබා ගත්තේ කියා. එක් වෙලාවක කිව්වා, මන්ත්‍රීවරු දෙපළක් බලහත්කාරයෙන් අරගෙන ගිහින් ඒ මන්ත්‍රීවරුන්ට තර්ජන ගර්ජන එල්ල කළාය කියලා, පැහැරගෙන ගියාය කියලා. ඔක්කෝම බොරුවක් නේ කළේ. ඒකත් මේ වැලිගම ප්‍රාදේශීය සභාවේ. ඊළඟට කිව්වා, තවත් මන්ත්‍රීවරයෙකුට වෙඩි තැබුවාය කියලා. ඒකත් ඔප්පු වෙනවා දුරකථන සංවාදයක් තුළින්, "නැහැ, මේ වෙඩි තියන්න ඇත්තේ අපේම කට්ටිය වෙන්න ඇති" කියලා. එවන් තත්ත්වයක් තුළ වැලිගම ප්‍රාදේශීය සභාවේ බලය විපක්ෂයට වැඩි ප්‍රමාණයක් තිබුණත් ඒක පැහැර ගන්නට වර්තමාන රජය කටයුතු කරපු ආකාරය මුළු රටම දන්නවා. ඒ නිසා විශේෂයෙන්ම මම කියන්න කැමතියි, එම ප්‍රාදේශීය සභා සභාපතිවරයාගේ ආරක්ෂාව සලස්වන්නට කටයුතු නොකිරීමේ වගකීම මේ රජය භාර ගන්නට ඕනෑය කියන එක. රජය වග වෙන්නත් ඕනෑ, වග කියන්නත් ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Sajith Premadasa, you have two more minutes from your allocated time.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පැහැදිලිවම අහන්න කැමැතියි, කෝ, අර "පුටුවකුයි, මේසයකුයි අරගෙන එන්න, ජාතික ආරක්ෂාව ගැන ටියුෂන් දෙනවා" කියපු රජයේ නියෝජිතයෝ. කෝ, ඒ ගොල්ලන්? ලොකුවට කථා කළා ජාතික ආරක්ෂාව ගැන. අද මේ රටේ සිවිල් ප්‍රජාවගේ නිදහස අහිමි වෙලා තිබෙනවා. ජීවත්වීමේ අයිතිය නැති වෙලා තිබෙනවා. ඒ වෙන මොනවත් නිසා නොවෙයි, මේ රජය පාතාල කල්ලි හරහා මේ රට තුළ මිලේච්ඡත්වය, මිනීමරු සංස්කෘතිය ප්‍රවර්ධනය වන්නට ඉඩ හැර තිබීම නිසායි. ඒ වගකීම මේ රජය භාර ගන්නට ඕනෑ.

අපි කිසිම දවසක මැර දේශපාලනය, පාතාල දේශපාලනය, කුඩු දේශපාලනය අනුමත කරන්නෙත් නැහැ, ඒ ගමන් මාර්ගයේ අපි ගිහිල්ලාත් නැහැ කියන එක පැහැදිලිව කියන්න ඕනෑ. නමුත්, අද වෙනම මඩ බලකායක් නිර්මාණය වෙලා පෙන්වන්න හදනවා, අපි අපේ දේශපාලන ගමන ක්‍රියාත්මක කරන්නේ මේ කල්ලි කණ්ඩායම් හරහාය කියලා. මම බොහොම පැහැදිලිව කියන්න කැමැතියි, ඒ දේශපාලනය අපි තරයේ ප්‍රතික්ෂේප කරනවා කියන එක. මේ මිනීමරු සංස්කෘතිය ඉවත් කරන්නට ගත හැකි උපරිම ශක්තිය යොදා කටයුතු කරන්න; මේ නීති ප්‍රතිසංස්කරණය කරලා, මේ මිලේච්ඡත්වය ව්‍යාප්ත කරන කණ්ඩායම් නීතියේ රාමුව තුළ පරාජය කරන්න මේ රජයට කොන්දක් තිබෙනවා නම්, ඒ සඳහා කරන හැම වෑයමකටම අපි අපේ සහයෝගය ලබා දෙනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

හැබැයි, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ මරණයට මේ රජය සෘජුවම වගකිව යුතුයි. ඒ කාරණයෙන් මේ රජයට පැනලා යන්න බැහැ. ඒක මම පැහැදිලිව ප්‍රකාශ කරනවා. මේ අවස්ථාවේ මේ රටේ ක්‍රියාත්මක වන පාතාල කල්ලි, කුඩු කල්ලි, මැර කල්ලි මර්දනය කරන්න අපි අපේ උපරිම ශක්තිය ලබා දෙනවා වාගේම ඒ කල්ලි මර්දනය කිරීමේ මුවාවෙන් විපක්ෂය මර්දනය කිරීමට දරන උත්සාහය අපි තරයේ හෙළා දකිනවා.

ඒ වාගේම මම තව කාරණයටක් කියන්න කැමැතියි. දැන් මහජන දින පැවැත්වීම ආණ්ඩු පක්ෂයේ මහජන නියෝජිතයෝ කරනවාද, නැද්ද කියලා මම දන්නේ නැහැ. ඒක විපක්ෂයේ අපි කරනවා. මහජනතාව හමු වෙනවා. මහජනතාව අතරට යනවා. හැබැයි, අද වන විට විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව ඉවත් කරලා තිබෙනවා. ඒ ආරක්ෂාව අහිමි කරලා තිබෙනවා. ආරක්ෂක අංශවලට, පොලිස්පතිවරයා ප්‍රමුඛ, ඇමතිවරයා ප්‍රමුඛ කණ්ඩායම්වලට අපි කිව්වා, මේ මන්ත්‍රීවරුන්ට තමන්ගේ රාජකාරි ඉෂ්ට කරන්නට, මහජන යුතුකම, වගකීම ඉෂ්ට කරන්නට ඒ අවශ්‍ය රැකවරණය ලබා දෙන්න කියලා. මම අහන්න කැමැතියි, ඒ ඉල්ලීමට අද වෙලා තිබෙන්නේ මොකක්ද කියන එක. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පමණක් නොවෙයි, පළාත් පාලන ක්ෂේත්‍රයේ ඉන්න අපේ මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන්ගේ වගකීම, ඒ අයගේ යුතුකම, ඒ මහජන සේවාව ඉෂ්ට සිද්ධ කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂාව ලබා දීම මේ රජයේ යුතුකමයි, වගකීමයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව ගැන කරපු ඉල්ලීමට අද කිසිම පිළිතුරක් නැහැ. කරුණාකරලා පිළිතුරක් ලබා දෙන්න. ඇගැයීම් කරන්න ඕනෑ ලු, තක්සේරු කරන්න ඕනෑ ලු, වාර්තා ගන්න ඕනෑ ලු. අවසානයේ ජීවිත පරිත්‍යාග කරන්නටත් සිද්ධ වෙනවාද, මේ ඉල්ලීම ඉෂ්ට කරන්න? මම ඒක අහන්න කැමැතියි. මතක තබා ගන්න ඕනෑ, මේ මන්ත්‍රීවරු 225දෙනාම නියෝජනය කරන්නේ ලක්ෂ 220ක් වන ජනතාවයි කියන එක. අපි ආරක්ෂාව පතන්නේ පළමුව ලක්ෂ 220ක් වූ සිවිල් ප්‍රජාවගේ, පුරවැසි පරපුරේ ආරක්ෂාව ලබා දීලා. ඒ අය තමයි ප්‍රමුඛතාව. ඒ අයගේ ඉල්ලීම්, ඒ අයගේ යුතුකම්, වගකීම් ඉෂ්ට කරන්නට අපි බැඳී සිටිනවා. ඒ නිසා මේ රටේ සිවිල් පුරවැසියන්ගේත්, මහජන නියෝජිතයන්ගේත් ආරක්ෂාව තහවුරු කරන්නට වහාම ගන්නා පියවර කුමක්ද කියන එක රටට හෙළිදරවු කරන්න. ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Aravinda Senarath, you have 11 minutes.

[අ.භා.1.12]

ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ අපි රටේ ජාතික වශයෙන් වැදගත් මාතෘකාවක් පිළිබඳවයි කථා කරන්නේ. මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ තුරන් කිරීම හා නෛතික රාමුව ශක්තිමත් කිරීම සඳහා ජාතික වැඩසටහනක් සකස් කිරීම වෙනුවෙන් ආණ්ඩු පක්ෂය විධියට අප කටයුතු කරමින් ඉන්න මොහොතක්, මෙය. ඒ කරුණු කාරණා පිළිබඳවයි අප කථා කරමින් ඉන්නේ.

විපක්ෂය පැත්තෙන් ආණ්ඩුවට විවිධ චෝදනා, මඩ, අවලාද නඟමින් ඉන්නවා. ඒ වාගේම අද දවසේ ඔවුන් තමන්ට ඉතාම ගැළපෙන ඇඳුමකින් සැරසිලා පාර්ලිමේන්තුවට පැමිණ සිටිනවා. අපි ඉතිහාසයේ ඉගෙන ගෙන තිබෙනවා, අපේ රටේ කළු දේශපාලන චරිත සුදු ඇඳගෙන ඇවිල්ලා මිනිසුන් රවට්ටපු ආකාරය. ඒ අයට සමාජය තුළ කිව්වා, "ප්‍රභූවරු" කියලා. සමාජයේ තහවුරුවක් තිබුණා, සුදු ඇඳගෙන එන මේ මහත්වරුන්ගේ ඇතුළ කළුයි කියලා. ඉතිහාසයේ ඒ අය සමාජයේ පුරවැසියන් රැවැට්ටුවා. හැබැයි විපක්ෂය අද කුමන හෝ හේතුවක් නිසා ඇත්ත ඇඳුම අඳින තැනට වැටිලා තිබෙනවා. ඇතුළ කළු මිනිසුන් එළියට කළු අඳින එක හොඳයි, ජනතාවට හඳුනා ගන්න. ඔය කළු ඇඳගත්තු මහත්වරු මේ රටට නිර්මාණය කරපු සමාජ, ආර්ථික රටාවේ පසුබිමේ ප්‍රතිඵල තමයි අද අපි භුක්ති විඳිමින් ඉන්නේ. ඒ නිසා ඒ ගැළපෙනම ඇඳුම අද විපක්ෂයේ අය ඇඳගෙන ඇවිල්ලා තිබෙනවා. හැබැයි, සමහර මන්ත්‍රීවරු එහෙම නැහැ. ඒ පිළිබඳවත් මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවක වගකීම තමයි, මත්ද්‍රව්‍ය පාලනය කිරීම, අපරාධ මර්දනය කිරීම සහ අපරාධ පාලනය කරලා මිනිසුන්ට නිදහසේ ජීවත් වෙන්න ඕනෑ වටපිටාව නිර්මාණය කිරීම. අපි බලය අරගෙන අවුරුද්දයි. හැබැයි, බලය අරගෙන ගෙවුණු මේ අවුරුද්ද ඇතුළේ ආණ්ඩුවක් විධියට අපි මේ පිළිබඳව විධිමත් සැලැස්මක් යටතේ කටයුතු කරමින් නීතිය ක්‍රියාත්මක කරමින් ඉන්නවා. හැබැයි, ඉතිහාසයේ එහෙම තිබුණේ නැහැ. සමහර රාජ්‍ය නායකයෝ අපරාධකාරයන්ගේ කරට උඩින් අත දමා ගත්තා. සමහර රාජ්‍ය නායකයෝ කුඩු business කරපු දේශපාලනඥයන් රැකගත්තා; වැළඳ ගත්තා. ඒ තමයි, ඔවුන් සමාජයට දුන්නු පණිවිඩය. ඔවුන් තමන්ගේ ප්‍රධාන ආරක්ෂකයා බවට පත් කරගත්තේ පාතාලය. ඉතිහාසයේ එහෙම අයගේ නම් ඕනෑ තරම් තිබෙනවා. ඔය කථා කරන මහත්වරු මේ මාස 10 ආණ්ඩුවට විවේචන එල්ල කරන්න කලින් තමන්ගේ හෘදය සාක්ෂියට තව්වු කරලා බලන්න, තමන්ගේ අප්පලා සහ තමන් පාලනය කරපු කාලය තුළ මේ රටට මුහුණ දෙන්න වෙච්ච අර්බුද පිළිබඳව. මට මතකයි 2001දී -ඔය කථා කරන මහත්වරුන්ගේ ආණ්ඩු පැවැති කාලයේ- හම්බන්තොට දිස්ත්‍රික්කයේ හිටියා, එම්.කේ. රංජිත් කියලා පළාත් සභා ඇමති කෙනෙක්. එතුමා අධි ආරක්ෂිත කලාපයේදී -ආරක්ෂාව තිබෙන්නේ එතැනයි- මරලා දැම්මා. ඔය කථා කරන මහත්වරු හිටියා, ඒ ආණ්ඩුවේ ඇමතිවරුන් විධියට.

වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ ඝාතනය අපි කවුරුවත් අනුමත කරන්නේ නැහැ. ඒකට බලපෑ කරුණු කාරණා තිබෙන්න පුළුවන්. ඒක පොලිස් දෙපාර්තමේන්තුව පැත්තෙන් අපි අහගනිමු. හැබැයි, මේ සමාජය මෙතැනට ගෙනාවේ විපක්ෂයේ ඉන්න මහත්වරු. මැරකම නැහැ කිව්වාට, මැරකම නැති වුණේ 2024 සැප්තැම්බර් 21න් පසුවයි. ඒක මතක තබාගන්න. ප්‍රාදේශීය සභා ඡන්දයක් දිනුවාට පසුව, පළාත් සභා ඡන්දයක් දිනුවාට පසුව දිස්ත්‍රික්කය ඇතුළේ මැර දේශපාලනය කළා.

බංකුවක් අරගෙන එන්න කියන කථාවක් කියනවා නේ, පැය 24න් ප්‍රශ්න විසඳපු එකක් ගැන කියනවා නේ. ඔය විපක්ෂයේ මහත්වරුන්ට අපි මතක් කරනවා, අපි පැය 24න් මේ සමාජය සෝදලා, පිරිසිදු කරලා මැර දේශපාලනය අපේ ලාංකීය භූමියෙන් නැති කර තිබෙන බව. ගමේ ඉන්න තරුණයන්ට අත ඔසවන්න පුළුවන් කිසිදු දේශපාලනඥයෙක් -පළාත් සභාවේ මන්ත්‍රීවරු, ගමේ ඉන්න සංවිධායකයන්- මේ සමාජය තුළ දැන් නැහැ. අපි ඒ සියල්ල යටපත් කරලා, මර්දනය කරලා තිබෙනවා. අපි ඒක ජීවිත අත්දැකීම් අනුව ආදර්ශයෙන්, ප්‍රජාතන්ත්‍රවාදීවයි කළේ. අපි මැර දේශපාලනය ක්‍රියාත්මක කළේ නැහැ. හැබැයි, මැර දේශපාලනය කරපු මහත්වරු ඇවිල්ලා අපට වැදි බණ දේශනා කරනවා. මහත්තයෝ, කණ්ණාඩියක් ඉස්සරහට ගිහිල්ලා තමන් දිහා බලන්න. එතකොට මැර දේශපාලනය නඩත්තු කරපු මිනිස්සු කවුද කියලා පෙනේවි.

[ගරු අරවින්ද සෙනරත් මහතා]

මෙහිදී මතු වුණු කාරණා ගොඩයි. විපක්ෂයේ සමහර දේශපාලනඥයෝ මෙතැනට ඇවිල්ලා මේ ආණ්ඩුවට චෝදනා කරමින් කියනවා, අපරාධ රැල්ල දැන් වැඩි වෙලා තිබෙනවා කියලා. විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ මාමණ්ඩිය ඝාතනය කළා, ගාල්ලේදී. මෙය, එතුමාට මඩ ගහන්න කියනවා නොවෙයි. හැබැයි පොලිස් වාර්තා අරගෙන බැලුවාට පසුව එතුමාට සම්බන්ධතා තිබෙනවා, අපරාධ කල්ලිත් එක්ක, කුඩු ජාවාරම් එක්ක. එහෙම අයයි මේ ඉන්නේ. එම නිසා අපි විපක්ෂයට යෝජනාවක් කරනවා. ප්‍රාදේශීය සභාවේ හෝ වෙනත් දේශපාලන යන්ත්‍රණයක් තුළ හෝ කුඩු බිස්නස් කරන විපක්ෂයේ අය ඉන්නවා නම් ඒ අපරාධකාරයන්ට කියන්න, ඒවා නවත්වන්න කියලා. ඔය කථා කරන මහත්වරුන්ගේ පක්ෂ ඇතුළේ එවැනි අය තවම ඉන්නවා. ඒ අය තමයි සංවිධානාත්මකව සැලසුම් කරලා ඒවා කරන්නේ. අපි දන්නේ නැහැ, විපක්ෂය මේක මෙහෙයවනවා ද කියලාත්. අපි ඒක හොයන්න ඕනෑ. කාලසටහනකට නම් වෙඩි තියන්නේ, කාලසටහනකට නම් මිනිසුන් මරන්නේ, "දවසේ වෙඩිල්ල" කියන මාතෘකාව නම් එන්නේ, ඒ සියලු දේ ඇතුළේ විපක්ෂයේ සැලසුම් තිබෙනවාද කියලා අපි හොයන්න ඕනෑ.

මොකද, මේ හැම දෙයකටම අපරාධකරුවන් විධියට අත් අඩංගුවට ගන්නේ විපක්ෂයේ අයයි. විපක්ෂය කලබල වෙන්න ඕනෑ නැහැ. විපක්ෂයේ සිටින හැම මන්ත්‍රීවරයෙකුටම මේ චෝදනා නැහැ. හැබැයි, තම තමන්ගේ පක්ෂ ශුද්ධ කර ගන්න ඕනෑ. අපරාධකාරයන්ගෙන් පිරිච්ච පක්ෂ ශුද්ධ කර ගන්න ඕනෑ. ඔබතුමන්ලාගේ පක්ෂ නියෝජනය කරන හොඳ කොල්ලෝ කෙල්ලෝ ගම්වල ඉන්නවා නේ. ඒ අයට අවස්ථාව නැහැ නේ. මිද්දෙණියේදී කුඩුත් එක්ක අපරාධකාරයෝ රංචුවක් අත් අඩංගුවට ගත්තා. ඒ සියලු දෙනාම විපක්ෂයේ පක්ෂ නියෝජනය කරන අය. ඒක මඩක් නොවෙයි. මා නියෝජනය කරන හම්බන්තොට දිස්ත්‍රික්කයේ විපක්ෂයේ මන්ත්‍රීවරු දෙදෙනෙක් මේ මොහොතේ මා ඉදිරිපිට ඉන්නවා. ඒ දෙදෙනාගේ හෘදය සාක්ෂියෙන් ඇහුවොත් ඒ ගැන කියාවි. ඒ ජාවාරම්වලට, ඒ අපරාධවලට සම්බන්ධ වෙලා ඉන්න සියලුදෙනා පාහේ ඒ ඒ පක්ෂවල සංවිධායකයෝ. එතකොට කරන්න තිබෙන්නේ මොකක්ද? "අපි මේක මර්දනය කරන්න ආණ්ඩුවට සහාය දෙනවා" කියලා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියනවා වාගේම, තමන්ගේ පක්ෂයේ ගෝලයන්ට කියන්න, "උඹලා මේ අපරාධවලින් ඈත් වෙයල්ලා; උඹලා නීතිය ඉස්සරහට ගිහිල්ලා මේක නිවැරදි කර ගනිල්ලා" කියලා. ඒ ඉල්ලීම කරන්න. එහෙම කරන්නේ නැතිව ඒ අය නඩත්තු කරන ගමන් මේ ආණ්ඩුව විවේචනය කරන්න එපා. ආණ්ඩුව නීතිය ක්‍රියාත්මක කරමින් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා කලබල විය යුතු නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක අපරාධයක්. මොකද, අපේ රටේ වසරින් වසර කුඩු සම්බන්ධයෙන් අත් අඩංගුවට ගැනීම් වැඩි වෙලා තිබෙනවා; අයිස් සම්බන්ධයෙන් අත් අඩංගුවට ගැනීම් වැඩි වෙලා තිබෙනවා. මේක ව්‍යාපාරයක් විධියට පවත්වාගෙන යන්න හිටපු පාලකයෝ ඔවුන්ට උදව් කරලා තිබෙනවා. සාමාන්‍යයෙන් ගත්තොත් මේ වාගේ අපරාධ, මේ වාගේ ජාවාරම් කරන්න බැහැ, පවතින ආණ්ඩුවේ උදව් නැතිව. ඉතිහාසය පුරාවට එහෙම කරලා තිබෙනවා. හැබැයි, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් මතක තියා ගන්න ඕනෑ, මේ අපරාධවලට, මේ කුඩු ජාවාරමට උදව් නොකරන ආණ්ඩුවක් අපි හදලා තිබෙන බව. ඒ 2024 අපි හදපු ජාතික ජන බලවේගය ආණ්ඩුව මිස වෙන මොකවත් නොවෙයි.

අපි අපරාධකරුවන්ට උදව් කරන්නේ නැහැ; අපට ඒ කිසිවෙකු සමඟ සම්බන්ධකම් නැහැ. අපි ඒක පාලනය කරන්න, මර්දනය කරන්න කටයුතු කරමින් ඉන්නවා. ඔබතුමන්ලා ඒ වැඩ පිළිවෙළත් එක්ක අත්වැල් බැඳගන්න. මේක බේදවාචකයක්. අද අවුරුදු 14ට අඩු දරුවෝ අයිස් ගහන තැනට පත් වෙලා තිබෙනවා. මහා ලොකුවට මාධ්‍ය ඉස්සරහට ඇවිල්ලා කයිවාරු ගැහුවාට වැඩක් නැහැ. මේවා තේරුම් ගන්න. මේක සමාජය තුළ තිබෙන බේදවාචකයක්. පාසල් යන වයසේ දරුවෝ අද කුඩු බොනවා. මේ සමාජය තුළ සිටින දුප්පත් දරුවන් ඒ ජාවාරම්වලට සම්බන්ධ කර ගන්නවා. මේ මන්ත්‍රීවරුන් අද මෙතැන මේ කාරණය ගැන කථා කරලා යයි. හිතන්න එපා, කුඩු ගහන්නේ, මේ කුඩු ජාවාරමට සම්බන්ධ වෙන්නේ විසිරුණු පවුල්වල, දුප්පත් පවුල්වල දරුවන් විතරක් කියලා. අද විවිධ තරාතිරම්වල පවුල්වල දරුවෝ කුඩු බොන තත්ත්වයට පත් වෙලා සිටිනවා; කුඩු business එකත් එක්ක සම්බන්ධ වෙලා සිටිනවා. ඒ නිසා මේක බේදවාචකයක්. මේක සමස්ත පුරවැසියන් අත්වැල් බැඳගෙන විසඳා ගත යුතු ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය අපේ පක්ෂයට විතරක් අදාළ එකක් නොවෙයි.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, what is your point of Order?

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, හිටපු අමාත්‍යවරයෙකුගේ father-in-law ඝාතනය වුණා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
He has not named you, Hon. Member.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නම කිව්වේ නැති වුණාට, බිරිඳගේ තාත්තාව ඝාතනය වෙච්ච පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විධියට දැන් මේ ගරු සභාවේ ඉන්නේ මා විතරයි නේ. එතකොට මම ගැන තමයි එතුමා සඳහන් කළේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පාතාලයට සම්බන්ධ වාර්තා තිබෙනවා නම්, ඔබතුමා ඒවා ගැන පාර්ලිමේන්තුවෙන් එළියේදී කියන්න. මොකද, මාධ්‍යයත් එවැන්නක් කියලා මම ඔවුන්ට නඩු දාලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, we need to continue. You have been listed to speak; you can speak later.

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මගේ වෙලාව දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Deputy Minister, you may continue.

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සඳහන් කළේ හිටපු නියෝජ්‍ය ඇමතිවරයෙක් කියලායි. ඒ පිළිබඳ විවේචන තිබෙනවා නම්, තමන්ට දැනෙනවා නම් කථා කළාට කමක් නැහැ. මම එතුමාගේ නම කියලා ඒක කිව්වේ නැහැ. හරිද? එයාට කැක්කුමක් තිබෙනවා නම් ඒක වෙනම විසඳාගන්න. මගේ කාලය මට දෙන්න. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා මතක තියා ගන්න, ඔබට සහ ඔබේ තාත්තාගේ දේශපාලනයටත් අපි භය නැති බව. හරිද? අපි ඔබට වාගේම ඔබේ තාත්තාගේ දේශපාලනයටත් භය නැහැ. ඒ සියල්ල පරද්දලා තමයි අපි ජාතික ජන බලවේගය ආණ්ඩුව හදලා තිබෙන්නේ. ඒ නිසා සද්දේ දාලා මේවා යට කරන්න බැහැ. අපරාධකාරයෝ බයවෙලා ඉන්නේ; අපරාධකාරයෝ කලබල වෙලා තිබෙනවා. අපි කියනවා හම්බන්තොට දිස්ත්‍රික්කයේ මිනිසුන්ට, අපි කියනවා ලාංකීය මිනිසුන්ට, මේ අපරාධකාරයන්ගෙන් අපේ මාතෘ භූමිය නිදහස් කර ගැනීමේ වගකීම ජාතික ජන බලවේග ආණ්ඩුව භාරගෙන තිබෙනවා, අකුරක් නැර අපි ඒක ඉෂ්ට කරනවා කියලා. කලබල වෙච්ච මිනිස්සු කලබල වුණාට කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කථා කරමින් සිටියේ මේ ජාතික ව්‍යසනය පිළිබඳව. එය මැඩලීම සඳහා සමස්ත පුරවැසියෝ එකතු වෙන්නට ඕනෑ. විපක්ෂය එකතු වෙන්න ඕනෑ. විපක්ෂය මෙතැනට ඇවිල්ලා, මාධ්‍ය ඉස්සරහට ගිහිල්ලා කිව්වාට, මේක පාලනය කිරීමට, මර්දනය කිරීමට අපි උදව් කරනවා කියලා, යටින් වෙනත් දේශපාලන ගේම් ගහන එක නවත්වන්න ඕනෑ.

අද ඒ ප්‍රාදේශීය සභා සභාපතිවරයාගේ ඝාතනය සම්බන්ධයෙන් කථා කරන ගොඩක් අය කරන්නේ සැබෑ ඝාතකයෝ වහන එක. ඒක තමයි ඉතිහාසය පුරාම කළේ. සැබෑ ඝාතකයෝ සොයා ගන්න ආරක්ෂක අංශවලට ඉඩ දෙන්නේ නැතුව, ඒක දේශපාලන ගොඩට දාලා සැබෑ ඝාතකයෝ වහන්න උත්සාහ කරනවා. ඒක ඇතුළේත් තිබෙනවා, නැවත වටයකින් පාතාලය ශක්තිමත් කරන කියමනක්. එම නිසා අපි මේ සියල්ල තේරුම් ගන්න ඕනෑ.

අපි මේ රට දැන් අලුත් දිශාවකට හරවමින් තිබෙන්නේ. අපි අලුත් ගමනක් යන්න ඕනෑ. මේ රට වැටුණු රටක්. මේ රටේ ආර්ථිකය විතරක් නොවෙයි, සමාජ ජීවිතය, සංස්කෘතික ජීවිතය සමස්ත කඩා වැටීමකට ලක් වුණු රටක්. එම නිසා මේක ආණ්ඩු පක්ෂයේ වගකීමක් විතරක් නොවෙයි, සමස්ත පුරවැසියාගේ වාගේම විපක්ෂයේත් වගකීමක් විධියටත් අරගන්න ඕනෑ. අපි එකතු වෙලා මේ ප්‍රශ්නය විසඳන්න ඕනෑ. ඒ සඳහා එකතු වෙන්න කියන ආරාධනයයි අපි මේ කරන්නේ. දැන් නීතිය ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. කිසිදු දේශපාලනඥයෙක් සම්බන්ධයෙන්, දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් අපට පෞද්ගලික ප්‍රශ්න නැහැ. හැබැයි, නීතිය නිවැරදිව ක්‍රියාත්මක වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීතිය ක්‍රියාත්මක වෙද්දී විපක්ෂයේ සාමාජිකයෝ තමයි කුඩුත් එක්ක අත්අඩංගුවට ගන්නේ. ටී56ත් එක්ක අත්අඩංගුවට ගන්නේ විපක්ෂයේ පක්ෂ නියෝජනය කරන ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු. ඒ නිසා ඔවුන්ට වේදනාවක් තිබෙන්න පුළුවන් අපි ඔවුන්ගේ පක්ෂවලට මඩ ගහනවා කියලා. නැහැ, අපි පක්ෂවලට මඩ ගහන්නේ නැහැ. පුද්ගලයෝ අත්අඩංගුවට ගනිද්දී තම තමන්ගේ පක්ෂවල අය නම් අත්අඩංගුවට ගන්නේ, කරුණාකරලා අපි ඉල්ලීමක් කරනවා, ඒ අපරාධවල නිරත වුණු තමන්ගේ පක්ෂයේ අයට කියන්න, ඒවා නතර කරලා මේ රට හදන්න උදව් කරන්න කියලා. අන්න ඒ ඉල්ලීම කරමින්, විපක්ෂය කලබල වුණාට අපි කලබල නැහැ, නීතියත් ක්‍රියාත්මක කරනවා, ජාතික වැඩ පිළිවෙළකුත් හදනවාය කියන එක කියන්න ඕනෑ. මේ සියල්ල කරලා ජනතාවට නිදහසේ සතුටින් ජීවත් වෙන්න පුළුවන් රටක් නිර්මාණය කරනවාය කියන පණිවුඩය ගෙනෙනවා.

බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Kaveenthiran Kodeeswaran, You have six minutes.

[பி.ப. 1.24]

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் கொண்டுவரப்பட்டுள்ள ஒழுங்கமைக்கப்பட்ட குற்றச் செயல்களில் ஈடுபடும் கும்பல்களுக்கும் போதைப்பொருள் கடத்தலுக்கும் எதிரான நிகழ்ச்சித்திட்டம் சம்பந்தமான ஒத்திவைப்புப் பிரேரணையை நான் வரவேற்கின்றேன்.

இந்த நாட்டில் போதைப்பொருள் கடத்தல் மற்றும் திட்டமிட்ட குற்றச்செயல்கள் என்பன ஒழிக்கப்பட வேண்டியவை. இவை இந்த நாட்டின் எதிர்காலச் சந்ததியினரை மட்டுமல்லாமல், பொருளாதாரத்தையும் பாதிக்கின்ற செயற்பாடுகளாகவே பார்க்கப்படுகின்றன. உண்மையிலேயே இந்த அரசானது போதைப்பொருளை ஒழிக்கின்ற விஷயத்திலும் திட்டமிட்ட குற்றச்செயல்களைத் தடுப்பதிலும் தனது செயற்பாட்டை முன்நோக்கி நகர்த்திக்கொண்டிருப்பது பாராட்டுக்குரிய விடயமாகும். இருந்தாலும், இந்த நாட்டில் பல துப்பாக்கிச் சூட்டுச் சம்பவங்களும் கொலைகளும் நடந்துகொண்டுதான் இருக்கின்றன. நாங்கள் நாடு என்ற ரீதியில் ஒன்றிணைந்து, இவ்வாறான குற்றச் செயல்களில் ஈடுபடுபவர்களையும் போதைப்பொருள் கடத்துபவர்களையும் சரியான முறையில் தண்டிக்கவேண்டியவர்களாக இருக்கின்றோம். கடுமையான சட்டதிட்டங்களைக் கொண்டுவந்து, போதைப்பொருளுடன் சம்பந்தப்பட்டவர்களுக்கு குறிப்பாக, போதைப்பொருளுடன் சம்பந்தப்பட்ட அரசியல்வாதிகளுக்கு தகுந்த தண்டனைகளைக் கொடுக்கவேண்டிய கடமையும் பொறுப்பும் இந்த அரசுக்கு இருக்கின்றது. இதனை இந்த அரசு சரிவரச் செய்ய வேண்டும். இதற்குரிய சகலவிதமான ஒத்துழைப்பையும் ஒத்தாசையையும் நிச்சயமாக நாங்கள் வழங்குவோம்.

2009ஆம் ஆண்டுக்கு முன்னர் வடக்கு, கிழக்கு தமிழீழ விடுதலைப் புலிகளின் நிருவாகத்தின்கீழ் இருந்தபொழுது, அங்கு போதைப்பொருள் பாவனை என்பது ஒரு சதவீதம்கூட இருக்கவில்லை. அவர்கள் அங்கு சிறந்ததொரு நிருவாகக் கட்டமைப்பை ஏற்படுத்தியிருந்தார்கள். அதனால் அங்கு வாழுகின்ற மக்கள் போதைப்பொருள் பாவனைக்கு எதிராகச் செயற்பட்டார்கள். அங்கு ஒரு காலமும் போதைப்பொருள் பாவிக்கப்படவில்லை. இவ்வாறு சரியான சட்டதிட்டங்களைக் கொண்டுவந்து இந்த நாட்டில் போதைப்பொருள் பாவனையை ஒழிக்க வேண்டிய கடமையும் பொறுப்பும் இந்த அரசுக்கு இருக்கின்றது.

அண்மையில் பீல்ட் மார்ஷல் சரத் பொன்சேகா அவர்கள் ஒரு விடயத்தைச் சொல்லியிருந்தார். அதாவது, "2009ஆம் ஆண்டு இறுதி யுத்தத்தின்போது, வெள்ளைக்கொடியுடன் சரணடைந்த பொதுமக்கள் மற்றும் தமிழீழ விடுதலைப் புலிகள் இயக்கத்தைச் சேர்ந்தவர்கள் சவேந்திர சில்வா அவர்களின் அனுமதியோடு சுட்டுக்கொலை செய்யப்பட்டார்கள்" என்று. இந்த விடயத்துடன் சம்பந்தப்பட்ட அரசியல்வாதிகள் குறிப்பாக, அந்த நேரத்தில் பாதுகாப்பு அமைச்சின் செயலாளராக இருந்த கோட்டாபய ராஜபக்ஷ அவர்கள் தண்டிக்கப்பட வேண்டியவராக இருக்கின்றார். இந்த நாட்டில் யுத்தம் முடிவடைந்த பின்னர் - 2009ஆம் ஆண்டிலிருந்து

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

இன்றுவரை - தமிழ் மக்களுக்கான நியாயம் கிடைக்காமல் இருக்கின்றது. இந்த நாட்டில் இராணுவத் தளபதியாக இருந்தவரே சொல்லியிருக்கிறார், சவேந்திர சில்வா உட்பட இராணுவ அதிகாரிகள் அப்போதிருந்த அரசியல்வாதிகளோடு சேர்ந்து இறுதி யுத்தத்தில் சரணடைந்த தமிழ் மக்களைக் கொன்றிருப்பதாக. எனினும், அவர்களுக்கு எதிராக கடந்த அரசாங்கமும் விசாரணை நடத்தவில்லை; இந்த அரசாங்கமும் விசாரணை நடத்தவில்லை. தமிழ் மக்கள் உள்நாட்டுப் பொறிமுறைமீது நம்பிக்கையிழந்து இருக்கின்றார்கள். அதனால்தான் நாங்கள் சர்வதேச விசாரணையைக் கோருகின்றோம். சர்வதேச விசாரணை மூலம்தான் இவ்வாறான நபர்களைத் தண்டிக்க முடியும். மேற்குறித்த சம்பவத்துடன் சம்பந்தப்பட்ட எத்தனையோ இராணுவ அதிகாரிகள் இருக்கிறார்கள்; அரசியல்வாதிகள் இருக்கிறார்கள். உள்நாட்டுப் பொறிமுறைமூலம் இவர்களைத் தண்டிப்பது சாத்தியப்படாது என்பதை நான் இந்த இடத்தில் தெளிவாகக் கூற விரும்புகின்றேன். அதனால்தான் நாங்கள் சர்வதேச விசாரணையைக் கோரவேண்டியவர்களாக இருக்கின்றோம்.

மேலும், இந்த நாட்டில் நடந்த 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலோடு சம்பந்தப்பட்டவர்களைக் கைதுசெய்து சிறையில் அடைப்பதாக இந்த அரசு ஆட்சிக்கு வருவதற்கு முன்னர் சொன்னது. ஆனால், இற்றைவரை அந்தத் தாக்குதலில் உயிரிழந்தவர்களின் உறவுகளுக்கு நியாயம் கிடைக்கவில்லை. ஏனெனில், அந்தத் தாக்குதலுடன் சில இராணுவ அதிகாரிகள் சம்பந்தப்பட்டு இருக்கிறார்கள்; அரசியல்வாதிகள் சம்பந்தப்பட்டு இருக்கிறார்கள். அவர்களைத் தண்டித்தால் இந்த நாடு பிரளயம் அடையும் என்ற பயம் இந்த அரசுக்கு இருக்கின்றது. இந்த அரசு சரியாகச் செயற்பட வேண்டும் என்றால், குற்றவாளிகளைத் தண்டிக்க வேண்டும்; அதில் கவனம் செலுத்த வேண்டும். இந்த அரசும் இதனைச் செய்யவில்லை என்றால், கடந்த கால அரசுகளைப் போன்றுதான் நாங்கள் இந்த அரசையும் பார்ப்போம். எனவே, இந்த அரசு குற்றவாளிகளுக்கு உரிய தண்டனைகளைக் கொடுக்க வேண்டுமெனக் கேட்டு, விடை பெறுகின்றேன்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Susantha Dodawatta. You have ten minutes.

[අ.භා. 1.30]

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ධර්මප්‍රිය විජේසිංහ මැතිතුමා විසින් සංවිධානාත්මක අපරාධ කල්ලි මැඩ පැවැත්වීම, ඒ වාගේම මත්ද්‍රව්‍ය ජාවාරම මැඩ පැවැත්වීම සම්බන්ධයෙන් ජාතික ජන බලවේග රජය ගෙන එන 'රටම එකට' ජාතික වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් අද දින සභාව කල් තබන අවස්ථාවේ ගෙනැවිත් තිබෙන යෝජනාව සම්බන්ධයෙන් කථා කරන්නට මට අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෙසේ වෙතත් විවාදයට අදාළ කාරණාවට එන්න ප්‍රථම මම මේ සභාවට යමක් සඳහන් කරන්න ඕනෑ. ඊයේ දින සිදු වූ මනුෂ්‍ය ඝාතනයක් සම්බන්ධයෙන් විපක්ෂ මන්ත්‍රීවරු අද දින මේ සභාව තුළ රජයට චෝදනාත්මක ස්වරූපයෙන් අදහස් දක්වමින් සිටිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ පුරවැසියෙක් නම්, ඒ පුරවැසියා සාමාන්‍ය පුරවැසියෙක් වුවත්, අපරාධකරුවෙක් වුවත් ඔහුගේ ජීවිතය ආරක්ෂා කිරීමේ වගකීම රාජ්‍ය සතු බව අපි හැමෝම දන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම යම් සිදු වීමක් වුණාම විපක්ෂයේ දේශපාලන පක්ෂ එහි වගකීම හැම විටම රජය මත පැවරීම හරහා දේශපාලනය කිරීමට උත්සාහ කරනවා. තමන්ගේ දේශපාලන ව්‍යාපාරය හරහා නාම යෝජනා ලබා දීලා තමන්ව බලයට ගෙනෙන්නේ කවුද කියන එක සම්බන්ධයෙනුත් විපක්ෂයට වගකීමක් තිබෙනවාය කියන එක මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. ඒ වාගේම වත්මන් රජය විසින් මේ අදාළ සිද්ධිය සම්බන්ධයෙන් සාධාරණ, අපක්ෂපාති පරීක්ෂණයක් මෙහෙයවනවා.

මිද්දෙනියේ කජ්ජා ඝාතනය සම්බන්ධයෙන් කථා කරනකොට, කාට සම්බන්ධ තොරතුරු වසන් කරන්නද කජ්ජා ඝාතනය කළේ කියන එක ගැන සමාජ කතිකාවක් නිර්මාණය වුණු ආකාරය අපි දැක්කා. ඒ වාගේම වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ඝාතනය කළේ කවුරු සම්බන්ධ තොරතුරු වසන් කරන්නද? දැන් විපක්ෂ නායකතුමා කිව්වා, විපක්ෂයේ සියලු පක්ෂ එකතු වෙලා තමයි ඔහුව සභාපතිත්වයට පත් කළේ කියලා. එහෙම නම් ඔහුව මේ තනතුරට පත් කරලා, මේ ඉලක්කය පහසු කිරීමක් කළාද කියන එක සම්බන්ධයෙනුත් විමර්ශනය කළ යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ විවාද කෙරෙන්නේ සංවිධානාත්මක අපරාධ සහ මත්ද්‍රව්‍ය ජාවාරම සම්බන්ධයෙන්. එවැනි ඉතාම වැදගත් විවාදයක්, මේ මොහොතේ මේ රට සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය වන විවාදයක් කරන මේ අවස්ථාවේදී ඊට අදාළ කරුණු ඉදිරිපත් නොකරමින් විපක්ෂය මේ උත්තරීතර සභාවේ කාලය කා දැමීම සම්බන්ධයෙන් අපි කනගාටු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,මේ රටේ සංවිධානාත්මක අපරාධ, මත් ද්‍රව්‍ය සහ දේශපාලනය එක හුයක බැඳුණු දේවල් විධියට තමයි අතීතයේ ඉඳන් පැවතුණේ කියන එක පක්ෂ විපක්ෂ හැමෝම එකඟ වෙන කාරණාවක්. ඒක මේ සභාවට අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වත්මන් රජය මේ නව ජාතික වැඩ පිළිවෙළ හරහා සංවිධානාත්මක අපරාධ සහ මත් ද්‍රව්‍ය මේ රටින් තුරන් කිරීම සඳහා අවශ්‍ය විද්‍යාත්මක පියවර ගනිමින් ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකයේ මෙවැනි තත්ත්ව පාලනය කර ගත්ත රටවල් ඒ සඳහා අනුගමනය කරපු ක්‍රමවේද තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශක්තිමත් නීති පද්ධතියක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. මේ රජය විසින් ඒ සඳහා අවශ්‍ය නව නීති නිර්මාණය කරමින් තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය වන කාර්යක්ෂම අධිකරණ පද්ධතියක් නිර්මාණය කරමින් තිබෙනවා. සංවිධානාත්මක අපරාධ සහ මත් ද්‍රව්‍ය සම්බන්ධයෙන් වෙනම අධිකරණ නිර්මාණය කිරීමේ සාකච්ඡාවක් තිබෙනවා. මේ ව්‍යසනයෙන් මේ රට බේරාගන්න, අපි ඒ ප්‍රගතිශීලී පියවර ගනිමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රජය විසින් පසුගිය දිනෙක 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවේ සම්මත කර ගත්තා. මේ පනත හරහා සංවිධානාත්මක අපරාධවලට සම්බන්ධ කණ්ඩායම් විසින්, මේ මත් ද්‍රව්‍ය ජාලයන්ට සම්බන්ධ කණ්ඩායම් විසින් එකී අපරාධමය කටයුතු හරහා උත්පාදනය කරගත්ත දේපළ, ඒවායින් උපයා ගත්ත මුදල් නැවත පවරා ගැනීමේ කාර්ය ශක්තිමත් කරලා ඒ සඳහා අවශ්‍ය නීති අණපනත් ගෙනැවිත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාත්‍යන්තර සහ කලාපීය සහයෝගීතාව ලබා ගැනීම සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු වෙලා පියවර විශාල ප්‍රමාණයක් රැගෙන තිබෙනවා. ඉන්දියාව ඇතුළු කලාපීය රටවල් සමඟ සංවිධානාත්මක අපරාධ සම්බන්ධ තොරතුරු, මත් ද්‍රව්‍ය සම්බන්ධ තොරතුරු හුවමාරු කර ගැනීමේ, ඒ සම්බන්ධව එකතු වෙලා මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙළකට වත්මන් රජය මැදිහත් වෙමින් තිබෙනවා.

ඒ වාගේම මත් ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා සමුද්‍රීය පර්යේෂණ උපකරණ ජපානයෙන් ආධාර වශයෙන් ලැබුණු බව මේ රටේ ජනතාව දන්නවා. ඒ වාගේම අපි ගුවන් තොටුපළට නව ස්කෑන් යන්ත්‍රයක් සවිකරලා තිබෙනවා, මත් ද්‍රව්‍ය හඳුනාගන්න. ඒ වාගේම මේ ව්‍යසනය ජයගැනීම සඳහා නාවික හමුදාව, පොලිස් විශේෂ කාර්ය බලකාය, පොලීසිය විසින් විශේෂ මෙහෙයුම් ක්‍රියාත්මක කරමින් සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවන් ජාතික ව්‍යාපාරයක් ක්‍රියාත්මක කිරීමේදී මේ රටේ මහජනතාවගේ මැදිහත්වීම කියන්නේ සාධනීය කාරණාවක්. මොකද අපි දන්නවා, මීට පෙර පැවැති පාලන කාලවලදී මේ රටේ සාමාන්‍ය මහජනතාව අපරාධකරුවන් සම්බන්ධයෙන්, මත්ද්‍රව්‍යවලට සම්බන්ධ පුද්ගලයන් සම්බන්ධයෙන් තොරතුරු ලබා දීමට මැළිකමක් දැක්වූ බව. ඇයි ඒ? අදාළ විමර්ශන ආයතන පිළිබඳව විශ්වාසයක් තිබුණේ නැහැ. දේශපාලන අධිකාරිය පිළිබඳව විශ්වාසයක් තිබුණේ නැහැ. හැබැයි අද තත්ත්වය ඊට වඩා වෙනස්. අද අපරාධ විමර්ශනය පිළිබඳව විශ්වාසනීයත්වය මේ රජය මඟින් තහවුරු කරලා තිබෙනවා. ඒ වාගේම මේ රජයේ පාලනය යටතේ තිබෙන අදාළ විමර්ශන ආයතන මඟින් එම විමර්ශනවල විශ්වාසනීයත්වය තහවුරු කරලා තිබෙනවා. පසුගිය කාලයේ දේශීය සහ විදේශීය වශයෙන් සිදු කළ පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම්, මත්ද්‍රව්‍ය තොග අත්අඩංගුවට ගැනීම් සහ අවි ආයුධ අත්අඩංගුවට ගැනීම් හරහා අපි ජනතාවට ඒ විශ්වාසය ලබා දීලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මේ රටේ ජනතාවට මේ කාරණය කියන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

මේ රට මේ ව්‍යසනයෙන් ගලවා ගැනීමේ සද්කාර්යයට දායක විය යුතු, ඒ සඳහා ඔබගේ දායකත්වය වැඩි වැඩියෙන් ලබා දිය යුතු කාලය ඇවිල්ලා තිබෙනවා. ඒ වෙනුවෙන් මේ වන විටත් අපි 1997 දුරකථන අංකය හඳුන්වා දීලා තිබෙනවා. ඒ වාගේම වට්ස්ඇප් හරහා අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා අංක හඳුන්වා දීලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම තොරතුරු ලබා දෙන සියලු පුද්ගලයන්ගේ අනන්‍යතාව හෙළි නොකරමින්, ඒ අදාළ විමර්ශන කටයුතු නියමාකාරයෙන් කිරීමේ වගකීම එම ආයතන විසින් භාරගෙන තිබෙනවා. ඒ නිසා අපි රටේ ජනතාවට ආරාධනා කරනවා, ඒ මහජන ව්‍යාපාරය සමඟ එකතු වෙන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම විමර්ශන සහ කාර්යය සම්බන්ධයෙන් මාධ්‍යයේ හැසිරීම පිළිබඳවත් විශේෂයෙන්ම කියන්න ඕනෑ. ඇතැම් මුද්‍රිත මාධ්‍ය, ඒ වාගේම ඇතැම් ජනමාධ්‍ය, සමාජ ජාල මාධ්‍ය හරහා අපරාධ රාජ්‍යයක් තුළ අපරාධවලින් අයුතු ලෙස මුදල් උත්පාදනය කර ගත් නිකම්මු වීරයන් බවට පත් කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙනවා අපි දකිනවා. ඒ නිසා අපරාධකරුවන්, මත්ද්‍රව්‍යවලට සම්බන්ධ තැනැත්තන් මේ සමාජයේ වීරයන් බවට පත් කරන්න එපා කියලා අපි ඒ මාධ්‍ය ආයතනවලින්, ඒ වාගේම සමාජ ජාල මාධ්‍ය ක්‍රියාකාරීන්ගෙන් ඉල්ලනවා. ඔවුන් වීරයන් බවට පත් නොකළ යුතු කොට්ඨාසයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. United Nations Office on Drugs and Crime - UNODCහි - 2024 ජූනි වාර්තාව අනුව සංවිධානාත්මක අපරාධ සහ මත්ද්‍රව්‍ය හේතුවෙන් වැඩියෙන්ම පීඩාවට පත් වෙච්ච රටවල් 10ක් හඳුනාගෙන තිබෙනවා. මොනවාද ඒ රටවල් 10? ඇෆ්ගනිස්තානය, මියන්මාරය, කොලොම්බියාව, මෙක්සිකෝව, ඉක්වඩෝරය, පේරු, නයිජීරියාව, කොස්ට රිකා, මැලේසියාව සහ ශ්‍රී ලංකාව. ඒක තමයි අපි මුහුණ දීලා තිබෙන අවාසනාවන්ත තත්ත්වය. අපේ රට අද ලෝකයේ මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ සම්බන්ධයෙන් වැඩියෙන්ම පීඩාවට පත් රටවල් 10 අතරට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා රටේ ජනතාවගෙන්, විමර්ශන අංශවලින් වාගේම විපක්ෂයෙනුත් මම ඉල්ලීමක් කරනවා. මත්ද්‍රව්‍යවලට, සංවිධානාත්මක අපරාධවලට ජාති, ආගම්, පක්ෂ, පාට භේද නැහැ. හෙට ඒකට බිලි වෙන්නේ ඔබේ දරුවාද, මගේ දරුවාද කියලා නැහැ. පවුල තුළට එනකොට දේශපාලන පක්ෂ, පාට භේදවලින් තොරවයි ඒ බලපෑම එන්නේ. ඒ නිසා මේ රට අනාගත සොම්බි රාජ්‍යයක් නොවීම සඳහා පුරවැසි වගකීම ඉෂ්ට කිරීමේ වගකීම ආණ්ඩු පක්ෂය විධියට අපටත්, විපක්ෂය විධියට ඔබතුමන්ලාටත් තිබෙනවා. ඒ නිසා අප සියලුදෙනා එකාවන්ව මේ ජාතික ව්‍යසනයෙන් මේ රට ආරක්ෂා කර ගැනීම සඳහා එකතු වෙමු. ඒ සඳහා මේ රජයේ වැඩ පිළිවෙළට ඔබ සියලුදෙනාගේ සහාය දෙන්න කියලා ඉල්ලා සිටිමින්, මාගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Namal Rajapaksa. You have ten minutes.

[අ.භා. 1.41]

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබ තමුන්නාන්සේලා අද මේ විවාදය සඳහා මේ මාතෘකාව - විෂයය - තෝරා ගැනීම පිළිබඳව ප්‍රථමයෙන්ම මම ස්තූතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කථානායතුමනි, හැබැයි ඉතින් ඒ කොහොම වුණත් සංවිධානාත්මක අපරාධ වෙන්න පුළුවන්, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් වෙන්න පුළුවන්, එක්තරා කොට්ඨාසයකට රාජ්‍ය අනුග්‍රහය ලැබෙනවා නම්, ඔබතුමන්ලා ඔය විවාද කරන, කථා කරන කාරණා ක්‍රියාත්මක කරන්න ලෙහෙසි වෙන්නේ නැහැ. මොකද, තමන්ගේ රාජ්‍යය ඇතුළෙන් නම් ඒ සමහර සංවිධානාත්මක අපරාධ කණ්ඩායම් මෙහෙයවන්නේ, ඒ තෝරා ගත් සංවිධානාත්මක අපරාධකරුවන්ගේ හෝ මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ අවශ්‍යතාව ඉෂ්ට කරන්න නම් තමුන්නාන්සේලා කටයුතු කරන්නේ, ඒ තුළ මේ විෂය පථය සාකච්ඡා කිරීමෙන් ඵලක් වෙන්නේ නැහැ. මේක නවත්වන්න ඕනෑ. අපි දන්නවා, ඒ සඳහා බුද්ධි අංශ ශක්තිමත් කරන්න ඕනෑ බව. බුද්ධි අංශ නිලධාරින් සිරගත කරලා ඒක කරන්න බැහැ. නාවික හමුදාව ශක්තිමත් කරන්න ඕනෑ. හිටපු නාවික හමුදාපතිවරයා සහ බුද්ධි අංශ ප්‍රධානීන් සිරගත කරලා, ඔබේ පක්ෂයේ බුද්ධි අංශ පාවිච්චි කරලා මේ සංවිධානාත්මක අපරාධ නවත්වන්න පුළුවන් කියලා ඔබතුමන්ලා හිතනවා නම් ඒක කරන්න බැහැ. ඒ නිසා තමුන්නාන්සේලාගෙන් මම ඉල්ලන්නේ, ඉස්සෙල්ලාම අපේ රටේ බුද්ධි අංශ ශක්තිමත් කරන්න කියලායි. ඒ, ගොඩබිමේත්, මුහුදේත්. ඒ වාගේම ජාත්‍යන්තර බුද්ධි අංශවලින් ලැබෙන වාර්තා අනුව ක්‍රියාත්මක වන්න.

දැන් UNODC එකෙන් ලැබුණු වාර්තාවක් ගැන කථා කළා. මීට පෙරත් UNODC එකෙන් DEA එක හරහා බුද්ධි අංශ වාර්තාවක් ලංකාවට එව්වා. හැබැයි, ඒ කන්ටේනර් දෙක check කරලා වරායෙන් පැන්නුවා. එහෙම නේද, ගරු ඇමතිතුමනි. කවුද, ඒවා පන්නන්න අවසර දුන්නේ? අද වෙනතුරු ඔබතුමන්ලා ඒ ගැන කියන්නේ නැහැ. තවම හොයනවා ලු. අනෙක් ඔක්කෝම

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

දන්නවා, ඒක දන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ආ, මෙච්චර කාලයක් ගියා, කන්ටේනර් දෙක පන්නපු කෙනා හොයාගන්න බැහැ. දැන් මාස ගණනක් ගත වුණා. කන්ටේනර් ආවේ දෙසැම්බර් මාසයේ, පන්නලා තිබෙන්නේ ජනවාරි මාසයේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කන්ටේනර් දෙක පැන්නුවේ ජනවාරි මාසයේ. දැන් මාස 11ක් විතර ගතවෙලා. මේ, ඔක්තෝබර් මාසය. අවුරුද්දත් ඉවර වෙන්න යනවා, තවම හොයනවා. තවත් කන්ටේනර් 323ක් පැන්නුවා. දැන් කෝ ඒවා? ඒවා පන්නපු විධිය මොකක්ද? මේවාට කවුද වගකියන්නේ? නියෝජ්‍ය ඇමතිවරයා මාධ්‍යයට ඇවිල්ලා කියනවා, "අපි දන්නවා, තිබෙන තැන. අපි වගකීම භාර ගන්නවා" කියලා. මාධ්‍යවේදියා අහනවා, ඒකේ ආයුධ, පුපුරන ද්‍රව්‍ය, මත් ද්‍රව්‍ය තිබුණොත් මොකද කරන්නේ කියලා. "ඔව්, ඒකේ වගකීමත් අපි භාර ගන්නවා" කිව්වා. ඒ නිසා ඔබතුමන්ලා මේ ගන්න උත්සාහය හොඳයි, හැබැයි ඒක අවංකව කරන්න. නුවරඑළියේ අයිස් හදන ෆැක්ටරි එකක් තිබෙනවා කිව්වා. දැන් ඇහුවාම කියනවා, එහෙම එකක් තිබෙන තැනක් තවම දන්නේ නැහැ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොකක්ද මේ බොරුව? පසුගිය දිනක මම නාවික හමුදාපතිවරයා සම්බන්ධයෙන් කථා කළාම, විෂය භාර ඇමතිවරයා මේ පාර්ලිමේන්තුව ඇතුළේදී කිව්වා, අධිකරණ නියෝගයකින් අත්අඩංගුවට ගත්තේ කියලා. හැන්සාඩ් වාර්තාවේ ඒ බව තිබෙනවා. ඇමතිතුමා එහෙම කිව්වා. හැබැයි, ඇප ගන්න ඉහළ උසාවියට ගියාම CID එකට බණිනවා, අත්අඩංගුවට ගත්ත විධිය වැරදියි කියලා. මහජන ආරක්ෂක ඇමතිවරයා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියනවා, අධිකරණ නියෝගයකින් අත්අඩංගුවට ගත්තා කියලා. හැබැයි, ඇප ගන්න ගියාම මොකක්ද කිව්වේ? CID එකේ අවුරුදු 20ක් සේවය කරපු කෙනෙක් මෙහෙමද හැසිරෙන්නේ කියන තැනට, රටේ මිනිස්සු අද හිනාවෙන්න පටන් අරගෙන තිබෙනවා. මොකද, තමුන්නාන්සේලාගේ දේශපාලන වේදිකාවේ හිටපු අයට, පාස්කු ඉරිදා ප්‍රහාරයේ බුද්ධි අංශ වාර්තා මඟ හැරපු අයට, දේශපාලන රැකවරණය ගන්න ආණ්ඩුවේ තනතුරු දීලා තිබෙනවා. එලෙස ආණ්ඩුවේ තනතුරු දුන්නාට කමක් නැහැ, ඒක ඔබේ කැමැත්ත. හැබැයි, ඔවුන් අර කන්ටේනර් දෙක පැන්නුවා වාගේ තවදුරටත් ලැබෙන බුද්ධි අංශ වාර්තා මඟ හරිනවා නම්, යම් කිසි පුරවැසියෙක් තමන්ට ආරක්ෂාව ඉල්ලා පොලිස්පතිවරයාට ලිඛිතව දැනුම් දුන්නාම, ඒ ලිඛිතව දැනුම් දුන් කාරණය මඟ හරිනවා නම්, ඒ ගැන ක්‍රියාත්මක වෙන්නේ නැත්නම්, ආයෙත් රටේ ආරක්ෂාව ගැන, රටේ පුරවැසියාගේ ආරක්ෂාව ගැන අපට කථා කරන්න තිබෙන්නේ මොකක්ද?

පාර්ලිමේන්තුවේ දෙපැත්තට වෙලා අපට බැණ ගන්න ලෙහෙසියි. ඔබතුමන්ලා දැන්වත් මේ දේවල් තේරුම් ගන්න. ඔබතුමන්ලාට අපට ඇඟිල්ල දික් කරන්නත් ලෙහෙසියි. හැබැයි, ලසන්ත වික්‍රමසේකර සභාපතිවරයා තමන්ගේ ජීවිත ආරක්ෂාව ගැන පොලිස්පතිවරයාට ලිඛිතව දන්වා තිබෙනවා. ඔබතුමන්ලා ක්‍රියාත්මක වුණේ නැහැ. ඇයි ඒ? ඒ ගැන ඇහුවාම, කලබල වෙලා, මරණ පරීක්ෂණ වාර්තාව එන්නත් කලින්, මැරුණාද, නැද්ද කියලා දැන ගන්නත් කලින්, මෙතැනට ඇවිල්ලා නැඟිටලා කියනවා, "නැහැ, මොහුට නඩු තිබෙනවා" කියලා. ඒ කාරණය නොවෙයි, මෙතැන තිබෙන ප්‍රශ්නය. ගරු ඇමතිතුමනි, ඔබතුමා එක්ක තිබෙන ප්‍රශ්නයකට නොවෙයි මම මේ දේවල් කියන්නේ, අවංකව මම මේ දේවල් කියන්නේ. අපි යථාර්ථය තේරුම් ගන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අධිකරණ භූමිය ඇතුළට ගිහිල්ලා, නඩුකාරතුමිය ඉදිරිපිට පුද්ගලයෙක් ඝාතනය කරනවා. ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙක් ඝාතනය කරනවා. ඔහුගේ ඉතිහාසය පිළිබඳව, ඔහුගේ ක්‍රියාකාරකම් පිළිබඳව ඔබතුමන්ලා වෙනම ගනුදෙනු කර ගන්න. හැබැයි, ඒ පුද්ගලයාව ඝාතනය කරනවා, මහජන දිනය දවසේ තමන්ගේ කාමරයේ වාඩි වෙලා සිටියදී. *[බාධා කිරීමක්]* අපි කියන්නම් කෝ, වෙලාව ආවම කවුද call කළේ කියලා, කවුද නීතිඥවරුන් කියලාත් අපි කියන්නම්. ගරු ඇමතිතුමනි, කරුණාකරලා තේරුම් ගන්න, ඔබතුමා සහ මා අතර ප්‍රශ්නයක් නැහැ. මම මේ දේවල් ඔබතුමාට කියන්නේ අවංකව. *[බාධා කිරීමක්]* ඔබතුමා සද්ද නැතුව ඔය ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියන දේ අහගන්න කෝ. ඔන්න, දැන් අහගත්තා නේ. අන්න, කියන්න. ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඉස්කෝලේ ගිහිල්ලා ඉගැන්වූයේ නැති වුණාට, වෘත්තීය සමිතිවල කටයුතු කරලා පුරුදුයි නේ. ඔබතුමා දැන් උත්තර දෙන්න කෝ. හැබැයි, ඔබතුමන්ලා මොකක්ද කරන්නේ? අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ ආණ්ඩුවේ රැකවරණය සහිතව සංවිධානාත්මක අපරාධකරුවන්ට ක්‍රියාත්මක වෙන්න ඉඩ තියන්න එපා කියලායි. ඒක කරන්න එපා. එක කණ්ඩායමක් ක්‍රියාත්මක වෙනවා, තව කණ්ඩායමක් අත්අඩංගුවට ගන්නවා. එහෙම කරන්න එපා. එහෙම කිරීමෙන් මේ රටේ ජනතාවට සාධාරණයක් වෙන්නේ නැහැ. මටත් ළමයි ඉන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි විශ්වාස කරනවා, මත් ද්‍රව්‍ය උවදුර නැති වෙන්න ඕනෑ, නවත්වන්න ඕනෑ කියලා. එදා අපි ක්‍රීඩාව ප්‍රවර්ධනය කළේ, සංස්කෘතියට, කලාවට දරුවෝ ගෙනාවේ මතින් ඈත් කරන්න. හැබැයි, ඒකටත් ඔබතුමන්ලා බැන්නා. ඒ කාලයේ කිව්වා, බේබිලා රේස් පදිනවා කියලා. ඒකටත් බණිනවා. හැබැයි, ඒකට කමක් නැහැ. මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න. එලෙස කටයුතු කරන අතර සංවිධානාත්මක අපරාධකරුවන්ව ආරක්ෂා කරන්න ඔබතුමන්ලා ලැහැස්ති වෙන්න එපා.

ඔබතුමන්ලා නීතිය ක්‍රියාත්මක කරන ආකාරය බලන්න කෝ. එක පැත්තකින් පොලීසිය පිල්ලෙයාන් අත්අඩංගුවට අරගෙන ඉන්නවා. ඇහුවාම කියන්නේ, පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් කියලා. හැබැයි, ඔහුගේ Detention Order - DO - එකේ පාස්කු ඉරිදා ප්‍රහාරය ගැන සඳහන් වෙලා නැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. තුන්පාරක් දීර්ඝ කළා නේ, ඒ රැඳවුම් නියෝගය. ඒ රැඳවුම් නියෝගයේ පාස්කු ඉරිදා ප්‍රහාරයක් ගැන ලියලා නැහැ නේ. හැබැයි, මාධ්‍යයට කියන්නේ පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධව අත්අඩංගුවට ගත්තා කියලා.

අනෙක් පැත්තෙන් මිද්දෙනියේ සිද්ධිය සම්බන්ධයෙන් ඔබතුමන්ලා DO ගැහුවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි, පුවක්දණ්ඩාවෙන් අල්ලපු කෙනා, අර කිලෝග්‍රෑම් 850ක් ගොඩබිමේ තිබිලා අහු වුණේ, ඒ පුද්ගලයාත් පුවක්දණ්ඩාවේ, අපේ ගමේ. ඒ, "පුවක්දණ්ඩාවේ සනා" ද කවුද කියන පුද්ගලයෙක්. හැබැයි, ඔහුට රැඳවුම් නියෝග නැහැ. ඔහු සාමාන්‍ය නීතිය යටතේ අත්අඩංගුවට ගත්තේ. දවසෙන් රිමාන්ඩ් කළා. නඩුව යාවි, මාස 6ක්, 7ක්. රස පරීක්ෂක වාර්තා නැහැ. ඔබතුමන්ලා මිද්දෙනියේ සිද්ධිය සම්බන්ධ රස පරීක්ෂක වාර්තාව පැය 24න් ගෙනාවා කිව්වා නේ. අධිකරණ ඇමතිවරයා මේ වෙලාවේ ගරු සභාවේ නැහැ. හැබැයි, එතුමා හිටියා නම් හොඳයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මිද්දෙනියේ සිද්ධිය සම්බන්ධ රස පරීක්ෂක වාර්තාව පැය 24න් ගත්තා වාගේ අනික් රස පරීක්ෂක වාර්තාත් ඉක්මනින් ගන්නකෝ. මේ වන විට බන්ධනාගාරයේ තිස් හතළිස්දහසක් ඉන්නවා, හිර වෙලා. රස පරීක්ෂක වාර්තා එන්නේ නැතිව විශාල පිරිසක් අසරණ වෙලා ඉන්නවා. අවුරුද්දක් දෙකක් යනවා, රස පරීක්ෂක වාර්තාවක් එන්න. මිද්දෙනියේ සිද්ධිය සම්බන්ධව රස පරීක්ෂක වාර්තාව ගත්තා වාගේ අනික් ඒවාත් ඉක්මනින් ගන්න කෝ. හැබැයි, ඔබතුමන්ලා ඒවාට මහන්සි වෙන්නේ නැහැ.

දේශපාලනික වශයෙන් තමන්ගේ නොහැකියාව වහගන්න, තමන්ගේ බැරිකම වහගන්න, තමන්ගේ නොදන්නාකම වහගන්න, විපක්ෂය මර්දනය කරන්න තමුන්නාන්සේලා ලැහැස්ති වනවා. මම දැක්කා, අද කථා කරපු අය ගාල්ලේ වෙඩි තැබීමක්

සම්බන්ධයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ මාමා කෙනෙකු ගැන කිව්වා. ඒ මාමා කසාද බඳින්න කලින් හිටපු දේශපාලන පක්ෂය මොකක්ද කියලාත් හොයාගන්න කෝ; කාටද වැඩ කළේ කියලාත් හොයාගන්න කෝ. එතකොට ඔය ඉස්සරහ පේළියේ ඉන්න හුඟක් අයගේ වත්කම් බැරකම් අලුතින් දෙන්න වෙයි. ඒවා ගැන අපිත් බලාගෙන ඉන්නේ. අපි වෙලාවට ඒවා එළියට දමනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, අද ඒකට වෙලාව නොවෙයි.

ඔබේ ආණ්ඩුවෙන් තනතුරු දීලා තිබෙන පොලීසියේ සමහර නිලධාරින් අද කොහොමද කටයුතු කරන්නේ? අවංක නිලධාරිනුත් ඉන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, සමහරු හරිම පහත් විධියට දේශපාලනය කරනවා. අපි දැක්කා, නාරාහේන්පිට OIC මහත්මයාට එක වෙලාවකදී කියනවා, "නාමල්ගෙයි, ගෝඨාභයගෙයි නම කියන්න, promotion දෙන්නම්" කියලා. කළුතර OIC මහත්මයාට තව වෙලාවකදී කියනවා, "තවත් පුද්ගලයකුගේ නමක් කියන්න, නාවික හමුදාපතිවරයාට විරුද්ධව සාක්ෂි දෙන්න, අපි බේරා ගන්නම්, promotion දෙන්නම්" කියලා. ඒ අතර ඇමතිවරයා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියනවා, promotion දෙන බලය පොලිස් කොමිසමෙන් පොලිස්පතිවරයාට දෙන්න කියලා. මොකක්ද මේ ක්‍රමවේදය?

මේ රටේ සංසරණය වන මත් ද්‍රව්‍ය තමුන්නාන්සේලා අවංකව අල්ලන්න ඕනෑ. දරුවන්ව මතින් බේරාගන්න ඕනෑ. ඒකට පුනරුත්ථාපන කඳවුරු කීයක් තමුන්නාන්සේලා තහවුරු කර තිබෙනවාද? අදටත් 5,000කට අඩු පිරිසක් තමයි මේ රටේ පුනරුත්ථාපනය කරන්න පුළුවන් වන්නේ. එම කඳවුරු සංඛ්‍යාව වැඩි කරන්න තමුන්නාන්සේලාට තිබෙන විකල්පය මොකක්ද? ඒ දරුවන්ව රැකියාගත කරන්න තමුන්නාන්සේලාට තිබෙන විකල්පය මොකක්ද? ඒ දරුවන්ගේ මානසිකත්වය ශක්තිමත් කරන්න තමුන්නාන්සේලාට තිබෙන විකල්පය මොකක්ද? තමුන්නාන්සේලා ඒ දේවල්වලට විකල්ප හොයන්නේ නැතිව ඒ දරුවන් ඒවායෙන් ඈත් කර ගන්න මේක ඇතුළේ දේශපාලනය කරන්න ලැහැස්ති වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණු දරුවන් පැහැදිලිවම පුනරුත්ථාපනය කරන්න ඕනෑ.

ඒකෙදි ඔබතුමන්ලා මතක තබා ගත යුතු කරුණක් තිබෙනවා. මොකද, මහා පරිමාණ අපරාධකරුවන්ට නඩු දමන වගන්තියෙන්මයි දවසක් දෙකක් මත් ද්‍රව්‍ය පාවිච්චි කරපු දරුවන්ටත් තමුන්නාන්සේලා නඩු දමන්නේ. විකුණන අයටත් එහෙමයි; බෙදාහරින අයටත් එහෙමයි. අවසානයේ අහිංසක දරුවෙක් එක පාරක්, දෙපාරක් මත් ද්‍රව්‍ය පාවිච්චි කරලා අහු වෙලා රිමාන්ඩ් වුණාම එළියට එන්නේ මත් ද්‍රව්‍ය ජාවාරම්කාරයෙක් වෙලා. එහෙම නොවෙයි, ඒකට අවශ්‍ය නීති ගෙනෙන්න, පුනරුත්ථාපන කඳවුරු ශක්තිමත් කරන්න, ඒකට අවශ්‍ය වැඩ පිළිවෙළක් හදන්න. හැබැයි, ඒ වැඩ පිළිවෙළ හදන්නේ නැතිව ඔබතුමන්ලා සංවිධානාත්මක අපරාධකරුවන් පාවිච්චි කරලා තමන්ට දේශපාලන වාසි ලබා ගන්න උත්සාහ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැලිගම සිද්ධිය සම්බන්ධයෙන් කියන්න මට එක විනාඩියක් දෙන්න. වැලිගම සිද්ධිය අද ඊයේ ආරම්භ වෙච්ච එකක් නොවෙයි. මීට පෙර ඉඳලා, වැලිගම ප්‍රාදේශීය සභාව හදන තැන ඉඳලා ප්‍රශ්න ඇති වුණා. ඒ සම්බන්ධව පොලීසියට පැමිණිලි කළා, පොලීසියෙන් එතැනට ගියා. දෙදෙනෙකු අතුරුදහන් වුණා කිව්වා, හොයා බලනකොට ඒ අය beach එකේ ඇවිදින්න ගිහිල්ලා අහු වුණා. තමුන්නාන්සේලාගේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට වෙඩි තියලා අහු වුණා. ඔහුගේ හඬ පටයක් තිබෙනවා, "අපේ පක්ෂයෙන්ම මේක කළාද දන්නේ නැහැ" කියලා. ඒක මම කියන දෙයක් නොවෙයි. එතුමාම කියන කාරණයක්. ඒ සම්බන්ධයෙන් මාධ්‍ය සාකච්ඡාවකුත් පවත්වා තිබෙනවා. හැබැයි, එහෙම තොරතුරු තිබියදී ඔබතුමන්ලා නීතිය ක්‍රියාත්මක කළාද? ඔබතුමන්ලා නීතිය ක්‍රියාත්මක කරන්න මහන්සි වුණාද, අඩු ගණනේ ඔබතුමන්ලා නීතිය ක්‍රියාත්මක කරන්න උනන්දු වුණාද? එහෙමවත් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අවසානයේ මහජන දිනයේ සභාපතිවරයාගේ කාමරය ඇතුළට ඇවිල්ලා වෙඩි තබා ගියා.

මේ කාරණය මතක තබා ගන්න. ඔබතුමන්ලාගේ 159දෙනා මහජන දින පවත්වන්නේ නැති වෙන්න පුළුවන්. ඔබතුමන්ලාගේ දේශපාලන න්‍යාය පත්‍රය ඇතුළේ ඔබතුමන්ලාට මහජන දින අදාළ නොවන්න පුළුවන්. හැබැයි, අපි මහජන දින පවත්වනවා. අපට වෙඩි තැබුවත් අපි මහජන දින පවත්වනවා; අපට ගැහුවත් අපි මහජන දින පවත්වනවා; අපේ ගෙවල් ගිනි තැබුවත් අපි මහජන දින පවත්වනවා. මොකද, අපි මේ රටේ ජනතාව වෙනුවෙන් පෙනී ඉන්න පුළුවන් හැම අවස්ථාවකදීම ඒ අය වෙනුවෙන් පෙනී සිටිනවා.

මම අවසාන වශයෙන් ඔබතුමන්ලාගෙන් ගෞරවයෙන් ඉල්ලන්නේ මෙයයි. මේක හොඳ වැඩක්. ඒ නිසා මත් ද්‍රව්‍ය උවදුර හා පාතාලය නවත්වමු. මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරමු. අපි පක්ෂයක් විධියට අපේ පක්ෂයෙන් නාම යෝජනා දෙනකොට ඒ පුද්ගලයා සංවිධානාත්මක අපරාධවලට, මත් ද්‍රව්‍යවලට සම්බන්ධද, නැද්ද කියන කාරණා පිළිබඳව පොලිස් වාර්තාවක් ගන්නම්. ඔබතුමන්ලාත් එහෙම පොලිස් වාර්තාවක් ගන්න. අපේ අපේක්ෂකයන් ගැන හොයනකොට ඔබතුමන්ලාගේ ඥාතීන්ටත් උපදෙස් දෙන්න - දැන් කිව්වා නේ, විපක්ෂයේ අපේක්ෂකයන්ට උපදෙස් දෙන්න කියලා - එම නිසා ඉස්සරහ පේළියේ, මැද පේළියේ, පිටුපස පේළියේ වාඩි වෙලා ඉන්න අය තමන්ගේ නෑදෑයන්ටත් උපදෙස් දෙන්න, මේවායින් ඈත් වෙන්න කියලා. මොකද, අපි පෞද්ගලික දේවල් පාර්ලිමේන්තුවේ කථා කරන්න ලැහැස්ති නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එම නිසා අවංකව කටයුතු කරන්න. හැබැයි, ඔබතුමන්ලාගෙන් මම ගෞරවයෙන් ඉල්ලනවා, රාජ්‍ය අනුග්‍රහය යටතේ සංවිධානාත්මක අපරාධකරුවන්ට හැසිරෙන්න ඉඩ තබන්න එපා කියලා. එහෙම වුණොත්තින් නැවත වතාවක් මේ රාජ්‍යය බිඳ වැටිලා ත්‍රස්තවාදී රාජ්‍යයක් බවට මේ රාජ්‍යය පත් වනවා කියන කාරණයත් මතක තබා ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Major General (Rtd.) Aruna Jayasekera. You have 12 minutes.

[අ.භා. 1.54]

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තූතියි. අද ඉතා වැදගත් විෂයයක් සම්බන්ධවයි සංවාදය පවත්වන්නේ. මත් ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ මේ රටින් තුරන් කිරීම වෙනුවෙන් නෛතික රාමුව එහෙම නැත්නම් නීති පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අපේ රජය විසින් - ආණ්ඩුව විසින් - දියත් කිරීමට නියමිත "රටම එකට" ජාතික වැඩසටහන සම්බන්ධයෙන් වූ විවාදයට සම්බන්ධ වීමට ලැබීම ගැන මම ඉතා සන්තෝෂ වෙනවා.

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, සංවිධානාත්මක අපරාධ නිසා අපේ රට කොච්චර ව්‍යසනයට පත් වෙලා තිබෙනවාද කියා. මත් ද්‍රව්‍ය ජාවාරම වෙනම, තනිව සිදු වන්නේ නැහැ. සිද්ධ වුණේත් නැහැ; සිද්ධ වෙන්නේත් නැහැ. ඒකට සංවිධානාත්මක අපරාධ කල්ලි සම්බන්ධයි. අපරාධ ජාලයක් එක්ක සම්බන්ධ වෙලා, බද්ධ වෙලා තමයි ඒක තිබෙන්නේ. ඒකට දේශපාලනඥයෝ පවා අනුබල දීම, ඔවුන්ට ආරක්ෂාව සැපයීම සිදු වුණු බව පසුගිය කාල වකවානුවල අපි දැක්කා. ඒවා නැවැත්වීම සම්බන්ධව කිසිම ක්‍රියාමාර්ගයක් පසුගිය රජයන් විසින් ගත්තේ නැහැ. ඒ සම්බන්ධව ඔවුන් කටයුතු කළේ නැති බවත් අපි දන්නවා. එහි ප්‍රතිඵලයක් වශයෙන් තමයි, මත් ද්‍රව්‍ය උවදුර රට පුරාම ව්‍යාප්ත වෙලා හැම ජන කොටසක් පුරාම පැතිරිලා තිබෙන්නේ. අන්තිමේදී අපේ පාසල් පද්ධතියටත් මෙම උවදුර පැතිර ගියා. ඉතා නරක ලෙස පාසල් ළමුන් වෙතත් මේ උවදුර පැතිර ගියා.

Hon. Deputy Speaker, I should mention here how the country was when we came to power. We have been experiencing organized crimes - massive, large-scale financial crimes - over a period of time. These organized crimes have not been connected only to the drug menace or drug trafficking, but have been embedded in or networked with human trafficking as well. Then, there has been corruption. When you say corruption, corruption of major scale at State, sub-State or whatever level that you talk about. Also, there has been weapon smuggling. That is why we find weapons here and there, posing a huge threat not only to national security, but also to public, social and economic security. When there is no economic security, we cannot expect to have national security as well.

Sir, here, the most dangerous thing is the involvement of politicians in these crimes. Previously, ඔවුන් මේ සංවිධානාත්මක අපරාධ ජාලවලට කොච්චර දුරට, කොච්චර ගැඹුරින් සම්බන්ධ වෙලා සිටියාද? It was not only the politicians, but we have also been experiencing a badly-practised political culture. That is why we also came forward to save the country from this menace and this mess. The rule of law had completely collapsed; the Judiciary was challenged by the Executive some time ago and suspicion, anger and mistrust grew exponentially among the communities. That happened through the spread of drugs, the gun culture and organized crimes. That was to earn a buck, to earn black money out of it. So, there had been State corruption and also the worst that could happen to a country had happened by the time we came to power. That is why we want to bring the country back to normal and ensure prosperity for our future generations.

The particular group behind those organized crimes - it has not been limited to politicians, as I mentioned, but to a group which holds power - are very well organized. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂිත දූෂිත කණ්ඩායමක් ඉන්නවා. අපි මේකට "සංවිධානාත්මක අපරාධ" කියන වචනය දාගෙන තිබෙන්නේ ඇයි? මේ තුළ රජයේ සේවකයනුත් කොටසක් ඉන්නවා. ඒ වාගේම කොම්පැනි, ව්‍යාපාරික ආයතන කිහිපයකුත් ඉන්නවා. Also, there are accountants, audit firms, lawyers, various groups and teams, banks and real estate agencies involved. මේකෙන් තමයි හදාගෙන තිබෙන්නේ මේ organized crimes කියන එක. ඒකට මත්ද්‍රව්‍ය, අනීතික ලෙස අවි ආයුධ පරිහරණය, හොරෙන් අවි ආයුධ බලපත්‍ර ගැනීම අයිති වෙනවා. ජාතික මට්ටමින් හෝ ඊට පහළින් කවුරුන් හෝ ඒකට විරුද්ධ වෙනවා නම් ඒකට තමයි අපරාධ කල්ලි උඩට ඉස්මතු කරන්නේ හිටපු දේශපාලනඥයන්ගේ බලපෑම් උඩින්, අර උදවියව neutralize කරන්න. එහෙම තමයි සංවිධානාත්මක අපරාධ ජාලය අපේ රටේ ඇති වෙලා තිබෙන්නේ. මේක මහා පිළිකාවක්.

අපේ රටේ ඉතා වැදගත් වයස් සීමාවක් වන අවුරුදු 21-26 අතර දරුවෝ විශාල ප්‍රමාණයක් මත්ද්‍රව්‍ය උවදුරට ඇබ්බැහි වෙලා සිටිනවා. කියන්නත් කනගාටුයි, අපේ බන්ධනාගාරවල දැනට සිටින රැඳවියන්ගෙන් සියයට 70ක් පමණ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා සිටිනවා. පොලිස් නිලධාරින්ගෙන් සියයට 15ක්, 20ක් විතර ඉන්නවා, සමහර වෙලාවට මේවා භාවිත කරන. දැනට තිබෙන වාර්තා අනුව පොලිස් නිලධාරින් 68දෙනෙකුගේ සේවය අත්හිටුවා තිබෙනවා, ඒ සම්බන්ධව ක්‍රියා කිරීම, ඒවාට සම්බන්ධ වීම, තොරතුරු දීම සහ ඒවාට උදවු දීම නිසා. විශේෂයෙන්ම මේ අය අනීතික මූල්‍ය ගනුදෙනු මෙරට පමණක් නොවෙයි ජාත්‍යන්තරවත් සිදු කරනවා. ඒ වාගේම ජාත්‍යන්තර අපරාධ ජාලවලටත් මේ කල්ලි සම්බන්ධ වෙලා තිබෙනවා. ඉහත කාරණා ගත්තාම මේ මත්ද්‍රව්‍ය අපි නැති කරන්න ඕනෑ නැද්ද? අපි මේක ජාතික මෙහෙවරක් විධියට ගන්න ඕනෑ නැද්ද? මේකට හැමෝම සම්බන්ධ වෙන්න ඕනෑ නැද්ද? එහෙම නොකළොත් රටක් හදන්න බැහැ. ඒ නිසා තමයි මේ සියලු පාර්ශ්වයන්ගේ මැදිහත්වීම අපි බලාපොරොත්තු වෙන්නේ. "රටම එකට" ජාතික මෙහෙවර වැඩසටහනට සියලු පාර්ශ්වයන් සම්බන්ධ කරගෙන, වගකීම් දීලා, වග වෙන්න දීලා නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ.

අපට නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවායින් විශේෂයෙන් පොලීසිය යටතේ විශේෂ කාර්ය බලකාය තිබෙනවා. ඒ වාගේම ත්‍රිවිධ හමුදාව ඉන්නවා. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව තිබෙනවා, රේගුව තිබෙනවා. අපි දන්නවා, ඒ ආයතන මත්ද්‍රව්‍ය අපරාධ සම්බන්ධයෙන් ක්‍රියා කළ ආකාරය. පසුගිය කාලයේ විශේෂයෙන්ම බුද්ධි අංශ එම කටයුතු සම්බන්ධව විශේෂ කර්තව්‍යයක් සිදුකර තිබෙනවා. දැනටත් එහෙම කරනවා. ඉදිරියේදීත් විශේෂයෙන් බුද්ධි අංශ හරහා ජාතික වැඩසටහන්වලට අදාළ විශාල කාර්යයක් කරන්න තිබෙනවා. රාජ්‍ය සේවයත් එම කටයුතුවලට සම්බන්ධ කරගන්න ඕනෑ. ඒ වාගේම පාසල් පද්ධතියත් සම්බන්ධ කරගන්න ඕනෑ. පාසල් ගුරු භවතුන්, ආදි ශිෂ්‍ය සංගම්, ආගමික නායකයන්, ආගමික පාර්ශ්ව මෙයට සම්බන්ධ කරගන්න ඕනෑ. ඒ වාගේම බුද්ධි අංශවල විශේෂ දායකත්වයක් කළ යුතුව තිබෙනවා, මේ සම්බන්ධයෙන්. මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධවලට විරුද්ධව ක්‍රියා කරන විශාල ජාත්‍යන්තර ජාලයක් තිබෙනවා. ඔවුන්ගෙන් තොරතුරු අරගෙන, මේ කලාපයේ සහ ලෝකයේ සහයෝගීතාව වර්ධනය කරගෙන, තොරතුරු හුවමාරු කර ගැනීමට බුද්ධි අංශවලට සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට විශේෂ කාර්යභාරයක් පැවරෙනවා. දැනටමත් ඔවුන් එය සිදු කරනවා. විශේෂයෙන්ම ඔවුන්ට එම කාර්යභාරය පැවරීමට මේ ජාතික මෙහෙවර තුළිනුත් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම කියන්න ඕනෑ, කවුරු හිටියත්, මොන නීතිය ක්‍රියාත්මක වුණත්, මොන අංශ තිබුණත්, මොන mechanisms, මොන උපායමාර්ග තිබුණත් මහජනතාවගේ සහයෝගයත් මේ සඳහා අවශ්‍ය බව. පසුගිය මාස 10ක විතර කාල වකවානුව තුළ මහජනතාව අපේ මේ වැඩ පිළිවෙළ හා සම්බන්ධ වෙලා, විශේෂයෙන් පොලීසියත් සමඟ ඉතා කිට්ටුවෙන් සම්බන්ධ වෙලා එම තොරතුරු දුන්නා. ඒවායේ ප්‍රතිඵල තමයි අපිට මේ ලැබෙන්නේ.

අපි අවුරුදු 30ක කාලයක් යුද්ධ කළා. ඒක ඉතා සාර්ථකව නිම කළා. මමත් යුද හමුදාවේ අවුරුදු 36ක් සේවය කළා. පසුගිය දශක 3ක පමණ කාලය තුළ මහජනතාව විශේෂයෙන්ම සැලකිලිමත් වෙමින්, එකට ඉදිමින්, "රටම එකට" කියන චේතනාවට ඇවිල්ලා ඒ රුදුරු ත්‍රස්තවාදයෙන් මේ රට බේරා ගන්න ඉදිරිපත් වුණා. ඒ කාලයේ මහජනතාව සිවිල් ආරක්ෂක කමිටුවලට සම්බන්ධ වෙලා, තොරතුරු දීලා, තොරතුරු හුවමාරු කරගෙන, දැනුවත් කරලා, පාසල් ආරක්ෂා කරන්න ඉදිරිපත් වුණා. ඒ නිසා මම කියන්න කැමැතියි, මේ මත්ද්‍රව්‍ය මර්දනය කිරීමේ කටයුත්තටත් සියලු දෙනාගේම සහයෝගීතාව අවශ්‍ය බව. මහජනතාවගේ සහයෝගීතාව නැත්නම් මේක කරන්න බැහැ.

මේකට සැපයුමත් තිබෙනවා, ඉල්ලුමත් තිබෙනවා. ඒ වාගේම පරිසරය හැදෙන්නත් ඕනෑ. අපි දැන් සෑහෙන දුරකට එම සැපයුම් ජාලය කඩා තිබෙනවා. විශේෂයෙන්ම නාවික හමුදාව ඈත මුහුදු තීරයේ උදේ, දවල්, රෑ විශේෂ මෙහෙයුම් දියත් කරනවා. සතියකට පමණ කලින් තංගල්ල ප්‍රදේශයේ මුහුදු තීරයෙන් මත්ද්‍රව්‍ය තොගයක් ඇල්ලුවා. තංගල්ල, රෑකව ප්‍රදේශයට මමත් ගිහිල්ලා බැලුවා. මත්ද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 850කට ආසන්න ප්‍රමාණයක් නාවික හමුදා භාරයට ගෙන තිබුණා. ඒවා මහ දරුණු මත්ද්‍රව්‍ය. ඒවා සමාජගත වුණා නම්, කොච්චර ව්‍යසනයක් වෙන්න පුළුවන්ද? තංගල්ල කියන්නේ අපිට ආර්ථික වශයෙන් දියුණු කරගන්න පුළුවන්, ශක්තිමත් ආර්ථිකයක් හදන්න පුළුවන් ප්‍රදේශයක්. නමුත් ඒ ප්‍රදේශවල සිදු වන්නේ මොනවාද? මත්ද්‍රව්‍ය සම්බන්ධ කටයුතු, අපරාධ සම්බන්ධ කටයුතු. අපරාධ ජාලයක් ක්‍රියාත්මක වෙන්නේ. මේ මත්ද්‍රව්‍යවලට පවතින ඉල්ලුම සහ සැපයුම අතර ලොකු සම්බන්ධයක් තිබෙනවා. ඒක නිසා එම සැපයුම කැඩීමට වාගේම ඉල්ලුමත් අඩු කිරීමට තමයි අපේ මේ ජාතික මෙහෙවර ක්‍රියාත්මක වෙන්නේ. ඒ කියන්නේ, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච කෙනෙක් පුනරුත්ථාපනයට ගිහිල්ලා නැවත සමාජගත වෙනකොට අපි ඔහුව ආරක්ෂා කරන්න ඕනෑ. ඒ නිසා තමයි අපේ මේ ජාතික වැඩමුළුවට, මේ ජාතික ව්‍යාපාරයට සමගාමීව මහජන ආරක්ෂක කමිටු හදා තිබෙන්නේ; ප්‍රජා සංවර්ධන සභා, ප්‍රජාශක්ති ජාතික වැඩසටහන හදා තිබෙන්නේ. ඒවායෙන් දුප්පත්භාවය තුරන් කර, දුප්පත්භාවයෙන් අනාරක්ෂිත වෙලා තිබෙන පවුල්වල දරුවන්ව ආරක්ෂා කර, ඔවුන්ව සවිබලගන්වා ඔවුන්වත් මේ ජාතික මෙහෙවරට, ආර්ථික වර්ධනයට එකතු කර ගැනීමෙන් අනාගතයේදී අපට මේ මත්ද්‍රව්‍ය උවදුර විශාල ලෙස මර්දනය කරගන්න පුළුවන් වෙනවා.

අපේ රජය අපේ ප්‍රතිපත්ති හරහා බැඳී සිටිනවා, මේ උවදුර නැති කිරීමට. අපි ඒක අනිවාර්යයෙන්ම කරනවා. අපි පොරොන්දු වුණා. එසේ පොරොන්දු වුණා වාගේම අපි ඒක කරනවා. ඔබලාට දැක ගන්නත් පුළුවන්, දැන් මේ කරන දේවල්වල ප්‍රතිඵල. අපි දන්නවා, මේවාට strategies හදන්නේ කොහොමද කියලා. අපි මේ උපායමාර්ග - strategies - බිම් මට්ටමින්, මධ්‍යම මට්ටමින්, ජාතික මට්ටමින් හදා ජාත්‍යන්තරයත් එක්ක සම්බන්ධ වෙලා තමයි මේ වැඩ කටයුතු කරන්නේ. ඒකෙන් develop කරනවා, අපේ මේ සැලසුම්. ඒ සැලසුම් ක්‍රියාත්මක කරන පිළිවෙළක් තිබෙනවා. ඒ පිළිවෙළ මහජනතාවට බද්ධ කරලා, මහජනතාව නියෝජනය කරන කමිටු එක්කත් එකතු වෙලා එම තොරතුරු හුවමාරු කරගෙන මේ රටින් මේ මත්ද්‍රව්‍ය, මේ අපරාධ ජාලය අනිවාර්යයෙන්ම නැති කරනවා කියා අපි පොරොන්දු වෙනවා.

අපට මහා ජනබලයක් ලබා දීලා තිබෙනවා, උතුර, නැගෙනහිර, කඳුකරය ඇතුළු මුළු රටෙන්ම. ඒකට අපි ගෞරවය දක්වන්න ඕනෑ. ඔවුන්ගේ ඒ ජන මතයේ තිබෙන්නෙත් බලාපොරොත්තු. ඔවුන්ට තිබෙන විශාලතම බලාපොරොත්තුව තමයි මත්ද්‍රව්‍ය උවදුර, මේ අපරාධ රැල්ල මේ රටින් තුරන් කරන එක. ඒකට අපි දිවි හිමියෙන් ඉදිරිපත් වෙනවා. අපේ ජීවිත නැති වුණත් අපි මේ සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම ක්‍රියා කරනවා. මම විශ්වාසයෙන් කියනවා, මෙතැන ඉන්න 159දෙනාගේම අත් පිරිසිදුයි, සිත් පිරිසිදුයි, ක්‍රියාව පිරිසිදුයි කියලා. මේක, ඒ තරම් උතුම් දේශපාලන ව්‍යාපාරයක්. මෙවැනි දේශපාලන ව්‍යාපාරයක් රටකට ආපහු බිහි වෙන්නේ නැහැ. ඒ නිසා තමයි අපි වාගේ අයත් මේකට සම්බන්ධ වුණේ. තව ඕනෑ තරම් දේශපාලන ව්‍යාපාර තිබුණත් අපි මේකට සම්බන්ධ වුණේ ඒකයි. ඉතිහාසයට අදාළව මේ ව්‍යාපාරයට විරුද්ධව කොච්චර දේවල් කිව්වත්, ඒවා සම්පූර්ණයෙන්ම බොරු. ඒ නිසා අපි ආරාධනා කරනවා, විරුද්ධ පක්ෂයට, එහෙම නැත්නම් අනෙකුත් විරුද්ධ දේශපාලන බලවේගවලට, පක්ෂවලට, ව්‍යාපාරවලට, මහ ජනතාවට මේ ජාතික ව්‍යාපාරයත් එක්ක එකතු වෙලා මේ මහා ව්‍යසනයෙන් මේ රට ගොඩ ගන්න කියලා.

මේ සම්බන්ධව අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. මොකද, අපි ඇවිල්ලා තිබෙන්නේ මේ රට හදන්න. මේ රටේ අනාගත පරපුරේ අවශ්‍යතාව අපි දැකලා තිබෙනවා. රටට වෙච්ච හානිය අපි දැක්කා. යුද්ධය අවසන් කරලා අවුරුදු 15ක් -දශක එකහමාරක්- ගත වුණා. දැන් මේ විරුද්ධ පක්ෂය නියෝජනය කරන අයගේ ආණ්ඩු ඒ කාලයේ පස් අවුරුදු සැලසුම් තුනක් හැදුවා නම්, අපි අද මේවාට එන්න ඕනෑ නැහැ. සුඛිත මුදිත රටක්, ආසියාවේ ආශ්චර්යය ඇති කරනවා කිව්වත් එහෙම කළේ නැහැ. ඒ කාලයේ පස් අවුරුදු සැලසුම් තුනක් හදන්න තිබුණා. ඒ පසු අවුරුදු සැලසුම් තුන තුළ මේ සියලු දේවල් ගැබ් කරලා තිබුණා නම්, අපිට මෙච්චර දුර එන්න ඕනෑ නැහැ. එහෙම වුණා නම් මීට කලින් අපට ඉතා හොඳ, ස්වයංපෝෂිත, ආර්ථිකමය වශයෙන් දියුණු, ලෝකයේ හොඳ නමක් දිනා ගත් රටක් හැටියට ඉදිරියට යන්න තිබුණා. නමුත් අපට ඒක කර ගන්න බැරි වුණා. දූෂිත දේශපාලන සංස්කෘතියයි අපි ඉස්සෙල්ලාම වෙනස් කළේ. අපි ඒකට හොඳ උදාහරණයක් දුන්නා. ඒ නිසා අපේ වැඩකටයුතු ඉදිරියටත් කරගෙන යන්න ඔබ සියලු දෙනාගේම සහාය ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින්, අවස්ථාව ලබා දුන්නාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Chathura Galappaththi. You have seven minutes.

Before he starts, will an Hon. Member propose the Hon. Kitnan Selvaraj to the Chair?

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. KITNAN SELVARAJ took the Chair.

[අ.භා. 2.09]

ගරු චතුර ගලප්පත්ති මහතා
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ කථා කරන මාතෘකාව යටතේ අදහස් කිහිපයක් දක්වන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙන ගමන්, මුලින්ම මම කාරණයක් ගැන සඳහන් කළ යුතුව තිබෙනවා. විශේෂයෙන් ඊයේ දවස ගත්තොත්, ලංකා ඉතිහාසයට කළු පැල්ලමක් එක් කළ දවසක්. ඒකට හේතුව, ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට මහජන ඡන්දයෙන් තේරී පත් වුණු ප්‍රාදේශීය සභා සභාපතිවරයෙකුව ඔහුගේ නිල කාමරය තුළදී මහ දවාලේ ඝාතනය කරපු දවස තමයි ඊයේ දවස. මහජන ආරක්ෂක ඇමතිතුමාත්, ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. ඒ දෙන්නාම ලොකු කථා කියනවා. නමුත්, ඊයේ දිනය වෙනකොට වෙඩි තැබීමේ සිද්ධි century එකක් සම්පූර්ණ වෙලා ඉවරයි. ඒ වාගේම half century එකකට වඩා මරණ සිදුවෙලා තිබෙනවා. ඊයේ දවසේ සිද්ධියත් එක්ක 57වැනියා තමයි ඒ ඝාතනය වෙලා තිබෙන්නේ. ඒ වාගේම 101වැනි වෙඩිල්ල තමයි පත්තු කරලා තිබෙන්නේ. ඉතින් තවම ඇමතිතුමා සහ නියෝජ්‍ය ඇමතිතුමා මහජන ආරක්ෂාවයි, ජාතික ආරක්ෂාවයි ගැන පම්පෝරි කියවනවා නම්, මේ රටේ ජනතාවට දහ වාරයක් හිතන්න වෙනවා, මෙතුමන්ලා මේ අවුරුද්ද ඇතුළත මොනවාද කියලා තිබෙන්නේ කියලා.

මේ රජය බලයට එන්න කලින් විශේෂයෙන් මහජන ආරක්ෂාව සහ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් ගොඩක් දේවල් කිව්වා. අද ඒවා එකින් එක බොරු වෙන බව දැන දැනත්, මෙතුමන්ලා ගෙනෙන තර්කය මොකක්ද? ඇත්තටම මම මේ කථාව කරන්න හේතු වුණේ, මහජන ආරක්ෂක අමාත්‍යතුමා ඊයේ දිනයේදී සිදු කරපු ප්‍රකාශයයි. එතුමා කළ ප්‍රකාශය අපි දැඩි පිළිකුලෙන් යුතුව හෙළා දකිනවා. එතුමා ඊයේ දවසේත් කිව්වා, මහජන ආරක්ෂාවට ප්‍රශ්නයක් වෙලා නැහැ කියලා. ඒ වාගේම එතුමා කෙළින්ම ප්‍රකාශ කළා, ඊයේ ඝාතනයට ලක් වෙච්ච ලසන්ත වික්‍රමසේකර කියන සභාපතිවරයා අපරාධකරුවෙක් කියලා. ඔහුට නඩු 6ක් ගොනු වෙලා තිබෙන බව ඇත්ත. හැබැයි, ඔහු අපරාධකරුවෙක් කියලා කිසිම උසාවියකින් තීන්දුවක් දීලා නැහැ.

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
එතුමා අපරාධකරුවෙක් වෙලා නැහැ.

ගරු චතුර ගලප්පත්ති මහතා
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)

අපරාධකරුවෙක් වෙලා නැහැ. ඒකට උසාවියෙන් තීන්දුවක් දෙන්න ඕනෑ. උසාවියෙන් තීන්දුවක් දෙන්නේ නැතිව කොහොමද ඔහු අපරාධකාරයෙක් වෙන්නේ? ඒ තීන්දුව ඔබතුමන්ලාට දෙන්න බැහැ. ඔබතුමන්ලා කැලෑ නීතියයි ක්‍රියාත්මක කරන්නේ. *[බාධා කිරීම්]* ඔබතුමන්ලා කැලෑ නීතිය ගැන දන්නා නිසායි එහෙම කටයුතු කරන්නේ.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මෙතුමන්ලාටත් නඩු තිබෙනවා නේ.

ගරු චතුර ගලප්පත්ති මහතා
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)

මෙතුමන්ලාටත් නඩු තිබෙනවා. ඕනෑම කෙනෙකුට නඩු තිබෙන්න පුළුවන්.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගොඩනැඟිල්ලක් අල්ලා ගත්තු එකකට නඩුවක් තිබෙන්නේ.

ගරු චතුර ගලප්පත්ති මහතා
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)

ගොඩනැඟිලි අල්ලා ගත්තාට නඩු තිබෙනවා. ඒවාට බලපෑම් කරපු ඒවාත් තිබෙනවා. එහෙම තිබියදී,- *[බාධා කිරීම්]* සැකකරුවෝ ඉන්න පුළුවන්. *[බාධා කිරීම්]* එහෙම නම් ඔබතුමන්ලාගේ පක්ෂයේ මහ ලේකම්තුමා අරගෙන බලන්නකෝ. ඔබතුමන්ලාගේ පක්ෂයේ මහ ලේකම්තුමාට තිබෙන **අපරාධ චෝදනා** සහ එතුමා විඳපු දඬුවම් ගැන බලන්න. *[බාධා කිරීමක්]* එහෙම තියාගෙන බොරුවට කයිවාරු ගහනවා. නඩු තිබුණාට ඒ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා සැකකරුවෙක් පමණයි. නමුත්, ඊයේ දවසේ මහජන ආරක්ෂක අමාත්‍යතුමා ඒ සභාපතිතුමාව අපරාධකරුවෙකු ලෙස හංවඩු ගැසීමට විරුද්ධවයි මම අද දවසේ මේ වචනය හරි කථා කරන්න තීන්දු කළේ.

මේ වන විට මේ ආණ්ඩුවට අවුරුද්දක් ගත වෙලා තිබෙනවා. ඔබතුමන්ලාගේම පක්ෂයේම කෙනෙක් විධායක ජනාධිපතිවරයා වෙලා ඉන්නවා. ඒ වාගේම මේ ආණ්ඩුවට මන්ත්‍රී ධුර 159ක බහුතර බලයක් -පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක්- තිබෙනවා. පළාත් පාලන ඡන්දය තියන්න කලින් නාම යෝජනා දීලා මාස 6ක් විතර ඉන්න වුණා. ඡන්දය තියලා දැන් මාස 6ක් වෙනවා. ඒ සභාව පිහිටුවද්දීත් විවිධ ප්‍රශ්න තිබුණා. ප්‍රශ්න මැද්දේ එතුමා මාස 3ක් සභාපතිවරයා වශයෙන් හිටියා. ආණ්ඩුව එතුමාට විරුද්ධව දමපු එක නඩුවක් ගැන හෝ කියන්න. මෙතැන කථා කරන එක මන්ත්‍රීවරයෙක් හෝ කියන්න, ඒ සභාපතිතුමාට විරුද්ධව මේ ආණ්ඩුව වාර්තමානයේදී දාපු එක නඩුවක් ගැන. එහෙම දාපු එක නඩුවක්වත් නැහැ. එතුමාගේ ඉතිහාසය හා සම්බන්ධ කාරණාත් එක්ක තිබෙන, සැකකරුවෙකු විධියට ඉන්න නඩුවලට එතුමාව අපරාධකාරයෙක් කරලා ඉවරයි. ඒ වාගේම, සමාජ මාධ්‍ය සහ ඩෝබිලා සෙට් එක යොදවා එතුමාව අපරාධකාරයෙකු විධියට හංවඩු ගහලා ඉවරයි.

ලසන්තට යම් සාධාරණයක් ඉටු විය යුතුයි. එතුමාගේ ඉතිහාසය පිළිබඳ කාරණා තිබෙන්න පුළුවන්. මෙතැනත් ඉන්නවා 1988, 1989 සමයේ මිනිසුන් ඝාතනය කරලා, දේපළ හානි සිදු කරලා, විවිධ දේවල් කරලා අද ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් හැටියට ඉන්න අය. ඒ වාගේ එතුමාගේ ඉතිහාසයේත් යම් යම් දේවල් තිබෙනවා. මිදිගම කියන්නේ ඉතිහාසයේ ඉඳන්ම ඔය වාගේ අපරාධකාරයෝ බිහි වෙච්ච තැනක්. ඒක ඒ සමාජ වටපිටාවත් එක්ක ඇතිවුණු දෙයක්. "හරක් කටා" කියලා හඳුන්වන නවීන් චින්තක වෙන්න පුළුවන්, ඒ වාගේම "මිදිගම රුවන්" වෙන්න පුළුවන්, ඒ එක වයස් සීමාවක ඉන්න යාළුවෝ කණ්ඩායමක්. ඒගොල්ලෝ පාසල් මිත්‍රයෝ; ඥාතීන්. එසේ ඒ මිත්‍රයන් එක්ක එකට ඉන්න කොට නඩු වැටෙනවා.

මට එතුමාව පෞද්ගලිකව මුණ ගැහෙන්නේ 2016දී. 2016දී එතුමාව මුණ ගැහෙන්නේ වෙනත් දෙයක් නිසා නොවෙයි. ඒ ගමේ තිබෙනවා ගමට විතරක් නොවෙයි මුළු ලංකාවටම ඩොලර් ගෙනෙන කර්මාන්තශාලාවක්. ඇත්තටම ඒ කර්මාන්තශාලාව නිසා ගමේ අයට විශාල අසාධාරණයක් සිද්ධ වෙනවා. Management එක වෙනස් වීම තුළ ගමේ ඉන්න සේවකයන් ඉවත් කරන්න කටයුතු කරනවා. ගමේ තිබෙන වැවට විෂ ද්‍රව්‍යයක් දාලා වැවේ මාලුවෝ මැරෙන්න ගන්නවා. ඒ වාගේම, රෑට වායුවක් එළියට නිකුත් කිරීම නිසා ප්‍රදේශයේ ජනතාව ලෙඩ වෙන්න ගන්නවා. අන්න එතකොට ගමට නායකත්වයක් දෙන්න කෙනෙක් ඉදිරිපත් වුණේ නැහැ. විවිධ දේශපාලන මත දරපු කෙනෙක් වුණත් ඒ වෙලාවේදී ගමට නායකත්වයක් දෙන්න

එතුමා කටයුතු කළා. අන්න එහි ප්‍රතිඵලයක් විධියට ගමේ ඉන්න ජනතාව තමයි එතුමාව අප ළඟට එක්කරගෙන ඇවිත් "මෙතුමාව අපේක්ෂකයෙක් කරන්න" කියලා යෝජනා කළේ. අපි ලසන්තව හොයා ගෙන ගියේ නැහැ. නමුත්, සජිත් ප්‍රේමදාස මැතිතුමා ඇතුළු සමඟි ජන බලවේගයට මේ කාරණාව අල්ලාගෙන හැමෝම පහර ගහනවා නේ. ඒ සභාපතිවරයා අපරාධකාරයෙක් කියලා උසාවියෙන් තීන්දු කරලා නැත්නම් එක එක අය කිව්වාට අපරාධකාරයෙක් වෙන්නේ නැහැ. උසාවියෙන් තීන්දු කරලා තිබුණා නම් ඔහු අපරාධකරුවෙක් කියලා, අපට ඒ ගැන හිතන්න තිබුණා. හැබැයි, තවමත් ඔහු සැකකාරයෙක් විතරයි. අන්න ඒ නිසා තමයි පක්ෂයක් විධියට ගමේ අදහසට ඇහුම්කන් දීලා ඔහුට නාම යෝජනා දෙන්න කටයුතු කළේ.

මම තවත් කාරණයක් කියන්න ඕනෑ. මෙතැන තිබෙන බරපතළම වැරැද්ද, මේ ආණ්ඩුවට ඇඟිල්ල දිගු කරපු ප්‍රධාන කාරණාව මේකයි. ඔහු සභාපතිවරයා වශයෙන් සිටියදී -මාස දෙකකට කලින්- පොලිස්පතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, තමාට ජීවිත ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා, ජීවිත අවදානමක් තිබෙනවා, ඒ නිසා ඒ පිළිබඳව කටයුතු කරන්න කියලා. හැබැයි, ඒකට කිසිම පිළිතුරක් දීලා නැහැ. ඔන්න, ඕවාටයි ඔබතුමන්ලා පිළිතුරු දෙන්න ඕනෑ. Easter attack එක සම්බන්ධයෙන් එදා හිටපු පොලිස්පතිවරයාට තිබුණු චෝදනාව මොකක්ද? ඒ සම්බන්ධයෙන් වගකීම නොගැනීම හෙවත් වගකීම් රහිත වීම. එතකොට මේ පොලිස්පතිවරයාටත් අදාළ වන්නේ ඒ කාරණයම තමයි. වැඩිම ඡන්ද ප්‍රතිශතයක් අරගෙන මහජන ඡන්දයෙන් පත් වෙච්ච සභාපතිවරයෙකු තමාට ආරක්ෂාව ලබා දෙන්න කියලා කරපු ඉල්ලීම නොසලකා ඔහුට ආරක්ෂාව නොදීම තුළ අන්න මහ දවල් අමු අමුවේ ඔහුව ඝාතනය කර තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන් වෙනවා.

ගරු චතුර ගලප්පත්ති මහතා
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමාගේ කාලයත් මට ලබා දීලා තිබෙනවා.

එදා Easter attack සම්බන්ධයෙන් හිටපු පොලිස්පතිවරයාට යම් චෝදනාවක් එල්ල වී තිබෙනවා නම් ඒ වාගේම චෝදනාවක් මේ වර්තමාන පොලිස්පතිවරයාටත් තිබෙනවා. එතුමාට එරෙහිව නීතිමය පියවර ගන්න අපි කටයුතු කරනවා කියන කාරණාව අපි කියන්න ඕනෑ.

ඔබතුමන්ලා මත්ද්‍රව්‍ය ගැන කථා කරනවා; පාසල්වල මත්ද්‍රව්‍ය තිබෙනවා කියනවා; තවත් ඒවා මේවා ගැන කියනවා. හැබැයි, කන්ටේනර් 323ක් පරීක්ෂාවකින් තොරව මේ රට ඇතුළට ගෙන ඒම තුළ මොන වාගේ දේවල් මේ රටට ඇතුළු වුණාද කියන කාරණාව සම්බන්ධයෙන් තවම පියවරක් ගෙන නැහැ. ඒවා තුළ ආයුධ තිබුණා වෙන්න පුළුවන්; මත්ද්‍රව්‍ය තිබුණා වෙන්න පුළුවන්. රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධ නියෝජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා; මහජන ආරක්ෂක ඇමතිතුමාත් ඉන්නවා. මේවාට උත්තර දෙන්න.

අද කොහේ හරි කුඩු ටිකක් හම්බ වෙනවා නම්, කොහේ හරි ආයුධ ටිකක් හම්බ වෙනවා නම්, ඒකට වගකියන්න ඕනෑ වෙන කවුරුවත් නොවෙයි, වර්තමාන ආණ්ඩුවයි කියන එක මම පැහැදිලිව කියනවා. ඔබතුමන්ලා ඒකට උත්තරයක් දෙන්නේ නැතුව කොහේ කොහේ හරි කුඩු ටිකක් අහු වුණාම මොකක්ද කරන්නේ? දවසේ news එක යන්නේ, දවසේ trailer එක යන්නේ, "මෙන්න කොහෙන් හරි කුඩු ටිකක් හම්බ වුණා. කොහෙන් හරි ආයුධ ටිකක් හම්බ වුණා. පාතාලයේ අය හසු වුණා" කියලායි. අද මේ රජය ෆේල් වෙලා තිබෙනවා; කන්ටේනර් 323ට මොකක්ද වුණේ කියලා කියන්න බැරි වෙලා තිබෙනවා. මිද්දෙනියෙන් කන්ටේනර් දෙකක් හමු වුණා. ඒ කන්ටේනර් දෙකේ අයිස් තිබුණා. ඒකට පොහොට්ටුවේ මන්ත්‍රීවරයෙක් සම්බන්ධයි කියලා ඒක පොහොට්ටුව පිට දැම්මා. හැබැයි, වැලිගමදී හමු වුණා ලු, අයිස් හදන ෆැක්ටරියක්. වැලිගමදී හමු වුණේ අයිස් ෆැක්ටරියක් කිව්වාට ඒකේ තිබුණේ අයිස් නොවෙයි; ලංකාවේ අලුතින්ම හොයා ගත් මත්ද්‍රව්‍යයක්. ඒකට අදාළව විදේශිකයෙකු අත්අඩංගුවට ගත්තා. හැබැයි, ලාංකිකයෝ දෙන්නෙකුත් හිටියා. ඒ දෙන්නාට කොහොමද පොලීසියෙන් ඇප දෙන්නේ? අයිස් මත්ද්‍රව්‍ය ෆැක්ටරියක් හම්බ වුණා නම්, ඒගොල්ලන් අත් අඩංඩගුවට ගන්නේ නැතුව කොහොමද එදාම ඇප දෙන්නේ? ඔන්න ඕවාට උත්තර දෙන්න. පොලීසියට එනකොට ඇප දීලා ඉවරයි. එහෙමත් කරලා තියෙද්දී බොරු බයිලා කියනවා.

අවසාන වශයෙන් මම තවත් එක දෙයක් කියනවා. මෑතකදී දරුවන් සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයට අදාළව ගෙනාපු (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ දෙවන වර කියවීමේ විවාදය වෙලාවේදී ගරු බිමල් රත්නායක ඇමතිතුමා අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කිව්වා, "තාරේ සමීන් පර්" film එක බලන්න කියලා. එතුමා ඒ film එක හරියට බලලා නැහැ. ඒකේ තිබෙන්නේ මොකක්ද? විවිධ දක්ෂතා තිබෙන දරුවෝ පිරිසක් ඉන්නවා, ඒ දරුවන්ගේ දක්ෂතා හඳුනාගෙන ඒ අයට හරි මාර්ගය පෙන්වන කථාවක්, මේක. හැබැයි, එතැනින් පස්සේ "සිතාරේ සමීන් පර්" කියලා film එකකුත් ආවා. අපි ඒකත් බලලා තිබෙනවා. එතුමා ඒක බැලුවේ නැත්නම් බලන්න කියන්න ඕනෑ. හැබැයි, මම මේ ආණ්ඩුවේ ඉන්න සියලු මන්ත්‍රීවරුන්ට යෝජනාවක් කරනවා. පසුගිය කාලයේ film එකක් ආවා, "මදරාසි" කියලා. ඒක Tamil film එකක්. "මදරාසි" film එක බලන්න කියලා මම කියනවා. ඒකේ තිබෙන්නේ, දකුණු ඉන්දියාවේ තමිල්නාඩුවට ආයුධ කන්ටේනර් පහක් ගෙනැල්ලා ඒ සාමකාමී තමිල්නාඩුව පාලනය කිරීම සඳහා ගන්නා පියවරක් ගැන. ඉතින් එක පැත්තකින් අපට සැකයක් එනවා, ඒ film එකේ වෙන දේවල්ද අද මේ රටේත් වෙන්නේ කියලා. ඒ චිත්‍රපටයේ වෙන්නේ මොකක්ද? මුලින්ම test කරන්න ආයුධ සියයක් ස්ථාන සියයකට යවලා රටේ මේ වාගේ ඝාතන රැල්ලක් ඇති කරනවා. මේ trial එකක් කරන්නේ. එහෙම කරලා තමයි ඒගොල්ලන් පාලනය කරන්න කටයුතු කරන්නේ. මම අපේ NPP එකේ සහ JVP එකේ සහෝදර මන්ත්‍රීවරුන්ට කියනවා, "තාරේ සමීන් පර්" film එක බලනවා වාගේම "මදරාසි" film එකත් බලන්න කියලා. එතකොට අද මේ රටේ තිබෙන තත්ත්වය අන්න ඒ ඉන්දියානු film එකෙන් බලාගන්න පුළුවන්.

බොහොම ස්තූතියි.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහජන ආරක්ෂක ඇමතිතුමා.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඊයේ දින පාර්ලිමේන්තුවේ කරපු ප්‍රකාශයක් සම්බන්ධයෙන් මේ ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් මතු කළා. මා ඊයේ දිනයේ නිවැරදිව ප්‍රකාශ කළේ, ඊයේ දිනයේ සාතනයට ලක් වූ ලසන්ත වික්‍රමසේකර හෙවත් "මිදිගම ලසා" පොලිස් තොරතුරු අනුව ලියාපදිංචි අපරාධකරුවෙක් බවයි; IRC අපරාධකරුවෙකු, එහෙම නැත්නම් රජයේ අපරාධ ලේඛනාගාරයේ ලියාපදිංචි අපරාධකරුවෙකු හැටියට තමයි ඔහු ප්‍රසිද්ධ වෙලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආරක්ෂාව දීමේදී අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ විත්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට ආරක්ෂාව දෙනවා. පොලිස් දෙපාර්තමේන්තුවට හැකියාවක් නැහැ, ලියාපදිංචි අපරාධකරුවන්ට ආරක්ෂාව දෙන්න.

ගරු චතුර ගලප්පත්ති මහතා
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා.

ගරු චතුර ගලප්පත්ති මහතා
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කියනවා ඔහු පොලීසියේ ලියාපදිංචි වෙච්ච අපරාධකාරයෙක් කියලා. නමුත් කාරණාව මේකයි. මේ රටේ සාතනයක් වෙච්ච ගමන් කියන්නේ මොකක්ද? එක්කෝ, එයා අපරාධකාරයෙක් නැත්නම් කුඩුකාරයෙක් කියනවා. ඔන්න ඔය දෙක කියලා ගැලවෙන ක්‍රමයක් තිබෙන්නේ. මොකක්ද මේ ආණ්ඩුව,- *[බාධා කිරීමක්]* එහෙම කරන්න ඔබතුමන්ලා ඕනෑ නැහැ. ඔය වැඩේ ළමයෙකුට භාර දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.22]

ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කැමැතියි අද මේ විවාදයට එක් වෙමින් අපේ ශ්‍රේෂ්ඨ දාර්ශනිකයෙක් වෙච්ච කාල් මාක්ස්ගේ කියමනක් කියන්න. කාල් මාක්ස් කියනවා, "එක්කෝ මිනිස් සමාජය අශිෂ්ටත්වය කරා පසුපසට යනවා. එහෙම නැත්නම් ශිෂ්ටත්වය කරා පෙරට යනවා" කියලා. පසුගිය දශක හතරකට වැඩි කාලයක් තුළ, 1977දී මේ මහත්වරුන්ගේ ආදිතම නායකයා වෙච්ච ජේ.ආර්. ජයවර්ධන මේ රටට හඳුන්වා දීපු විවෘත ආර්ථිකයත් එක්ක අපේ රට ක්‍රම ක්‍රමයෙන් අශිෂ්ටත්වය කරා ගමන් කරමින් තිබුණේ. අශිෂ්ටත්වය කරා ගමන් කරමින් තිබුණු රට තමයි පසුගිය සැප්තැම්බර් මාසයේ 21වෙනි දා අනුර දිසානායක සහෝදරයා ජනාධිපති බවට පත් වුණාට පස්සේ අපි ක්‍රමානුකූලව ශිෂ්ටත්වය කරා මෙහෙයවමින් තිබෙන්නේ.

ඒ වාගේම මාක්ස් කියනවා, "අපට දැන් කාලය ඇවිල්ලා තිබෙනවා, යුගය ඇවිල්ලා තිබෙනවා, මේ මිනිස් සමාජය දිහා සන්සුන් සිතින් බලන්න" කියලා. අද අපි සිදු කරමින් ඉන්නේත් ඒක. අශිෂ්ටත්වය කරා ගමන් කරමින් තිබුණු රට ශිෂ්ටත්වය කරා මෙහෙයවමින්, ඒ මිනිස් සමාජය දිහා සන්සුන් සිතින් බලන වැයමක තමයි අද අපි මේ නියැළිලා ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ මහත්වරු ගණනාවක් අද කථා කරනකොට මට මතක් වුණා, අර "අබ කෑ මිනිහාගේ මොළේ දනවා" කියන කථාව. දැන් අබ කාපු කාගේ කාගේත් මොළේ දනවා. එක්කෙනෙක් නම් පැනලා දිව්වා; අබ කාපු කෙනෙක්. අපි දකිනවා හැමදාම දිවා ආහාරයෙන් පස්සේ එනවා. එතකොට සභාවේ පිරිසත් ටිකක් අඩුයි. මොනවා හරි කියනවා, කියලා දුවනවා. අපි උත්තර දෙනකම් ඉන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ඒ නිසා ඊළඟ දවසේ තියා ගන්න. ඒක මම බොහොම ඕනෑකමින් ඉල්ලනවා. කට්ටිය නම් දැන් එයාට නමකුත් හදලා. අපි කැමැති නැහැ ඒවා කියන්න. නේද? මොකක්ද අර "නැමොළේ" වාගේ නමකුත් හදලා තිබෙනවා. ඒක වෙනම කථාවක්.

කොහොම වුණත්, පසුගිය කාලය තිස්සේ අපේ රටට මත්ද්‍රව්‍ය ආවේ එක්කෝ ආර්ජන්ටිනාවෙන්, නැත්නම් පාකිස්තානය හෝ ලෝකයේ තවත් වෙන කොහේ හරි රටකින්. හැබැයි, දැන් මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කරන, අයිස් නිෂ්පාදන කරන කර්මාන්තශාලා භූමියක් බවට දැන් මේ මුළු රට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම හම්බන්තොට ඒ තැනට පත් කරලා තිබෙනවා. ඒ නිසා දැන් අපේ උත්සාහය මොකක්ද? වර්තමාන ආණ්ඩුව "රටම එකට" කියන තේමාවෙන් මුළු රටක් එක මිටට අරගෙන මේ උවදුරට එරෙහිව සටන් වදින්න තීරණය කරලා තිබෙනවා. කවුරු අභියෝග කළත්, මේවා මොන අපරාධකරුවන්, මොන සංවිධානාත්මක අපරාධකරුවන් මෙහෙයවූවත් අපි ඒ තබපු පියවර ආපස්සට ගන්නේ නැහැ කියන එක අබ කාපු හැමෝටම කියන්න ඕනෑ. විශේෂයෙන්ම මේක අපේ යුගයේ වගකීම. ඒ වගකීම ඉටු කරන්න කිසිසේත්ම අපි පසුබට වන්නේ නැහැ කියන සහතිකය මුළු මහත් ශ්‍රී ලංකාවාසී ජනතාවටම අද අපි මේ විවාදයට එක්වෙමින් දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මත්ද්‍රව්‍යවලට ගොදුරු වෙලා තිබෙන්නේ දුප්පතුන් විතරක් නොවෙයි. දුප්පත්ද, මධ්‍යම පාන්තිකද, ධනය තිබෙනවාද කියන ඒ කිසිවක් නොසලකා මුළුමහත් සමාජයේම දරු පැටවු ටික අද මේකට ගොදුරු වෙමින් තිබෙනවා. වැඩිපුරම මධ්‍යම පාන්තික දරුවෝ මේකට ගොදුරු වෙමින් තිබෙනවා. ඒක නිසා මේ මත්ද්‍රව්‍ය උවදුරින් මේ රට මුදා ගන්න එක, මේ රට මත්ද්‍රව්‍යයෙන් නිදහස් රටක් බවට පත් කරන එක වර්තමාන අපේ ජාතික ජන බලවේග ආණ්ඩුවේ ජනාධිපතිතුමා ඇතුළු අපි සියලුදෙනාගේ වගකීමයි කියන එක අපි මේ සභාවට අවධාරණය කරනවා. අපි විපක්ෂයේ මහත්වරුන්ගෙන් මේක අහනවා. කොහොමද තමුන්නාන්සේලා රෙදිත් ඇඳගෙන කථා කරන්නේ, කොහොමද රෙදිත් ඇඳගෙන මත්ද්‍රව්‍ය ජාවාරම වෙනුවෙන් පෙනී සිටින්නේ, කොහොමද සංවිධානාත්මක අපරාධකරුවන් වෙනුවෙන් පෙනී සිටින්නේ?

IRC අය ගැනත් මම ඕනෑ නම් කියන්නම්. ඔහු IRC ලේඛනයේ 1305/2015 යටතේ "B" ශ්‍රේණියේ ලියාපදිංචි අපරාධකාරයෙක්. අපි ආණ්ඩුවක් විධියට, දේශපාලන ව්‍යාපාරයක් විධියට කුමන පුද්ගලයෙකු හෝ සාතනය කරන එකට එකඟ නැහැ. කිසිවෙක් මඟ මඟ සාතනය කරනවාට අපි එකඟ නැහැ. ඒක නිසා තමයි, අපේ මුළු වැර යොදමින්, මුළු වැයම යොදමින් මේ අපරාධ මැඩලන්න ඕනෑ කරන මැදිහත්වීම ආණ්ඩුවක් විධියට සිදු කරමින් තිබෙන්නේ. කිසිවෙක් සාතනය

කරනවාට අපි එකඟ නැහැ. සජබයේ තමුන්නාන්සේලාගේ ප්‍රාදේශීය සභා සභාපතිවරු කී දෙනෙක් ඉන්නවාද? පළාත් පාලන ආයතනවල තමුන්නාන්සේලාගේ සභාපතිවරු හිටියා 35දෙනෙක්. ඉතිරි 34දෙනාගේත් සභාපති කාමරවලට පැනලා මෙහෙම මහ දවල් වෙඩි තියන එකක් කොහේවත් තිබුණාද? එහෙම නැහැ. ඒ විතරක් නොවෙයි. එතුමා නඩු තුනකට සම්බන්ධ වෙලා තිබෙනවා. ඕනෑ නම් මම ඒ නඩු අංකත් එක්ක කියන්නම්. කුරුණෑගල, ගාල්ල උසාවිවල තිබෙන නඩු අංකත් එක්ක මම විස්තර කියන්නම්. එතුමා තුන් වතාවක් අත්හිටවූ සිරදඬුවම් ලබපු කෙනෙක්. එහෙම නැතුව එතුමා සාමාන්‍ය පුද්ගලයෙක් නොවෙයි. ඔබතුමන්ලාගේ ප්‍රාදේශීය සභා සභාපතිවරු 35දෙනෙක් ඉන්නවා. එතුමා හැර තව 34දෙනෙක් ඉන්නවා. එහෙම නම් ගිහිල්ලා ඒ 34දෙනාටත් වෙඩි තියන්න එපා යැ! එහෙම වුණේ නැහැ නේ. මෙහෙම වෙන්න බලපාපු විෂය මූලික තත්ත්ව තිබුණා. ඒ විෂය මූලික තත්ත්ව ඇතුළේ තමයි ඊයේ "වැලිගම ලසා" ඝාතනයට ලක් වුණේ. එහෙම නැතුව සාමාන්‍ය පරිදි මහජන සේවාව කරමින් ඉන්න අනෙක් 34දෙනාට මෙහෙම ප්‍රශ්නයක් මතු වෙලා නැහැ.

මම මේ කාරණයත් කියන්න ඕනෑ. 80ක් වෙච්ච දේශපාලනඥයන්ගේ නම් ගම් හෙළිදරව් කරලා තිබුණා. මාකඳුරේ මධුෂ්ලා ඝාතනය කරලා ඒවා මධුෂ් එක්ක වළ දැම්මා, එදා මෛත්‍රී, රනිල්, සජිත් ආණ්ඩුව. මෛත්‍රී, රනිල්, සජිත් ආණ්ඩුව එදා අපරාධකරුවන් ආරක්ෂා කළා. ඒ විතරක් නොවෙයි. ගෝඨාභය ආණ්ඩුවත්, රනිල්-රාජපක්ෂ ආණ්ඩුවත් අපරාධකරුවන් ආරක්ෂා කළා. වර්තමාන ජාතික ජන බලවේග -මාලිමාව- ආණ්ඩුව කිසිදු අපරාධකරුවෙක් ආරක්ෂා කරන්නේ නැහැ. කිසිම අපරාධකාරයෙක් ආරක්ෂා කරන්නේ නැහැ. අපි ඒ සියලුදෙනාම නීතිය හමුවට පමුණුවනවා. ඔබතුමන්ලාගේ කාලයේ වාගේ විවිධ විධියට මහ මහ ඝාතනය කරන ඒ සංස්කෘතිය, ඒ දේශපාලන සංස්කෘතිය අපි මේ රටේ අවසන් කරලා තිබෙන්නේ.

දැන් මේ කථා කරන මහත්වරු සමහරු සුදු ඇඳගෙන, සමහරු කළු ඇඳගෙන. සුදු-කළු මහත්වරුන්ට අපි මේ කාරණය කියන්න ඕනෑ. ඔබතුමන්ලාට ඉතිහාසය අමතකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතක ඇති, තංගල්ල සභාපති සුදු ජාතිකයෙක් ඝාතනය කළ බව. ඇයි? ඔහුගේ බිරිඳ වන වික්ටෝරියා ඇලෙක්ස්‍රැන්ඩ්‍රියා ඔහුගේ දෑස් ඉදිරිපිට දූෂණය කරන්න යනකොට ඒකට විරුද්ධ වුණාට, පොහොට්ටුවේ සභාපති -නාමල්ලාගේ ගෝලයෝ- ඒ සුදු ජාතිකයා ඝාතනය කළා. ඒ සභාපතිවරයා අදටත් අවුරුදු 20ක් හිරේ. ඒ විතරක් නොවෙයි. පියල් මනම්පේරි කියන්නේ කවුද? ඒගොල්ලන්ගේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී.

සම්පත් මනම්පේරි කියන්නේ කවුද? මේගොල්ලන්ගේ සංවිධායක. "බැකෝ සමන්" කියන්නේ කවුද? ඒත් මේගොල්ලන්ගේ පාක්ෂිකයෙක්, මිද්දෙනිය පැත්තේ. මේ හැමෝම ගත්තොත්, පොහොට්ටුවේ. අපි හිතාගෙන හිටියේ පොහොට්ටුවේ විතරයි කියලා. *[බාධා කිරීමක්]* ඔය ටික ඔබතුමා කියන්න. ඔබතුමා තමයි ඒ ටික දන්නේ. ඔබතුමන්ලා ඒ ටික කියන්න. මොකද, අපි දන්නා ටික අපි කියනවා. මේගොල්ලන් තමයි ඉතිරි සංවිධානාත්මක අපරාධකරුවෝ, මේගොල්ලන් නායකත්වය දෙන, - *[බාධා කිරීමක්]* මාදුගොඩ මන්ත්‍රීතුමනි, මේ අහන්නකෝ. ඔබතුමා මේවාට සම්බන්ධයක් නැහැ නේ, අපි දන්නා තරමින්. ඔබතුමා ගාල්ලේ පුංචි තැනකින් ඇවිල්ලා, බොහොම මහන්සියෙන් ඉහළට ආපු හැටි අපටත් කියලා තිබෙනවා. මන්ත්‍රී විධියට ආපු හැටි ඔබතුමා මා එක්කත් කියලා තිබෙනවා. ඒ නිසා ඔබතුමා ටිකක් නිශ්ශබ්දව ඉන්න. අනුන්ගේ කුණු ඇඟේ ගාගන්න එපා. අපරාධකරුවන්ගේ ඔඩොක්කුවට වැටෙන්න එපා. පුළුවන් නම් ඔතැනින් ටික ටික ඈත් වෙන්න. ඊළඟ ඡන්දයට පුළුවන් නම් අපිත් එක්ක එකතු වෙන්න try එකක් දීලා බලමු. ඔබතුමා ඒ කුණු ගාගන්න එපා.

දැන් මේ මහත්වරුන්ට, සමහර අපරාධකරුවන්ට සහතික ලියන්න හදන අයට අපි මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ මහජන ආරක්ෂක ඇමතිතුමා නිවැරදිව කිව්වා වාගේ මිනීමරුවන්ට, පාතාල අපරාධකරුවන්ට, සංවිධානාත්මක අපරාධකරුවන්ට, IRC ලියාපදිංචිය තිබෙන අයට පොලිස් ආරක්ෂාව දෙන්නේ කොහේද? මොන රටේද එහෙම කරන්නේ?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මට තව විනාඩි දෙකක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ලෝකයේ එහෙම කරන එක රටක් ගැන අපට කියන්නකෝ. මෙවැනි අයට පොලිස් ආරක්ෂාව ලබාදෙන ලෝකයේ එක රටක් ගැන කියන්නකෝ. එහෙම රටවල් ලෝකයේ කොහේවත් නැහැ. දැන් අර කට්ටිය කලබල වෙන එක ගැන අහන්න දෙයක් නැහැ. මම දැක්කා, මෙතුමා කැබිතිගොල්ලෑවේද කොහෙද ගිහින්ප මොනවාදෝ කියනවා. මේ සභාවේ කවුරුත් නැති වෙලාවේ සද්දේ දාලා යනවා. ඊළඟට රටේ කොහේ හරි කොනකට ගිහිල්ලා, -සෙනඟත් නැහැ- 7,8දෙනෙක් එකතු කරගෙන මාධ්‍ය ටික ගෙන්වාගෙන මොනවා හෝ කියනවා. බය නැහැ ලු. බයවෙන්න ඕනෑ නැහැ. මොකටද, බය වෙන්නේ? අපි සංවිධානාත්මක අපරාධකරුවන් පසුපස තමයි හඹා යමින්, අත්අඩංගුවට ගනිමින් සිටින්නේ. අපි මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්, බෙදාහරින්නන් පසුපස යමින් තමයි මේ අත්අඩංගුවට ගැනීම් සිදු කරමින් ඉන්නේ. ඉතින්, නාමල් මොකටද බය වෙන්නේ? නාමල්ට බයවෙන්න කාරණයක් නැහැ, එතුමා මේ සංවිධානාත්මක අපරාධවලට සම්බන්ධයක් නැත්නම්. එතුමා මේ මත්ද්‍රව්‍ය ජාවාරම්වලට, හම්බන්තොට මම කියපු නම්වලට, තවත් නම්වලට සම්බන්ධ නැත්නම් බය වෙන්න දෙයක් නැහැ. අපි දන්නේ නැහැ, අන්න සමහර phonesවල තිබෙනවා, "නාමල් සර්, මගේ සර් රාජපක්ෂ" කියලා. කාගෙද දන්නේ නැහැ. අර phonesවල තිබෙනවා, "බැකෝ සමන්"ගේ phonesවල තිබෙනවා. අපි දන්නේ නැහැ, ඒ කියන්නේ මේ නාමල් ගැනද, වෙන නාමල් කෙනෙක් ගැනද කියලා; "මගේ සර් රාජපක්ෂ" කියලා කියන්නේ මේ රාජපක්ෂ පවුලේ කෙනෙක් ගැන ද, වෙන රාජපක්ෂ කෙනෙක් ගැනද කියලා අපි දන්නේ නැහැ. කලබල වෙන එක ගැනත් අහන්න දෙයක් නැහැ. මම කලින් කිව්වා වාගේ අබ කාපු අයගේ මොළේ දනවා විතරක් නොවෙයි, මුළු ඇහම දනවා.

කන්ටේනර් ගැනත් කියලා මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් මේ කන්ටේනර් ගැන කියනවා. කමක් නැහැ, මම කලිනුත් මේ ගැන කියලා තිබෙනවා. අවුරුදු 5ම කන්ටේනර් ටික කරේ තබාගෙන යන්න. මේ කන්ටේනර් ගැන ඉතාම පැහැදිලිව විමර්ශනය කර වාර්තාවක් ලැබී තිබෙනවා. දැන් ඒ වාර්තාව CID එකේ විමර්ශනයට දීලා තිබෙනවා. අපි ඔබට -මේ රටේ ජනතාවට- සහතික වෙනවා. විපක්ෂයට මේ ගැන කිව්වාට වැඩක් නැහැ. මොකද, ඒගොල්ලන් හැමදාම මේ ගැන කියනවා. ඒ නිසා අපි රටේ ජනතාවට සහතික වෙනවා, අපි ඒගොල්ලන් වාගේ හෙලිකොප්ටර්වලින් ගිහිල්ලා අපරාධකරුවෝ බදාගන්නේ නැහැ කියලා. එහෙම දේශපාලන ව්‍යාපාරයක් නොවෙයි, මේක. ඒ වාගේම කිසිදු අපරාධයක් අපි යට ගහන්නේ නැහැ, හංගන්නේ නැහැ. ඒවාට දේශපාලන

[ගරු මහින්ද ජයසිංහ මහතා]

වශයෙන් මැදිහත් වෙන්නේ නැහැ. මා නියෝජනය කරන දිස්ත්‍රික්කයට තමයි මීගමුව අයත් වන්නේ. මීගමුවට chopper එකෙන් ආවේ, මහින්ද රාජපක්ෂ. Chopper එකෙන් ඇවිල්ලා, ලාන්සාගේ ගෙදර ළඟ බැහැලා ගිහින් බදාගත්තා, කුඩුත් එක්ක අහු වෙච්ච වෙලාවේ. අපේ මේ විවාදය ආරම්භ කරපු ධර්මප්‍රිය විජේසිංහ සහෝදරයා කිව්වා, කොහොමද මීගමුව පුරා කුඩු පතුරලා තිබෙන්නේ කියලා. මීගමුව පුරා කුඩු පැතිරුණාට, අද මුළු මහත් මීගමුවම, මුළු ගම්පහම තුළ මේ මත්ද්‍රව්‍ය වසංගතයක් බවට පත් වෙලා තිබෙනවා. අපේ අහිංසක දරු පැටවු ඒකට ගොදුරු වෙලා ඉන්නවා. ඒ නිසා මුළු රටටම අපි සහතික වෙනවා, කිසිසේත්ම අපේ දෙවුර මත පැටවුණු මේ වගකීම අත් හරින්න අපි සූදානම් නැති බව. අපේ දෙවුර මත පැටවුණු මේ වගකීම අපි අත් හරින්නේ මේ රට මත්ද්‍රව්‍යයෙන් තොර රටක් බවට පරිවර්තනය කළ දවසට බව අපි සහතික කරනවා. ඒ වාගේම, අපි මේ අපරාධ රාජ්‍යය දෙස, මත්ද්‍රව්‍යයෙන් පිරුණු මේ රාජ්‍යය දෙස නොබලා අහක බලාගෙන ඉන්න සූදානම් නැහැ. ගරු ජනාධිපතිතුමා කිව්වා වාගේ මේක මහා කළු කුහරයක්. අපි එහි දොර ඇරියා. ඒ කළු කුහරයේ දොර වහලා නිහඬව ඉන්න අපි සූදානම් නැහැ. ඒ ඔස්සේ හඹාගෙන යමින් සියලු අපරාධ, සියලු මත්ද්‍රව්‍ය ජාවාරම් මේ රටින් තුරන් කරනවා. ඒ වෙනුවෙන් අත්වැල් බැඳගන්න කියා අපි මුළු රටේම ජනතාවගෙන් ඉල්ලනවා. විපක්ෂයේ අය ඕනෑ නම් ඉතිරි වෙන්න. අපි මුළු රටේම ජනතාවගෙන් -පාසල්වල විදුහල්පතිවරුන්, ගුරුවරුන්, ආගමික නායකයින් ඇතුළු සියලු දෙනාගෙන්- ඉල්ලා සිටිනවා මේ ව්‍යායාමය සමඟ, මුළු රටක් එක මිටට අරගෙන මත්ද්‍රව්‍ය තුරන් කරන්න යන මේ ගමනත් එක්ක අත්වැල් බැඳගන්න කියලා. මට වැඩිපුර කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.36]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුව දැන් මොනවාද කියන්නේ කියලා අපිට තේරෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. මම ඔබතුමන්ලාට බාධා කළේ නැහැ නේ. අපිට ගොඩක් දේවල් කියන්න තිබෙනවා. නමුත් විපක්ෂයෙන් මට වෙලාව දෙන්නේ නැති නිසා තිබෙන වෙලාවෙන් මේ කාරණා ටික මම ඉක්මනට කියන්නම්. මට වෙලාව හම්බ වෙන්නේ නැහැ නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේගොල්ලන්ට දැන් මහජන නියෝජිතයන්ට ආරක්ෂාව දෙන්න බැරිවෙලා තිබෙනවා. රටේ සාතන රැල්ලක් ක්‍රියාත්මක වෙද්දි, වෙඩි උණ්ඩ එකසිය ගණනක් පත්තු වෙද්දි, මිනිස්සු පණස් ගණනක් මැරෙද්දි, මේගොල්ලන් මේ මොන වාගේ බයිලා කියනවාද කියලා අපට නම් තේරෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා සාතනය වුණා. ආණ්ඩුව විධියට ඇමතිතුමාගේ ප්‍රකාශය මම පෞද්ගලික ප්‍රකාශයක් විධියට සලකන්නේ නැහැ. ඒක ආණ්ඩුවේ ප්‍රකාශයක් විධියට තමයි අපි සලකන්නේ. ඔහු මහජන නියෝජිතයෙක් වුණාට පාතාල අපරාධකාරයෙක් කියලා එතුමා කියනවා. ඔහු පාතාල අපරාධකාරයෙක් කියලා ඇමතිතුමා දන්නවා ලු. එහෙම නම් මේ ගෙවිච්ච අවුරුද්ද තුළ ඔහුව අත්අඩංගුවට ගත්තේ නැත්තේ ඇයි? ඔහුව අත් අඩංගුවට ගත්තේ නැත්තේ ඇයි? දැන් මෙතැන අසත්‍ය කියනවාට වැඩිය ඔහුව අත්අඩංගුවට ගන්න තිබුණා නේ. ඔහුට නඩු තිබෙනවා නම්, ඔහු මත්ද්‍රව්‍ය ජාවාරම් කරලා තිබෙනවා නම්, මුදල් විශුද්ධිකරණය කරලා තිබෙනවා නම් ඔහුව අත්අඩංගුවට ගන්න බැරිව මෙතැන නිකම් කෙඳිරි ගාලා වැඩක් නැහැ.

ඊළඟට, මේ ඇමතිතුමා පැයකින් සාධාරණීකරණය කරන විධියට, පාතාල අපරාධකාරයෙක් නිසා එහෙම වෙඩි තියලා මැරුවාට කමක් නැහැ වාගේ කථාවක් කිව්වා. හැබැයි 1988-89 කාලයේ මිනී මරපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

එහෙම මරන්න ඕනෑ කියලා අපි නම් කියන්නේ නැහැ. මොකද, යුක්තිය පසිඳලීමේ, යුක්තිය ක්‍රියාත්මක කිරීමේ නීතියක් රටේ තිබෙනවා. ඒ ක්‍රමයට විනා ආයුධයට ආයුධය ක්‍රමයට ගිහිල්ලා කවුරුවත් මරන්න ඕනෑ කියලා අපි කියන්නේ නැහැ. පාර්ලිමේන්තුව ගිනි තියන්න ඕනෑ කියලා කියපු ඇමතිවරු මේ ඉස්සරහා පේළියේ ඉන්නවා නේ. ඒගොල්ලන්ව මරන්න ඕනෑ කියලා අපි කියනවාද? අපි කියන්නේ නීතිය ක්‍රියාත්මක කරන්න කියලායි.

මම ඉතාම පැහැදිලිව මේ කාරණයත් කියන්න ඕනෑ. දැන් මාර වැඩේ කියන්නේ මේකයි. මේක පාතාලය, පාතාලය අතර ගැටුමක් කියලා පැයකින් කියනවා. මිනිහාව මරලා, පාතාලය, පාතාලය අතර ගැටුමක් කියලා පැයක් ඇතුළත කියනවා. එතකොට මේ පුද්ගලයාව මරනවා කියලා හරියට නිකම් ආණ්ඩුව දැනගෙන ඉඳලා වාගෙයි නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රාදේශීය සභා ඡන්දෙන් පස්සේ systems මාරු කරන්න කියලා ආපු කට්ටිය ප්‍රතිපත්ති පාවා දීලා සජබයේ, පොහොට්ටුවේ, UNP එකේ ඉන්න අයගේ ඔළු ගෙඩි උස්සවලා සභා පිහිටෙව්වා. ලජ්ජා නැහැ. වැලිගම ප්‍රාදේශීය සභාව කොහොමටවත් දෙන්නේ නැහැ කියලා ඒ සභා පිහිටුවන ක්‍රමය තුළ කිව්වා. JVP ආණ්ඩුවට කොහොමටවත් සභාව පිහිටුවන්න දෙන්නේ නැහැ කියලා සභාව පිහිටවපු මිනිහා තමයි මේ මරලා තිබෙන්නේ. ඒ නිසා මේක එහෙම සාධාරණීකරණය කරන්න බැහැ. ආණ්ඩුව මේ සාතනයේ වගකීම භාරගන්න ඕනෑ. කවදාහරි මාලිමාවේ මන්ත්‍රී කෙනෙක් ගමේ ගුටි කෑවාම තමයි මේගොල්ලන්ට ඕවා තේරෙන්නේ. මොකද, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා මහජන දිනයේ ඔහුගේ රාජකාරි කාලය අතරතුර කටයුතු කරද්දි, මහජනතාව අතර සිටියදී මේගොල්ලන්ට ආරක්ෂාව දෙන්න බැහැ. ඔහුට විරුද්ධව චෝදනාවක් තිබෙනවා නම් ඔහුව අත්අඩංගුවට ගන්න තිබුණා. ඔය වාගේම තමයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සම්බන්ධවත් කියන්නේ. මන්ත්‍රීවරුන් යන උත්සවවලට ආරක්ෂාව දෙනවා ලු. දැන් මේගොල්ලොත් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වනවා, මහජන දින කරනවා. ආර්ථික අර්බුදය උත්සන්න වෙද්දි ඉස්සෙල්ලා පහර වදින්නේ අපිට නොවෙයි, ඔයගොල්ලන්ට. ඒ නිසා මේවා මේ විධියට සාධාරණීකරණය කරන්න එපා කියන එක අපි පැහැදිලිව කියනවා.

මේගොල්ලෝ කිව්වේ කොහොමද? රාජපක්ෂ කාලයේ අපරාධ රාජ්‍යයක් තිබුණා ලු. ඔව්, රාජපක්ෂ කාලයේ සිදු වුණු සාතන ඔක්කෝම ගැන හොයන්න. ලසන්ත වික්‍රමතුංගව මරපු එක ගැන හොයන්න, එක්නැලිගොඩ මරපු එක ගැන හොයන්න, තාජුඩීන් සාතනය ගැන හොයන්න. හැබැයි එහෙම කියලා දැන් මේ රට අපරාධ රාජ්‍යයක් බවට continue කරන්න කිසිම අවශ්‍යතාවක් නැහැ. මට මතක විධියට ජනාධිපතිතුමා විපක්ෂයේ සිටියදී කිව්වා, කෙනෙක් සාතනය වුණායින් පස්සේ ඔහුගේ

අතීතය ගැන කථා කරලා වැඩක් නැහැ කියලා. ආයුධ පෙන්වන්න ගිහිල්ලා මරන එකක් ගැන කියද්දි දවසක් එතුමා එහෙම කිව්වා. කණ්ණාඩිය ළඟට ගිහිල්ලා බලන්න. හැන්සාඩ් වාර්තාවේත් ඒක තිබෙනවා. ඔහු මැරුණාට පස්සේ, "ඔහු පාතාල ක්‍රියාකාරිකයෙක්. ඒක නිසා පාතාල අවුලක් නිසා තමයි ඔහුව වෙඩි තියලා මැරුවේ" වාගේ කථා මේ ආණ්ඩුවට කියන්න බැහැ. එතකොට මේ ආණ්ඩුවේ රෙදි ගැලවෙනවා කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

ඊළඟට, 1988-89 කාලය ගත්තොත්, ඒ කාලයේ මිනීමරපු අය ඉන්නවා, සතුරන්ගෙන් පළිගත් අය ඉන්නවා, ගෝනි බිල්ලෝ විධියට ගිය අය ඉන්නවා. අපි ඒ අයව මරන්න ඕනෑ කියලා කියනවාද? අපි කිසිසේත්ම එහෙම කියන්නේ නැහැ. අපි කියන්නේ නීතිය ක්‍රියාත්මක කරන්න කියලායි. මේ වාගේම බටලන්ද ගැනත් සද්දයක් දාගෙන ඇවිල්ලා, "අපගෙන් වෙන්ව ගිය ප්‍රේමණීය විරුවන් වෙනුවෙන් සාධාරණය ඉෂ්ට කරනවා" කියලා මෙතැන අඳෝනා දුන්නා, මාධ්‍ය හමු තුළ අඳෝනා දුන්නා මට මතකයි. අප්‍රේල් මාසයෙන් පස්සේ නැවත විවාදයක් තියනවා කියලාත් කිව්වා. දැන් විවාදයත් නැහැ, බටලන්දත් නැහැ, මොකුත් නැහැ. නඩුත් නැහැ, බඩුත් නැහැ. කයිය විතරයි. කයියයි, ගඳයි විතරයි. එච්චරයි. දැන් ඒක ජනතාවට තේරිලා තිබෙන්නේ. මම අහන්න කැමැතියි, ආණ්ඩුව පරීක්ෂණ ඉවර වෙන්න කලින් මෙහෙම තීන්දු දෙනවා නම්, මේ රටේ ජනතාව 1988-89 කාලය සම්බන්ධවත් ඒ වාගේ තීන්දු තීරණ දෙන්න ඕනෑ නේද කියලා. දුන්නේ නැද්ද, ජනතාව? ජනතාව කියනවා නේ, නීතිය ක්‍රියාත්මක කරන්න කියලා. ඒ නිසා ජනතාවගේ ආරක්ෂාව නැති කරපු, ඒ වගකීම භාර ගන්න බැරි ආණ්ඩුවක් දැන් වැඩ බැරි ටාසන්ලා වාගේ ලොකු ටෝක් දෙනවා. අපි කිව්වාද, මත්ද්‍රව්‍ය අල්ලන්න එපා කියලා? අපි කිව්වාද, පාතාලකාරයෝ අල්ලන්න එපා කියලා? අපි කිව්වා, අල්ලන්න, අපි ඒකට සහයෝගය දෙනවා, අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ කියලා. මොකද, ඒගොල්ලන්ට වෙන වෙන කල්ලිවලට ඇඟිල්ල දිගු කරන්න පුළුවන් වුණාට, සමගි ජන බලවේගයට ඇඟිල්ල දිගු කරන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව කරුණු කීපයක් කියන්න තිබෙනවා. නමුත්, මට වෙලාව නැහැ නේ, මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මර්දනකාරී ආණ්ඩුව මේ විධියටම තමයි කටයුතු කළේ. විපක්ෂයේ ඉන්නකොට එකක් කියනවා, දැන් තව එකක් කියනවා. ගරු අග්‍රාමාත්‍යතුමිය යටතේ තිබෙනවා, NIBM කියලා ආයතනයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අන්තර් සමාගම් සේවක සංගමය ලිඛිතව සභාපතිවරයාගෙන් ඉල්ලීමක් කරනවා, වෘත්තීය සමිතියක් පිහිටුවන්න අවසර දෙන්න කියලා. සභාපතිවරයා අත්තනෝමතිකව ඊට ඉඩ දෙන්නේ නැහැ. අගමැතිතුමියට ගිය මාසයේ මේ සම්බන්ධව ලියලා තිබෙනවා, උත්තරයක් නැහැ. ඒ නිසා අපි පැහැදිලිව කියන්න කැමැතියි, ටිකක් බුද්ධියෙන් කල්පනා කරලා බලන්න කියා, තමන් ආ ගමන, බලයට එන්න කලින් තමන් කථා කරපු දේවල්, තමන් හැසිරුණු විධිය, තමන් කරපු දේශපාලනය පිළිබඳව. අද ඒ දේශපාලනය තමන්ට පාරා වළල්ලක් වෙද්දි මේ වාගේ සුරංගනා කථා කියලා, ටොෆි දීලා, චොකලට් දීලා රවට්ටන්න එපා. මොකද, මිනිස්සු මීට වැඩිය බුද්ධිමත්. විශේෂයෙන් ඔබට ඡන්දය දීපු තරුණ ඡන්ද දායකයා - Gen Z එකේ ඡන්ද දායකයා - මේක දිහා බලනවා, ඔබ කියන ගොන් කථාවලට හිනා වෙනවා. නිකම් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිනා වෙන්නේ ඉස්සරහින් නොවෙයි, පස්ස පැත්තෙන්. ඒ නිසා ඒ දේවල් කැරකිලා තමන්ට නැවත එනවා. ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ, මේ විධියට ඝාතනයක් සාධාරණය කිරීමට ආණ්ඩුවට කිසිම අයිතියකුත් නැහැ, වගකීමකුත් නැහැ කියලා. ඒ නිසා පරීක්ෂණ කරලා මේ සම්බන්ධව නිවැරදි කරුණු හෙළිදක්වන්න. එහෙම නැතිව බොරු lists දාන්න එපා. බාර් ලැයිස්තු දැම්මා, අර ලැයිස්තු දැම්මා, මේ ලැයිස්තු දැම්මා කියන්න එපා. ඒ වාගේ නොයෙක් ලැයිස්තු දැම්මාට, හැබැයි ඒ එක ලැයිස්තුවකටවත් වෙච්ච දෙයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මේ ගැන වගකීමෙන්, හරියාකාරව පරීක්ෂණ කරලා සාධාරණව නීතිය ඉෂ්ට කරන සමාජයක් බවට පත් කරන්න. අපි ඒකට කැමැතියි, සතුටුයි. එවැනි දේවල්වලට අපි සහයෝගය දෙනවා. එහෙම නැතිව පාතාලකාරයෙක් හරි, 1988-89 කාලයේදී මරපු අය හරි, එහෙම නැත්නම් වෙනත් ජාවාරමකට සම්බන්ධ වුණු අය හරි මෙහෙම මහ පාරෙදි හෝ කාර්යාලයකදී මරන එක සාධාරණීකරණය කරන්න බැහැ. ඒ නිසා අපි ඇමතිතුමාට කියනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225දෙනාගේ වගකීම ඔබතුමා භාර ගන්න ඕනෑය කියලා. මහජනතාව එක්ක රාජකාරි කරන්න බැරි වුණත්, ඒකේ වගකීමත් ඔබතුමා භාර ගන්න ඕනෑ. මහජනතාව ළඟට යන්න බැරි වුණත්, ඒකේ වගකීමත් ඔබතුමා භාර ගන්න ඕනෑ. අනාගතයේ අර්බුදයක් ඇවිල්ලා ඔබතුමන්ලාගේ පක්ෂයේ කාට හෝ ප්‍රශ්නයක් ඇති වුණොත් ඒකේ වගකීමත් ඔබතුමා භාර ගන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ඔබතුමා විනාඩියක කාලයක් වැඩිපුර දුන්නාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

අදුත්තු, කෞරව මයිල්වාහනම් ජෙගදීස්වරන් අවර්කල්! උංකළුක්කු 8 නිමිටංකළ් උණ්ටු.

[பி.ப. 2.45]

ගරු මයිල්වාහනම් ජෙගදීස්වරන් මහතා
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இடம்பெறுகின்ற போதைப்பொருள் கடத்தல் மற்றும் ஒழுங்கமைக்கப்பட்ட குற்றக் கும்பலுக்கு எதிரான நிகழ்ச்சித்திட்டம் தொடர்பான ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதம் காலத்துக்குப் பொருத்தமானது.

தற்போது நமது நாட்டில் போதைப்பொருள் கடத்தலும் ஒழுங்கமைக்கப்பட்ட குற்றச்செயல்களும் நகமும் சதையும் போல ஒன்றிணைந்தே இடம்பெறுகின்றன. உண்மையிலேயே இவை எமது நாட்டைப் பாரிய அழிவை நோக்கி அல்லது இருண்ட யுகத்தை நோக்கிக் கொண்டு செல்கின்றன. ஆரம்ப காலத்தில் எமது நாட்டில் போதைப்பொருள் பாவனை மட்டுமே இருந்தது. அதன் பிற்பாடு, எமது நாடு போதைப்பொருளை பரிமாற்றும் கேந்திர நிலையமாகக் காணப்பட்டது. அதிலிருந்து ஒருபடி வளர்ச்சியடைந்து, தற்போது போதைப்பொருளை உற்பத்தி செய்யும் நாடாக மாறியிருக்கின்றது. இவ்வாறு எமது நாடு கீழ்த்தரமான நிலையை அடைந்திருப்பது மிகவும் வேதனைக்குரிய விடயமாகும். இந்த நிலையிலிருந்து எமது நாட்டை மிக விரைவாக மீட்டெடுக்க வேண்டிய பாரிய பொறுப்பு எங்களுக்கு இருக்கின்றது. அரசியல்வாதிகளின் உதவியின்றி இந்த வலையமைப்பு இவ்வளவு தூரம் வளர்ச்சியடைந்திருக்க முடியாது. அவர்களின் ஆதரவு, அரவணைப்பின் ஊடாகத்தான் இவ்வாறான செயற்பாடுகள் முன்னெடுக்கப்பட்டு இருக்கின்றன. இன்று அவை இந்த நாட்டை அழிவுப் பாதைக்குள் இட்டுச் சென்றிருக்கின்றன. உதாரணத்துக்கு, நாங்கள் வடக்கு மாகாணத்தை

[ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා]

எடுத்துக்கொள்வோம். 2009ஆம் ஆண்டுக்கு முன்னர் அங்கு யுத்தம் மட்டுமே காணப்பட்டது. ஆனால், தற்போது அதைவிட மிக மோசமான நிலையிலே வடக்கு மாகாணமும் கிழக்கு மாகாணமும் காணப்படுகின்றன.

கடந்த கால அரசாங்கங்கள் எமது பகுதிகளில் திட்டமிட்ட வகையில் போதைப்பொருள் பாவனையையும் விநியோகத்தையும் ஊக்கப்படுத்தக்கூடிய வகையிலான செயற்பாடுளை முன்னெடுத்து இருக்கின்றன. அதுமாத்திரமன்றி, தமிழர்களின் கலாசார, பண்பாட்டு விழுமியங்களைச் சிதைக்கும் வகையில் திட்டமிட்டுச் செயற்பாடுகளைச் செய்திருக்கின்றன. நிச்சயமாக இவற்றுக்கு எங்களுடைய அரசாங்கம் பதிலடி கொடுத்தே தீரும். இதற்கு உதாரணமாகப் பல விடயங்களைச் சொல்லலாம். இரண்டு வாரங்களுக்கு முன்னர்கூட, கிட்டத்தட்ட 3,500 போதை மாத்திரைகளுடன் மீன்களை ஏற்றிச் சென்ற வாகனமொன்று பொலிஸாரால் கைப்பற்றப்பட்டு இருக்கின்றது. மன்னார் பேசாலைப் பிரதேசத்தில் கடந்த 2-3 மாதங்களில் 'ஐஸ்' போதைப்பொருள் பாவனையால் மூன்று இளைஞர்கள் மரணமடைந்து இருக்கிறார்கள். இவை எமது இளைஞர்களையும் எதிர்காலச் சந்ததியினரையும் எவ்வகையான நிலைக்கு இட்டுச் செல்லும் என்பதை நாம் ஒரு கணம் சிந்தித்துப் பார்க்க வேண்டும். எனவே, இவற்றுக்கு எதிராக நாங்கள் ஒன்றுபட்டுச் செயற்பட வேண்டிய கட்டாயத் தேவை இருக்கின்றது.

போதைப்பொருள் வியாபாரத்தில் ஈடுபடும் குழுக்கள் ஒன்றிணைந்து குற்றச்செயல்களில் ஈடுபடும் கறுப்பு இராச்சியம் ஒன்று உள்ளது. அந்தக் கறுப்பு இராச்சியத்தை முழுமையாக ஒழிக்கவேண்டிய தேவை இருக்கின்றது. கடந்த காலங்களில் போதைப்பொருள் பாவனையை நாடு முழுவதும் வியாபிப்பதற்கு அரசியல்வாதிகள் ஒத்துழைப்பு வழங்கி இருக்கிறார்கள். இன்று இங்கு உரையாற்றிய எதிர்க்கட்சியைச் சேர்ந்த பலர், கொலைக் குற்றங்கள் உட்பட பாரிய குற்றச்செயல்களில் ஈடுபட்டு, குற்றவாளிகளாக விசாரணைக்கு உட்படுத்தப்பட்டு இருக்கின்றவர்களைப் புனிதர்களாக்குகின்ற செயற்பாடுகளில் ஈடுபடுவதை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கிறது. அவர்களுக்கு நாங்கள் ஒன்றைக் கூறிக்கொள்ள விரும்புகின்றோம். நாடு முழுவதும் வியாபித்திருக்கும் புற்றுநோயைவிடக் கொடுமையான இந்த நிலைமையை நிச்சயமாக எங்களுடைய அரசாங்கத்தால் இல்லாமல் செய்ய முடியும். இவற்றுக்கு எதிராக நாடு முழுவதும் ஒன்றிணைந்த கட்டமைப்பு ரீதியான நடவடிக்கை எடுக்கவேண்டிய நிலையில் நாங்கள் இருக்கின்றோம். இதற்கு பொது மக்கள், பாதுகாப்புத் தரப்பினர் என அனைவரினதும் முழுமையான ஒத்துழைப்பு தேவையாக இருக்கின்றது.

போதைப்பொருள் பாவனையால் பாதிப்படைவது எதிர்காலச் சந்ததியினரான எமது இளைஞர் - யுவதிகள்; பல்கலைக்கழக மாணவர்கள்; பாடசாலை மாணவர்கள்! இவர்களுக்குச் சூட்சுமமான முறையிலே போதைப்பொருள் விநியோகிக்கப்படுகின்றது. 'ஐஸ்' போதைப்பொருளைப் பயன்படுத்துகின்றவர்கள் சாதாரண நபர்களைப் போன்றே சமூகத்தில் உலா வருகின்றனர். அவர்களை இனங்காண முடியாத துர்ப்பாக்கிய நிலைமை காணப்படுகின்றது. இந்த நிலைமையைப் பார்க்கும்பொழுது, எதிர்காலம் பற்றி சிந்திக்கும்பொழுது மிகவும் பயங்கரமாக உள்ளது. உதாரணத்துக்கு, 'ஐஸ்' போதைப்பொருளை பயன்படுத்துகின்ற ஒரு குடும்பத்தில் இருக்கும் குழந்தைக்கு தாய்ப்பால் ஊடாகப் போதைப்பொருள் போகக்கூடிய துர்ப்பாக்கிய நிலைமை காணப்படுகின்றது. இது அதி பயங்கரமான நிலைமை! இந்த நிலைமையில் இருந்து நாட்டை மீட்டெடுக்க வேண்டிய கடப்பாட்டில் நாங்கள் இருக்கின்றோம். இதனை முழுமையாக இல்லாமல் செய்வதற்கு மாண்புமிகு சனாதிபதி தலைமையில் பாரியதொரு வேலைத்திட்டத்தை எதிர்காலத்தில் நாங்கள் முன்னெடுக்க இருக்கின்றோம்.

பொலிஸ், இராணுவம், சுகாதாரத்துறை, அரச திணைக்களங்கள், பொதுமக்கள் என அனைத்துப் பிரிவினரையும் ஒன்றிணைத்து பாரியதொரு வேலைத்திட்டத்தை மேற்கொள்வதன் ஊடாகத்தான் இதனை ஒழிக்க முடியும். நிச்சயமாக நாங்கள் இதனை ஒழிப்போம். இதற்கான மிக முக்கியமான ஒத்துழைப்பு பெண்களிடம் இருந்தே எதிர்பார்க்கப்படுகின்றது. ஏனெனில், 'ஐஸ்' போதைப்பொருளைப் பாவிக்கின்ற இளைஞர், யுவதிகள் இரவு முழுவதும் விழித்திருக்கின்ற நிலைமை காணப்படுகின்றது. இவ்வாறானவர்களை அவர்களது குடும்பத்தில் உள்ளவர்களால் இனங்காண முடியாத நிலைமை காணப்படுகின்றது. தாய், தந்தை நினைத்துக்கொண்டு இருப்பார்கள், பிள்ளை விழித்திருந்து படிக்கின்றது என்று. ஏனைய போதைப்பொருள் பாவனையாளர்களைப்போல் இவர்களை இலகுவாக இனங்காண முடியாது. ஏனெனில், இவ்வாறானவர்களில் வித்தியாசம் தெரிவதில்லை. இது மிகவும் வேதனைக்குரிய விடயமாகும்.

எனவே, கூர்மையாகக் கவனித்து, இவ்வாறானவர்களை இனங்கண்டு, அவர்களைச் சிகிச்சைக்கு உட்படுத்தி மீட்டெடுக்க வேண்டிய நிலைமை காணப்படுகின்றது. இந்தத் தேசத்தில் மிக மோசமாகவுள்ள இந்நிலைமையை இல்லாதொழிக்கும் பயணத்துக்கு அனைவரும் ஒத்துழைப்பு வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றோம். இதில் எந்தவித பாரபட்சமோ, வேறுபாடோ கிடையாது. கடந்த காலங்களில் மேற்கொண்ட இழிவான செயல்களில் இருந்து விடுபட்டு இந்தப் பயணத்தில் இணைந்து கொள்ளுமாறு எதிர்த்தரப்பினரையும் கேட்டுக் கொள்கின்றோம். இந்த நாட்டிலிருந்து போதைப்பொருளையும் ஒழுங்கமைக்கப்பட்ட குற்றச்செயல்களையும் இல்லாதொழித்து அழகானதொரு தேசமாக, மகிழ்ச்சியானதொரு தேசமாக இந்த நாட்டை உருவாக்கும் பணியில் அனைவரும் இணைந்துகொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

நாடு படிப்படியாக பொருளாதார வீழ்ச்சியில் இருந்து மீண்டு வருகின்ற இவ்வேளையில், போதைப்பொருள் பாவனையும் ஒழுங்கமைக்கப்பட்ட குற்றச்செயல்களும் பாரிய சவாலாக இருக்கின்றன. சமநேரத்தில் இரண்டு விடயங்களையும் அவதானித்துச் செயற்பட வேண்டிய தேவை இருக்கின்றது. இந்த இரண்டு விடயங்களும் கவனம் செலுத்தப்பட வேண்டிய விடயங்களாகும். போதைப்பொருள் பாவனை மற்றும் ஒழுங்கமைக்கப்பட்ட குற்றச்செயல்கள் நாட்டில் அனைத்து விடயங்களிலும் ஸ்தம்பித நிலையை ஏற்படுத்தக் கூடியன. இவற்றிலிருந்து நாட்டை மீட்டெடுப்பதற்கு நாங்கள் ஒன்றிணைந்து பாடுபட வேண்டும்.

எதிர்க்கட்சியினர் அரசாங்கத்தின்மீது பல்வேறு குற்றச்சாட்டுகளைச் சுமத்துகின்றார்கள். அவர்கள் ஒரு கணம் சிந்தித்துப் பார்க்க வேண்டும். அப்பொழுதுதான், போதைப்பொருள் பாவனை எவ்வாறு அவர்களால் ஊக்குவிக்கப்பட்டு வந்தது என்பது அவர்களுக்கே புரியும்! அவர்கள் மனசாட்சியைத் தொட்டுப் பார்க்க வேண்டும். அவர்கள் அதில் எவ்வாறு ஈடுபட்டார்கள் என்பது அப்பொழுது அவர்களுக்கே புரியும்! இனியாவது இவ்வாறான

செயற்பாடுகளில் இருந்து விடுபட்டு, தேசத்தைக் கட்டியெழுப்பும் பணியில் எங்களோடு ஒன்றிணையுமாறு அவர்களை தயவாகக் கேட்டுக் கொள்கின்றேன். மாண்புமிகு சனாதிபதி அவர்கள் தலைமையில், எங்களுடைய ஆட்சிக் காலத்தில், இவை இரண்டும் முற்றுமுழுதாக இந்த நாட்டிலிருந்து துடைத்தெறியப்பட்டு ஓர் அழகான, மகிழ்ச்சியான தேசம் உருவாக்கப்படும். அந்தப் பணியை நிச்சயமாக நாங்கள் மிக விரைவாக செய்து காட்டுவோம் என்று இவ்விடத்தில் கூறி, விடை பெறுகின்றேன். நன்றி, வணக்கம்!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.55]

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තූතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සාමාන්‍යයෙන් මම, මගේ පෞද්ගලික කාරණා පාර්ලිමේන්තුව ඇතුළේ කථා කරන කෙනෙක් නොවෙයි. මේක මට අතිසංවේදී කාරණයක්. අපේ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ඇමතිවරයෙක්,- සාමාන්‍යයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු කියන්නේ, ටිකක් කොන්ද කෙළින් තිබෙන මනුස්සයෝ; කියන්න ඕනෑ දෙයක් තිබෙනවා නම් කෙළින් කියනවා. එතුමාට කියන්න ඕනෑ දෙයක් තිබෙනවා නම් කෙළින්ම කියන්න තිබුණා, ඩී.වී. චානකගේ නෝනාගේ තාත්තා මෙන්න මෙහෙම ඝාතනය වුණා, ඒකට පාතාලයේ මොකක් හරි සම්බන්ධයක් තිබෙනවා, එහෙම නැත්නම් පාතාලය සම්බන්ධයෙන් චෝදනාවක් තිබෙනවා කියලා. එහෙම කෙළින් කියන්න තිබුණා. හැබැයි, එහෙම කෙළින් කිව්වේ නැහැ. පාතාලයට සම්බන්ධ මොකක් හරි තිබෙනවා වැනි කථාවක් කිව්වා. හැබැයි, මම පැහැදිලිවම කියන්න ඕනෑ මගේ මාමාණ්ඩිට පාතාලය සම්බන්ධ චෝදනාවක් පොලිස් වාර්තාවකවත්, පොලීසියක පැමිණිල්ලක්වත් කොහේවත් නැහැ කියන එක. එක ප්‍රසිද්ධ මාධ්‍යයක් ඒ ගැන වාර්තා කළා. මම ඒ මාධ්‍යයට විරුද්ධව නඩු දාලා තිබෙනවා. නිකම් Letter of Demand එකක් යවලා අත්හැරලා නැහැ. පොඩි මාධ්‍ය සන්දර්ශන දාලා නැහැ. මම ඒ සම්බන්ධයෙන් කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා තිබෙනවා. අනෙක් කාරණය මේකයි. දෙයක් කරනවා නම්, කොන්දක් තිබෙනවා නම්, මේ පාර්ලිමේන්තුවේ වරප්‍රසාද අස්සේ හැංගෙන්න එපා. හම්බන්තොට ඉන්නේ කොන්ද තිබෙන මිනිස්සු. පුළුවන් නම් එළියට ගිහිල්ලා මේ ගැන කියන්න. එහෙම වුණොත් ඔබතුමාට Letter of Demand එක එවනවා. සති 2ක් කල් දෙනවා. හම්බන්තොට දිසා අධිකරණයේ ඔබතුමාට විරුද්ධව නඩු දමනවා. ඒක අනිවාර්යයෙන් ඩී.වී. චානක කරනවා.

ගෙදර කෙනෙක් ඝාතනය වෙලා හැමදාම ඒක පාර්ලිමේන්තුවේදී මතක් කරනකොට අපේ පවුලේ අයට රිදෙනවා. මොකද, තමන්ගේ තාත්තත් නැති වෙලා ඔයගොල්ලන් බොරු චෝදනා කරනකොට රිදෙනවා. මාතර දිස්ත්‍රික්කයේ නායකයාගෙන්, ගාල්ල දිස්ත්‍රික්කයේ නායකයාගෙන් ඔබතුමන්ලා ගිහිල්ලා අහන්න, මගේ මාමණ්ඩි දේශපාලනය කළේ කාටද කියලා. ආනන්ද විජේපාල මහත්තයා ගිහිල්ලා අහන්න, මගේ මාමණ්ඩි දේශපාලනය කළේ කාටද කියලා. මගේ මාමණ්ඩි නැති වනකොට මම බැඳලා. මගේ විවාහයෙන් මාස දෙකක් ඇතුළත තමයි මගේ මාමණ්ඩිගේ ජීවිතය නැති වුණේ. සුනිල් හඳුන්නෙත්තිගෙන් වාගේම නලින් හේවගේගෙන් අහන්න, මගේ මාමණ්ඩි කාටද දේශපාලනය කළේ කියලා. ඒ ගැන අහන්න. ඕනෑ නම් recording එක දෙන්නම්. පාපිසි ඔය දන්නේ නැතුව පාර්ලිමේන්තුවේ කථා කළාට, රෑට කථා කරලා මගේ මස්සිනාගෙන් සමාව ගන්නවා. ඕනෑ නම් දැන් recording එක දාලා පෙන්වන්නද? සමාව ගන්න ඒවා අහන්න ඕනෑද? ගත්ත උදවු අහන්න ඕනෑද? වීඩියෝ දාලා පෙන්වන්නද? අපේ shop එකට ඇවිල්ලා උදවු ගත්ත ඒවා බලන්න ඕනෑද කාටද දේශපාලනය කළේ කියලා? ඒවා ඕනෑ නම් පෙන්වන්නම්. ගිහිල්ලා සුනිල් හඳුන්නෙත්තිගෙන් ඒ ගැන අහන්න; නලින් හේවගේගෙන් අහන්න.

පෞද්ගලික කාරණා අපි දේශපාලනය තුළ කථා කරන්නේ නැහැ. හැබැයි, ඔබතුමන්ලා දේශපාලන වශයෙන් උදවු ඔක්කොම පක්ෂයට අරගෙන, ගන්න තිබෙන හැම දෙයම අරගෙන මෙතැනට ඇවිල්ලා කිසිම චෝදනාවක් නැති මනුස්සයෝ ගැන කථා කරනකොට අපට වේදනාවක් තිබෙනවා. මම පාර්ලිමේන්තුවේදී කවදාවත් පෞද්ගලික දේවල් කථා කරන්නේ නැහැ. හැබැයි, හම්බන්තොට දිස්ත්‍රික්කයේ කෙනෙක් වුණාම කොන්දක් තිබෙන්න ඕනෑ. පුළුවන් නම් එළියට ඇවිල්ලා කියන්න. ඔයගොල්ලන්ගේ සුනාමියටවත් බැරි වුණා, මාව පාර්ලිමේන්තුවෙන් එළියට දමන්න. ඔයගොල්ලන්ගේ ශ්‍රමදානයටවත් බැරි වුණා, මාව පාර්ලිමේන්තුවෙන් එළියට දමන්න. ඔයගොල්ලන්ගේ ජේසීබීවලටත් බැරි වුණා, මාව පාර්ලිමේන්තුවෙන් එළියට දමන්න. ඔයගොල්ලන්ගේ 159, අපේ 3ට අඩු වෙද්දිත් මම පාර්ලිමේන්තුවේ හිටියා. ඒක මතක තියා ගන්න.

ගරු ආනන්ද විජේපාල ඇමතිතුමනි, දැන් ඔබතුමන්ලා දිගටම මිද්දෙනිය ගැනත් කථා කළා. කන්ටේනර් ගැනත් කථා කළා. හැබැයි, මේ කන්ටේනර් දෙක පන්නපු විධිය ගැන ඔබතුමන්ලා කථා කරන්නේ නැහැ නේද? Drug Enforcement Administration - DEA - කියන්නේ, ලෝකයේ - ඇමෙරිකාවේ - තිබෙන උසස්ම බුද්ධි අංශය. ලෝකයේ තිබෙන උසස්ම බුද්ධි අංශයෙන් ඔබතුමන්ලාට report එකක් දීලා තිබෙනවා නේ. ඔබතුමා ඒක පාර්ලිමේන්තුවේදී පිළිගත්තා. ඒකෙන් කියා තිබෙනවා, මේ කන්ටේනර් එකේ එන්නේ අයිස් කියලා; මේකේ එන්නේ අයිස් කියලා කෙළින්ම කියා තිබෙනවා. මිද්දෙනියෙන් අල්ලපු කන්ටේනර් එකේ එන්නේ අයිස් කියලා කෙළින්ම කියා තිබුණා නම්, ඇයි ඔබතුමන්ලා ඒවා එළියට යන්න දුන්නේ? ඒක check කළා නේ; ඒක පොලීසියෙන් ගිහිල්ලා check කළා නේ. මේ සම්බන්ධයෙන් පොලිස්පතිතුමාට ලියුම ආවා නේ. මේ සම්බන්ධයෙන් ඇමතිවරු දැනගෙන හිටියා නේ. ඇමෙරිකාවෙන් කිව්වා නම් මේක technical fault එකක් කියලා ඔබතුමන්ලා පැනලා යන්නේ කොහොමද? එහෙම පුළුවන්ද, ඔබතුමන්ලාට පැනලා යන්න? එහෙම පැනලා යන්න බැහැ. ඇමෙරිකාවෙන් කිව්වා නම් technical fault එකක් කියලා ඔබතුමන්ලාට පුළුවන්කමක් තිබෙන්න ඕනෑ, එක වතාවක් නොවෙයි දහ වතාවක් හරි check කරලා මේවා අල්ලා ගන්න. හෙට අනිද්දා වනකොට අපි ඉල්ලලා තිබෙනවා -*[බාධා කිරීමක්]*

දැන් මනම්පේරිගේ අපේක්ෂකත්වය නම් හොයා ගත්තා. මල්ලිගේ මන්ත්‍රීකමත් සොයා ගත්තා. හෙට-අනිද්දා lawyer කවුද කියලා දැන ගන්නත් අපි report එක ඉල්ලා තිබෙනවා. මම නම් දන්නවා, lawyer කවුද කියලා. දැන් අපට නම ඇවිල්ලා තිබෙනවා. හැබැයි, අපි සාක්ෂි අතේ නැතිව කථා කරන්නේ නැහැ. ඔය පළමුවැනි පේළියේ ඉන්න ප්‍රධාන අමාත්‍යවරයෙක් තමයි lawyer විධියට ඉන්නේ. එයා තමයි උදව් කරලා තිබෙන්නේ. දැන් අපට තිබෙන ප්‍රශ්නය තමයි, ඒ lawyer ද ඔය කන්ටේනර් දෙක පන්නන්න උදවු කළේ කියන එක. මොකද, United Nations Office on Drugs and Crime - UNODC-

[ගරු ඩී.වී. චානක මහතා]

මඟින් කිව්වා නම්, ඇමෙරිකාවේ DEA එකෙන් කිව්වා නම්, එහෙනම් කන්ටේනර් දෙක පැන්නුවේ කොහොමද? එතකොට මනම්ජේරිගේ lawyer ද උදවු කළේ? එහෙම නැත්නම් අමාත්‍යවරු ද උදව් කළේ? කොහොමද උදව් කළේ? අන්න ඒවාත් හොයන්න. දැන් මාස 6ක් ගිහිල්ලාත් ඒකේ officersලා තවමත් අල්ලන්න බැරි ඇයි? මේකට අදාළ Sri Lanka Customsහි නිලධාරින් කවුද කියලා හොයන්න මාස 6ක් යන්නේ නැහැ නේ. පොලීසියේ කවුද සම්බන්ධ කියලා හොයන්න මාස 6ක් යන්නේ නැහැ නේ. මේවායේ දත්ත හොයන්න මාස 6ක් යන්නේ නැහැ නේ. අත්අඩංගුවට ගන්න මාස 6ක් යන්නේ නැහැ නේ.

පුවක්දණ්ඩාවේ සනා මාලිමාවේ සාමාජිකයෙක් කියලා අපි හැමෝම දන්නවා නේ. ඒක හංගන්න දෙයක් නැහැ. ඒ බව හම්බන්තොට දිස්ත්‍රික්කයේ හැමෝම දන්නවා. හැබැයි, ඔහුව රඳවා ගැනීමේ නියෝගය ගැහුවේ නැත්තේ ඇයි? ආරක්ෂක අංශ විසින් අල්ලා ගත්ත ලංකාවේ ලොකුම අයිස් තොගය අයිති මනුස්සයා තමයි ඒ. දැන් බලන්න, අර අල්ලාගෙන ආපු හැම කෙනාටම මාස 3ක රඳවා ගැනීමේ නියෝගය ගැහුවා. එහෙම නම් පුවක්දණ්ඩාවේ සනා එක දවසින් රිමාන්ඩ් කළේ ඇයි? මොකද, ඒ බලය තිබෙන්නේ ආරක්ෂක ඇමතිවරයාට. එක දවසක් පොලීසියට තියා ගන්න පුළුවන්, DO ගහන්න. ආරක්ෂක ඇමතිවරයාට මාස 3ක් පුළුවන්. එහෙම 3 පාරක් extend කරලා මාස 9ක් තියාගන්න පුළුවන්. හැබැයි, ඔහුව එක දවසින් ඇතුළට දැම්මේ ඇයි? ආණ්ඩුවට පක්ෂ පාතාලය ආරක්ෂා කරනවා; විරුද්ධ අය නැති කරනවා. ඔය සජබයේ සභාපතිවරයාත් ආණ්ඩුවට පක්ෂ පාතාලය දාලා සාතනය කළා ද කියලා අද රටේ ජනතාව විශාල සැකයකින් ඉන්න බව අද අපට පේන්න තිබෙනවා.

බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු මේජර් ජෙනරාල් ජී.ඩී. සූරියබණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.02]

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ තුරන් කිරීම සඳහා ශක්තිමත් නීති රාමුවක් සකස් කිරීම පිළිබඳව අද දින ගරු ධර්මප්‍රිය වීජේසිංහ මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද සභාව කල් තැබීමේ යෝජනාව ගැන අදහස් දක්වන්නට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව ආරම්භ කරන්නට කලින් මම කැමැතියි ඊයේ සිදු වූ ඒ මනුෂ්‍ය ඝාතනය හෙළා දකින්න. එවැනි මනුෂ්‍ය ඝාතන හෙළා දකින්න අපි පැකිළෙන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි, සිදුවන සියලුම මනුෂ්‍ය ඝාතන අපි හෙළා දකිනවා. ඒ වාගේම, මනුෂ්‍යත්වයට එරෙහි සියලුම අපරාධ හෙළා දකින්නට අපි පැකිළෙන්නේ නැහැ.

ගරු විපක්ෂ නායකතුමා පාර්ලිමේන්තුවේදී ආණ්ඩු පක්ෂයේ අපේ මන්ත්‍රීවරුන්ට ප්‍රශ්නයක් යොමු කළා, මහජනතාව මුණ ගැසෙනවා ද, එහෙම නැත්නම් මහජන දින පවත්වනවා ද කියන එක සැක සහිතයි කියලා. අපි ප්‍රකාශ කරන්න කැමැතියි, අපි සෑම සතියකම මහජන හමු, මහජන දින පවත්වනවා කියලා. ඒ වාගේම, මහජනයා සමඟ අපි නිතරම සම්බන්ධ වෙලා කටයුතු කරනවා. අපට නම් ආරක්ෂාව සම්බන්ධයෙන් කිසිදු ආකාරයකින්වත් තර්ජනයක් මතු වෙලා නැහැ. ඇත්තටම යම්කිසි අයෙකුට ආරක්ෂාව සම්බන්ධයෙන් මේ වාගේ තර්ජනයක් මතු වෙන්නේ එක්කෝ ඔහු නීති විරෝධී දෙයක්, කටයුත්තක් කරලා තිබෙන්න ඕනෑ. එහෙම නැත්නම්, ඔහු යම්කිසි අපරාධයකට යොමු වෙච්ච කෙනෙක් වෙන්න ඕනෑ. නැත්නම් අපරාධයක් කරපු කෙනෙක් වෙන්න ඕනෑ. එහෙම නැත්නම් මත්ද්‍රව්‍ය ජාවාරම්වලට හෝ යම්කිසි නීති විරෝධී ක්‍රියාවකට සම්බන්ධ කෙනෙක් නම් ඔහු ඇත්තටම ආරක්ෂාව ගැන සැලකිලිමත් විය යුතු වෙනවා. එහෙම නැත්නම් ඔහුට ආරක්ෂාව ලබාගත යුතු වෙනවා.

මම මේ ළඟදී සමාජ මාධ්‍ය තුළ දැක්කා, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ඇත්තටම ඉතාම හොඳ තීරණයක් අරගෙන තිබුණා. ඒ තමයි, ඉදිරියේදී එතුමාගේ පක්ෂයෙන් යම් කෙනෙක් යම් මැතිවරණයකට ඉදිරිපත් වෙනවා නම් නාම යෝජනා ලබා දෙන්නට කලින්, ඔහු හෝ ඇය සම්බන්ධයෙන් පොලිස් වාර්තාවක් ලබා ගන්නවා කියන එක. ඒක ඉතා හොඳ තීරණයක්. මොකද, එහෙම නැති වුණොත් නොයෙකුත් අපරාධවලට සම්බන්ධ අය, නොයෙකුත් ජාවාරම්වලට සම්බන්ධ අය මහජන නියෝජිතයන් වශයෙන් පත්වෙලා ආවාට පස්සේ අර වාගේ ජීවිත තර්ජන ඇති වෙනවා. ඒක ස්වාභාවිකයි. ඒ නිසා එතුමා ඒ කියන ආකාරයට කටයුතු ක්‍රියාත්මක කළොත්, ඒ තත්වය වැළකෙනවා කියන එකත් මම මේ අවස්ථාවේ කියන්න අවශ්‍යයි.

ඒ වාගේම තව දෙයක් කියන්නට අවශ්‍යයි. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ පාර්ලිමේන්තුවේදී මතු කරපු දේ තමයි, මේ ආකාරයේ ඝාතනයක් සිද්ධ වුණේ පළමුවැනි වතාවට කියන කාරණය. ඒක වැරැදියි. ඇත්තටම 2003 වර්ෂයේදී හික්කඩුව නගර සභාවේ සභාපති, ගාමිණී පින්නවුව මහතා ඝාතනයට ලක් වුණා, නාඳුනන තුවක්කුකරුවන් දෙදෙනෙක් ඇවිල්ලා වෙඩි තැබීම නිසා. ඇත්තටම මේක දෙවැනි එකද, තුන්වැනි එකද කියන එක නොවෙයි අපට වැදගත් වෙන්නේ. මේක අනිවාර්යයෙන් අවසන් ඝාතනය බවට අපි පත් කළ යුතු වෙනවා; නැවත මෙවැනි සිද්ධීන් මේ රටේ ඇති නොවීමට කටයුතු කළ යුතු වනවා. හැම කෙනෙකුගේම ජීවිත අපට වටිනවා. ඒ නිසා තමයි ගරු ජනාධිපතිතුමාගේ මැදිහත් වීම මත අපි "රටම එකට" කියන ජාතික වැඩසටහන, දිස්ත්‍රික්ක මට්ටමින්, ප්‍රාදේශීය මට්ටමින් දියත් කරලා "මත්ද්‍රව්‍ය" කියන වසංගතය මේ රටින් තුරන් කිරීමේ කටයුත්තට අත ගහලා තිබෙන්නේ.

ඇත්තටම මේ මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ අද මුළු ලෝකයටම තර්ජනයක් වෙලා තිබෙනවා. අපි දැක්කා, මෑත කාලයේදී සමහර රටවලට අනෙකුත් රටවල් චෝදනා කරනවා, ඔවුන්ගේ රටේ ක්‍රියාත්මක වන මත්ද්‍රව්‍ය ජාවාරම් සහ සංවිධානාත්මක අපරාධ නිසා ඒ ඒ රටවල ජාතික ආරක්ෂාවට බලපෑම් එල්ල වෙනවා කියලා. ඒ නිසා දෘඪ බලය - hard power - පාවිච්චි කරන තත්ත්වය දක්වා මේ ප්‍රශ්නය වර්ධනය වෙමින් තිබෙනවා. ඒ කියන්නේ, මේක ලෝක සාමයට බලපාන ගැටලුවක් බවට පත්වෙලා තිබෙනවා. මේක අපේ රටට පමණක් සීමා වුණු කාරණයක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඕනෑම රටක ප්‍රගමනයට ඒ රටේ පුරවැසියන්ගේ සක්‍රිය දායකත්වය අත්‍යවශ්‍යම කාරණයක් කියලා අපි දන්නවා. ඒ වාගේම පුරවැසියන් විසින් ඒ සක්‍රිය දායකත්වය ලබා දෙන්නට නම්, ඔවුන් සියලුදෙනාම කායික හා මානසික නිරෝගිකමින් යුත් පුරවැසියන් බවට පත් විය යුතුමයි.

අපි දන්නවා, අපේ රටේ සිටින පුරවැසියන්, විශේෂයෙන්ම අපේ තරුණ ප්‍රජාව මත්ද්‍රව්‍ය ජාවාරම විසින් බිලී බා ගැනීමෙන් අපේ රටේ අනාගතයට, අපේ රටේ ප්‍රගමනයට ලොකු බලපෑමක් එල්ල වෙලා තිබෙනවා කියලා. ඒ වාගේම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් සහ මත්ද්‍රව්‍ය ජාවාරමේ නියැළෙන අය සංවිධානාත්මක අපරාධ සඳහාත් යොමු වෙනවා කියන එක අපි දන්නවා. ඒ නිසා ඔවුන් ජාතික ආරක්ෂාවටත් යම්කිසි බලපෑමක් කරන කොට්ඨාසයක් බවට පත් වෙමින් තිබෙනවා. අන්න ඒ අනතුර අපි මේ සමාජයෙන් අයින් කළ යුතුමයි.

ඒ නිසා තමයි අපි "රටම එකට" කියන ජාතික වැඩසටහන ආරම්භ කරලා, මේ රටින් මත්ද්‍රව්‍ය තුරන් කරලා, සංවිධානාත්මක අපරාධ මේ රටෙන් මුලිනුපුටා දමන්න බලාපොරොත්තු වෙන්නේ. ඇත්තටම මේක ලෙහෙසි පහසු කාර්යයක් නොවෙයි. මේක ටිකක් සංකීර්ණ හා බැරෑරුම් කාර්ය භාරයක්. ඒ සඳහා රටේ සිටින සියලුමදෙනා එකමුතු විය යුතු වෙනවා. විශේෂයෙන්ම මෙහිදී මේ රටට මත්ද්‍රව්‍ය ගෙන්වන්නන්, මේ රට තුළ බෙදා හරින්නන් සහ ඒවාට ඇබ්බැහි වූවන්, ඒ කියන්නේ ගැණුම්කරුවන් යන ත්‍රිත්වය අපි කෙසේ හෝ අඩපණ කරන්නට අවශ්‍ය වෙනවා. ගෙන්වන්නන් සහ බෙදා හරින්නන් අඩපණ කරන්න නම් අපි අපේ මුහුද අනිවාර්යයෙන්ම ආරක්ෂා කළ යුතු වෙනවා. ඒ එක්කම ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවත් අපි ශක්තිමත් කරන්න ඕනෑ. එමෙන්ම ශ්‍රී ලංකා නාවික හමුදාවත් එක්ව ඒ සඳහා ශක්තිමත් යන්ත්‍රණයක් හදන්නට ඕනෑ.

ගරු සුසන්ත දොඩාවත්ත මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට ගුවන් තොටුපොළවල්වල ශක්තිමත් ආරක්ෂක ජාලයක් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම ධීවර වරායවල්වලින් ඔබ්බට ගිහිල්ලා වෙරළ තීරයේ ධීවර ගම්මානවල ධීවර යාත්‍රා නැවතුම් ස්ථාන සම්බන්ධයෙනුත් අපි අවධානය යොමු කළ යුතු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන් මතක් කරන්න කැමැතියි, අපේ රටට මත්ද්‍රව්‍ය ගෙන්වීම වළක්වන්නට නම් අපි උතුරු පළාතේ උතුර, නැඟෙනහිර සහ බටහිර වෙරළ තීරයන් කෙරෙහි අපි වැඩි අවධානයක් යොමු කළ යුතු වෙනවා. විශේෂයෙන්ම ඒ කලාපය ඉතාම සංවේදී කලාපයක්. ඉන්දියානු ධීවරයන් එම කලාපයේ ගැවසෙනවා, අපේ ධීවරයින් සමඟ නොයෙකුත් ආකාරයේ සම්බන්ධතා ඇතිවෙලා තිබෙනවා. ඉතින්, අපේ රටට මත්ද්‍රව්‍ය හෝ අනෙකුත් ඕනෑම ද්‍රව්‍යයක් පහසුවෙන් ගෙන්වීමට හැකි කලාපයක් ලෙස අපි එම කලාපය හඳුනාගෙන තිබෙනවා. එම නිසා අපි ඒ සම්බන්ධයෙනුත් අවධානය යොමු කළ යුතු වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කාලය අවසන් වෙනවා.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් ප්‍රකාශ කරන්න කැමැතියි. අපි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන තේමාව යටතේ ඉදිරිපත් කරලා තිබෙනවා. මුදල්වලින් පොහොසත් රටක් නොවෙයි, ආකල්පවලින්, දැනුමින්, කායික සහ මානසික සෞඛ්‍යයෙන් පොහොසත් රටක් හදලා අපේ ඉදිරි අනාගත පරම්පරාවට ජීවත් වෙන්න පුළුවන් ලස්සන රටක් නිර්මාණය කරන්න අපි සියලු දෙනා එක් වෙමු, කැප වෙමු කියා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ ஜீ.ஜீ. பொன்னம்பலம் அவர்கள்! உங்களுக்கு 9 நிமிடங்கள் உண்டு.

[பி.ப. 3.10]

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு முன்னர் கௌரவ உறுப்பினர் மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார அவர்கள் உரையாற்றினார். அவர் தனது உரையில் கடைசியாக வட, கிழக்கு கடற்பரப்பு பாதுகாப்புச் சம்பந்தமாகச் சொல்லியிருந்தார். அதாவது, அந்தக் கடற்பரப்பு மிகவும் நீண்ட ஒரு பிரதேசம் என்ற வகையிலே, அதன் ஊடாகத்தான் நாட்டுக்குள் போதைப்பொருள் கூடுதலாகக் கொண்டு வரப்படுகின்றது, அதைக் கட்டுப்படுத்துவது அத்தியாவசிய தேவையாக இருக்கின்றது என்ற கருத்தை அவர் கூறியிருந்தார்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் முதற்கட்டமாக 2001 - 2010ஆம் ஆண்டு வரைக்கும் ஒரு பாராளுமன்ற உறுப்பினராக இருந்தேன். அப்பொழுது தமிழீழ விடுதலைப் புலிகள் இயக்கத்துக்கும் அப்போதைய அரசாங்கத்துக்கும் இடையில் ஒரு சமாதான முயற்சி - போர் நிறுத்த உடன்படிக்கை - ஏற்படுத்தப்பட்டிருந்து. 2006ஆம் ஆண்டு அரசாங்கம் ஒருதலைப்பட்சமாக அதிலிருந்து விலகி, ஓர் இனப்படுகொலையை நோக்கி போரை நடத்தியது. அந்தக் காலப்பகுதியிலே நான் பாராளுமன்றத்தில் ஓர் உறுப்பினராக இருந்தமையால், தமிழீழ விடுதலைப் புலிகள் இயக்கத்தோடு - அவர்களுடைய நிருவாகத்தோடு - கூடுதலாகப் புழங்கக்கூடிய ஒரு சந்தர்ப்பம் கிடைத்திருந்தது. இது எந்தவகையிலும் எவரையும் துன்புறுத்துவதற்காகவோ, கோபப்படுத்துவதற் காகவோ சொல்லுகின்ற காரியமல்ல. உண்மையிலே நான் பெருமையோடு சொல்லுகின்ற விடயம் என்னவென்றால், அன்றைய காலகட்டத்தில் வட, கிழக்கிலே இந்தப் போதைப்பொருள் பாவனை என்பது கிட்டத்தட்ட பூஜ்ஜியத்துக்கு வந்திருந்தது. அதிலும் விஷேசமாக, தமிழீழ விடுதலைப் புலிகளின் கட்டுப்பாட்டுப் பிரதேசங்களிலே இந்தப் போதைப்பொருள் பாவனை என்பது பூஜ்ஜியமாக இருந்தது. தங்களுடைய கட்டுப்பாட்டில் இருக்கின்ற மக்களைப் பாதுகாக்க வேண்டும் என்ற விருப்பத்தின் அடிப்படையில் அவர்களுடைய நிருவாகம் அங்கு இயங்கிய காரணத்தினாலே அதனை ஒழிக்க முடிந்தது. அந்தளவுக்கு அவர்கள் அதற்கு முன்னுரிமை வழங்கி சாதித்துக் காட்டினார்கள்.

வடக்கு, கிழக்கிலே தமிழீழ விடுதலைப் புலிகள் இயக்கத்தின் கட்டுப்பாட்டுக்கு அப்பால் அரச கட்டுப்பாட்டுப் பிரதேசங்களிலும்கூட போதைப்பொருளுடன் தொடர்புடைய விடயங்கள் மிகவும் குறைந்தளவிலே இருந்தன. ஏனென்றால், தமிழீழ விடுதலைப் புலிகள் இயக்கத்தினுடைய ஆதிக்கம் அரச கட்டுப்பாட்டுப் பிரதேசங்களிலும் இருந்ததால் போதைப் பொருள் வியாபாரத்தில் ஈடுபடுபவர்களுக்குப் பயம் இருந்தது. அந்தளவுக்கு மக்கள்மீது விருப்பமும், பாசமும் கொண்ட ஒரு நிருவாகம் இருந்தால் உண்மையிலேயே சமூகத்திலே மிகவும் மோசமான புற்றுநோய்போல கருதக்கூடிய இந்தப் பிரச்சினை தீர்க்கப்படலாம்! ஆனால், யதார்த்தம் என்ன? இன்றைக்கும் வடக்கு, கிழக்கிலே இந்தப் போதைப்பொருளைப் பரப்புவதிலே இராணுவத்துக்கு மிகப்பெரிய பங்கு இருக்கின்றது.

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

போர் முடிவடைந்ததற்குப் பிற்பாடு, 2015இல் கௌரவ சனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களின் தலைமையில் போதைப்பொருளை ஒழிப்பதற்கான ஒரு வேலைத்திட்டம் நடைபெற்றபொழுது, வட, கிழக்கிலே அதனை அமுல்படுத்துவதற்கு counterinsurgency என்று இராணுவம் அவர்களுக்குப் புத்திமதி சொன்னது. அதாவது, அந்த வேலைத்திட்டத்தை முன்னெடுப்பதற்கு அன்றைய அரசாங்கம் விரும்பிய ஒருசில நாட்களுக்குள்ளே, அங்கு இதை முற்றுமுழுதாக ஒழிப்பதை தாங்கள் விரும்பவில்லை என்று இராணுவம் சொன்னது. 1995ஆம் ஆண்டிலிருந்து இராணுவக் கட்டுப்பாட்டுக்குள் யாழ்ப்பாணம் சென்றதற்குப் பிற்பாடுதான் உண்மையில் போதைப்பொருள் சம்பந்தப்பட்ட பிரச்சினையே வளரத் தொடங்கியது. அதுவும், 2009ஆம் ஆண்டுக்குப் பிறகு வட, கிழக்கு இதனால் மிக மோசமாகப் பாதிக்கப்பட்டு இருக்கின்றது. குறிப்பாக, வட மாகாணம் மிக மோசமாகப் பாதிக்கப்பட்டு இருக்கின்றது, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இன்றைக்கு போதைப்பொருள் வியாபாரத்தில் ஈடுபடுபவர்கள் சமூகத்தில் உள்ளவர்களால் அடையாளப் படுத்தப்பட்டு, அவர்களைத் துரத்திப் பிடிக்கச் செல்கின்றபோது அவர்கள் ஓடி ஒளிகின்ற இடம் இராணுவ முகாம்கள்! இதுதான் இன்றைய நிலைமை! பொலிஸ் நிலையத்துக்குச் சென்று அங்கு போதைப்பொருள் வியாபாரம் செய்கின்றவர்கள் தொடர்பாக முறைப்பாடு செய்தால், பொலிசார் அவ்வகையான முறைப்பாடுகளைப் பதிவு செய்வதற்கு மறுக்கிறார்கள். இதுதான் உண்மை! இவை யாழ்ப்பாணத்தில் நடைபெறுகின்கின்ற ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களில் வெளிப்படையாகப் பேசப்படுகின்ற விடயங்கள்!

ஆகவே, அந்த மக்கள்மீது பற்றுக்கொண்ட ஒரு நிருவாகம் - ஓர் அரசாங்கம் - இருந்தால் மட்டும்தான் இவ்வகையான மோசமான செயல்களைத் தடுக்கலாம். முதற்கட்டமாக நீங்கள் இந்தப் போதைப்பொருளை இராணுவத்தைப் பயன்படுத்தி பரப்பினீர்கள். தமிழீழ விடுதலைப் புலிகள் இயக்கத்துடைய புரட்சியைத் தோற்கடிப்பதற்காக நீங்கள் தொடங்கிய இந்தப் புற்றுநோய் இன்று தெற்குக்கும் பரவியிருக்கின்றது. இந்த நிலை ஏனென்று நீங்கள் இராணுவத்தினருடைய தொடர்புகளைத் தேடிப் பாருங்கள்! நிச்சயமாக அவர்களின் பங்கு இருக்கும். அந்தளவு தூரத்துக்கு அவர்கள் ஊடாகத்தான் இது பரவுகின்றது. இதுதான் உண்மை! போதைப்பொருள் வியாபாரத்தினூடாக சம்பாதிக்கக் கூடியவர்களுக்கு கண் திறந்திருக்கின்றது.

கௌரவ உறுப்பினர் அவர்களே, நாங்கள் ஓர் அரசியல் கட்சியாக இனப்பிரச்சினைத் தீர்வு தொடர்பாகப் பேசுகின்ற பொழுதெல்லாம் மக்களுடைய பாதுகாப்பு, மக்களுடைய நலன்கள் சம்பந்தமாகச் சொல்கின்றோம். அதற்கு அதிகாரங்கள் தேவைப்படுகின்றன. பாதுகாப்பு, கல்வி, சுகாதாரம் போன்றவை அடிப்படைத் தேவைப்பாடுகள்; சமூகத்துக்கு மிகவும் தேவைப்படுகின்ற விடயங்கள்! அந்த விடயங்களை அந்தந்த மக்களிடமே விட்டுவிட வேண்டும். அந்தந்த மக்களிடமே அவற்றை விட்டால் மட்டும்தான், அதிலே ஈடுபடுகின்றவர்கள் அம்மக்களுக்குப் பொறுப்புக்கூற வேண்டிய நிலைக்குத் தள்ளப்படுவார்கள். அப்போது அந்தக் காரியங்கள் சரியான வகையில் நடைபெறும். வட, கிழக்கோடு எந்தவித தொடர்பும் இல்லாதவர்கள், அங்கிருக்கக்கூடிய மக்களைப் பலவீனப்படுத்துவதற்கு 30 வருடமாகச் செயற்பட்டவர்கள் இன்று அங்கு நிருவாகம் செய்கின்றபொழுது, அங்கிருக்கின்ற பிரச்சினைகளை ஒரு நாளும் தீர்க்க முடியாது. இதுதான் உண்மை!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் இரண்டு நிமிடங்கள் மட்டுமே இருக்கின்றன.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் முடித்துக் கொள்கின்றேன்.

அதுமட்டுமல்லாமல், நீங்கள் கல்வியை எடுத்துப் பாருங்கள்! 2009ஆம் ஆண்டு வரைக்கும் ஏன், போர் நடைபெற்றுக் கொண்டிருந்த காலப் பகுதியிலும்கூட வட மாகாணம் கல்வியில் 2 - 5 இடங்களுக்குள்தான் இருந்தது. 2009ஆம் ஆண்டுக்குப் பிறகு கல்வியில் நாங்கள் எட்டாம், ஒன்பதாம் இடத்தில் இருக்கின்றோம். அதாவது, கடைசி இடத்தில் இருக்கின்றோம். போர் நடைபெறுகின்றபொழுது வட மாகாணம் தமிழீழ விடுதலைப் புலிகள் இயக்கத்தின் கட்டுப்பாட்டில் இருந்ததால், அவர்களின் ஆதிக்கம் அந்தப் பிரதேசத்தில் இருந்ததால், மிகவும் கஷ்டமான நேரத்திலும்கூட அந்தப் பிள்ளைகளால் ஏதோ ஒரு வகையில் படிக்கக்கூடிய ஒரு சூழல் ஏற்பட்டது. ஆனால், இன்றைக்குத் திட்டமிட்டு போதைப்பொருளைப் பரப்பியதன் காரணமாக அந்த நிலைமை மோசமடைந்து கொண்டு வருகின்றது. அதுதான் உண்மை! அந்தத் துரதிருஷ்டம் இன்றைக்குத் தெற்குக்கும் பரவியிருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் கடைசியாகச் சொல்ல விரும்புவது என்னவென்றால், அரசாங்கம் எடுக்கும் இவ்வாறான முடிவுகளுக்கு எங்களுடைய பூரண ஆதரவு இருக்கும் என்றுதான். இதில் மாற்றுக் கருத்து இருக்க முடியாது. நான் இந்த இடத்தில் ஒருசில விடயங்களைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். 2023ஆம் ஆண்டு "End overreliance on punitive measures to address drugs problem - UN report" ஒன்று வெளிவந்து இருக்கின்றது. நான் அந்த அறிக்கையை ***table** பண்ணுகின்றேன்.

இதில், ஒரு விடயம் மிகத் தெளிவாகச் சொல்லப்பட்டு இருக்கின்றது. It states, I quote:

> "A UN human rights report today calls for a shift from punitive measures to address the global drugs problem to the use of policies grounded in human rights and public health, arguing that disproportionate use of criminal penalties is causing harm."

இன்னோர் இடத்தில் இவ்வாறு சொல்கின்றது. I quote:

> "The UN Human Rights Office report, mandated by the UN Human Rights Council, finds that disproportionate use of criminal penalties discourages people who use drugs from seeking treatment and feeds stigma and social exclusion."

உண்மையில் போதைப்பொருளைப் பயன் படுத்துபவர்களைக் குற்றவாளிகள் எனக் கருதுவது தவறென்பது ஏகோபித்த முடிவாகும். ஆகவே, குற்ற நிலையில் இருந்து அவர்களை விடுவித்து, அந்த வியாபாரத்தில் ஈடுபடுபவர்களுக்கு கூடுதலான தண்டனையைக் கொடுக்க

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

வேண்டுமே தவிர, அவர்களை நீங்கள் சிறையில் அடைப்பது தவறு! இதனால் 10,500 பேர் இருக்கக்கூடிய சிறையில் 35,000 பேரை அடைக்க வேண்டிய நிலை ஏற்பட்டிருக்கின்றது.

ஆகவே, இந்த மாற்றங்களை நீங்கள் நிச்சயமாகச் செய்ய வேண்டும். அரசாங்கம் போதைப்பொருள் ஒழிப்பு சம்பந்தமாக ஆக்கபூர்வமான நடவடிக்கை எடுப்பதாக இருந்தால், இராணுவத்தை இந்தச் செயல்களில் இருந்து முற்றுமுழுதாக நீக்கி விடுங்கள்! இராணுவத்திற்கும் இதற்கும் எந்தவிதமான தொடர்பும் இல்லை! வட, கிழக்கைப் பொறுத்தவரையில் அவர்கள்தான் இந்தப் பிரச்சினைக்கு மூல காரணம். ஆகவே, இராணுவத்தை முற்றுமுழுதாக நீக்கி, உங்களுடைய திட்டம் சம்பந்தமாக ஒரு White Paper ஒன்றை மிக விரைவில் வெளியிட்டு, அது தொடர்பாக மக்கள் மட்டத்திலே, நிபுணத்துவம் பெற்றிருக்கின்றவர்கள் மட்டத்திலே கருத்துகளை அறிந்து, அத்திட்டத்தை வகுக்க வேண்டும். நிபுணத்துவம் பெற்றவர்கள் மட்டும்தான் இது சம்பந்தமாக முடிவெடுக்க வேண்டுமே தவிர, இதனுடன் சம்பந்தப்படாத, இந்தப் பிரச்சினை தொடர்பாக எந்தவிதமான அறிவும் இல்லாதவர்களை இதனுள் தொடர்பு படுத்தாதீர்கள்! வட, கிழக்கைப் பொறுத்தவரையில், மோசமாகப் போதைப்பொருளைப் பரப்புகின்ற இராணுவம் போன்ற தரப்புகளை இந்தத் திட்டத்துக்குள் எந்தவிதத்திலும் ஈடுபடுத்தாதீர்கள் என்று நான் தயவுடன் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.22]

ගරු සංජීව රණසිංහ මහතා
(மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ)
(The Hon. Sanjeewa Ranasingha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය සති අග මේ සතියට අදාළ කරන පාර්ලිමේන්තු කටයුතු සංවිධානය වෙද්දී ආණ්ඩුව විසින් යෝජනා කරනු ලබනවා, මත්ද්‍රව්‍ය හා සංවිධානාත්මක අපරාධ තුරන් කිරීම සඳහා වන සහාව කල් තබන අවස්ථාවේ විවාදය. ඊයේ කථික ලැයිස්තු සූදානම් කරගෙන ඒ වෙනුවෙන් අපි සූදානම් වෙද්දී අපි දැක්කා ඊයේ උදෑසන මේ රටේ බලගතු අපරාධයකට මේ සමාජය මුහුණ දෙනවා. අපි ඒ ගැන කනගාටු වෙනවා. මේ රටේ කිසිම පුද්ගලයෙක් කිසිදු වෙඩික්කරුවෙක් අතින්, අපරාධකරුවෙක් අතින් මරණයට පත් විය යුතු නැහැ. හැබැයි, ඉතිහාසයේ අපේ රට කොතැනද තිබුණේ, අද අපි කොතැනටද ගමන් කරමින් ඉන්නේ? අද අපි දකිනවා, වසර ගණනාවක් මේ රටේ ආණ්ඩු කරපු, ආණ්ඩු බලය හොබවපු, මේ රටේ පරිපාලනය වෙනුවෙන් මැදිහත් වුණු ඒ දේශපාලන පක්ෂ අද විපක්ෂය ලෙස කළු ඇඳගෙන සුදු මුහුණුවලින් හිනා වෙවී ඉන්නවා. අපි දැක්කා, මේ වෙනකොටම mediaවලට මුදා හැර තිබෙනවා සිනාමුසු මුහුණින් ඉන්න එතුමන්ලාගේ ඡායාරූප. මේ සමාජයක්, රටක් කළු කරපු, කළු සමාජ පසුතලයක් නිර්මාණය කරපු, ඒ වෙනුවෙන් දේශපාලන ජවනිකා නිර්මාණය කර ගත්ත ඒ ඉතිහාසයට විරාමය තබන්න තමයි අද අපි මේ විවාදය අරගෙන ඇවිල්ලා තිබෙන්නේ.

ඉතිහාසයේ අපේ රට කොතැනද තිබුණේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දිනෙක මම මිතුරන් කිහිපදෙනෙක් සමඟ ගියා, නෙළුව ආසන්නයේ තිබෙන "ලංකාගම" කියන ඒ සුන්දර බිම්කඩට. එතැන මෙසයක් තියාගෙන යම් සටහනක් ලියමින් හිටපු පුද්ගලයෙක් අපේ නෙත ගැටුණා. අපි ඇහුවා, මොකද ඔබතුමා කරන්නේ කියලා. අපි එතකොට තමයි දැන ගත්තේ, එතුමා සිංහල කථා කරන්න බැරි ඉන්දියානු මහාචාර්යවරයෙක් බව. දැනට මාස දෙක තුනකට කලින් අපි එතැනට ගියේ. අපි ඇහුවා, ඔබතුමා මොකද කරන්නේ කියලා. ඔහු කිව්වා, "මම රටවල් 48ක ඇවිදලා 49වන අවස්ථාවට තමයි ඔබතුමන්ලාගේ රටට -ශ්‍රී ලංකාවට- ආවේ" කියලා. "මහාචාර්යතුමනි, ලෝකයේ රටවල් 48ක ඇවිදලා 49 වැනි රට ලෙස ඔබ ශ්‍රී ලංකාව තෝරාගෙන තිබෙනවා. ඔබ කොහොමද මේ රට දකින්නේ?" කියලා අපි ඇහුවා. ඒ මහාචාර්යවරයා කියනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මම ඕස්ට්‍රේලියාවට ගියා. හරි ලස්සනයි. හැබැයි එක ලැව් ගින්නකින් අක්කර දහස් ගණනක් අළු දූවිලි බවට පත් වෙනවා. මම යුරෝපයේ ගොඩක් ලස්සන රටවලට ගියා. හැබැයි, හිමෙන් වැහිච්ච තැන්, හිමෙන් ගල් වෙච්ච තැන් තිබෙනවා. ඔබතුමන්ලාගේ රටේ මම එහෙම කිසිම තැනක් දැක්කේ නැහැ. ජපානය ගොඩක් දියුණුයි. කාර්මික නිෂ්පාදනය ඉහළයි. හැබැයි ජපානයට භූමිකම්පා එනවා. ඒක නිසා ඒගොල්ලන්ට ගොඩනැඟිලි හදාගන්න වෙලා තිබෙන්නේ springs දමලා" කියලා. "මම මාලදිවයිනට ගියා, ඒක එක ගංගාවක් නැති රටක්. හැබැයි ඔබතුමන්ලාගේ මධ්‍යම කඳුකරයේ ඉඳලා මුළු රටම තෙත් කරන ගංගා 103ක් රට සශ්‍රීක කරගෙන රට පුරා ගලා බහිනවා" කියාත් ඔහු කිව්වා. තවත් රටවල් ගණනාවක් ඔහු උදාහරණයට ගත්තා. මම ලෝකයේ ගොඩක් රටවලට ගියා කියලා ඔහු අවසාන වශයෙන් කිව්වා, "මම එංගලන්තයට ගියා. ප්‍රංශයට ගියා. නමුත් ඔබතුමන්ලාගේ රට ඇතුළේ, නුවරඑළියේ, එංගලන්තයත් තිබුණා, ප්‍රංශයත් තිබුණා" කියලා. අපේ රට ඒ වාගේ දේශගුණික කලාප ගොඩක් තිබෙන රටක්. නමුත් අවුරුදු 76කට පස්සේ මේ රට, මේ වටිනා රාජ්‍යය අද කොහේද තිබෙන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද ඇයි මේ යෝජනාව අරගෙන ආවේ? ඊයේ අපි කථා කළ ඒ ගරු සභාපතිතුමාගේ මරණය ගැන අපි කනගාටු වෙනවා. ඒක සදාචාර සමාජයක් තුළ, යුක්තිගරුක සමාජයක් තුළ විය යුතු නැති දෙයක්. හැබැයි අපි කියනවා, "අවි ගත්තෝ අවියෙන්ම නසිති. මත් ජාවාරම්කරුවන්ගේ අවසානය සිපිරිගෙයයි. එසේ නැත්නම් අභිමිරි මරණයයි" කියලා. නමුත් එසේ කෙළවර විය යුතු නැහැ. සමාජය එතැනට අරගෙන ආපු, ඒ සමාජය නිර්මාණය කිරීම වෙනුවෙන් තමන්ගේ සියලු දේශපාලන ක්‍රියාකාරකම් මෙහෙයවපු ඒ දේශපාලකයන්, ඒ දේශපාලන පක්ෂ තමයි අද විපක්ෂය තුළ කටයුතු කරමින් ඉන්නේ. අපේ රටේ දේශපාලන ඉතිහාසය ඇතුළේ මේ ආසන්න කාලයේ සිදුවූ සිද්ධි ගණනාවක් තුළින් අපි මේ කළු රාජ්‍යය ඇතුළේ බිහිසුණු අත්දැකීම් දැක්කා.

මේ සමාජ දේශපාලන ආර්ථිකය විසින් නිර්මාණය කරලා මේ වෙනකොට සිරගතවුණු, මරණයට පත් වුණු විශාල පිරිසක් අපි දකිනවා. තමන්ගේ පැවැත්ම වෙනුවෙන්, තමන්ගේ දේශපාලන අරමුණු වෙනුවෙන්, තමන්ගේ බලය වෙනුවෙන් ධනය, බලය පාවිච්චි කරලා මැර බල කණ්ඩායම් නිර්මාණය කරපු මිනිස්සු ඉන්නවා. අපි මුළු මහත් ලාංකීය සමාජයට කියනවා, මින් මත්තට එවැනි මිනිසුන්ට, එවැනි කළු සමාජවලට, එවැනි පාතාලයන්ට මේ රටේ නැවත ඉඩක් නැහැ කියලා. එහෙම පවතින්න නොවෙයි, අපි මේ ඓතිහාසික සමාජ පරිවර්තනය මේ රට ඇතුළේ නිර්මාණය කළේ. මේ රටේ දේශපාලකයන් පාවිච්චි කරපු ඒ ගෝනවල සුනිල්ලාගේ ඉඳලා නූතන පරම්පරාව දක්වා පුරුක් බෙහෝ ප්‍රමාණයක් තිබෙනවා. "මීගස්ආරේ කජ්ජා" වෙන්න පුළුවන්, "ජූලම්පිටියේ අමරේ" වෙන්න පුළුවන්, සම්පත් මනම්පේරි වෙන්න පුළුවන්, ඉන්දුනීසියාවේ ඉඳලා අත්අඩංගුවට අරගෙන ආපු ඒ පාතාල සාමාජිකයන් වෙන්න පුළුවන්, නේපාලයේදී අත්අඩංගුවට ගත්ත සෙව්වන්දි වෙන්න පුළුවන්, ඒගොල්ලන් කවුරුවත් අද සතුටින් නැහැ. හැබැයි, අද කළු

[ගරු සංජීව රණසිංහ මහතා]

ඇඳගෙන, එය සංකේතයක් බවට පත් කරගෙන මේ ජනතාවාදී ආණ්ඩුව අපකීර්තියට ලක් කරන්න කෘත්‍රිමව නිර්මාණය කරපු ඒ විරෝධය තමයි අද අපි මේ පාර්ලිමේන්තුව ඇතුළේ දකින්නේ. මේගොල්ලන්ගේ හදවතේ නැති, ආධ්‍යාත්මයේ නැති ඒ වේදනාව අද කළු ඇඳුමකින් සැරසිලා මෙතැන හුවා දක්වන්න හදන නිසා අපි කියනවා, ඒ කළු සමාජය, ඒ කළු සංස්කෘතිය අපි අවසන් කරන්න තමයි, මකලා දමන්න තමයි සභාව කල්තබන අවස්ථාවේ මේ විවාදය අරගෙන ආවේ කියලා. ඒ අරමුණ වෙනුවෙන් මේ මුළු මහත් සමාජයම පෙළ ගැහෙන්න. ඒ අපරාධකරුවන්ට, පාතාල සාමාජිකයන්ට තවදුරටත් මේ රටේ ඉඩක් නැහැ විතරක් නොවෙයි, එහි ගොදුරක් බවට පත් වෙන්නත් එපා, ජීවිතය අමිහිරි ලෙස කෙළවර කරගන්නත් එපා කියන ඒ ආදරණීය, ගෞරවනීය ඉල්ලීම මුළු මහත් ලාංකීය සමාජයෙන්ම අපි ඉල්ලා සිටිනවා.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ எம்.ஏ.எம். தாஹிர் அவர்கள்! உங்களுக்கு 6 நிமிடங்கள் உண்டு.

[பி.ப. 3.30]

ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, போதைப்பொருள் செயற்பாடுகளைக் கட்டுப்படுத்தல் சம்பந்தமான இன்றைய ஒத்திவைப்புப் பிரேரணையானது உண்மையிலேயே வரவேற்கத்தக்கது. அச்செயற்பாடுகள் இந்த நாட்டிலே கட்டுப்பாட்டுக்குள் கொண்டுவரப்படவேண்டிய அல்லது கட்டுப்படுத்தப்படவேண்டிய விடயங்களாக இருக்கின்றன. போதைப்பொருள் மற்றும் திட்டமிடப்பட்ட அல்லது ஒழுங்கமைக்கப்பட்ட குற்றச்செயல்களைக் கட்டுப் படுத்துகின்ற விடயங்களிலே இந்த அரசாங்கம் கரிசனை காட்டி வருகின்றது.

இந்த நாட்டினுடைய அரசியல் வரலாற்றிலே 2009ஆம் ஆண்டுக்குப் பின்னரான காலப்பகுதியானது, வலுக்கட்டாயமாக இனவாதத்தைத் தோற்றுவித்த ஓர் அரசியல் பார்வையைக் கொண்டுள்ளது. 2009ஆம் ஆண்டில் யுத்தம் முடிவடைந்த பிறகு, இந்த நாட்டிலே இனவாதத்தைத் தோற்றுவிக்க வேண்டும் அல்லது சிறுபான்மைச் சமூகத்தைக் கட்டுப்படுத்த வேண்டும்; அவர்களை அடக்கியாள வேண்டும் என்கின்ற ஒரு நிலையில் அந்தக் காலகட்டத்தில் இருந்த அரசாங்கங்கள் திட்டமிடப்பட்ட குற்றச் செயல்களைக் கையிலே எடுத்துச் செயற்பட்டன. அவ்வாறு எடுத்துக் கொள்ளப்பட்ட விடயங்களிலே, "கிரீஸ் பூதம்" முக்கியமானது. இராணுவத்தின் புலனாய்வுப் பிரிவினர் அல்லது இராணுவத்தோடு தொடர்புபட்டவர்களை வைத்து நாடு பூராவும் குறிப்பாக வட, கிழக்குப் பிரதேசங்களிலே அது மேற்கொள்ளப்பட்டது. சிறுபான்மைச் சமூகத்திடம் ஆயுதக் கலாசாரம் இருக்கின்றதா என்றொரு தேடுதலை மேற்கொள்கின்ற அடிப்படையில் அது செய்யப்பட்டதாக அந்த நேரம் பரவலாகப் பேசப்பட்டது. அந்தக் கிரீஸ் பூதத்தைப் பின்தொடர்ந்தபோது, இறுதியாக அப்பூதம் ஓடிச் சென்று இராணுவ முகாம்களிலே தஞ்சமடைந்த செயற்பாடுகளையும் நாம் பார்த்தோம். அவ்வாறான ஒரு சம்பவம் நிந்தவூரிலே இடம்பெற்றபோது, நாங்கள் அவர்களைக் கையும் களவுமாகப் பிடித்திருந்தபோதும், STF வந்து அவர்களைப் பாதுகாத்துக் கொண்டுபோன சம்பவத்தை 2011ஆம் ஆண்டு காலப்பகுதியிலே நாங்கள் நேரடியாகக் கண்ணுற்றோம்.

அதற்குப் பிறகு, அளுத்கம கலவரம் ஏற்பட்டது. அதுவும் திட்டமிடப்பட்ட படுகொலைச் செயற்பாடாக இருந்ததை நாங்கள் பார்த்தோம். அதன்பிறகு, திகன கலவரம் நடைபெற்றது. அதுவும் அவ்வாறான திட்டமிடப்பட்ட ஒரு செயற்பாடாகவே இருந்தது. அதுமாத்திரமல்ல, 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலின்போது குறிப்பாக, கிறிஸ்தவ சமூகத்தைச் சார்ந்த மக்கள் அநியாயமான முறையிலே கொல்லப்பட்டும், காயப்படுத்தப்பட்டுமிருந்த பின்னணியிலே, முஸ்லிம் சமூகம் இழிவான பார்வைக்கு உள்ளானார்கள். உலக அரங்கிலே முஸ்லிம்கள் 'பயங்கரவாதிகள்' என்றும், இலங்கையிலும் அவ்வாறான செயற்பாடுகளிலே குழுக்களாக இயங்கு கின்றார்கள் என்றும் அவர்களைக் கேவலப்படுத்திய விடயம் இன்றும் கறைபடிந்திருக்கின்ற ஒன்றாகவே காணப்படு கின்றது. எனவே, அந்தக் கறையை நீக்க வேண்டும் என்பதற்காக நீங்கள் இந்த நாட்டிலே அதிகாரத்தைக் கேட்டபோது, முஸ்லிம்கள் தீவிரமாக உங்களுக்கான வாக்குகளை வழங்கினார்கள். 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலி னுடைய சூத்திரதாரிகளை நீங்கள் கண்டுபிடித்து வெளிப்படுத்துவீர்கள் என்ற ஒரு நம்பிக்கையின் அடிப்படையிலேதான் ஒட்டுமொத்த முஸ்லிம் சமூகமும் மிகக் கூடுதலான வாக்குகளை உங்களுக்கு வழங்கியது.

இந்த அநியாய சம்பவம் இந்த நாட்டில் இருக்கின்ற கிறிஸ்தவ, முஸ்லிம் சமூகங்களுக்கிடையில் ஓர் இழுபறி நிலையை ஏற்படுத்தியிருக்கின்றது. இதற்கான தீர்வை இந்த அரசு வழங்க வேண்டும். இதன் பின்னணியில் யார் இருக்கின்றார்கள் என்று நிச்சயமாக உங்களுக்குத் தெரியும். அவ்வாறான செயற்பாடுகளுடன் சம்பந்தப்பட்டவர்கள் உங்களுடைய அரசாங்கத்திலும் பொறுப்பு வாய்ந்த பதவிகளை வகிக்கின்றார்கள் என்றும் தெரியும். எமது பிரதேசங்களிலும் வீடு வீடாகச் சென்று சமையலறையில் வைக்கப்பட்டிருந்த கத்திகள் உட்பட சமையலுக்குப் பயன்படுத்துகின்ற உபகரணங்களை இராணுவத்தினர் கைப்பற்றிச் சென்ற சம்பவம் பதிவாகியிருக்கின்றது. அவ்வாறான தாக்குதல் செயற்பாடு சாதாரண மனிதர்களால் நடாத்தப்படவில்லை யென்று தெரிந்தும்கூட, அன்று வீடுகளுக்குச் சென்று அங்கிருந்த மக்களை மிகக் கஷ்டப்படுத்தினார்கள். குறிப்பாக, நிந்தவூர் பிரதேச சபையினுடைய கட்டிடம் ஒன்றை ஆக்கிரமிப்புச் செய்து, சுமார் ஆறு வருடங்களின் பின்னர் அண்மையில்தான் அது கையளிக்கப்பட்டது. இவ்வாறான சூழலிலே, அவை திட்டமிடப்பட்ட செயற்பாடுகள் என்று தெரிந்தும்கூட, 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலின் சூத்திரதாரிகள் தொடர்பான விபரங்களை வெளியிடாமல் இருப்பதற்கான காரணம் என்னவெனத் தெரிய வேண்டும்.

போதைப்பொருள் விடயமும் இராணுவத்தினருடைய பின்னணியில்தான் செய்யப்பட்டிருக்கின்றது. குறிப்பாக, வடக்கு மற்றும் கிழக்கிலே போதைப்பொருள் பாவனை மிகவேகமாகப் பரவியதற்கு உதவியதற்கான காரணம், அங்குள்ள கல்வி வளர்ச்சியை முடக்குவதற்காகத்தான். அங்குள்ள முஸ்லிம், தமிழ் மக்கள் கல்வியில் உயர்ந்து, பெரும் பதவிகளை வகித்துவிடக் கூடாது என்பதற்காக இராணுவத்தினர் மூலம் போதைப்பொருள் வியாபாரம் எங்களுடைய பிரதேசத்தில் மிகப்பிரபல்யமாக நடைபெற்றது என்பதற்கு மிகக்கூடுதலான ஆதாரங்கள் இருக்கின்றன.

எமது ஊர்களில் நாங்கள் பல பதவிகளை வகித்திருந்த காலங்களில் போதைப்பொருள் பாவனை தொடர்பாக ஆராய்ந்து பார்த்திருக்கின்றோம். அந்த வகையில், ஓர் இராணுவ முகாமோடு அல்லது கடற்படைத் தளத்தோடு அல்லது அந்தப் பிரதேசத்தில் இருக்கின்ற ஒரு பொலிஸ் அதிகாரியோடு தொடர்புபட்டதாகவே போதைப்பொருள் வியாபாரங்கள் நாட்டிலே நடந்தேறியதை எங்களால் அவதானிக்க முடிந்தது. அதற்குப் பல சான்றுகள் தெட்டத் தெளிவாக உள்ளன. போதைப்பொருள் வியாபாரம் சம்பந்தமாக கைது செய்யப்படுகின்றவர்கள், இராணுவத்தில் இருந்து தப்பி ஓடியவர்கள் என்று வரலாறுகள் கூறுகின்றன. எனவே, போதைப்பொருள் வியாபாரத்துடன் சம்பந்தப் பட்டவர்களைக் கைது செய்ய வேண்டும். அவர்களுக்குக் கூடுதலான தண்டனைகளை வழங்க வேண்டும். குறிப்பாக, வட, கிழக்கில் இருக்கின்ற முஸ்லிம் சமூகத்தையும் தமிழ் சமூகத்தையும் பாதிப்படையச் செய்ய வேண்டும் என்ற நோக்கத்திலேதான் போதைப்பொருள் அங்கு பரவலாகப் பரப்பப்பட்டது. அங்கேயிருக்கின்ற மக்களுடைய கல்வியை அழிப்பதற்கு வித்திடும் ஒரு செயற்பாடாகவே நாங்கள் இதனைப் பார்க்கின்றோம். எனவே, இந்த அரசினுடைய நடவடிக்கைகளுக்கு முழுமையான ஆதரவை நாங்கள் எச்சந்தர்ப்பத்திலும் வழங்குவோம் என்று கூறி விடை பெறுகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හසාරා ලියනගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.38]

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே)
(The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂ මත්ද්‍රව්‍ය මුලිනුපුටා දැමීම සඳහා වන "රටම එකට" ජාතික වැඩසටහන සඳහා සියලුදෙනාගේම සහයෝගය අපේක්ෂා කරමින්, ආණ්ඩු පක්ෂය විසින් අද දවසේ ගෙනා සභාව කල්තැබීමේ යෝජනාව සම්බන්ධව අදහස් දැක්වීමේදී, රටම එකට ගන්න හදන මේ වැඩසටහන පිළිබඳව ජනතාව දැනුවත් කරන්නට මෙය අවස්ථාවක් කර ගන්න මා සිතුවා. මොකද, මේ සමහර මාතෘකා ගැන කථා කරනකොට සමහරුන්ට මොනවාද කැවිලා වාගේ කියලා අද උදෑසන සිටම අපි දැක්කා. ඒ මාතෘකා ගැන කථා කරන එකත් ඒ අයට allergic වාගේ දැනුණා. මට හිතුණා, විපක්ෂයේ ඒ තැනට අපි ලඝු වෙන්නේ නැතුව, ඒ අවධානය වෙනතකට යොමු කරන්නේ නැතුව, මේ ජාතික වැඩ පිළිවෙළ සම්බන්ධව ජනතාව දැනුවත් කරන්නට මෙය අවස්ථාවක් කර ගන්න. මොකද, විපක්ෂයේ භූමිකාව තමයි ඔය කරන්නේ. තැන් තැන්වලට වෙලා කෑ ගහන එක, සන්දර්ශනයක් කරන එක, mikes ටිකක් වට කර ගන්න එක ඒ අයගේ භූමිකාව. හොඳටම හොඳයි, ඕක ඔහොමම කරගෙන ඉන්න. ඒ අතරේ අපි රටම එකතු කරගෙන තවත් වැඩකට අත ගහන්නටයි මේ සූදානමින් සිටින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, ජාතික ජන බලවේගය විධියට අපට මේ රටේ තිබුණු ප්‍රධාන අභියෝගය වුණේ, මුලින්ම රටේ ආර්ථික ස්ථාවරභාවය අත්පත් කර ගැනීම බව. අපි විශ්වාස කරනවා, ඒ අභියෝගය අපි සාර්ථකව ජයග්‍රහණය කර තිබෙනවා කියලා. ඒ වාගේම දෙවනුව අපට තවත් අභියෝගයක් තිබෙනවා. ඒ තමයි, සමාජයීය වශයෙන් අපේ රට පත්ව තිබෙන උවදුරෙන් බේරාගැනීම. මේ රට විෂ මත්ද්‍රව්‍යවලින් වාගේම, සමූහ අපරාධ සම්බන්ධව තිබෙන මේ උවදුරින් බේරාගෙන නැවත ගොඩනැඟීමේ සමාජයීය මෙහෙවරත් අප සතුව තිබෙනවා. අපි දන්නවා, මේ උවදුර නිසාම අද වන විට මේ සමාජයේ තිබෙන සියලු වටිනාකම්, ඒ වාගේම හර පද්ධතීන්, බැඳියාවන්, ළෙන්ගතුකම්, සහකම්පනය වාගේ මානුෂීය ගුණාංග සම්පූර්ණයෙන්ම අපෙන් යටපත් වෙලා තිබෙන බව. ඒ නිසා අපි විශ්වාස කරනවා, රටක් ආර්ථිකව කොතරම් ගොඩනැඟුණත්, සමාජයීය වශයෙන් ඒ රට බිඳ වැටිලා තිබෙනවා නම්, ඒ අත්පත් කර ගන්නා ආර්ථිකයෙන් පලක් නැහැ කියලා.

සමාජය භීතියකින් ඇළලී තිබෙන මේ මත්ද්‍රව්‍ය ව්‍යසනය සම්බන්ධව වත්මන් රජය බලයට පත්වීමෙන් අනතුරුව අනුගමනය කරපු දැඩි ක්‍රියාමාර්ග නිසා ඉතිහාසයේ වැඩිම විෂ මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් අත්අඩංගුවට ගැනීමට අපට හැකියාව ලැබිලා තිබෙනවා. ඒ අත්අඩංගුවට ගැනීම් සහ වැටලීම්වලින් මේ වන විට නඩු පවරා ඇති සංඛ්‍යාව ගත්තොත්, 187,872ක් වනවා. අපි විශ්වාස කරනවා, මත්ද්‍රව්‍ය වේවා, මේ ජාවාරම් වේවා මේ සියල්ල මුලිනුපුටා දැමීම සඳහා හුදෙක් දේශපාලන නායකත්වය වාගේම රාජ්‍ය තාන්ත්‍රික සහභාගිත්වය වාගේම මහජන සහභාගිත්වය කියන විශේෂ අංගයත් මේ සඳහා අපි එකතු කර ගත යුතු බව. ඒ නිසා කඩිනම් හා ජාතික වැඩ පිළිවෙළක් විධියට "රටම එකට" කියන ජාතික වැඩ පිළිවෙළ සඳහා සියලුදෙනා එකතු කර ගනිමින්, විෂ මත්ද්‍රව්‍ය මුලිනුපුටා දැමීමේ ඓතිහාසික ආණ්ඩුව බවට ජාතික ජන බලවේගයේ ආණ්ඩුව පත් කරන්න තමයි අපි මේ සියලුදෙනා එකතු කරගෙන අලුත් ගමනක් යන්න සූදානම් වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දේශපාලන නායකත්වයත් සමඟ, රාජ්‍ය අංශයේ අනුග්‍රහයත් සමඟ, මහජනතාවගේ පුළුල් සහභාගිත්වය සමඟ, මේ යන්ත්‍රණය බිඳ වැටීටවීමේදී අපි හඳුනා ගත යුතු අවස්ථා දෙකක් තිබෙනවා. ඒ තමයි, supply එක සහ demand එක අඩු කිරීම. Supply එක අඩු කරන්න, ඒ කියන්නේ මේ දැවැන්ත ජාලය බිඳ වැටීටවීම සඳහා මා කලින් ප්‍රකාශ කළා වාගේම දැවැන්ත වැටලීම් ප්‍රමාණයක් අපි දැන් සිද්ධ කරමින් යනවා. ඒ වාගේම demand එක අඩු කර ගැනීමත් මෙහිදී අප කළ යුතු වනවා. ඒ කියන්නේ, ඒවා ලබා ගැනීමට තිබෙන අවශ්‍යතාව අඩු කර ගත යුතු වනවා. කාන්තාවක් වශයෙන් මමත් කියන්න ඕනෑ, අපේ දරු පරම්පරාව මේවායෙන් ආරක්ෂා කර ගැනීමේදී මේ සම්බන්ධව psychological aspect එකක් තිබෙන බව. මේ ප්‍රශ්නය දේශපාලනික ප්‍රශ්නයක් කියලා අපි හිතුවාට ඒක එහෙම නැහැ. මේක අපේ දරුවන් සම්බන්ධව තිබෙන ප්‍රශ්නයක්. අපේ දරුවන් කාමරයක් ඇතුළේ තියාගෙන, එහෙම නැත්නම් බිත්ති හතරක් ඇතුළේ තියාගෙන මේ උවදුරින් ඔවුන් ආරක්ෂා කර ගන්න පුළුවන් කියලා අපි හිතනවා නම්, ඒක එහෙම නැහැ.

මා නියෝජනය කරන්නේ ගාල්ල දිස්ත්‍රික්කය. දකුණු පළාත ගත්තාම, අද උදේ ඉඳන්ම අපි මේ මත්ද්‍රව්‍ය උවදුර පිළිබඳව කථා කළා. ඒ සම්බන්ධව ගාල්ල දිස්ත්‍රික් ළමා කමිටුව සහ මත්ද්‍රව්‍ය නිවාරණ අනුකමිටුව මඟින් නිකුත් කරපු වාර්තාවක් තිබෙනවා. ඒක දකුණු පළාතේ තිබෙන සියලුම පාසල්වල සිටින දරුවන් අතර වූ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ වාර්තාවක්. ඒ වාර්තාව අනුව වයස අවුරුදු 14-16 අතර දරුවන් මත්ද්‍රව්‍ය භාවිත කළ හැකි risk group එකක් විධියට හඳුනා ගෙන තිබෙනවා. ඒ දරුවන්ගේ වයස තුළ සිදු වන හෝර්මෝන ක්‍රියාකාරිත්වයත් එක්ක මේ සම්බන්ධව ඔවුන්ට නිරායාසයෙන්ම කුතූහලයක් ඇති වනවා. අන්න ඒ කුතූහලය නිසාම සමහර වෙලාවට ඒ දරුවන් මත්ද්‍රව්‍යවල ගොදුරක් බවට පත්වීම නිතැතින්ම සිදු වනවා. ඒ නිසා මම මහජනතාවට ආරාධනා කරනවා, ඔබට පෞද්ගලිකව කුමන දේශපාලන මතයක් දරන්නට අයිතියක් තිබුණත්, "රටම එකට" කියන ඔබේ දරුවාගේ අනාගතය සම්බන්ධ කාරණාවට මැදිහත් වන්න කියලා. මොකද, ඔබේ දරුවා මේ උවදුරේ ගොදුරක් වන විට ඔබේ පක්ෂ, පාට භේද ඊට අදාළ වන්නේ නැහැ.

[ගරු නීතිඥ හසාරා ලියනගේ මහතා]

අපි මහජන දින කරනකොට අපි ළඟට ඇවිල්ලා අඩන කාන්තාවෝ ඉන්නවා. තමන්ගේ දරුවා මේවායේ ගොදුරක් බවට පත් වෙලා ඉන්නවා කියන අම්මලා ඉන්නවා. ලයිට් කණු අසල පොළොව හාරමින්, කානු අවුස්සමින් තරුණ පරම්පරාව මේවා හොයනවා කියලා වැඩිහිටියෝ ඇවිත් අපට කියනවා. ඒ වාගේම තමන්ගේ දරුවා රෑට නිදාගෙන ඉන්නකොට අම්මාට ඇහෙනවා, ගේ ළඟින් ත්‍රිරෝද රථයක් ඇවිල්ලා නතර කරනවා, දරුවා කාමරයේ දොර ඇරලා එළියට යනවා, අම්මාට සැකයක් එනවා මොනවා හරි වෙනවා කියලා. හැබැයි අම්මාටත් හරියටම තේරෙන්නේ නැහැ, මොකක්ද වෙන්නේ කියලා. ඔබ මේ උවදුරේ ගොදුරක් බවට පත් වන්නට හෝ ආන්තීකරණයකට ලක් වන්න හෝ දුගීභාවයට පත් වන්න අවශ්‍යතාවක් නැහැ. හැබැයි, අපේ දරුවන් ඉදිරි කාලයේදී මේ මත්ද්‍රව්‍ය උවදුරේ ගොදුරක් බවට පත් වන්නට අනිවාර්යයෙන්ම ඉඩ කඩක් තිබෙනවා. ඒ නිසා මම ආරාධනා කරනවා, අපේ රටේ ඉන්න මහජනතාවට, ඒ වාගේම සියලුම දේශපාලන අධිකාරින්ට මේ උවදුර මැඩලන්නට අපිත් එක්ක එකතු වන්න කියලා. අද උදේ ඉඳන්ම දේශපාලන සංස්කෘතිය ගැන කථා කළා. ඔබ ඒ වාගේ යහපත් දේශපාලන සංස්කෘතියක් ගැන කථා කරනවා නම්, මහජන නියෝජිතයන් විධියට - මහජනතාව නියෝජනය කිරීමේ අපේක්ෂාවෙන් නාම යෝජනා භාර දෙනකොටත් - ඒ කියන දේශපාලන සංස්කෘතිය ගැන ඉගෙන ගෙන ආවා නම් මම හිතනවා, මේ කථා කරන ගොඩක් දේවල්වලට උත්තරය ඒ තුළ තිබෙනවා කියලා.

ඒ වාගේම අපි මේ සඳහා ආරාධනා කරනවා, ආගමික නායකයන්ටත්. දේශපාලන අධිකාරිය නායකත්වය දෙනකොට, නීතිය ක්‍රියාත්මක වනකොට, අණ දෙනකොට, ඔබවහන්සේලා අපේ රටේ ජනතාවට බණ කියන්න, මේවායෙන් ඈත්වීමේ තිබෙන වැදගත්කම ගැන. ඒ වාගේම අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉන්න අපේ විදුහල්පතිවරුන්ටත්, ගුරුවරුන්ටත් අපි මේ සඳහා ආරාධනා කරනවා. විශේෂයෙන්ම තරුණ පරම්පරාවටත් අපි මේ සඳහා ආරාධනා කරනවා. ඔබේ රැහේ එකෙක් පිට යන්නට හදනකොට ඔහුගේ කශේරුකාව හදන්න. නැහැ, මට ඕක එපා කියන තැනට ඒ අයගේ පෞරුෂත්වය ගොඩ නඟන්නට අපේ තරුණ පරම්පරාවටත් ලොකු දායකත්වයක් දිය හැකිව තිබෙනවා.

මේ ජාතික වැඩ පිළිවෙළට සමගාමීව තවත් බොහෝ වැඩසටහන් අප ක්‍රියාත්මක කරමින් තිබෙනවා. විශේෂයෙන් පුනරුත්ථාපන කඳවුරු නැවත ප්‍රතිසංවිධානය කරමින් සෑම දිස්ත්‍රික්කයකම පුනරුත්ථාපන කඳවුරක් පිහිටුවීම, නීති අණ පනත් සම්මත කර ගැනීම ඒ අතරින් ප්‍රමුඛ වනවා. විශේෂයෙන්ම අපරාධයකින් උත්පාදිත දේපළ නැවත පවරා ගැනීම යටතේ ඔබ දන්නවා, පසුගිය දා අත්අඩංගුවට පත් වෙච්ච "කෙහෙල්බද්දර පද්මේ"ගේ රුපියල් කෝටි 5කට වැඩි අනීතික දේපළ රජයට පවරා ගැනීම කරන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ළමුන් 17,000කට වැඩි පිරිසක් risk category එකේ ඉන්න බව මම කලින් කිව්වා. එම දරුවන් හඳුනා ගනිමින්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ඔවුන්ව මෙහෙයවීමේ වැඩ පිළිවෙළක් අපි දැන් සූදානම් කර තිබෙනවා. ඒ වාගේම තමයි Clean Sri Lanka 2025 අරමුදලෙන් රුපියල් මිලියන 100ක් වාගේම ඉදිරි අය වැයෙන් තවත් රුපියල් මිලියන 1,000ක ප්‍රතිපාදන වෙන් කරමින් අපි මේ කටයුත්ත රටම එකට අරගෙන කරන්න සූදානමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහ ජනතාවට දැන් විශ්වාසයක් ඇති වෙලා තිබෙනවා, ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ තවදුරටත් මේ දේවල් පතුරන අයට දේශපාලන රැකවරණයක් නැහැ කියලා. අපට ජනතාව දීලා තිබෙනවා, mandate එකක්. ඒ ජන වරම - mandate එක - ආරක්ෂා කර ගනිමින්, ඒ ජන වරමේ පදනම හොඳින් හඳුනා ගෙන, මේ ජාතික වගකීම ආරක්ෂා කරමින්, ඒකට දේශපාලන නායකත්වය ලබා දෙමින්, ඒ වාගේම සියලුදෙනා එකට එකතු කර ගනිමින්, ජාතික ජන බලවේගය විධියට මේ ආණ්ඩුව ජනතාවගේ විශ්වාසය තහවුරු කර ගනිමින් මේ රටෙන් විෂ මත්ද්‍රව්‍ය සහමුලින්ම නැති කිරීමේ වගකීම තවදුරටත් භාර ගන්නවා කියන පණිවුඩය ලබා දෙමින්, කාලය ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ගයාන් ජනක මහතා
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே)
(The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law)

විසින් ස්ථිර කරන ලදී
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. KITNAN SELVARAJ left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.

[අ.භා. 3.46]

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ දීර්ඝ ප්‍රජාතන්ත්‍රවාදී ඉතිහාසයකට උරුමකම් කියන අපේ රටේ උත්තරීතර සභාව - මේ පාර්ලිමේන්තුව - නියෝජනය කරන සියලු මහජන නියෝජිතයන් මෙතැනට එන්නේ මහජනතාව වෙනුවෙන්. අද අපි බොහොම කනගාටුවට පත් වන දවසක්. අද මම මේ උත්තරීතර සභාවට කළු ඇඳගෙන ආවේ මහජන ආරක්ෂක අමාත්‍යවරයාගේ ප්‍රකාශයට විශේෂ විරෝධයක් දැක්වීමේ අරමුණින්. ඒකට හේතුව මේකයි. වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඊයේ සාතනය වූ විගස පාර්ලිමේන්තුව අමතා එම අමාත්‍යවරයා ප්‍රකාශයක් කළා. නමුත් එතුමා ප්‍රකාශ කළේ නැහැ, "මහජන ආරක්ෂක ඇමතිවරයා වශයෙන් මට වගකීමක් තිබෙනවා. එම වගකීම මම ඉෂ්ට කරනවා. එය පිටුපස ඉන්න සාතකයින් හඹා යනවා. සාතකයින් හොයා ගන්නවා. ඔවුන්ට දඬුවම් කරනවා. මහජන

ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධව, එතුමා සභාපති පුටුවේ සිටියදී ඒ කරන ලද ප්‍රහාරය හෙළා දකිනවා. ඒක අපේ ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායට කරන ලද මරු පහරක්" කියලා. එලෙස එතුමා දකින්නේ නැහැ. එතුමා ඒ වෙනුවට පැවසුවේ මොකක්ද? සභාපතිවරයාට "ලසා" යනුවෙන් අන්වර්ථ නාමයකුත් දාලා, ඔහු ජනතාව අතර හිටපු පාතාලයේ පුද්ගලයෙක් හැටියට නම් කරන්න උත්සාහ කළා. ඒක තමයි ප්‍රශ්නය.

සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා මගේ මිත්‍රයෙක්. ඒ වාගේම එතුමා නීති පීඨයේ මගේ සමකාලීනයෙක්. එතුමා නීතිවේදියෙක්; නීතිඥයෙක්. එතුමා නියෝජ්‍ය ඇමති කරලා, ආනන්ද විජේපාල මහතා ඇමතිවරයා කරලා. එතුමා දන්නේ නැහැ, අපේ නීතියේ තිබෙන ප්‍රධාන සංකල්පයක් ගැන. ඒ තමයි, නිර්දෝෂීභාවය පිළිබඳ පූර්ව නිගමනය - presumption of innocence. දැන් කවුද නඩු ඇහුවේ? ඊයේ මෙතැන නඩුවක් ඇහුවා. ලාල් කාන්ත මහත්තයා මැතිවරණ කාලයේදී කිව්වේ, "ගමේ නඩු අහනවා" කියලා. ගමේ අයට ගමේ නඩු අහන්න දීලා අපි තීන්දු ගන්නවාය කිව්වා වාගේ එකක්ද මේ වෙන්නේ? වැලිගම නඩුව වැලිගමදී අහලා දඬුවම් කළාද? ඒකද මේ කළේ? එතකොට මේ රටේ මිනිසුන් කවුරු ගැන ද බලාපොරොත්තු තබා ගන්නේ? විශේෂයෙන් මහජන නියෝජිතයන් හැටියට අද අපට මොන ආරක්ෂාවක්ද තිබෙන්නේ? දැන් අපේත් පපුවට ඔහොම වෙඩිල්ලක් තියලා, දිලිත් ජයවීර නොහොත් "රොටියා" කියලා කියයි. "රොටියා"ට වෙඩි තිබ්බා කියයි. මෙය සරලව ගන්න පුළුවන් කාරණයක්ද? මම මේ සම්බන්ධයෙන් අතිශයින් කනගාටු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ නීතියේ ආධිපත්‍යය රැක ගැනීම සඳහා අපට විශාල වගකීමක් පැවරී තිබෙනවා. ඒ සිදුවීම් අපි මේ විධියට සරලව ගෙන එම වගකීම පැහැර හරිනවා නම්, අපි අධිකරණ පද්ධතිය අභියෝගයට ලක් කරනවා. පොලීසිය ඇතුළු මේ රටේ තිබෙන ආරක්ෂක අංශ අභියෝගයට ලක් කරනවා. ඒවා අභියෝගයට ලක් කරලා, මෙතැනට ඇවිල්ලා ප්‍රකාශයක් කරනවා. එය මොන තරම් පහත් - නිහීන - වැඩක්ද? ඒ පිළිබඳව අපේ කනගාටුව අපි ප්‍රකාශ කරනවා පමණක් නොව, මම සියලු මහජන නියෝජිතයින් වෙනුවෙන් ඉල්ලීමක් කරනවා. අද ප්‍රාදේශීය සභාවේ ඉඳලා පාර්ලිමේන්තුව දක්වා ඉන්න සියලු මහජන නියෝජිතයින් වෙනුවෙන් මම මේ කාරණය කියන්නේ. ඔවුන්ගේ ආරක්ෂාව වහාම තහවුරු කරන්න. අපට මහ ජනතාව අතරට යන්න විධියක් නැහැ, ආණ්ඩු පක්ෂයට මෙවැනි ආකල්පයක් නම් තිබෙන්නේ. අපි කොහොමද මහ ජනතාව අතරට යන්නේ? අසාධාරණ සමාජය අද මෙහි බිහි වෙමින් පවතින බව ජනතාවටත් දැනෙනවා නම් මම හිතන්නේ මේක තමයි වෙන්න පුළුවන් නරකම තත්ත්වය.

ඊළඟට, මම මේ කාරණයත් කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මට කථා කරන්නට අවශ්‍ය වුණා, මත්ද්‍රව්‍ය සහ මත් කුඩු ඇල්ලීම පිළිබඳව සහ මේ නටන නාඩගම පිළිබඳව. හැබැයි, ඒ ගැන කථා කරන්නට මට වෙලාවක් නැහැ. මොකද, අද ඊට වඩා බරපතළ තත්ත්ව මතු වී ඇති නිසා. හැබැයි, වාක්‍ය දෙකකින් මම එය කියන්නට ඕනෑ. අද මේ රටේ දුප්පත් ජනතාව අන්ත දරිද්‍රතාවෙන් පෙළෙනවා. උද්ධමනය නිසා ඔවුන්ගේ ක්‍රය ශක්තිය - භාණ්ඩයක් ලබා ගැනීමට තිබෙන හැකියාව - බරපතළ විධියට අඩු වෙලා. ඒකට මේ මත්ද්‍රව්‍ය නාඩගම නටන එක විසඳුම නොවෙයි. මම දිගින් දිගටම කිව්වා, හොරු ඇල්ලුවාය කියලා හොරු ඉවර වෙන්නේත් නැහැ, කුඩු ඇල්ලුවාය කියලා කුඩු ඉවර වෙන්නේත් නැහැ, මේ වාගේ දවල්ට මරාගෙන, මරාගෙන යන මිනිසුන් ඇල්ලුවාය කියලා පාතාලය ඉවර වෙන්නේත් නැහැ කියලා.

මහජන නියෝජිතයන් කට අරින, අරින වෙලාවට ඔවුන් බිය වැද්දුවාට අපිව බිය වද්දලා ඉවර කරන්නත් බැහැ. ඒ නිසා මේ ප්‍රශ්නයේ මූල බීජය හඳුනාගෙන අද සමාජ දේහයට වෙලා තිබෙන දේ හඳුනා ගන්නට ඕනෑ. මොකක්ද මේ සමාජ දේහයට වෙලා තිබෙන්නේ? දවස ගාණේ වෙඩිල්ලක් ඇහෙන්න, දවස ගාණේ කිලෝ ගණනින් කුඩු අහු වෙන්න මොකක්ද වෙලා තිබෙන්නේ? මේ සමාජ දේහය සම්පූර්ණයෙන්ම බිඳ වැටිලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකට හේතුව කනගාටුවෙන් වුණත් මම කියන්න ඕනෑ. ලෝකය ගත් විට අපේ කලාපයේ දුර්වල රාජ්‍යයන් නිර්මාණය කිරීම සඳහා භූ-දේශපාලනික වශයෙන් බටහිර කඳවුර කටයුතු කරලා තිබෙන ආකාරය අද වනකොට ඉතා පැහැදිලියි. මෙතුමන්ලා කිව්වාට 159දෙනාම කදිරගාමර්ලා කියලා, අපට පේනවා නේ, දැන් මේ සභාවේ ඉන්න කදිරගාමර්ලාගේ හැටි. මෙවැනි දුර්වල ආණ්ඩුවක් නිකම් නිර්මාණය වුණේ නැහැ, මේක නිර්මාණය කරපු ආණ්ඩුවක්. දීර්ඝ කාලයක් තිස්සේ භූ-දේශපාලනිකව ඔවුන් ගෙන ගිය උපාය මාර්ගික සැලැස්මක ප්‍රතිඵලයක් හැටියට තමයි මේක වෙලා තිබෙන්නේ. මෙන්න මේක හඳුනා ගන්න. මේක හඳුනාගෙන අපි ඔක්කෝම එකතු වෙන්නට ඕනෑ. අපේ ආදරණීය මව්බිම මේ විධියට පල්ලෙහාට ඇද දාලා අද වෙනත් බලවේග විසින් අපේ ධනය සූරා කනවා නම්, අපේ මිනිස්සු දරිද්‍රතාවට පත් කරලා, අන්ත දරිද්‍රතාවට පත් කරනවා නම්, ඔවුන් උපයන මුදල් පොලිය හෝ මොකක් හරි කියලා පිට රටට අරගෙන යනවා නම් අපි වෙනත් විකල්පයකට යා යුතුයි. ඒ සඳහා කාලය දැන් ඇවිල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අපේ විපක්ෂය ගැන යමක් කියන්නට ඕනෑ. අපි අහලා තිබෙන විධියට වාගේම දැකලා තිබෙන විධියට දුර්වල ආණ්ඩුවක් නිර්මාණය කරනකොට ඒගොල්ලන් දුර්වල විපක්ෂයක් නිර්මාණය කරනවා. ඒක කනගාටුවෙන් වුණත් මම කියන්නට ඕනෑ. දැන් මහජනතාව අතර මතයක් පවතිනවා, ආණ්ඩුවේ සමහරු විපක්ෂයේ සමහරුත් එක්ක රැට රැට ගනුදෙනු කරනවා කියලා. ඒ මතය වහාම වෙනස් වෙන්න ඕනෑ. මේක මම කියන්නේ අපේ විපක්ෂයට. ඒ මතය ඉතාම නරක මතයක්. දුර්වල ආණ්ඩුවත් එක්ක දුර්වල විපක්ෂයක් නිර්මාණය වෙලා කියලා සමාජයේ මතයක් ඇති වුණු ගමන් -ඇති වුණු ගමන් කිව්වාට ඇති වෙලා තිබෙනවා- මේ රටේ ජනතාව වෙනුවෙන් ඒ ගැන කටයුතු කරන්න අපට ලොකු වගකීමක් තිබෙනවා, එවැනි අවස්ථාවලදී කළ යුතු කාර්යභාරය පිළිබඳව මීට වැඩිය දැඩි තීරණ අරගෙන විපක්ෂයක් හැටියට නිර්භීතව, අභීතව නැඟී සිටින්නට. අපි ඔවුන්ගේ නියෝජිතයන්. ඔවුන් විපක්ෂයෙන් බලාපොරොත්තු වෙනවා, මීට වඩා අභීත කාර්යභාරයක්, මීට වඩා නිවැරදි ඉලක්ක සහගත කාර්යභාරයක්. මගේ ආදරණීය විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන්, අපේ මිත්‍රයින්ගෙන් මම ඉල්ලා සිටින්නට ඕනෑ, අපි නිකම් ඒකාබද්ධ විපක්ෂය කියලා විහිළුසහගත වැඩ කරන්නේ නැතුව සිටිමු කියලා. ඒවාත් මේ නටවන්නේ රූකඩ ආණ්ඩු වාගේම රූකඩ විපක්ෂ. නමුත්, ඒක කරන්න දෙන්න බැහැ. මේ රටට ආදරය කරන මගේ විපක්ෂ මිත්‍රයින්ට මම කියන්නේ අපි බොහොම පෞරුෂයක් ඇතුව නැඟී සිටින්න ඕනෑ කියන එකයි. අපි එකතු වෙනවා නම් එකතු වෙමු. එකතු වෙන්න පුළුවන්, ඕනෑ නම් එක ලකුණක් යටතේ. අපි වෙන වෙනම දේශපාලනය කරමු. හැබැයි, මේ ආණ්ඩුවෙන් දෙන ගුලි කන්නට අපේ විපක්ෂය සූදානම් නොවිය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වනවිට අවාසනාවන්ත තත්ත්වයක් උදා වෙලා තිබෙන බව මම කියන්නට ඕනෑ. අපේ මහජන නියෝජිතයෙකු මහජන නියෝජිතත්වය දරමින් නිල පුටුවේ වාඩි වෙලා සිටියදී ඝාතනය කරලා තිබෙනවා. එවැනි අවස්ථාවකදී අපි මීට වැඩිය දැඩි හඬක් ඒ වෙනුවෙන් නැඟිය යුතුයි. එහෙම නැත්නම් ඊළඟ වෙඩි උණ්ඩය පත්තු වෙන්නේ මේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ පපුව මත බව මතක තබා ගන්නටත් ඕනෑ කියමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අම්බිකා සාමිවෙල් මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.57]

ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මම සතුටු වෙනවා, විපක්ෂය ගැන අනාවැකියක් කියමින් නිහඬ වෙච්ච මන්ත්‍රීතුමාට පසුව මට කථා කරන්නට අවස්ථාව ලැබුණු එක ගැන. ඇත්තටම අද සියලුදෙනාම එකතු වෙලා මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ තුරන් කිරීමේ ජාතික වැඩ පිළිවෙළ ගැන කථා කරනවා.

මම අද උදේම දැක්කා, විපක්ෂයේ කිහිපදෙනෙකු කළුපාට ඇඳුම් ඇඳගෙන ඉන්නවා. වැරැදි දෙයක් කරනවා නම් විපක්ෂය විරුද්ධව නැඟී සිටියාට කමක් නැහැ. අපේ මව්බිම කියන්නේ ඉතා ලස්සන, අලංකාර රටක්. එවැනි උතුම් රටක් මත්ද්‍රව්‍ය කියන උවදුරෙන් පීඩාවට පත් වෙලා කළු වෙලා තිබෙන මොහොතක එයට එරෙහිව ආණ්ඩුවක් හැටියට අපි නැඟිටිනවා කියනකොට විපක්ෂයේ මන්ත්‍රීවරුන් කළු ඇඳගෙන මේ සභාවේ විරෝධතා පෙන්වනවා. මොනවාද, අනේ! මට කලින් කථා කළ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ කථාව නතර කරන වෙලාවේදී කිව්වා වාගේ මේක ඒගොල්ලන්ගේ අවසානය තමයි. ඇත්තටම හොඳම අනාවැකිය කියලා තමයි එතුමා කථාව නතර කළේ. ඒ වාගේම එතුමා කිව්වා, රජය කරන ඒ වැඩේ නාඩගමක් කියලා. මත්ද්‍රව්‍ය විනාශ කිරීම සඳහා කරන මේ දේ නාඩගමක් නොවෙයි. මත්ද්‍රව්‍ය කියන්නේ අපේ රටේ අනාගත පරපුර නාස්ති කරන ලොකු ව්‍යසනයක්. අද අපි මේ කථා කරන්නේ නිකම් විහිළුවට ගන්න පුළුවන් දෙයක් නොවෙයි. විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිව්වා, මේ මත්ද්‍රව්‍ය නිසා උතුරු, නැඟෙනහිර පළාත්වල අධ්‍යාපනය නැති වෙලා, තරුණ තරුණියන්ගේ ජීවිත විනාශ වෙලා කියලා. ඇත්තටම අනාගත තරුණ පරපුර නැති වන දෙයක් පිළිබඳවයි අද අපි කථා කරන්නේ. මත්ද්‍රව්‍ය උවදුර කියන්නේ නාඩගමක් කියලා ඔබතුමන්ලා කියනවා නම් ඒක ව්‍යාප්ත කරන්න ඔබතුමන්ලා මුලපුරනවාද කියලා සැකයකුත් අපට ඇති වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මම මගේ කථාවට එන්නම්. ඇත්තටම මේක කියන්නම ඕනෑ දෙයක්.

එමතු නාට්ටිල් ඉළම් සමූකත්තෛක් කුරිවෛත්තු මේර්කොළ්ළප්පටුකින්ර, අවර්කළින් එතිර්කාලත්තෛ පාතාළත්තුක්කුළ් ඉට්ටුච්චෙල්කින්ර ඔරු චෙයලාකවේ නාන් ඉන්තප් පෝතෛප්පොරුළ් පාවනෛය෈ප් පාර්ක්කින්රේන්. ඔරු දේසත්තින් මුන්නේර්රමානතු, අත්දේසත්තිලුළ්ළ මක්කළින් ආරෝක්කියත්තිලුම් මන අමෛතියිලුම්තාන් තංකියිරුක්කින්රතු. ඉලංක෈යිල් පෙරුකිවරුම් පෝතෛප් පොරුළ් පාවනෛයානතු තනි මනිතන්, කුටුම්පම්, සමූකම් එන අනෛවර෈යුම් පාතික්කින්ර, අච්චුරුත්තුකින්ර ඔන්රාකක් කාණප්පටුකින්රතු. ඉතර්කු විලෛ කොටුප්පවර්කළාක මාරියිරුප්පවර්කළ් පෙණ්කළුම් ඉළ෈ඥර්කළුමේ ආකුම්. පෝතෛප්පොරුළ෈ප් පාවිප්පතන්මූලම් උටලිල් තර්කාලිකමාක සක්ති අතිකරිප්පතුපෝල් තෝන්රිනාලුම්, අතු නාළටෛවිල් නරම්පු මණ්ටලත්ත෈ත් තීවිරමාකච් චේතප්පටුත්තුකින්රතු. ඉතනාල් තූක්කමින්මෛ, ඉතය නෝය්, පසියින්මෛ, මූළ෈ පාතිප්පු පෝන්ර කටුම෈යාන පිරච්චින෈කළ් ඒර්පටුකින්රන. පෝතෛප්පොරුළ෈ නීණ්ට කාලම් පයන්පටුත්තුම්පෝතු, උටල් එටෛ කුර෈තල්, තෝල් නෝය්, තර්කොල෈ චෙය්තුකොළ්ළුම් එණ්ණම්, උයිරිழප්පු පෝන්ර පාරිය විළ෈වුකළ් ඒර්පටුකින්රන.

පෝතෛප්පොරුළ් පිරච්චින෈යානතු, කුරිප්පිට්ටතොරු සමූකත්තෛ මට්ටුම් පාතිප්පතිල්ල෈. අතු නාට්ටිලුළ්ළ අන෈ත්තු සමූකංකළ෈යුම් පාතික්කින්රතු. ඉතු ඔරු සමූකම් චාර්න්ත, ඔර් ඉනම් චාර්න්ත, කුරිප්පිට්ට වයතිනර් චාර්න්ත ඔරු පිරච්චින෈ අල්ල. අප්පාතිප්පු තන්න෈ච් චාර්න්ততල්ල එන්රු පුරක්කණිත්තුවිටවුම් මුටියාතු. ඒනෙනිල්, එමතු නාට්ටිල් ඉන, මත, මොழි පේතමිල්ලාමල්, ඉළ෈ඥර්කළ්, යුවතිකළ් එන්ර පේතමිල්ලාමල්, මුතියවර්කළ්, චිරුවර්කළ්, පෙණ්කළ්, ආණ්කළ්, මත කුරුක්කළ් එන අල්ලාත් තරප්පිනර෈යුම් පාතික්කින්ර ඔන්රාක ඉන්තප් පෝතෛප්පොරුළ් පිරච්චින෈ මාරියිරුක්කින්රතු. එනවේ, ඉතර්කු එතිරාක නාම් අන෈වරුම් ඔන්රුචේර වේණ්ටුම්.

නාන් ඔරු පෙණ්ණාක, එන්නුට෈ය චමූකත්තිල් ඉරුක්කින්ර පෙණ්කළුක්කුම් තාය්මාරුක්කුම් ඔරු විටයත්ත෈ක් කූර විරුම්පුකින්රේන්. පෝතෛප්පොරුළානතු එම්ම෈ අරියාමලේ එමතු වීට්ටුක්කුළ්ළුම් නුழ෈න්තු ඉරුක්කලාම්. අන්තළවුක්කුක් කොටියතුතාන් ඇන්තප් පෝතෛප්පොරුළ්! ඇව්වාරු පාරිය පාතිප්ප෈ ඒර්පටුත්තක්කූටිය ඔන්රුක්කුළ් ඇන්රු නාංකළ් අකප්පට්ටුක්කොණ්ටු ඉරුක්කින්රෝම්. එංකළුට෈ය පිළ්ළ෈කළාක ඉරුක්කට්ටුම්, කණවන්මාරාක ඉරුක්කට්ටුම්, චකෝතරර්කළාක ඉරුක්කට්ටුම්, අවර්කළ් තංකළ෈ අරියාමලේයේ ඇතනාල් පාතිප්පුක්කුළ්ළාකි ඉරුක්කින්රාර්කළ්. ඇන්රු ඇළ෈ඥර්කළ් මාත්තිරමල්ල, ඇළම් යුවතිකළ් උට්පට පෙණ්කළුම් ඇතනාල් පාතිප්පුක්කුළ්ළාකි ඉරුක්කින්රාර්කළ්. අවර්කළ෈ ඇතිලිරුන්තු මීට්ටෙටුක්ක වේණ්ටිය පොරුප්පු එංකළ් ඔව්වොරුවරුක්කුම් ඉරුක්කින්රතු. ඇව්වළවු කාලමුම් පෝතෛප්පොරුළ෈ ඔழික්කුම් පොරුප්පු පොලිචාර්, මුප්පට෈යිනර් එන කුරිප්පිට්ටතොරු තරප්පිනරිටම් මාත්තිරමේ ඔප්පට෈ක්කප්පට්ටු ඉරුන්තතු. ආනාල්, ඇන්රු මතකුරුක්කළ්, පෙණ්කළ්, අතිපර්කළ්, ආසිරියර්කළ් එන අන෈වරුම් ඇතු තොටර්පාන තේසිය වේල෈ත්තිට්ටත්තිල් ඔන්රිණ෈ය වේණ්ටිය තේව෈ ඉරුක්කින්රතු. අණ්ම෈යිල් නාංකළ් තීපාවළි පණ්ටික෈ය෈ක් කොණ්ටාටිනෝම්. අතන් කරුප්පොරුළ් එන්නවෙන්රාල්, වාழ්க்கையின் இருளை அகற்றி ஒளியைக் கொண்டுவருவதுதான். நரகாசுரன் என்ற அரக்கனை அழித்து, வாழ்க்கைக்கு ஒளியைக் கொண்டு வந்ததுபோல, எங்களுடைய நாட்டை ஆக்கிரமித்துக்கொண்டு இருக்கின்ற போதைப்பொருளை ஒழித்து, ஒளிமயமான எதிர்காலத்தை ஏற்படுத்த வேண்டிய தேவை எமக்கு இருக்கின்றது.

මගේ කථාව අවසන් කරන්න කලින් අපේ ජනතාවට මේ කාරණය කියන්න ඕනෑ. මේක අපට අදාළ නැහැ කියලා එක්කෙනෙකුටවත් අත් හරින්න බැහැ. එයට හේතුව මෙයයි. අපි නොදැනුවත්වම අපේ දොරකඩ ළඟ මේ මත් උවදුර තිබෙනවා. සමහර වෙලාවට අපේ පවුලේ ඉන්න අපේ සහෝදරවරු, අපේ දරුවන්, අපේ ස්වාමි පුරුෂයන් හරහා මේ මත් උවදුර අපේ පවුලට ඇතුළු වෙලා තිබෙනවා. මේ උවදුරෙන් ජනතාව එළියට එන්න නම් මේක එක කණ්ඩායමකට භාර දීලා හරියන්නේ නැහැ. මත් උවදුර නිසා අඳුරේ සිටින්නා වූ අපේ මව්බිම බේරා ගන්න, ජාතිභේද කිසි දෙයක් බලන්නේ නැතුව අපි ඔක්කෝම එක මිටට එකතු වෙලා කටයුතු කරන්න ඕනෑ. මේකෙන් ජයග්‍රහණය ලබා ගන්න මව්වරුනි, පියවරුනි, සහෝදර සහෝදරියනි, අපි සියලුදෙනාම මත් උවදුර තුරන් කිරීමේ වැඩ පිළිවෙළට එකමුතු වෙමු. එහෙම කළොත් අපි හිතන්නේවත් නැති තරම් ඉක්මනින් මේ මත් උවදුර තුරන් කරලා, ලස්සන ජීවිතයක් අපේ අනාගත දරුවන්ට ළඟා කර දෙන්න පුළුවන්. නැත්නම් මේ උවදුර නිසා අපේ රට විනාශ වෙන්න පුළුවන්. ඒ නිසා මේ අභියෝගය ජය ගන්න සියලුදෙනා එක්ව නැඟිටිමු කියලා මම ආරාධනා කරනවා. ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.05]

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක මීටට එකතු වෙලා, සුබ නැකතට, රට අඳුරට ගිහිල්ලායි තිබෙන්නේ. ඒ නිසා ආණ්ඩුවේ අය තව කිඹුල් කඳුළු හෙළුවත් අද මේ නටන නාඩගම් පිළිබඳව රටේ පුරවැසියා, ජන්ද දායකයා බුද්ධිමත්ව විමසීමෙන් ඉන්නේ. ආණ්ඩු පක්ෂයේ ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා අද මේ කල් තැබීමේ යෝජනාව ගෙනාවේ එතුමා තුළ තිබෙන සද්භාවය නිසාය කියන කාරණය අපි දන්නවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පිටුපස තිබෙන බොරුව, මුසාව, රඟපෑම මොකක්ද කියන කාරණය මේ සමාජය දැනගත යුතුව තිබෙනවා. මම එතැනට එන්න කලින් යමක් කිව යුතුයි.

මේ ආණ්ඩුව ජනවරම ලබා ගත්තේ හොරු අල්ලන්න, හොරුන්ට දඬුවම් දෙන්න, හොරුන්ව කුදලන්න කියන කාරණය අද සමාජය නොපිළිගන්නා තැනට පත් වෙලා තිබෙනවා. හොරු අල්ලනවා කියා ඔබ කොතෙක් කිව්වත්, අද මේ ආණ්ඩුවේ ඉදිරි පෙළේ සිටින බහුතරයක් හොරු බවට පත් වෙලා තිබෙනවාය කියන කාරණය තමයි සමාජය කියන්නේ; සමාජය දකින්නේ. ඔවුන්ගේ හැඩ රුවින්, ඔවුන්ගේ කථා බහින්, ඔවුන්ගේ දිවි පෙවෙතින් ඒක ඔප්පු වෙලා හමාරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා දැන් මෙතුමන්ලා උත්සාහ කරන්නේ මොකකටද? දැන් හොරු අල්ලන්න බැහැ, හොරු මෙයාලා අල්ලා ගෙන ඉන්නවා, හොරකම, වංචාව, දූෂණය පසුගිය කාලයේ සිටි හොරුන්ටත් වඩා හොඳට මෙයාලා කරනවා.

මහ බැංකු බැඳුම්කර වංචාව හොරකමක් නොවෙයි කියලා ඔප්පු වුණා. බැඳුම්කර සිද්ධිය සම්බන්ධව කවුරුවත් හොරු නොවෙයි කියලා අගමැතිතුමිය විසින්ම ඔප්පු කර පෙන්නුවා. පසුගිය සභා වාර ගණනාවකදී එම හොරකම්, මැරකම්, වංචා කියපු කාරණා සියල්ල එසේ නොවෙයි කියන කාරණය ඔප්පු වුණා. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, අද උදේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න යටතේ 6 වැනි ප්‍රශ්නය අහපු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමා ලේඛනයක් ගෙනැල්ලා නම් කියා ඇහුවා, පසුගිය ආණ්ඩුවල හිටපු මැති-ඇමතිවරු ඉඩම් ගත්තාද කියලා. මොකක්ද, නියෝජ්‍ය ඇමති කිව්වේ? "නැහැ, එහෙම ලේඛනයක් නැහැ. එහෙම කතිකාවක් තිබුණා. එහෙම ඉඩම් වංචාවක් පිළිබඳව අනාවරණය වෙලා නැහැ. එහෙම ඉඩම් අල්ලා ගත් වැඩ පිළිවෙළක් පිළිබඳව අපි දන්නේ නැහැ" කිව්වා. මම දැක්කා, ආණ්ඩු පක්ෂයේ ඒ මන්ත්‍රීවරයා සැරෙන් අහනවා, මේ හොරු අල්ලන්නේ කවදාද කියලා. මම හිතන විධියට ඒ ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරයෙක් වෙන්න ඇති.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
පාපිස්සක්.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පාපිස්සක්. එතුමාට තරහ ගියා, සුජීව මන්ත්‍රීතුමා. ඒ මන්ත්‍රීතුමා ඇහුවා, කවදාද හොරු අල්ලන්නේ කියලා. අල්ලන්න බැහැ. දැන් මෙයාලා මාතෘකාවක් හදාගෙන තිබෙනවා. අර කථාවක් තිබෙනවා නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "හක්කෙ බුදු රැස් - බොක්කෙ දඩ මස්" කියලා. එහෙම තමයි මෙයාලත් ආණ්ඩු බලය ගන්නකොට බෝඩ් එක ගහගෙන හිටියේ. මෙයාලා බුදු රැස් පෙන්නුවා, හොරු අල්ලා, කුදලා කුඩුවට දමනවා කියලා. දැන් ඒක බැහැ. ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා ගෙනා මේ යෝජනාව පිටුපස තිබෙන්නේ, මේ යෝජනාවේ මාතෘකාව තුළ තිබෙන්නේ මොකක්ද? වෙන මොකුත් නොවෙයි. ඊළඟට "බුදු සරණයි!" කියන බෝඩ් එක ගසා තිබෙන්නේ. ඇයි? මෙයාලාගේ මේ ආණ්ඩුව පිටුපස තිබෙන කාරණා නිසා තමයි, මේ කුඩු ජාවාරමේ ආරම්භයේ ඉඳලා මේ දක්වා හොයා ගන්න බැරි තැනට පත් වෙලා තිබෙන්නේ.

කන්ටේනර් තුන්සියගණනින්, දෙකක තිබිලා හම්බ වුණේ මොනවාද? අයිස් ජාවාරමට සම්බන්ධ වෙච්ච අය කියලා චෝදනා කළාට, ඒ කන්ටේනර් පිට වුණේ කොහොමද, ඒ කන්ටේනර් පිට කළේ කවුද? ඒ කියන කාරණාව නිසා නොවෙයිද, අද බිමල් රත්නායක ඇමතිවරයාගෙන් එම අමාත්‍යාංශය ජනාධිපතිවරයා අයින් කර තිබෙන්නේ? අද එතුමා පාර්ලිමේන්තු එන්නේත් නැහැ, දකින්නත් නැහැ. ඒ නිසා ඔවුන් කරන මේ ජාවාරම, ඔවුන් දෙන සහයෝගය යනාදී ඒ සියල්ල වසන් කර ගන්න මේ අල්ලන කුඩු ටික නැවත එම ව්‍යාපාරිකයන් අතටම යනවාද කියන සැකය අපට තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉතිහාසයේ එහෙම සිද්ධ වුණා.

අද ආරක්ෂාව භාරව ඉන්නා සමහර ඇමතිවරුන් ඉන්නේ නිවාස සංකීර්ණවල තිබෙන කෝටි 50ක පමණ වටිනාකමින් යුත් නිවාසවල. එයාලට ඒවා යාළුවෝ දෙනවා කියනවා. එහෙම නම් ඒ යාළුවෝ කවුද? මේ ජාවාරම්වලට සම්බන්ධ කට්ටියද? මේ හම්බ වෙන ද්‍රව්‍ය හොර රහසේ පිටත් කරන නිසාද, අත යට ගනුදෙනු කරන නිසාද ඒවා එහෙම දෙන්නේ කියන කාරණය අපි අහනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? එහෙම වෙන්න බැරිද? පාරේ පයින් ගිය, බස් එකේ ගිය උදවිය දැන් කෝටි 50ක් පමණ වටිනා apartmentsවල ඉන්නවා නම්, එයාලා නීතිය භාරව කටයුතු කරන නියෝජ්‍ය ඇමතිවරුන් නම්, එහෙම නම් ඒ ගැන සැකයක් ඇති වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ වෙන මොකවත් නොවෙයි කරන්නේ. අල්ලන බව පෙන්වනවා. ඒවා ටීවී එකේ දමනවා. එයාලාගේ බලය පාවිච්චි කරලා, ඇමතිකම පාවිච්චි කරලා ඒවා නැවත අදාළ තැනටම යවනවා. රටේ ජනතාව හිතනවා, මෙයාලා මේවා අල්ලලා අපේ රටේ දරුවෝ බේරා ගන්න හදනවා කියලා. නැහැ, එහෙම වෙන්නේ නැහැ.

දැන් මෙයාලා වෙන මාතෘකාවක් හදා තිබෙනවා, හොරු අල්ලන්න බැරි නිසා. මේ මත්ද්‍රව්‍ය අල්ලලා, පාතාලයේ අය අල්ලලා ඒ සියල්ල පෙන්වා දෙන්නේ එයාලාගෙන් ගිලිහී යන බලය රැකගන්න, ජනතා අප්‍රසාදය නැති කරගන්න අවශ්‍ය වැඩ පිළිවෙළට දෝ කියන සැකය අපට තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් මෙයාලා කියනවා නේ, පාතාලයේ කණ්ඩායම්-කණ්ඩායම් අතර තිබෙන තත්ත්වයක් ගැන.

එහෙම නම් ආණ්ඩුව අපට මේකත් කියන්නකෝ. කටුනායක, සීදුව නගර සභාව නියෝජනය කරන ජාතික ජන බලවේගයේ මන්ත්‍රීතුමෙකුට වෙඩි තිබ්බා. ඒ වාගේම මාලිමාව නියෝජනය කරන වැලිගම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ ගෙදරකට වෙඩි තිබ්බා. ඒවා සිදු වන්නේ පාතාලය-පාතාලය සම්බන්ධව නම්, ඒ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාත්, ඒ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාත් පාතාලයට සම්බන්ධ නිසාද, වෙඩි තැබුවේ? එහෙම කියන්න බැහැ. අද, මහජන ආරක්ෂාව භාර ඇමතිවරයා ඇවිත් විළිලැජ්ජා නැතිව කියන්නේ මොකක්ද? මම දැක්කා, ආණ්ඩු පක්ෂයේ සමහර මන්ත්‍රීවරු කිඹුල් කඳුළු හෙළනවා, "කවුරු මැරුණත් අපි ඒ වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරනවා" කියලා. හැබැයි, ඒ කියන තෙතමනයක් මේ ආණ්ඩුවේ මහජන ආරක්ෂාව භාර ඇමතිවරයාට තිබෙනවාද?

[ගරු චමින්ද විජේසිරි මහතා]

ඊයේ මොනවාද එතුමා ඇවිත් කිව්වේ? අධිකරණයකින් ඔප්පු වෙලා වරදකාරයෙකු කරන්න කලින් -චෝදනා තිබෙන, අධිකරණයේ නඩු තිබෙන- ඒ පුද්ගලයා පාතාලයට සම්බන්ධයි කියනවා නම්, අන්න එතැනින් තමයි පාතාලය ආරම්භ වෙන්නේ. එහෙම නම්, අද මේ ආණ්ඩුවේ ඉන්න ඒ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

තමයි පාතාලය නිර්මාණය කරන්නේ. ඒ සාතනය වෙච්ච පුද්ගලයාට සහෝදරයෝ ඇති, දරුවෝ ඇති. ඒ කිසිම දෙයකට සම්බන්ධ වෙච්ච නැති පුද්ගලයින් ඒකට සම්බන්ධයි කියලා මහජන ආරක්ෂාව භාර ඇමතිවරයා නින්දිත විධියට මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරලා, වරප්‍රසාද පාවිච්චි කරලා, තමන්ගේ ඇමතිකම පාවිච්චි කරලා කියන කොට තමන් ඒවාට සම්බන්ධ නැතිනම් ඒක බලාගෙන ඉන්න දරුවන්ට වෙන්න පුළුවන්, ඒක බලාගෙන ඉන්න සහෝදරයන්ට වෙන්න පුළුවන් තරහා යන්නේ නැද්ද, වේදනාවක් දැනෙන්නේ නැද්ද, මූලාසනාරූඪ ගරු ගරු මන්ත්‍රීතුමනි? තමන් ඒ කිසි දෙයකට සම්බන්ධ නැතත් තමන්ගේ පරම්පරාව ඒවාට සම්බන්ධ කරන්න කටයුතු කරනවා නම්, එතැනින් නොවෙයිද නැවත පාතාලය පටන් ගන්නේ?

පාතාලයට සම්බන්ධ වෙච්ච, පාතාලය කියලා මිනී මරපු, චාමර සම්පත් මන්ත්‍රීතුමා ඔප්පු කරලා පෙන්වපු ඒ කාරණයට අදාළ ඇමතිවරයා ඉල්ලා අස්විය යුතු නැද්ද? එතුමා මහජන ආරක්ෂාව භාර ඇමතිකමට සුදුසු ද? එතුමා එයට සුදුසු නැහැ කියන කාරණය මේ මාතෘකාව තුළ අද ඔප්පු වෙලා හමාරයි. ඒ නිසා මම ආණ්ඩුවේ ඉන්න ඇමතිවරුන්ට කියනවා, හැමදාම කථා කරන ජාතික ජන බලවේගය ආණ්ඩුවේ කණ්ඩායමට කියනවා, විළිලැජ්ජාවක් ඇත්නම් මහජන ආරක්ෂාව භාර ඇමතිවරයාට ඒකෙන් ඉල්ලා අස්වෙන්න කියන්න කියලා. එතුමා ඒකට සුදුස්සෙක් නොවෙයි. 1988-89 කාලය තුළ මිනී මැරුම්වලට සම්බන්ධ වෙච්ච, ඒ මිනීමැරුම් මෙහෙයවපු, අවි මෙහෙයවපු, ඒ මිලේච්ඡත්වය තිබෙන

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

අද දේශපාලනය කරන්න ඇවිල්ලා අද මේ ආණ්ඩුව යටතේ නීතිය ක්‍රියාත්මක කරන හැටි අපට පෙනෙනවා.

මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්. දැන් ආණ්ඩුවේ හැමෝම කියනවා, "අපේ ආණ්ඩුවේ ඉන්න මන්ත්‍රීවරුන් ගත්තත්, අපේ ඇමතිවරුන් ගත්තත්, අපේ නියෝජ්‍ය ඇමතිවරුන් ගත්තත් අර කදිර්ගාමර් ස්වරූපයේ අයයි" කියලා. හැබැයි, මම කියන්නේ ඔබතුමන්ලා "රීගාමන්ලා" කියලායි. එහෙම නේද?

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

"රීගාමන්ලා" කිව්වා නම් හොඳයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
දැන් බලන්නකෝ හඳුන්නෙත්ති මහත්මයා. ගා ගත්තා නේ. හාලා ගා ගත්තා. ඒ නිසා ඔබතුමන්ලා කදිර්ගාමර්ලා කෙසේ වෙතත් රීගාමන්ලායි කියන කාරණය රටේ ජනතාව -පුරවැසියා- දන්නවා. ඔබතුමන්ලාගේ උගත්කම, බුද්ධිය කියන සියල්ල කෙරෙහි විශ්වාසය තබලා තමයි ඔබතුමන්ලාට බලය දුන්නේ. හැබැයි, ඒ උගත්කම, බුද්ධිය ආදි සියල්ල පාවිච්චි කරලා මේ ඉදිරි පෙළේ ඉන්න JVP

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ටික තමුන්නාන්සේලාගේ ගෞරවය කෙලෙසමින් හොරකම, වංචාව, දූෂණය, පාතාලය මෙහෙයවමින්, කුඩු ව්‍යාපාරය කරමින්, apartmentsවල ඉඳිමින්, සුර සැප විඳිමින් කටයුතු කරනවා කියන කාරණය සමාජය අද දකිනවා. රටේ ජනතාවට තුන්වේල කන්න නැහැ. රටේ ජනතාවට ප්‍රශ්න තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අද බදුල්ලේ මිනිසුන්ට එළවළු ටික විකුණාගන්න විධියක් නැහැ. හවසට අර සෙව්වන්දි කොහේට හරි ගෙනැල්ලා, සෙව්වන්දි පෙන්නලා ජනතාවගේ සැබෑ දුක, සැබෑ ප්‍රශ්න වසන් කරනවා. ආණ්ඩුව අද මේ ප්‍රශ්නය ගෙනැල්ලා, "අපි මේක අවසාන කරනවා" කියලා බොරුවට කරන රඟපෑම නවත්වන්න කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි, මට වෙලාව ලබා දුන්නාට, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජන්ත ගම්මැද්දෙගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.14]

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ අපේ ගරු ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ මේ යෝජනාව ගෙන ආවේ, විෂ මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ මැඩලීම සඳහා ගනු ලබන ව්‍යායාමයට යම් ශක්තියක් වෙන්න මේ පාර්ලිමේන්තුවේ යම් කතිකාවතක් ඇති කරන්නයි. නමුත්, අපි අහගෙන හිටියා මීට කලින් මේ පාර්ලිමේන්තුවේ කථා කරපු මන්ත්‍රීවරයා ඉතාම ලජ්ජා සහගත විධියට කියපු දේවල්. මේ විධියේ යෝජනාවක් ගෙනෙන කොට, මේ රටේ මහජන ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කරන ඇමතිවරයාව අපි ශක්තිමත් කරන්න ඕනෑ, එතුමාගේ එම තනතුර වඩාත් තහවුරු කරන්න ඕනෑ. හැබැයි ඒ මන්ත්‍රීවරයා කියනවා, ඒ ඇමතිවරයා දැන් අයින් කරන්න ඕනෑ කියලා. අපට තේරෙනවා මේ දෙබිඩි පිළිවෙත

මොකක්ද කියලා. ඔවුන් කල්පනා කරන්නේ මොකක්ද? ඔවුන් කල්පනා කරනවා, දැන් රට හරියට යනවා, මේක කඩා වට්ටන්න නම් ඒ ඇමතිවරයා අයින් කරන්න ඕනෑ කියලා. ඒ නිසා ඒකට අවශ්‍ය මතවාද හදන්න උත්සාහ කරවා. අපි කියනවා, අපට මන්ත්‍රීවරුන් 159දෙනෙකු ඉන්නේ නිකම් නොව, ඒ ඇමතිවරයා වාගේම මේ මුළු රටේම ජනතාව ශක්තිමත් කරන්න බව.

ඒ නිසා වහසි බස් දොඩන්න එපා කියලා අපි ඒ මන්ත්‍රීවරයාට කියනවා. ඔවුන්ගේ ඉතිහාසය අපි දන්නවා. ඒ ඉතිහාසය නිසා ඔවුන්ට හොඳ පාඩම් උගන්වා තිබෙනවා, මේ රටේ ජනතාව. ඒ නිසා එවැනි කාරණා මේ පාර්ලිමේන්තුවේ කියන්න එපා. අපි විපක්ෂය ගෙනෙන සමහර යෝජනාවලට, අදහස්වලට සාධාරණව ඇහුම්කන් දෙනවා. හැබැයි, එවැනි තක්කඩි ප්‍රකාශ මේ පාර්ලිමේන්තුව තුළ කරන්න අපි ඉඩ තබන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි එහෙම තක්කඩි වැඩ කරන්න ඉඩ දෙන්නේ නැහැ; ඒ අය අපට කලින් පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරු, අපට කලින් පාර්ලිමේන්තුවේ අත්දැකීම් ලබපු මන්ත්‍රීවරු. නමුත්, ඒ අය ඉතාම ලජ්ජා සහගත ප්‍රකාශ කරනවා. අපි ඒ පිළිබඳව කනගාටුව පළ කරනවා.

මා විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මාතර දිස්ත්‍රික්කයේ පිහිටි වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා තමයි ඒ ඝාතනය වුණේ. අපි මේ අවස්ථාවේදී ඒ පිළිබඳව අපේ ශෝකය; කනගාටුව විශේෂයෙන්ම ප්‍රකාශ කරනවා. අපි දන්නවා, පොලීසියට ඕනෑම අපරාධයක් අල්ලන්න පුළුවන් බව; අපරාධකරුවන් ගිය තැන සොයාගන්න අනිවාර්යයෙන් පුළුවන් බව. අපි ඒක විශ්වාස කරනවා. මේ රටේ පොලීසිය ඒකට අවශ්‍ය මැදිහත්වීම කරනවා. ඒ අපරාධකාරයන් නීතිය හමුවට ගෙනෙන්න පුළුවන් වාතාවරණය අපට අනිවාර්යයෙන්ම ඇති කර ගන්න පුළුවන්. ඒ විශ්වාසයෙන් අපි වැඩ කරනවා, අපට මොන චෝදනාව කළත්.

අපි දන්නවා, වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ මරණය ආණ්ඩුව පිට දමන්න විපක්ෂය අද ඉතාම නින්දිත විධියට චෝදනා කරන බව. අපි කියනවා, ඒ මිනී මැරුම් ඉතිහාසය තිබුණේ විපක්ෂයට බව. විපක්ෂයේ තිබෙන ප්‍රධාන පක්ෂ කීපය තුළම ඉන්නේ ඒ මිනී මැරුම් ඉතිහාසයට වග කියන්න ඕනෑ අයයි. 1988-89 කාලයට අදාළ මිනී මැරුම් ඉතිහාසය තිබෙන්නේත්, ඊට පසු කාලයට අදාළ මිනී මැරුම් ඉතිහාසය තිබෙන්නේත් ඔවුන්ටයි. එදා පාතාලය පෝෂණය කළේ අද විපක්ෂය නියෝජනය කරන ප්‍රධාන පක්ෂවල අයයි. ඒ සියලු දෙනා ඒවාට වග කියන්න ඕනෑ. අපි කියනවා, මේ අපරාධවලට සම්බන්ධ අය අනිවාර්යයෙන්ම නීතිය හමුවට ගෙනෙන බව, ඒ අයට අවශ්‍ය දඬුවම් දෙන බව, ඒකට අවශ්‍ය වැඩ කටයුතු කරන බව. ඒකට තමයි මේ ආණ්ඩුව පත් වෙලා තිබෙන්නේ. මේ රටේ ජනතාව මේ ආණ්ඩුවට ආදරය කරන්නේ ඒ නිසායි. අතිගරු ජනාධිපතිතුමාගේ ඉඳලා, අගමැතිතුමිය ඇතුළු මුළු කැබිනට් මණ්ඩලයටම, නියෝජ්‍ය ඇමතිවරුන්ට, අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සියලුදෙනාට රටේ ජනතාව අද ආදරය කරන්නේ ඒක නිසයි. අපට ප්‍රශ්නයක් නැහැ. අපට ඕනෑම තැනක බැහැලා යන්න පුළුවන්. අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. මොකද, අපි කාටවත් වරදක් කරලා නැති දේශපාලන නායකයෝ.

මාතර දිස්ත්‍රික්කය ගත්තොත්, අපට මාතර දිස්ත්‍රික්කයේ ඕනෑම තැනක ආරක්ෂාව නැතිව යන්න පුළුවන්. මොකද, අපි ජනතාවට වරදක් කරලා නැහැ. අපි දේශපාලනයට ආවේම මේ රට ඉතාම යහපත් තැනක් බවට පත් කරන්නයි. ඒ සඳහා අවශ්‍ය ජනවරම තමයි අපට දුන්නේ. ඒකට අදාළ මැදිහත් වීම තමයි අද පාර්ලිමේන්තුව ඇතුළේ අප මේ කරමින් ඉන්නේ. ඒ නිසා මම විශේෂයෙන්ම කියනවා අපි මේ ව්‍යායාමය ඉතාම සාර්ථකව නිම කරන බව. කියමනක් තිබෙනවා නේ, "ඕනෑම දෙයක් කොහොම හරි කරන්න ඕනෑ, බැරි නම් කෙසේ හෝ කරන්න ඕනෑ" කියලා. ඒ නිසා අපි කියනවා, මේ මත්ද්‍රව්‍ය ජාවාරම කෙසේ හෝ නවත්වන්න ඕනෑ කියලා. මත්ද්‍රව්‍ය ජාවාරම නැවැත්වීමට අදාළ මැදිහත් වීම අපි අනිවාර්යයෙන්ම කරනවා. අපි මොන බාධක ආවත් මේ මත්ද්‍රව්‍ය උවදුර මේ රටෙන් තුරන් කරන්න අවශ්‍ය මැදිහත් වීම කරනවා; ඒකට අවශ්‍ය ජනතා පවුර නිර්මාණය කරනවා. එළැඹෙන 30වැනි දායින් අපි ආරම්භ කරන්නේ අන්න ඒ වැඩසටහනයි. ඒ වෙනුවෙන් මේ රටේ ජනතාව පෙළ ගැහෙනවා කියන පණිවුඩය අපි විපක්ෂයේ මහත්වරුන්ට කියනවා.

ඒ නිසා ඔබ තමුන්නාන්සේලාත් කල්පනා කරන්න, මේ සද් කාර්යයට දායක වෙන්න ඕනෑ කියලා. මේ සද් කාර්යය විවේචනය කරන්න අද මැදිහත් වන විපක්ෂයේ හැම මන්ත්‍රීවරයෙකු පිටිපස්සේම මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයන් ඉන්නවා කියන සැකය අපට තිබෙනවා. විවේචනය කරන්නේ නැතිව එ හැමෝම මේ සද් කාර්යයට දායක වෙන්න ඕනෑ. විපක්ෂය කියන්නේ හැම එකටම විරුද්ධව මොනවා හරි කිය කියා යන කණ්ඩායමක් නොවෙයි. විපක්ෂය කියන්නේ ආණ්ඩුවට හොඳ, සාධනීය විධියට මඟ පෙන්වන කණ්ඩායමකටයි. ඔවුන් අන්න ඒ මඟ පෙන්වීම කරන්න ඕනෑ, ඒකට අවශ්‍ය මැදිහත් වීම් කරන්න ඕනෑ. අපි හිතනවා, ඒ වැඩේ අද පාර්ලිමේන්තුවේදී වුණේ නැහැ කියලා. සඳහාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ මේ ඉතාම වටිනා යෝජනාව ඉතාම නරක විධියට අරගෙන, තමන්ට මරු පහරක් විධියට අරගෙන කටයුතු කරන තැනට අද විපක්ෂය පත් වෙලා තිබෙනවා. ඒ පිළිබඳව අපි කනගාටුව ප්‍රකාශ කරනවා. මීට කලින් කථා කළ මන්ත්‍රීවරයෙක් කිව්වා, විපක්ෂය අබල දුබල වෙලා කියලා. ඔව්, ඒක ඇත්ත. සුන්බුන් විපක්ෂයක් තමයි තිබෙන්නේ. ඒ නිසා තමයි අද ඒ අය මෙවැනි තැනකට පත් වෙලා තිබෙන්නේ.

අපි කියනවා, ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙකු සද්භාවයෙන් ගෙනාපු මේ යෝජනාවට අප කවුරුත් සහයෝගය දෙන්න ඕනෑ, මේකට අවශ්‍ය මැදිහත් වීම් කරන්න ඕනෑ, මේකේ අඩුපාඩු තිබෙනවා නම් පෙන්වා දෙන්න ඕනෑ කියලා. ඒක කරනවා වෙනුවට වෙන වෙන කතන්දර කියමින් කාලය ගත කරන එක කොහෙත්ම වැදගත් නැහැ කියන කාරණය මම මේ අවස්ථාවේදී කියනවා.

අපි දන්නවා, මේ රටේ මත්ද්‍රව්‍ය උවදුර නිකම් ඇති වුණු එකක් නොවෙයි කියලා. මෙම මත්ද්‍රව්‍ය උවදුර මුල් කාලයේ ඉතාම පොඩියටයි පටන් ගත්තේ. අප පාසල් ගිය කාලයේ මේ උවදුර ඉතාම පොඩියට පටන් ගත්තු දෙයක් විධියටයි දැක්කේ. හැබැයි, අද වනකොට උදේ පාන්දර ගෙවල්වල මව්පියන්ගෙන් ඇහෙන කථා අපි දන්නවා. අම්මටයි, තාත්තටයි වැඳලා ඉස්කෝලේ යන්න දරුවා එළියට බහිනකොට අපේ ගෙවල්වල සිටින අපේ බිරින්දෑවරු දරුවන්ට කියන කථාව තමයි, "ඉස්කෝලේ ගියාට කමක් නැහැ, ඉස්කෝලේ ගිහිල්ලා කවුරුවත් දෙන ටොෆියක්වත් කන්න එපා පුතේ" කියන එක. උදේට අම්මාට තාත්තාට වඳින දරුවාට අපට කියන්න වෙලා තිබෙන්නේ ඒ කාරණය. ඒ තරමට මේක ව්‍යසනයක් වෙලා තිබෙනවා. දරුවෙකුට තවත් දරුවෙක් දෙන ටොෆියක්වත් කන්න එපා කියන තැනට අද පත් වෙලා තිබෙනවා. ඉතින් ඒ නිසා මේ තත්ත්වය තමයි අපි නවත්වන්න ඕනෑ. මේ තත්ත්වය නවත්වන්න අනිවාර්යයෙන්ම මේ ආණ්ඩුව කටයුතු කරනවා. ඒකට අවශ්‍ය මැදිහත්වීම් කරන්න ඕනෑ. ඒකට අවශ්‍ය ජන පවුරක් නිර්මාණය කරන්න ඕනෑ. අන්න ඒ ජන පවුර නිර්මාණය කිරීම තමයි අපි මේ කරන්නේ. එහෙම නැතුව මේ කාරණය හුදෙකලාව අරගෙන නීතිය විතරක් ක්‍රියාත්මක කරලා ඒක කරන්න බැහැ.

[ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා]

අපි විශේෂයෙන්ම කියනවා, මේ රටේ ජනමාධ්‍ය ආයතනවලටත් මේ සම්බන්ධයෙන් වගකීමක් තිබෙන බව. මම පසුගිය දවසක දැක්කා, එක මාධ්‍ය ආයතනයක් ප්‍රවෘත්තියක් පළ කරලා තිබෙනවා, මත්ද්‍රව්‍ය පිළිබඳ ඔත්තුවක් දුන්නා කියලා සැක කරලා කාන්තාවක් දූෂණය කළා කියලා. ඒ වාගේ ප්‍රවෘත්තියක් පළ කරන එක පවා මාධ්‍ය ආයතන ටිකක් කල්පනාවෙන් කරන්න ඕනෑ. මොකද ඒක ප්‍රවෘත්තියක් නොවෙයි. ඒ ප්‍රවෘත්තියෙන් වෙනත් අදහසක් එන්න පුළුවන්. මත්ද්‍රව්‍ය පිළිබඳව ඔත්තු දෙන, පොලීසියට තොරතුරු දෙන ඒ හැම කෙනෙක්ම බිය ගන්වන විධියේ ප්‍රවෘත්ති තමයි එවැනි ප්‍රවෘත්ති. උදේ පත්තර කියවන කෙනාත් ඒක කියවනවා. එහෙම වෙන්නේ නැතුව එවැනි කාරණා ඉතාම සංවේදී කාරණා විධියට අරගෙන ඊට මැදිහත් වෙන්න ඕනෑ. එහෙම මැදිහත් වෙන්න මාධ්‍ය ආයතනවලට විශේෂ වගකීමක් තිබෙනවා. මාධ්‍ය ආයතනවල විකාශය වන සමහර ටෙලි නාට්‍යවල තිබෙන්නේත් මත්ද්‍රව්‍ය පිළිබඳව වැරදි විධියේ අදහස් එන විධියට. ඒවා සියල්ල නවත්වන්න ඕනෑ. ඒවා නවත්වලා සියලු ආයතන, ආගමික නායකයන්, පූජක පක්ෂය, පොලීසිය, මේ රටේ හැම පුරවැසියෙක්ම, හැම සිවිල් සංවිධානයක්ම මැදිහත් වෙලා මේ මත්ද්‍රව්‍ය උවදුර තුරන් කිරීම සඳහා අවශ්‍ය ඒ මැදිහත්වීම කරමු. සියලු ජාතීන් එක මිටට එකතු වෙලා මේ අර්බුදය තුරන් කිරීම සඳහාත්, සංවිධානාත්මක අපරාධ කල්ලි මැඩපැවැත්වීම සඳහාත් අවශ්‍ය ඒ මැදිහත්වීම් කරමු. ඒ සඳහා සියලුදෙනාට ආරාධනා කරමින් මා නිහඬ වෙනවා.

බෙහෙවින්ම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.23]

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ අපි දැක්කා, ඉතාම ශෝකජනක අවස්ථාවක්. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයෙක් රාජකාරි කටයුතුවල යෙදිලා ඉන්න අතරතුර කාර්යාලයටම ඇවිල්ලා වෙඩි තියලා ඝාතනය කළා. ඊටත් වඩා ශෝකජනක කාරණාව තමයි ඊට පැය කිහිපයකට පස්සේ ආරක්ෂාව භාර ඇමතිවරයා ඇවිල්ලා කියනවා, මේ වෙඩි තැබීමට ලක්වුණු සභාපතිවරයාගේ ඉතිහාසය ගත්තාම, ඔහු යම් යම් කාරණාවලට සම්බන්ධයි කියලා. අපි ඇමතිවරයාගෙන් බලාපොරොත්තු වෙන්නේ ඒ ඝාතනයට සම්බන්ධ වෙඩික්කරුවන් හොයා ගැනීම සඳහා ඒ ඇමතිවරයාට නියමිත කාර්යභාරය ඉෂ්ට කරනවාද, එහෙම නැත්නම් ඒ ඝාතනය සාධාරණීකරණය කරන්න මේ පාර්ලිමේන්තුවේ කාලය පාවිච්චි කරනවාද කියන එක. මේක ලජ්ජාසහගත තත්ත්වයක්. මොකද, ආරක්ෂාව භාර ඇමතිවරයා ඇත්තටම මෙතැනදී එතුමාගේ නොහැකියාව පෙන්නුම් කරනවා. මේ කාරණාව ගැන ඒ කරපු ප්‍රකාශය, ඇමතිවරයකු හැටියට ඇත්තටම ලජ්ජා විය යුතු කාරණාවක්.

මේ සභාපතිවරයා මහජන නියෝජිතයකු හැටියට ප්‍රශ්න ගණනාවක් තිබුණු වේලාවක ඡන්දයෙන් දිනලා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට පත් වුණා. අපි එදා දැක්කා, මේ සභාවේ බලය පිහිටුවන්න යද්දීත් ප්‍රශ්න ගණනාවක් ආවා. එදා ආණ්ඩු පක්ෂයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු දෙපළක් ඉස්සුවා කියලා කිව්වා. පසුව ඒ දෙපළම වෙරළේ ඉන්නවා කියලා ප්‍රකාශ වුණා. තව මන්ත්‍රීවරයෙකුට වෙඩි තිබ්බා කිව්වා. ඒ වාගේම තව කිව්වා, ඒකත් අපේ අයම කළාද කියලා. එවැනි තත්ත්වයක් තුළ තමයි මේ සභාපතිවරයා පත් වුණේ. ඒ නිසා ආරක්ෂාව භාර ඇමතිවරයාගේ මේ ප්‍රකාශය තුළ අපට සැකයක් තිබෙනවා. මේ සිද්ධිය ඇති වෙලා පැය කිහිපයක් ඇතුළත මෙවැනි ප්‍රකාශයක් කිරීම පිළිබඳව විපක්ෂය හැටියට අපි කාටත් සැකයක් තිබෙනවා.

අපි විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ වෙනකොට මෙවැනි වෙඩි තැබීම් ගණනාවක් සිද්ධ වෙලා තිබෙන බව. 100කට වඩා වෙඩි තැබීම් සිද්ධ වෙලා තිබෙනවා, මේ වසර තුළ. ඝාතන තිබෙනවා පනස් ගණනක්. මෙවැනි තත්ත්වයක් නැති කිරීමට රජයට වගකීමක් තිබෙනවා. දැන් රජය නිරන්තරයෙන් කියනවා ජාතික ආරක්ෂාවේ ප්‍රශ්නයක් නැහැ කියලා. රටේ ආරක්ෂාවේ ප්‍රශ්නයක් නැහැ කියනවා. නමුත්, මේ තත්ත්වය තුළ සෑම පුරවැසියෙකුටම අද ඉතාම භයානක තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

කුඩු ගැන කථා කරද්දී, මේ ව්‍යසනය මේ රටින් අයින් කරන්න කරන ඕනෑම දෙයකට අපේ සහයෝගය දෙන්න ඕනෑ. අපි කවුරුත් මේ කුඩු නැති කරනවාට කැමැතියි. අපේ රටේ පිහිටීමත් එක්ක බැලුවාම, ගොඩක් වෙලාවට අපේ රටට එන කුඩු ප්‍රමාණය බැලුවාම, පසුගිය දවස්වල කුඩු අහු වුණේ කන්ටේනර් පිටින් බව අපි දන්නවා. හම්බන්තොටදී අහු වුණු ඒ කුඩු කන්ටේනර් දෙක සම්බන්ධ පරීක්ෂණ යනකොට මාධ්‍ය තුළින් අපි දැක්කා, ඒවා පරීක්ෂාවටත් ලක් කරලා එළියට දමපු ඒවා කියලා. ඒ, මේ රජය පත් වුණාට පස්සේ. තමුන්නාන්සේලාගෙන් මම මේ කාරණය අහනවා. තමුන්නාන්සේලා මේ ගැන කල්පනා කරන්නේ නැද්ද? දැන හෝ නොදැන දැන් රතු ලේබලය ගහපු කන්ටේනර් තුන්සිය ගණනක් නිදහස් කළා. දැන හෝ නොදැන ඒක සිද්ධ වුණා නේ. ලංකාව වෙනත් රටවලට කුඩු ප්‍රවාහනය කරන මධ්‍යස්ථානයක් හැටියට පාවිච්චි කරනවා නම්, මේ රට තුළට එන රතු ලේබල් ගහපු කන්ටේනර් අනිවාර්යයෙන්ම පරීක්ෂා කළ යුතු නැද්ද? මෙවැනි තත්ත්වයක් තුළ තමයි, තමුන්නාන්සේලාගේ රජය පත් වෙලා මාස කිහිපයක් යද්දී තමයි දැන හෝ නොදැන මේවා නිදහස් කරලා තිබෙන්නේ.

අද මේ ගෙනා සභාව කල් තැබීමේ යෝජනාව අනුව, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් තමුන්නාන්සේලා යම් වැඩ පිළිවෙළක් අරගෙන යනවා. රටට මත්ද්‍රව්‍ය එන මාර්ග මොනවාද? කන්ටේනර් හරහා මත්ද්‍රව්‍ය එනවා කියන එක දැන් ඔප්පු වෙලා තිබෙනවා. හම්බන්තොටට කන්ටේනර් දෙකක් ගිහිල්ලා, ඒවායේ මත්ද්‍රව්‍ය තිබුණා කියලා ප්‍රකාශ කරලා තිබෙනවා. එහෙම නම්, අපේ රටට එන කන්ටේනර් මේ විධියට නිදහස් කරන එක සාධාරණද? විශේෂයෙන්ම මේ කන්ටේනර් 325 තුළ 100කට වැඩි ප්‍රමාණයක් රතු ලේබලය ගහපු, ඒ කියන්නේ අනිවාර්යයෙන් පරීක්ෂා කළ යුතු කන්ටේනර් තිබුණා. මේ තත්ත්වය තුළ අපි කාටත් සැකයක් ඇති වෙනවා, මේ විධියට කටයුතු කිරීම තුළ තමුන්නාන්සේලා මත්ද්‍රව්‍ය අල්ලනවා කියලා එක් පැත්තකින් ජනතාවට එක් පින්තූරයක් පෙන්වන ගමන්, අනික් පැත්තෙන් මේවාට සහයෝගය දෙනවාද කියලා. ඒ නිසා අපි පැහැදිලිවම රජයට කියනවා, ඔබතුමන්ලාගේ රජය බලයට පත් වුණේ රටේ ජනතාව ඉතාම අමාරුවෙන් ජීවිතයක් ගත කරන වෙලාවක බව. ජනතාව තුන්වේලක් කන්න බැරිව අසරණ වෙච්ච, අරගළයක් ඇවිල්ලා මේ රටේ ජීවත් වෙන්න බැරිව ඉන්න අවස්ථාවක තමයි මේ රටේ ජනතාව මන්ත්‍රීවරු තුන්දෙනෙක් හිටපු තමුන්නාන්සේලාට මන්ත්‍රීවරු 159ක් දක්වා වැඩි කර ලබා දීලා තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මට තව පොඩි කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

නමුත් අපි පැහැදිලිව කියනවා. ඒ ජනතාව බලාපොරොත්තු වුණු දේවල් එකක්වත් අද තමුන්නාන්සේලාට ක්‍රියාත්මක කරන්න බැරිවෙලා තිබෙන බව. අද ජනතාවගේ දුප්පත්කම තව වැඩිවෙලා තිබෙනවා. ඒ කියන්නේ, අපේ රටේ ජීවත් වන පවුල්වලින් වැඩි කොටසක් දැන් ආයෙත් දුප්පත් ගොඩට ගිහින් තිබෙනවා. ඔවුන්ට ජීවත් වෙන්න අමාරු වෙලා තිබෙනවා. අද තමුන්නාන්සේලාගේ නොහැකියාව වහගන්න නොයෙකුත් ප්‍රචාර අරගෙන යනවා. විශේෂයෙන්ම අපේ වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ සාතනය සම්බන්ධයෙන් තමුන්නාන්සේලාගේ ආරක්ෂක ඇමතිවරයා සිදු කළ ප්‍රකාශය ගැන ඇත්තටම අපි ඉතාම කනගාටු වෙනවා. එහෙම ප්‍රකාශයක් කිරීම ගැන එතුමා ලජ්ජා වෙන්න ඕනෑ. එතුමාට කියන්න තිබුණේ අපි අනිවාර්යයෙන්ම මේ වෙඩික්කරුවන් - සාතකයන් - අල්ලනවා කියන එකයි. නමුත්, එතුමා කිව්වේ ඒක නොවෙයි. මේ මියගිය පුද්ගලයා සම්බන්ධ කාරණා ගණනාවක් තමයි එතුමා ප්‍රකාශ කළේ. ඒවා එකක්වත් ඔප්පු වෙලා ඔහු වැරදිකාරයෙක් වෙලා නැහැ. එහෙම තිබෙන තත්ත්වයක් තුළ තමයි එතුමා ඒ විධියට කථා කළේ. ඒ පිළිබඳ අපේ කනගාටුව ප්‍රකාශ කරනවා.

බොහොම ස්තූතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.30]

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ සාකච්ඡා කරන මාතෘකාව ගත්තාම, විශේෂයෙන් කුඩු එක්ක බැඳිච්ච මේ තත්ත්වය ගත්තාම, අපි දන්නා විධියට 1980 දශකයේ තමයි මේ විෂ මත්ද්‍රව්‍ය ප්‍රබල විධියට ඉස්සරහට ආවේ.

ඒ දවස්වල අපි පාසල් ශිෂ්‍යයෝ. 1980-90 දශකයේ තමයි මේවා ඉස්සරහට ආවේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුඩු ආවේ හුළඟට නොවෙයි. කුඩු මුහුදේ පාවෙලා ආවේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් නම් මුහුදේ පාවෙලාත් කුඩු එනවා. මොකද, දැන් සැපයුම් මාර්ග සම්පූර්ණයෙන්ම අවහිර වෙලා තිබෙනවා. නාවික හමුදාව දැන් ලොකු මෙහෙයුමක් කරනවා. ඒ නිසා දැන් සමහර වෙලාවට මුහුදේ පාවෙල එන්න පාකිස්තානයේ ඉඳන් කුඩු ගෝනි දානවා. ඒ සඳහා ධීවර යාත්‍රා යොදාගන්නවා කියලා අපට ආරංචියක් තිබෙනවා. සංවිධානාත්මකව තමයි මේවා ආවේ. මොකද, සමාජ, දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමේ වුවමනාවක් එදා පාලනයට තිබුණා. ඒක විවෘත ආර්ථිකයත් එක්ක බැඳිච්ච තත්ත්වයක්. එතකොට ඒකට කළු ආර්ථිකයක්, පාදඩ ආර්ථිකයක්, පාදඩ දේශපාලන සංස්කෘතියක් ඕනෑ වෙලා තිබෙනවා. අන්න ඒ පාදඩ දේශපාලන සංස්කෘතිය තමයි එදා 1980-90 දශකයේ පටන් ගත්තේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1980-90 දශකයේ නම් මේවා පටන් ගත්තේ, අද අපි කථා කරන්නේ 2025 අවුරුද්දේ. ඒ කියන්නේ අවුරුදු හතළිස් ගණනක් ඒ පාදඩ සංස්කෘතිය, කුඩු සංස්කෘතිය නැති කරන්න තිබ්බිච්ච පාලනයට බැරි වෙලා තිබෙනවා.

මේ අවුරුද්දක ආණ්ඩුව දුර්වල ආණ්ඩුවක් කියලා අද මෙතැන එක්කෙනෙක් කථා කරලා කිව්වා. එහෙනම් අවුරුදු 40ක් තිස්සේ මේ ව්‍යසනය වෙනස් කරන්න බැරි වෙච්ච ඒගොල්ලෝ සමත් ආණ්ඩුද, ඒගොල්ලෝ හරි ආණ්ඩුද? නැහැ. ඔවුන් මොකක්ද කළේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවුරුදු හතළිස් ගණනම ඔවුන් හොර ගල් ඇහිලුවා, මේවාට අනුබල දුන්නා. මේ පාතාලයට, මේ කුඩුවලට, මේ ජරා සංස්කෘතියට ඒ පාලනයෙන් අනුබලයක් දුන්නා. ඒ අවුරුදු හතළිස් ගණනම තිබ්බිච්ච පාලනයන් ගත්තොත්, ඒ කාලයේ පාලනය කළේ කවුද කියන එක නොවෙයි වැදගත්. ඉන් පළමුවැනි අවස්ථාව පටන් ගත්තේ ජේ.ආර්. ජයවර්ධන, ප්‍රේමදාස සහ තොන්ඩමන්. ඒ හැම පාලනයක්ම හොර ගල් අහුලලා තිබෙනවා. දැන් මේ ආණ්ඩුව මොකක්ද කරන්නේ? හොරගල් අහුලන්නේ නැතුව මේ තත්ත්වය වෙනස් කරන්න මේ ආණ්ඩුවට ඇත්ත වුවමනාවක් ඇති වෙලා තිබෙනවා. ඒ වෙනුවෙන් තමයි අද මේ යෝජනාව ගෙනාවේ.

විශේෂයෙන්ම මහජන ආරක්ෂක ඇමතිතුමා ඇතුළු අපි හැමෝම ආණ්ඩුවක් හැටියට මේ උත්සාහ කරන්නේ හොරගල් අහුලන්නේ නැතුව මේවා සම්පූර්ණයෙන් මේ රටින් ඉවත් කරන්නයි. ඒ සඳහා තමයි මේ හැමෝටම ලබන ඔක්තෝබර් 30වැනි දා සුගතදාස ක්‍රීඩාංගණයට එන්න කියලා කැඳවීමක් කරලා තිබෙන්නේ. ඒ නිසා ඔබතුමන්ලා අද ඇඳගෙන එන්න තිබුණේ කළු ඇඳුම් නොවෙයි. කළු ඇඳගෙන එනවා නම් ඔළුවේ ඉඳන් කළුවලින් වහගෙනයි එන්න තිබුණේ. හරි ක්‍රමය තමයි ඔළුවේ ඉඳන් කළුවලින් වහගන්න එක. දාගන්නවා නම් කළු ලෝගුවක් දාගන්න ඕනෑ. අද මේ විවාදයේදීත් කළේ, අවුරුදු හතළිස් ගණනක් හොර ගල් ඇහිලුවා වාගේ හොරගල් ඇහිලුව එක. කිසිම කෙනෙක් මේ යෝජනාවේ සමාජ වුවමනාව, රටේ වුවමනාව සම්බන්ධයෙන් එක වචනයක් කිව්වේ නැහැ. විපක්ෂයේ කිසිම කෙනෙක් ඒ ගැන එක වචනයක් කිව්වේ නැහැ. අහවලා මෙන්න මේක කිව්වාය කියලා පුළුවන් නම් මට කියන්න. විවිධ දේවල් කියලා ඉවර වෙලා, අපිත් මේකට කැමැතියි කියලා ඉඳලා හිටලා කෙනෙක් වුට්ටක් කිව්වා. එච්චරයි. හැබැයි ඇත්ත, අවංක වුවමනාවක් නැහැ. මූලාසානරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි රටක් හැටියට, සමාජයක් හැටියට මේ වුවමනාව තිබෙනවා.

අපි හදන ක්‍රමය අනුව, මේ කුඩු සංස්කෘතිය වෙනස් කරන්න, මේ පාතාලය නැති කරන්න, මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න මේ යන ගමනට විරුද්ධව වැඩිම වුණොත් මෙතැන කථා කරන හතරපස්දෙනාත් එක්කම මුළු රටේම ලක්ෂ 5ක් ඇති කියලා මම හිතනවා. මේකට විරුද්ධ ලක්ෂ 5ක් විතර ඉන්න පුළුවන්. නමුත් කුඩු සංස්කෘතියෙන්, පාතාලයෙන් ගැලවෙන්න බැරි විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ අය අපට ඇති. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිර ගෙදර 35,000ක් විතර ඉන්නවා කියලා මම විශ්වාස කරනවා. පව්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අය අහිංසක මිනිස්සු. ඇයි? ඒ අය මේ සංස්කෘතියට ගොදුරු වෙච්ච මිනිස්සු. වැඩිහරියක් ඉන්නේ මේවාට ගොදුරු වෙච්ච මිනිස්සු. මම හිටපු ගමේ එදා ලොකු බේකරියක් තිබුණා. ඒ බේකරියෙන් තමයි මුළු ප්‍රදේශයටම පාන් දුන්නේ. ඒ බේකරියෙන් තමයි අපිට බනිස් දුන්නේ. ඒ බේකරියෙන් තමයි අපිට ගල්බනිස් දුන්නේ. ඒ බේකරියෙන් තමයි අපිට ස්පන්ච් කේක් දුන්නේ. ඒ බේකරිය අයිති කෙනාට අපි කියන්නේ 'කේක් බාස්' කියලා. මම භය නැතිව කියන්නේ, දැන් මේ නම ජනප්‍රිය වුණත් ප්‍රශ්නයක් නැති නිසා. මොකද, ඒගොල්ලෝ අකමැති වෙන්නේ නැහැ, මම මේ නම කියනවාට. ඒ කේක් බාස්ගේ බේකරියේ ලස්සන ළමයින් 9ක් විතර හිටියා. ඔක්කෝම ජීවත් වුණේ ඒ බේකරියෙන්. හැබැයි, එක්කෙනෙක් කුඩු ගහන්න ගත්තා. එයා කොහොමද කුඩු ගහන්න ගත්තේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වෙලාවේ පටන් ගත් කුඩු ප්‍රවාහකයෙකුගෙන්. ඒ ගෙදර එක ළමයෙකුට දත් කැක්කුමක් හැදුණා. ඒ කුඩු ප්‍රවාහකයා ඇවිල්ලා දත් කැක්කුමට දුන්න බෙහෙත "කුඩු". පළමු 'ෂොට්' එක, වචනවලින්ම කියනවා නම්

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා]

කුඩු. පළමු 'ෂොට්' එක ගැහුවේ "දත් කැක්කුමට මේක හොඳයි, ගහපන්" කියලා දුන්නාම. ඊට පස්සේ ඒ පවුලේ පිරිමි ළමයි දෙන්නයි, ගැහැණු ළමයෙකුයි - තුන් දෙනෙක්ම - මේ කුඩුවලට අහු වුණා. ඔවුන්ට ඒකෙන් ගැළවෙන්න බැරි වුණා. අන්තිමේදී හදන පාන් ටික හොරෙන් අරන් ගිහිල්ලා විකුණුවා. බනිස් විකුණුවා. ඊට පස්සේ බේකරියේ විවිධ කෑලි, වාහනවල කෑලි හොරෙන් ගලවලා විකුණුවා. මේවා කළේ, ඒ කේක් බාසුන්නැහේගේ දරුවෝ. මම මේ උදාහරණයක් කියන්නේ. ඊට පස්සේ සම්පූර්ණයෙන්ම මුළු පවුලම විනාශ වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකෙන් බේරිලා, තැන් තැන්වල ජීවත් වෙන හතර පස් දෙනෙක් ඉන්නවා. දැන් බේකරියත් නැහැ. ඒක සම්පූර්ණයෙන්ම විනාශ වුණා. මම මේ උදාහරණයක් කිව්වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ මිත්‍රයෙක් හිටියා. එයා හොඳ cricketer කෙනෙක්. මිත්‍රයා ගියා O/Lවලට පාඩම් කරන්න. පාඩම් කරන්න ගිය තැනට ආවා ඒ වෙලාවේ එවපු වාහකයෙක්. ඇවිල්ලා කිව්වා, "උඹට පාඩම් කරන්න අමාරුයි. උඹට නිදිමත හැදෙනවා නේද? ගහපන් මේ 'ෂොට්' එක" කියලා. ඒකෙන් ඒ ළමයා කුඩුවලට ඇබ්බැහි වුණා. හොඳ ලස්සන කොල්ලෙක්. හොඳට ඉගෙන ගන්න පුළුවන් කොල්ලෙක්. ඒ කොල්ලා සමහර වෙලාවට පාරෙ දී හම්බ වෙලා මම වාහනය නැවැත්තුවාම ළඟට ඇවිල්ලා 'අයියේ' කියලා කථා කරලා කීයක් හරි ඉල්ලනවා. මට දුකේ බැහැ. මගේ පපුව හෝස් ගාලා යනවා. මෙන්න, මේ සමාජයට කරපු විනාශය. තවදුරටත් මේ ගැන නිහඬව ඉන්නවා නම්, හොර ගල් අහුලනවා නම් ඒ හොරගල් අහුලන හැම කෙනාම මේ විනාශයට වගකියන්න ඕනෑ. දැන්වත් තේරුම් ගන්න. 30වෙනි දාට සුගතදාස ක්‍රීඩාංගණයට එන්න. ඔයගොල්ලොත් එන්න. අපි ආරාධනා කරනවා; ආණ්ඩුවක් හැටියට ආරාධනා කරනවා, මේ සමාජයේ ව්‍යසනය වෙනස් කරගත යුතුයි කියලා. මෙතැන ඉන්නේ ගොඩාක් වයසක කට්ටිය. හැබැයි, අපේ මුණුපුරන්, මිණිපිරියන් තමයි මේකට ගොදුරු වෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
ඒ නිසා කරුණාකරලා මේවා වෙනස් කර ගත යුතුයි කියලා අපි ඉල්ලා සිටිනවා. මේ යෝජනාවේ හරය ඒක. නැතුව මේ එක එක කෑලි අල්ලන් ඒ කෑලිත් එක්ක පැටලෙන එක නොවෙයි කළ යුත්තේ. මේ යෝජනාවේ හරය ඒකයි. ඒ නිසා සමස්ත සමාජයක් හැටියට ඒ සඳහා එකතු වෙමු.

බොහොම ස්තූතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.39]

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற, போதைப்பொருள் கடத்தல் மற்றும் ஒழுங்கமைக்கப்பட்ட குற்றக் கும்பலுக்கு எதிரான நிகழ்ச்சித்திட்டம் சம்பந்தமான ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் எனக்கும் உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். நாம் இந்த விடயத்தை மிக முக்கியமானதொரு விடயமாகவே பார்க்கின்றோம். எதிர்கால சந்ததியினரைப் பாதுகாக்கும் நோக்கில், போதைப்பொருள் ஒழிப்பு தொடர்பில் இந்த அரசாங்கம் முன்னெடுக்கவுள்ள இந்த நிகழ்ச்சித்திட்டத்துக்கு எங்களுடைய முழுமையான ஆதரவையும் ஒத்துழைப்பையும் தருவோமெனக் கூறிக்கொள்வதுடன், அரசாங்கத்துக்கு வாழ்த்துக்களையும் நன்றியையும் தெரிவித்துக் கொள்கின்றோம்.

போதைப்பொருள் ஒழிப்பு விடயத்தில் நாம் இரண்டு விடயங்களைப் பார்க்கவேண்டி இருக்கின்றது. திட்டமிட்ட முறையில் போதைப்பொருளை நாட்டுக்குள் கொண்டுவருகின்ற ஒரு கும்பலுக்கு எதிராக நீங்கள் மிக இறுக்கமான நடவடிக்கைகளை எடுத்திருக்கின்றீர்கள். அதேவேளை, போதைப்பொருள் பாவிக்கின்றவர்களை மனநலம் பாதிக்கப்பட்டவர்களாகக் கருதி, அவர்களை அதிலிருந்து மீட்டெடுப்பதற்கான செயற்றிட்டத்தையும் மேற்கொள்ளவேண்டிய பாரிய பொறுப்பு அரசாங்கத்துக்கு இருக்கின்றது. இளம் சந்ததியினர் மூளைச்சலவை செய்யப்பட்டுள்ள காரணத்தாலும், பல்வேறு நெருக்கடியான சூழ்நிலைகளாலும் போதைப்பொருளைப் பாவித்துக் கொண்டிருக்கின்றார்கள். இதற்கு அப்பால் மிக முக்கியமானதொரு விடயத்தையும் நான் இங்கு சுட்டிக்காட்டவேண்டி இருக்கின்றது.

2009க்கு முன்னர், வடக்கு, கிழக்கில் போதைப்பொருள் சார்ந்த எந்தவொரு செயற்றிட்டத்தையும் நடைமுறைப்படுத்த முடியாத சூழ்நிலை இருந்தது. எனினும், 2009க்குப் பின்னர், அங்குள்ள இளைஞர், யுவதிகளைத் திட்டமிட்டு திசை திருப்பும் நோக்கில் ஆட்சியாளர்களால் பல்வேறு செயற்றிட்டங்கள் மேற்கொள்ளப்பட்டன. அவை இன்று நாடு முழுவதும் இருள் சூழ்ந்த நிலை ஏற்படுவதற்கு மூல காரணிகளாக மாறியிருக்கின்றன. இன்று போதைப்பொருள் சார்ந்த விடயத்தை அரசாங்கம் எதிர்கொள்கின்ற முறையையும் அதற்கு எதிராக எடுக்கின்ற நடவடிக்கைகளையும் பாராட்ட வேண்டும். நாட்டைத் தூய்மைப்படுத்துகின்ற இந்தச் செயற்றிட்டத்தினூடாக போதைப்பொருளை முற்றாக ஒழிப்பதன்மூலமே எமது இளம் சந்ததியினரைப் பாதுகாக்க முடியும். போதைப்பொருள் ஒழிப்புப் பணிமூலம் போதைப்பொருளைக் கொண்டுவருபவர்களைக் கடுமையாகத் தண்டிப்பதுடன், பாதிக்கப்பட்ட சமூகத்தை மீட்டெடுக்கும் நடவடிக்கையையும் மேற்கொள்ள வேண்டிய பாரிய பொறுப்பு அரசாங்கத்துக்கு இருக்கின்றது.

திட்டமிட்ட குற்றச்செயல்கள் போதைப்பொருளுடன் சம்பந்தப்பட்டதாகவும் நாட்டுக்குள் வன்முறைகளை ஏற்படுத்தக்கூடியதாகவும் அமைந்திருக்கின்றன. இந்த விடயம் தொடர்பில் அரசாங்கம் பல்வேறு செயற்றிட்டங்களை முன்னெடுக்கின்றபொழுதும், அவற்றை வெற்றிகரமாகவும் வினைத்திறனாகவும் முன்னெடுக்க முடியாத வகையில் நெருக்கடியான சூழ்நிலைகள் இருப்பதை எம்மால் அவதானிக்கக் கூடியதாக இருக்கின்றது. கடந்த ஒரு வருட காலத்தில் நூற்றுக்கும் மேற்பட்ட சூட்டுச் சம்பவங்கள் இடம்பெற்றுள்ளதுடன், பல்வேறு உயிரிழப்புகளும் ஏற்பட்டு இருக்கின்றன. அவ்வாறு உயிரிழந்தவர்கள் போதைப்பொருளுடன் தொடர்புபட்டவர்களாக, பாரிய குற்றச்செயல்களில் ஈடுபட்டவர்களாக இருந்தாலும், இந்த நாட்டின் பிரஜைகள் என்ற அடிப்படையில் அவர்களைப் பாதுகாக்க வேண்டிய பாரிய பொறுப்பு இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது. குற்றச்செயல்களில் ஈடுபட்டவர்களுக்குத்

தண்டனை வழங்கப்பட வேண்டியது முக்கியமானதொரு விடயமாக இருந்தாலும், அவர்கள் சூட்டுச் சம்பவங்களுக்கு இலக்காகாத வகையில் பாதுகாப்பு நடைமுறைகள் ஏற்படுத்தப்பட வேண்டும்.

மக்கள் பிரதிநிதிகள் என்ற அடிப்படையில், நாம் பல்வேறு நெருக்கடியான சூழ்நிலைகளை எதிர்கொள்ளவேண்டி இருக்கின்றது. நாம் சட்டவிரோத நடவடிக்கைகளுக்கு எதிராகக் குரல்கொடுக்கும்போது, அந்த நடவடிக்கைகளைத் தடுத்து நிறுத்துவதற்குச் சம்பந்தப்பட்ட நிறுவனங்களுக்கு ஆலோசனைகளை வழங்கும்போது, எங்களுக்கும் பாதுகாப்பு தொடர்பான பிரச்சினைகள் ஏற்படுகின்றன. எனவே, இந்த விடயம் தொடர்பில் அரசாங்கம் பெறுப்புடன் செயற்பட்டு, மக்கள் பிரதிநிதிகளுக்குப் பாதுகாப்பு வழங்குவதில் ஓர் உறுதியான நிலைப்பாட்டை எடுக்க வேண்டும். தற்போது நடைபெறுகின்ற சூட்டுச் சம்பவங்கள், திட்டமிட்ட குற்றச் செயல்கள் என்பன அவற்றுடன் சம்பந்தப்பட்டவர்களுக்கு இடையில் நடைபெறுவதாகக் கூறப்பட்டாலும், எதிர்காலத்தில் இவை பொது மக்களுக்குப் பாரிய நெருக்கடியாக மாறுவதற்கு வாய்ப்பு இருக்கின்றது.

2009க்குப் பின்னர் வட, கிழக்கு இளைஞர், யுவதிகளை இலக்கு வைத்து, அவர்களின் மனநெறியை, தமிழ்த் தேசியம் சார்ந்த, தமிழ் இனம் சார்ந்த பற்றுதலை இல்லாமல் செய்வதற்காக ஆட்சியாளர்களால் திட்டமிட்ட முறையில் மேற்கொள்ளப்பட்ட விடயங்கள் இன்று எவ்வாறு நாட்டுக்கு நெருக்கடியாக மாறியிருக்கின்றது என்பதை நீங்கள் எல்லோரும் புரிந்துகொள்ள வேண்டும். நாங்கள் திட்டமிட்ட குற்றச்செயல்களைக் கண்டுங்காணாமல் விட்டால், பாதுகாப்பை உறுதிப்படுத்தத் தவறினால், அது எதிர்காலத்தில் மிக நெருக்கடியான சூழ்நிலையை ஏற்படுத்தும். எனவே, இந்த அரசாங்கமும் பொது மக்கள் பாதுகாப்பு அமைச்சும் இந்த விடயம் தொடர்பில் தீர்க்கமானதொரு முடிவை எடுத்து, மக்கள் பிரதிநிதிகளையும் பொது மக்களையும் பாதுகாப்பதற்கான சிறப்பான ஏற்பாடுகளை மிக விரைவாக முன்னெடுக்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

மேலும், போதைப்பொருள் கடத்தல் மற்றும் திட்டமிட்ட குற்றச்செயல்களைத் தடுப்பதற்காக அரசாங்கத்தால் மேற்கொள்ளப்படவுள்ள செயற்றிட்டம் எதிர்காலத்தில் வெற்றியளிக்கக்கூடிய வகையில் மிகவும் வினைத்திறனான முறையில் முன்னெடுக்கப்பட வேண்டும். அது கட்சி சார்பற்று, கட்சிகளைக் குற்றஞ்சாட்டுவதற்கு அப்பால், நாட்டில் பாதுகாப்பை உறுதிப்படுத்தும் வகையில் முன்னெடுக்கப்பட வேண்டும். அதற்கு எங்களுடைய ஆதரவைத் தருவதாகக் கூறி, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අබූබකර් අතම්බාවා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.46]

ගරු අබූබකර් අතම්බාවා මහතා
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, போதைப்பொருள் மற்றும் குற்றச்செயல்களை ஒழித்து, சட்டக் கட்டமைப்பைப் பலப்படுத்தும் தேசிய நிகழ்ச்சித்திட்டம் தொடர்பாக அரசாங்கத் தரப்பால் கொண்டுவரப்பட்டுள்ள ஒத்திவைப்புவேளைப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு பெருமகிழ்ச்சி அடைகின்றேன்.

நச்சுத் தன்மையான போதைப்பொருட்கள் 1980களில் லிபரல்வாதிகளால் இந்த நாட்டுக்குக் கொண்டுவரப்பட்டதாக நாங்கள் அறிகின்றோம். நாட்டில் நடைபெற்ற 30 வருட கால யுத்தத்துக்குப் பின்னர், 2009, 2019, 2020, 2021, 2022ஆம் ஆண்டுகளில் போதைப்பொருள் பாவனை நாடு முழுவதும் உச்ச அளவில் காணப்பட்டது. இந்த நாட்டில் இருக்கின்ற இளைஞர்கள், பல்கலைக்கழக மாணவர்கள், பாடசாலை மாணவர்கள், ஏன் யுவதிகள்கூட போதைப்பொருள் பாவனைக்கு உள்ளாகியிருக்கிறார்கள். போதைப்பொருள் இறக்குமதி, அதன் விநியோகம், அதன் பாவனை போன்ற நடவடிக்கைகளின் பின்புலத்தில் அரசியல்வாதிகள் இருந்ததாக நாங்கள் கேள்விப் படுகின்றோம். போதைப்பொருள் வர்த்தகத்தினூடாகப் பெறப்பட்ட கறுப்புப் பணத்தை சில அரசியல்வாதிகள் தங்களுடைய அரசியல் இலாபத்துக்காகப் பயன்படுத்தி இருக்கிறார்கள்.

எமது நாட்டில் போதைப்பொருள் பாவனை அதிகரிப்பானது, நாட்டின் பொருளாதாரத்திலும் கலை, கலாசாரத்திலும் செல்வாக்குச் செலுத்தியது. எமது நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்ப வேண்டுமாகவிருந்தால், நாட்டில் காணப்படும் போதைப்பொருள் பயன்பாட்டைக் கட்டுப்படுத்த வேண்டும். நாட்டில் போதைப்பொருளை முற்றுமுழுதாக ஒழித்துவிட வேண்டும் என்பதில் மாண்புமிகு சனாதிபதி அவர்கள் மிகவும் கண்ணும் கருத்துமாக இருக்கின்றார். அதற்காக அவருக்கு இந்த நாட்டில் இருக்கின்ற பெற்றோர் குறிப்பாக தாய்மார் நன்றி தெரிவித்தவர்களாக இருக்கின்றார்கள்.

போதைப்பொருள் ஒழிப்பு தொடர்பான தேசிய திட்டமானது, இன்று நாடு முழுவதும் பேசப்படுகின்ற ஒரு விடயமாக மாறி இருக்கின்றது. இன்று காலையிலிருந்து நாங்கள் இந்தப் பாராளுமன்றத்தில் போதைப்பொருள் ஒழிப்பு தொடர்பாகப் பேசிக்கொண்டு இருக்கும்போது, எதிர்க்கட்சியில் இருக்கின்றவர்கள் அது தொடர்பாகப் பேசாமல், தங்களுடைய அரசியல் இலாபத்துக்காக வெவ்வேறு விடயங்களைப் பேசிக்கொண்டு இருக்கின்றார்கள். மாண்புமிகு சனாதிபதி அவர்கள் நினைப்பதுபோன்று, இந்த நாட்டிலிருந்து போதைப்பொருளை முற்றுமுழுதாக ஒழித்துவிட்டால், எதிர்காலத்தில் தங்களால் அரசியலில் ஈடுபட்டு பாராளுமன்றம் வரமுடியாது என்ற எண்ணம் அவர்களிடத்தில் தோன்றியிருக்கின்றது. அதன் காரணமாக அவர்கள் இந்தத் திட்டத்தை மறைமுகமாக ஏதோவொரு வகையில் சிதைத்துவிட வேண்டுமென நினைக்கின்றார்களோ என்ற ஐயம் எங்கள் மத்தியில் எழுந்திருக்கிறது. முன்வைத்த காலை பின்நோக்கி வைக்கப் போவதில்லையென மாண்புமிகு சனாதிபதி அவர்கள் கூறியிருக்கிறார். எனவே, நாங்கள் இந்தத் திட்டத்தை தொடர்ந்து முன்கொண்டு செல்ல இருக்கின்றோம்.

அதற்காக நாங்கள் கிராமிய, பிரதேச, மாவட்ட மட்டங்களில் மாத்திரமன்றி, தேசிய மட்டத்திலும் பல்வேறு நிகழ்ச்சித்திட்டங்களை ஏற்பாடு செய்து இருக்கின்றோம். அதன் ஓர் அங்கமாகத்தான் எதிர்வரும் 30 திகதி தேசிய நிகழ்வொன்றை நாங்கள் ஏற்பாடு செய்திருக்கிறோம். அது போதைப்பொருளை ஒழிக்கும் நிகழ்வாகப் பார்க்கப்படுகின்றது. அந்த நிகழ்வில் எதிர்க்கட்சியைச் சேர்ந்த உறுப்பினர்களும் கலந்துகொண்டு, இந்த வேலைத்திட்டம் வெற்றிபெறுவதற்குத் தங்களாலான சகல உதவிகளையும் செய்ய வேண்டும். அப்போதுதான் இந்த நாட்டிலுள்ள

[ගරු අබූබකර් අතම්බාවා මහතා]

எதிர்காலச் சந்ததியினரை குறிப்பாக, இளைஞர்களை நாங்கள் நினைத்ததுபோல் வழிநடத்த முடிவதோடு, இந்த நாட்டை நாங்கள் நினைக்கின்ற இலக்கை நோக்கிக் கொண்டுசெல்லவும் முடியுமென இந்தச் சந்தர்ப்பத்தில் குறிப்பிட விரும்புகின்றேன்.

இன்று காலை இங்கு பேசிய கௌரவ உறுப்பினர் ஒருவர் வைத்தியர் ஷாபி தொடர்பாகக் குறிப்பிட்டார். வைத்தியர் ஷாபி அவர்கள் 2019ஆம் ஆண்டு மே மாதம் 25ஆம் திகதி கைது செய்யப்பட்டார். மேற்குறித்த பாராளுமன்ற உறுப்பினர் அந்தக் காலப் பகுதியில் அரசாங்கத்திலே அங்கம்வகித்து இருந்தார். அவர் தொடர்ந்து பேசும்போது, அவருடைய முகப்புத்தகத்தில் சிலர் இன ரீதியான பதிவுகளை இடுவதாகச் சொல்லியிருந்தார். அந்தப் பதிவுகளை இடுபவர்கள் தேசிய மக்கள் சக்தியைச் சேர்ந்தவர்களென எண்ணி, தேசிய மக்கள் சக்தி ஓர் இனவாதக் கட்சி எனக் காண்பிக்க அவர் காலையில் முயற்சித்ததை நாங்கள் பார்த்தோம். இதனை நாங்கள் வன்மையாகக் கண்டிக்கின்றோம்.

இந்த நாட்டில் இருக்கின்ற முஸ்லிம்கள் இப்போது மாண்புமிகு சனாதிபதிக்கு ஆதரவு வழங்குவதற்கான தீர்மானத்தை மேற்கொண்டிருப்பதை நாங்கள் பார்க்கின்றோம். மாண்புமிகு சனாதிபதி அவர்கள் செல்கின்ற இடங்களில் எல்லாம் இந்த நாட்டில் போதைப்பொருள் ஒழிப்பு தொடர்பாகப் பேசுகிறார். அதனை ஒழிப்பதற்குத் தங்களாலான சகல ஒத்துழைப்புகளையும் உதவிகளையும் கட்சி, நிறம் கடந்து செய்வதற்கு நாங்கள் தயாராக இருக்கின்றோம். அந்த அடிப்படையில், இந்த நிகழ்ச்சித்திட்டத்தை எதிர்காலத்தில் முன்கொண்டு செல்வதற்கு சகலரும் ஒத்துழைப்பு வழங்க வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

போதைப்பொருள் பாவனைக்கு அடிமையாக்கப்பட்டவர்கள் பொதுவாக பொருளாதார ரீதியாக பாதிக்கப்பட்டவர்களாகவே காணப்படுகின்றார்கள். அதுமாத்திரமல்ல, போதைப்பொருள் வியாபாரம் மூலம் சேகரிக்கப்படும் பணத்தைக் கொண்டு அவர்கள் வெவ்வேறு வகையான தொழிற்றுறைகளில் ஈடுபடுவதை நாங்கள் பார்க்கின்றோம். அந்தத் தொழிற்றுறைகளும் இந்த நாட்டுக்கு எதிரான தொழிற்றுறைகளாகவே பார்க்கப்படுகின்றது. போதைப்பொருளானது இந்த நாட்டில் இருக்கின்ற இளைஞர்களிடத்தில் உடல், உள ரீதியான பாதிப்பை ஏற்படுத்துவதோடு, அவர்களுடைய வாழ்க்கைக் காலத்தையும் குறைக்கின்றது. இளவயது மரணங்களைத் தூண்டக்கூடிய இரசாயனப் பதார்த்தங்கள் போதைப்பொருளில் காணப்படுகின்றன. இவ்வாறான போதைப்பொருளை நாட்டுக்குள் கொண்டுவருவதில் வியாபாரிகள் உட்பட பாதாள உலகக் குழுவினர் ஈடுபட்டுக்கொண்டு இருக்கின்றார்கள். போதைப்பொருளை ஒழிப்பது மாத்திரமல்ல, அதனோடு தொடர்புபட்ட பாதாள உலகக் கோஷ்டியினரையும் கண்டறிந்து, அவர்களுக்குத் தண்டனை வழங்கவேண்டிய ஒரு காலகட்டத்திலே நாங்கள் இருந்துகொண்டு இருக்கின்றோம். தேசிய மக்கள் சக்தியினராகிய நாங்கள், போதைப்பொருளை ஒழிப்பதற்காகப் பல்வேறு நிகழ்ச்சித்திட்டங்களை எதிர்வரும் காலங்களில் ஒவ்வொரு வருடமும் தொடர்ச்சியாக மேற்கொள்வதற்குத் தீர்மானித்து இருக்கிறோம்.

போதைப்பொருள் பாவனையால் பாதிக்கப்பட்ட நூற்றுக்கணக்கான இளைஞர்கள் இந்த நாட்டில் இருக்கின்றார்கள். அவர்களுக்குப் புனர்வாழ்வு அளிக்க வேண்டிய தேவை இப்போது ஏற்பட்டு இருக்கின்றது. அவர்களுக்கு புனர்வாழ்வு அளிப்பதற்கான ஆலோசனைகளை வழங்குவதுடன், எதிர்காலத்தில் அவர்களுக்கான தொழில்வாய்ப்புகளையும் வழங்கவேண்டி இருக்கின்றது. அந்த வகையில், மாவட்டங்கள் தோறும் அவர்களுக்கு ஆலோசனைகள் வழங்குவதற்கான ஏற்பாடுகளை இந்த அரசாங்கம் எதிர்காலத்தில் செய்ய இருக்கின்றது. இவற்றின் மூலம் இந்த நாட்டைச் சிறந்த முறையில் கட்டியெழுப்பி, எதிர்காலச் சந்ததியினரிடம் கையளிப்பதன்மூலம் உலகத்திலேயே போதைப்பொருள் இல்லாத அல்லது போதைப்பொருள் பாவனை இல்லாத நாடாக எமது நாட்டை மாற்ற முடியுமெனக் கூறி, விடை பெறுகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.54]

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

වැදගත් මාතෘකාවක් වන සංවිධානාත්මක අපරාධ සහ මත්ද්‍රව්‍ය උවදුර වැළැක්වීම සඳහා මේ ගෙනාපු යෝජනාවට අපි, අපේ උපරිම සහයෝගය ලබා දෙනවා. මේ මොහොතේදී ප්‍රධාන අමාත්‍යවරු දෙදෙනෙක් මේ සභාවේ ඉන්නවා. මම හිතන විධියට, මේ මාතෘකාව සම්බන්ධයෙන් කථා කරද්දී අපේ විපක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙක් මේකට විරුද්ධව කථා කළේ නැහැ. මත්ද්‍රව්‍ය භාවිත කරන සුළු පිරිසක් හැරෙන්න වාගේම, අපරාධ ලෝකයට සම්බන්ධ සුළු පිරිසක් හැරෙන්න මුළු රටම දන්නවා, මේවා හොඳ නැති වැඩ කියලා. මේක නැවත නැවත මඩේ දමා හෝදන්න දෙයක් නැහැ. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා අපට චෝදනා කරලා වැඩකුත් නැහැ. ඔබතුමන්ලාට කරන්න තිබෙන්නේ ආණ්ඩුවෙන් දුන්නු පොරොන්දු අනුව ජීවන වියදම අඩු කරලා, රට දියුණු කරලා, මේ සිදු වන අපරාධ ඇතුළු මත්ද්‍රව්‍ය උවදුර නැති කරලා රට ශක්තිමත් කරන එකයි. නමුත්, ඔබතුමන්ලා මොකක්ද කරන්නේ? ඔබතුමන්ලාගේ අමාත්‍යාංශවල වැඩකටයුතු අසාර්ථක වෙනකොට, අමාත්‍යාංශ කරගන්න බැරි වෙනකොට මොකක්ද කරන්නේ? නිලධාරින් කියනවා, "ඇමතිවරු උද්ධච්චයි. කියන දේ අහන්නේ නැහැ. වැඩ දන්නේ නැහැ. කරන්න බැහැ" කියලා. මේ නොහැකියාව තුළ ඔබතුමන්ලා මාසයකට කොහොම හරි මොකක් හෝ මාතෘකාවක් තෝරා ගන්නවා. පළමුවෙන්ම දඬු ලේනුන්ගේ, වඳුරන්ගේ මාතෘකාව ආවා. ඊට පස්සේ බටලන්ද මාතෘකාව ආවා. ඉන්පසුව නලින්ද ජයතිස්ස ඇමතිතුමා ලැයිස්තු කිහිපයක් ඉදිරිපත් කළා. සුමාන ගාණක් ඒවා ඇදගෙන ගියා. ඒකෙන් වැඩක් වුණේ නැහැ. රටට වැඩක් වුණේත් නැහැ; අපිට වැඩක් වුණේත් නැහැ. ඒ තුළින් ඔබතුමන්ලා යම්කිසි ආකාරයකින් දේශපාලන වටිනාකමක් ගන්න ඇති. එච්චරයි. නමුත්, මේක හොඳ නැහැ.

ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, ඇමෙරිකාව වාගේ රටවල පවා මේ demand එක නැති කළේ නැත්නම් මේ මත්ද්‍රව්‍ය නැති කරන්න බැහැ කියලා ඔබතුමාත් දන්නවා. FBI එක, DEA එක ඇතුළු ආයතන ඔක්කොම එකතු කළත්, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඇමෙරිකාවේ demand එක නැති කළේ නැත්නම් කොලොම්බියාවෙන්, මෙක්සිකෝවෙන් එන මත්ද්‍රව්‍ය නවත්වන්න බැහැ. මේ අහු වෙන්නේ මත්ද්‍රව්‍යවලින් සියයට 3, 4, 5යි. කොහොම හරි මේවායේ demand එක නැති කරන්න ඕනෑ. මේ උදවිය පුනරුත්ථාපනය වෙන්න ඕනෑ. ඒවා ගැන ඔබතුමන්ලා කථා කරන්නේ නැහැ. ජනතාව භය කරනවා, අයිස්, අයිස් කියලා.

ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, ඒ කාලයේ අපට මතක් වෙන්නේ සුසන්තිකාලා, අරවින්දලා. ඒ කාලයේ අපි දන්නේ ඒ වාගේ ක්‍රීඩකයෝ, නළු නිළියෝ ඇතුළු අනෙකුත් අය ගැනයි. දැන් කථා කරන අයගේ නම් කියන්නත් මට ලජ්ජයි. දැන් මේ මොනවාද ඔබතුමන්ලා කියන නම්? අද අපේ රටේ ඉන්න දරුවන්ගේ වීරයෝ කවුද? මේ කුඩුකාරයෝ. TVවල පෙන්වන්නේ කවුද? මේ අල්ලාගෙන එන ඔක්කෝම ජාතික වීරයෝ බවට පත් කරලා, ගුවන් යානාවලින් පල්ලෙහාට බස්සන්නේ ඔබතුමන්ලාගේ ආණ්ඩුවයි. එහෙම කරන්නේ මේ ආණ්ඩුවේ නොහැකියාව වහගන්නයි. දරුවන්ට කියනවා, මේ තමයි entertainment, මේක තමයි බලාපොරොත්තු වෙන්නේ කියලා. ඔබතුමන්ලාගේ සමහර ඇමතිවරුම කියනවා, මේ අපරාධකාරයෝ දක්ෂයෝ කියලා. මම දන්නේ නැහැ, ඒ ඇමතිවරයා එහෙම කිව්වේ වැරදිලා ද කියලා. දැන් ඔබතුමන්ලා කියනවා, මේ සම්බන්ධයෙන් විපක්ෂයේ කවුරුවත් කථා කරන්නේ නැහැ කියලා. කථා කරන්න දෙයක් නැහැ. මේක නවත්වන්න. අපි මේවාට සහයෝගය දෙන්නේ නැහැ නේ. මේක නවත්වන්න අවශ්‍ය කටයුතු කරන්න. හැබැයි, මේක ගැන කථා කර කර ඔබතුමන්ලාගේ නොහැකියාව වහන්න එපා.

අද වනවිට අපේ රටේ ආර්ථික වර්ධන වේගය පල්ලෙහාට බැහැලා තිබෙන්නේ. රනිල් වික්‍රමසිංහ මහත්මයා, වට්ටලා තිබුණු ආර්ථික වර්ධන වේගය සියයට 5.2 දක්වා ඉහළට අරගෙන දුන්නා. අද ඒක පල්ලෙහාට බැහැලා. ඒක තිබෙන්න ඕනෑ සියයට 5.86ක. මොකද, වැටුණු රටක තමයි මේ ආර්ථික වර්ධන වේගය පෙන්වන්නේ, දියුණු රටක නොවෙයි. බිම් මට්ටමේ ඉඳලා පල්ලෙහාට එන්නේ. ආර්ථික වර්ධන වේගය සියයට 6ක, සියයට 6.5ක තිබෙන්න ඕනෑ, මේ ණය ඉස්සරහට ගෙවා ගන්න නම්. එහෙම වෙලා නැහැ. ඇමෙරිකාවෙන් කියනවා, ලංකාවට යන්න එපා, Marxist රටක් කියලා. ඔබතුමන්ලාගේ ළඟින්ම ඉන්නවා ජූලි වන්ග් කියන මෙරට ඇමෙරිකානු තානාපතිතුමිය. ඒ පැත්තෙන් ඉන්දියාව,- *[බාධා කිරීමක්]* මෙරට ඇමෙරිකානු තානාපතිතුමිය. ඔබතුමන්ලාගේ හරිනි අමරසූරිය මැතිතුමියගේ හොඳම යාළුවා. අනුර කුමාර දිසානායක මහත්මයාගේ හොඳම යාළුවා, මෙරට ඇමෙරිකානු තානාපතිතුමිය. කොච්චර ගිහිල්ලා කථා කළත් චීනයත් නැති වුණා; ඉන්දියාවත් නැති වුණා; ඇමෙරිකාවත් නැති වුණා. දැන් අන්තිමට වුණේ මොකක්ද?

ඇත්තටම මම මහජන ආරක්ෂාව භාර ඇමතිවරයාගේ අතීතය ගැන දන්නේ නැහැ. එතුමා කොහේද කියලා දන්නේ නැහැ. හැබැයි, එතුමා නිකම් ආනන්ද විජේපාල නොවෙයි. එතුමා මේ රටේ මහජන ආරක්ෂාව භාර ඇමතිවරයා. නමුත්, ඔබතුමා හැම වෙලාවේදීම අනාගන්නවා. ඔබතුමාගේ බොක්කේ තිබුණු එක ඊයේ තමයි එළියට ආවේ. ඒක ඉතාම කැතයි. ඒ කරපු ප්‍රකාශය ඔබතුමාට වටින්නේ නැහැ. ඔබතුමාට කරන්න තිබුණේ ඒක නොවෙයි. නලින්ද ඇමතිතුමා දෙතුන් වතාවක් ඔබතුමාව බේරා ගත්තා. සහෝදර නලින්ද ඇමතිතුමාට දේශපාලනය සම්බන්ධයෙන් යම්කිසි දැනුමක් තිබෙනවා. මම හිතන විධියට, ඒ සම්බන්ධයෙන් එතුමාට තිබෙන approach එකත් වෙනස් වෙන්න ඇති. ඔබතුමාගේ තනිකර වැරදි approach එකක් තිබෙන්නේ. ඔබතුමා ඊයේ ආපු ගමන්ම මේ සභාවේදී කිව්වේ මොකක්ද? ඒ මනුස්සයාගේ ලේ ටික වෙලෙන්නත් ඉස්සෙල්ලා අන්වර්ථ නාමයකුත් කිව්වා. ඔබතුමාගේ නම සම්බන්ධයෙනුත් ප්‍රශ්නයක් තිබෙනවා. අපි ඒවා කථා කරන්නේ නැහැ. ඒවා කථා කරන්න ඕනෑ නැහැ. ඒ විධියට කථා කරන්න වටින්නේ නැහැ. හැබැයි, ඔබතුමා මඩ ගහලා, ඒ මනුස්සයා අපරාධකාරයෙක් කරලා කථා කළා. අනුර කුමාර දිසානායක මහත්මයා කලින් කරපු කථාවක් මම දාන්නම්. අපරාධකාරයෝ මරනකොට එතුමා මොකක්ද කිව්වේ? "ඒ ඉතිහාසය වැඩක් නැහැ, මේ රටේ මිනිස්සු මරන්න කාටවත් අයිතියක් නැහැ" කියලා එතුමා කිව්වා. නමුත්, ඔබතුමා මොකක්ද කළේ? ඔබතුමා අපරාධ ලෝකයට තල්ලුවක් දුන්නා. ඔබතුමා කියන්නේ "අපරාධකරුවෙක් මරපු එක හරි, ඉතිරි ටිකත් මරපල්ලා" කියලා. එතුමා පළාත් පාලන ආයතනයක සභාපතිවරයෙක්. ඒ මනුස්සයා මැරුණා. ඔබතුමන්ලා ඔක්කොම දේශපාලනය අමතක කරන්නකෝ. අපි ඔක්කොම දේශපාලනය අමතක කරමුකෝ. ඔබතුමන්ලා ජේවීපී කළා, 1988 - 1989 කාලයේ. ඒ කාලයේ මිනිස්සු ඝාතනය වුණා. ජේවීපී එකෙන් රටේම මිනිස්සු මරන්න පටන් ගත්තා. හැබැයි අපි කියා තිබෙනවාද හමුදාවෙන් හරි, පොලීසියෙන් හරි ඒ මිනිස්සු මරපුවාම, "ජේවීපී එකේ මිනී මරපු අය මරපුවාම හරි" කියලා? ඒකට නීතියක් තිබෙනවා. ඒ නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ සඳහා පොලීසියට යන්න ඕනෑ, අධිකරණයට යන්න ඕනෑ, අධිකරණයෙන් ඔප්පු වෙන්න ඕනෑ. ඒ අනුව දඬුවම් දෙන්න ඕනෑ. ඔබතුමන්ලා සිද්ධියක් වුණු ගමන්ම ඒක නිකම්ම ලඝු කරනවා නේ. ඔබතුමන්ලා කියන විධියට විරුද්ධ පක්ෂයේ කෙනෙක් නම් පාතාලයට සම්බන්ධයි, ආණ්ඩු පක්ෂයේ කෙනෙක් නම් හා පැටියෙක් නැත්නම් පූස් පැටියෙක්. ආණ්ඩු පක්ෂයේ කෙනෙකුගේ ගෙදර ගේට්ටුවට වෙඩි තියනකොට, ඒ කෙනා පාතාලයට සම්බන්ධයි කියන්නේ නැහැ. මුහුද අයිනේ ඇවිද ගෙන ගිය දෙන්නෙක් අතුරුදහන් වුණාම කියන්නේ නැහැ, ඒ අය පාතාලයට සම්බන්ධයි කියලා. *[බාධා කිරීමක්]* මේ ඇමතිතුමා දන්නවා. ඒ, ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ.

මේ පුද්ගලයා සභාපති වුණාට පස්සේ කප්පම් ගැනීමේ ක්‍රියාවලට විරුද්ධව විශාල කාර්යභාරයක් කරගෙන යනකොට ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. එතුමා ඒ සම්බන්ධයෙන් ලියුමක් ලියා තිබෙනවා පොලිසීය භාර ඇමතිතුමාට. ගරු ඇමතිතුමනි, ඔබතුමා වගකීම භාරගන්න. මෙතැනින් පටන් ගන්න. එතුමාට තිබෙන නඩු ගැන නොවෙයි ඔබතුමාට කථා කරන්න තිබෙන්නේ. ඔබතුමා වග කියන ඇමතිවරයෙක්. ඔබතුමා නිකම් විජේපාල නොවෙයි නේ. ඔබතුමා මේ රටේ මිලියන 22කගේ ආරක්ෂක අමාත්‍යවරයා. සෞඛ්‍ය ඇමති වශයෙන් නලින්ද ජයතිස්ස ඇමතිතුමාට තේරෙනවා නම් ඒක හරියට කියන්න, ඔබතුමාට බැරිද?

ඒ මනුස්සයා කවුද, කොහේද, ඒ වත ගොත වැඩක් නැහැ, ඒ මනුස්සයා මරලා තිබෙනවා. ඒ සම්බන්ධව මොනවාද කිව්වේ? අඩුම ගානේ ඔබතුමාට මාසයක් බලන්න තිබුණා. ඔබතුමා ආපු ගමන් ඒ මනුස්සයා ගැන මොකක්ද කිව්වේ? මේ රටේ ජනතාවට පණිවුඩයක් දුන්නා, මේ වාගේ ප්‍රශ්න මේ මනුස්සයාට තිබෙනවා, මරපු එක හොඳයි, මේ වාගේ ප්‍රශ්න තිබෙන ඉතිරි උනුත් මරපල්ලා කියලා. 1988-89 කාලයේ ඔබතුමා කොහේ හිටියාද කියලා මම දන්නේ නැහැ. ඒවා ආපහු එළියට එනවා. නැත්නම් ඇමතිවරයකු වශයෙන් ඔබතුමාට එහෙම ප්‍රකාශ කරන්න බැහැ. නලින්ද ජයතිස්ස ඇමතිතුමා පසුගිය සැරේත් ඔබතුමා නිවැරදි කළා. මට මතකයි, අර උසාවිය ඇතුළේ වෙඩි තියපු සිද්ධියේදී එතුමා කිව්වා, "එහෙම නොවෙයි. අපරාධයක් වෙලා තිබෙනවා. ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙනවා" කියලා. හැබැයි, ඔබතුමා මොකක්ද කිව්වේ? ආරක්ෂාව සම්බන්ධයෙන් රටේ කිසිම ප්‍රශ්නයක් නැහැ කිව්වා. එහෙම කිව්වේ, උසාවිය මැදට ඇවිල්ලා වෙඩි තියලා යද්දී. ඒ වාගේම අනුර කුමාර මහත්තයා ජනාධිපතිවරයා වෙන්න කලින් ඇහුවා, "දවල් වරුවේ ඇවිල්ලා මහ මඟ වෙඩි තියලා යනවා, මේ මොන රටක්ද?" කියලා. ඒවා ඔබතුමන්ලාගේ කාලයේත් වෙන කොට ඔබතුමන්ලා ඒවා සුද්ද කරනවා.

ගරු ඇමතිතුමනි, මම මේ ලියුම ඔබතුමාට ඉදිරිපත් කරන්නම්. ඔබතුමා මෙහි වගකීම භාර ගන්න. මේ සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම ඔබතුමාට සහ පොලිස්පතිතුමාට නීතියෙන් දඬුවම් කරන්න ඕනෑ. මේ ගැන දැනුවත් කරලා තිබුණු නිසා ඔබතුමන්ලා මේකට වගකියන්න ඕනෑ. නලින්ද ජයතිස්ස ඇමතිතුමා සමඟ මම ඊයේ එකඟ වුණේ නැහැ. මෙහෙන් ලොකු

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

සද්දයක් එද්දී එතුමා කිව්වා, අපි හොයලා බලලා කවුද කියන්නම් කියලා. හොයලා බලලා කවුද කියලා හරියන්නේ නැහැ. ඒවා නොවෙයි අපරාධවලට දෙන උත්තර. ජේවීපී එකේ කවුද මැරුවේ කියලා හොයලා බලලා කියලා හරියන්නේ නැහැ. ජේවීපී එකේ සහෝදරයෝ කවුරු හරි නීති විරෝධී ලෙස හමුදාවෙන් මැරුවා නම්, පොලිසියෙන් මැරුවා නම්, ආණ්ඩුවෙන් මැරුවා නම්, හොයලා බලලා ගෙදරට ගිහිල්ලා කියලා හරියන්නේ නැහැ මෙන්න මෙයා තමයි මැරුවේ කියලා. එහෙම හරියන්නේ නැහැ. ඒක නොවෙයි පිළියම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ ලියුම කියවන්නම්. ඒ සභාපතිවරයා තමයි මේ ලියුම ලියා තිබෙන්නේ. "මා අධිකරණයට පැමිණෙන අවස්ථාවේදී හෝ ප්‍රාදේශීය සභාවෙන් පිටත්ව යන අවස්ථාවේදී මා ඝාතනය කිරීමට ඔවුන් උත්සාහ දරන බවට මාහට විශ්වාසයක් පවතින බවට සැල කර සිටිමි. ප්‍රධාන පාතාල කල්ලි ගණනාවක් මාහට තර්ජන එල්ල කර ඇත. ඔවුන් මා ඝාතනය කරන බවට පවසා ඇති බවට මාහට විශ්වාසදායක තොරතුරු ලැබී ඇති බව සැල කර සිටිමි. සමාජ මාධ්‍ය ඔස්සේ මාගේ ජීවිතයට තර්ජනයක් වන ආකාරයේ..." කියලා නමක් සඳහන් කර තිබෙනවා. මම ඒ නම කියන්නේ නැහැ. මම ඒ අය වීරයෝ කරන්නේ නැහැ. පාතාලයේ අය, කුඩුකාරයන් කියන්නේ අද රටේම ඉන්න ජනප්‍රිය චරිත. ඔබතුමන්ලා කරපු වැඩ තමයි මේවා. දේශපාලන වාසියක් ලබා ගන්න, ආණ්ඩුවේ අකර්මණ්‍යතාව වහ ගන්න ඔබතුමන්ලා කොහේවත් නැති ඒවා අදිනවා. ඇදලා ඔවුන්ට දෙනවා ලොකු mileage එකක්. මම ඔවුන්ගේ නමවත් කියන්නේ නැහැ.

ඊළඟට, සඳහන් කර තිබෙනවා, "...මේ සියලු තත්ත්වයන් හේතුවෙන් මාගේ ජීවිතයට බරපතළ තර්ජනයක් එල්ල වී ඇති බවට මාහට දැනෙන බැවින්ද, ඒ බවට දැන් දැන් සිදු වන තර්ජන ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය වී ඇති බැවින් ද මාගේ ජීවිත ආරක්ෂාව සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරන මෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිමි" කියලා.

ගරු ඇමතිතුමනි, මෙය පොලිස්පතිතුමාට ලියා තිබෙන්නේ. මෙහෙම ලිව්වාටත් පසුව මොකක්ද කරලා තිබෙන්නේ? ඇමතිතුමාට කියන්න තිබුණා "අපට මෙහෙම ලියුමක් ලියා තිබුණා. එතුමාගේ ජීවිතය සම්බන්ධයෙන් මෙහෙම ප්‍රශ්නයක් තිබුණා, අපි ආරක්ෂාව දෙන්න උත්සාහ කළා" කියලා. ඔබතුමන්ලා කිව්වා නේ assessment එකක් කරනවා කියලා. මම දන්නේ නැහැ, ඊයේත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් assessment එකක් කළා ලු. ඒ, අපට ලැබෙන හොර තොරතුරු. අපට කියන්න, කොහේද ඒ assessment එක කළේ, මොනවාද වුණේ කියලා. මන්ත්‍රීවරුන්ට තිබෙන තර්ජන මොනවාද කියලා අපි දන්නේ නැහැ. මම ඒවා ගැන කථා කරන්නෙත් නැහැ. අපි නම් මැරෙන්න බයත් නැහැ. තියන කෙනෙක් එක පාරින් දෙපාරින් තියලා ඉවර කළත් කථා කරන්න අපි බය නැහැ. අපි අවුරුද්දක් විතර හිටියා ඔබතුමන්ලාගේ -මේ ආණ්ඩුවේ- ක්‍රියාකාරකම් බලාගෙන. මොකද, හරි නැහැ නේ, අසාධාරණයි නේ එකපාරටම අපි ගහන්න පටන් ගත්තොත්.

ගරු ඇමතිතුමනි, වගකියන ඇමතිවරයකු ලෙස ඔබතුමාට ඊයේ ඇවිල්ලා කියන්න තිබුණා, "මෙහෙම ලියුමක් ලැබී තිබෙනවා. මේ සිදුවීම ඉතාම ම්ලේච්ඡයි. මේ සම්බන්ධයෙන් අපි පරීක්ෂණ පවත්වනවා, ඒ වරදකරුවන් අපි උසාවියට ඉදිරිපත් කර දඬුවම් දෙනවා" කියලා. ඔබතුමා මෙතැනදී ජේවීවී එකේ සාමාජිකයෙක් නොවෙයි.

ඒ නිසා ඔබතුමාගේ ක්‍රියාකලාපය ඉතාම නුසුදුසුයි. කවුද කිව්වා කදිර්ගාමර් මහත්තයා ගැන. කදිර්ගාමර් මහත්තයලා හිටියා නම් මෙහෙම කථා කරන්නේ නැහැ. ඇත්තටම ලජ්ජාසහගතයි මේ කරපු කාර්යය. මම ආණ්ඩුවෙන් බලාපොරොත්තු වුණා මීට වැඩිය,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා. කථාව අවසන් කරන්න.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Just give me one more minute, Sir.

ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, ඔබතුමන්ලාට යම් කිසි දේශපාලන දැනුමක් තිබෙනවා. නමුත් මේක දේශපාලනය නොවෙයි. මේ රටේ මේ සිද්ධ වෙන ඝාතන රැල්ල නවතින්නේ නැහැ, ගරු ඇමතිතුමා. අද මම කිව්වා කියලා ලියලා තියා ගන්න. ඝාතන තව තවත් වැඩි වෙනවා, ඉස්සරහට. Underworld gangs අතර සිදුවීම් තව තවත් පටන් ගන්නවා. ඒ චණ්ඩි රටේ වීරයෝ බවට පත් කරන්න එපා. මේ කුඩුකාරයෝ,- *[බාධා කිරීමක්]* දන්නේ ඔබතුමන්ලා-*[බාධා කිරීමක්]* මේ දත්ත තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් ඒ ගැන විවාදයක් කරන්න එපා. ඔබතුමා කථාව අවසන් කරන්න.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මේ අවුරුද්දේ වෙඩි තැබීම් 100යි. මොනවාද කියන්නේ? *[බාධා කිරීමක්]* වත ගොත හොයලා බලන්න, කොහෙන්ද ආවේ කියලා. බලන්න, ඉතිහාසය. මේ අවුරුද්දේ වෙඩි තැබීම් 100යි. Century එකක් ගැහුවා. ඔබතුමන්ලා මොනවා කියලා ද ආවේ? මේවා මාසයෙන් නවත්වන්න තිබුණා නේ. මේ යන පිළිවෙත බලන්න. ටියුෂන් දෙන්න බංකුව අරගෙන එන්න කිව්වා. අද ටියුෂන් දෙන්න වෙන්නේ ඔබතුමන්ලාට, ගෙදර-*[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බාධා කරන්න එපා, ගරු මන්ත්‍රීවරුනි. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, ඉක්මනින් කථාව අවසන් කරන්න. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ආණ්ඩුවේ ඉන්නේ ඔයගොල්ලන්නේ. අපේ නොවෙයි නේ ආණ්ඩුව. ජනාධිපති, අගමැති ඔයගොල්ලන්ගේ නේ. අපි කියන්නේ වෙන දේ. අපි ඔයගොල්ලන්ගේ හැකියාව දන්නවා. අපි කිව්වා, ඔබතුමන්ලාට සුපර්මාර්කට් එකක් භාර දීලා බලන්න කියලා. දැන් ඒක රටේ මිනිස්සුන්ට පෙනෙනවා. කෙරුවාව අපි දන්නවා. යන පාරත් අපි දන්නවා. ඔහොම සද්ද කරයි. සද්ද කරලා ප්‍රතිඵල ලැබෙනකොට ලැබෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ,- *[බාධා කිරීමක්]* කියන්න, කියන්න. අපි ඒවාට බය නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමන්ලා බාධා කරන්න එපා. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

ඉතිහාසය ගත්තොත් එහෙම,- *[බාධා කිරීමක්]* නිකම් මේ අනම් මනම් ගැන කථා කරනවා. ගරු ඇමතිතුමා, මෙහෙම ගියොත් මේ රටට විශාල විනාශයක් වෙනවා. අනුර කුමාර මහත්තයා ජනාධිපතිකම අතහරියි තව අවුරුදු දෙක තුනක් යනකොට. මෙතුමන්ලා ඇමතිකම් අතහරියි. හැබැයි, මේ රට යනවා අගාධයට. ණය ගෙවා ගන්න බැරි, අපරාධ ලෝකයක් බවට මේ රට ඉදිරි අනාගතයේ පත් වෙනවා මෙහෙම ගියොත් කියන ඒ වැදගත් පණිවුඩය මේ වැදගත් ඇමතිවරුන්ට මම දෙන්න කැමැතියි. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු වෛද්‍ය නලින්ද ජයතිස්ස අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.06]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මේ මොහොතේ පවතින ජාතික ව්‍යසනයෙන් රට බේරා ගැනීම වෙනුවෙන් මුළු රටම එකට එකතු කරගෙන යම් වැඩ පිළිවෙළකට ප්‍රවිෂ්ට වෙන්න ආණ්ඩුව කටයුතු කරමින් සිටින වෙලාවේ තමයි මේ පාර්ලිමේන්තු විවාදය පැවැත්වෙන්නේ. මේ මත්ද්‍රව්‍ය උවදුර කොතරම් ජාතික ව්‍යසනයක්ද කියන එක පෙන්වා දීම සඳහා මම සංඛ්‍යාලේඛන කිහිපයක් ඉදිරිපත් කරන්නම්. මේ අවුරුද්දේ ජනවාරි 01වැනි දා ඉඳලා ඔක්තෝබර් 21 දක්වා අපේ පොලීසිය ඇතුළු ආරක්ෂක අංශ විසින් අත්අඩංගුවට ගැනීම් සහ නඩු පැවරීම් කීයක් කරලා තිබෙනවාද කියලා මම කියන්නම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට බාධා කරන්න වන එකට සමාවෙන්න. ඔබතුමාට විනාඩි 6ක කාලයක් පමණයි ලැබෙන්නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගතවුණු මාස දහයහමාරකට ආසන්න කාලය තුළදී හෙරොයින් කිලෝග්‍රෑම් 1,481.4ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා, නඩු 58,130ක් ගොනු කරලා තිබෙනවා. කොකේන් කිලෝග්‍රෑම් 32.6ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා, නඩු 91ක් ගොනු කරලා තිබෙනවා. අයිස් කිලෝග්‍රෑම් 2,539.5ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා, නඩු 66,593ක් ගොනු කරලා තිබෙනවා. ගංජා සහ කේරළ ගංජා කිලෝග්‍රෑම් 14,419.4ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා, නඩු 58,724ක් ගොනු කරලා තිබෙනවා. මත් පෙති තිස්ලක්ෂයක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා, මත් කරල් ලක්ෂ 6ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ සම්බන්ධ නඩු 2,808ක් පවරලා තිබෙනවා. වෙනත් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 575ක් අත්අඩංගුවට අරගෙන නඩු පැවරීම් 1,474ක් කරලා තිබෙනවා. ඒ අනුව සමස්ත වශයෙන් නඩු පැවරීම් 187,872ක් කරලා තිබෙනවා. මම මේ ඉදිරිපත් කළේ පසුගිය මාස දහයහමාරට පොලීසිය ඇතුළු ආරක්ෂක අංශ විසින් අත්අඩංගුවට ගන්නා ලද මත්ද්‍රව්‍ය ප්‍රමාණ පිළිබඳවයි. ඔබතුමන්ලාට මේකෙන්ම තේරෙන්නට ඕනෑ, මත්ද්‍රව්‍ය ජාවාරම මේ රටේ කොතරම් දුරකට බරපතළ ලෙස විහිදිලා, පැතිරිලා, කාවැදිලා තිබෙනවාද කියන එක.

මත්ද්‍රව්‍ය ජාවාරම නිකම් සිද්ධ වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකට පාතාලය සම්බන්ධයි, ඒකට කළු දේශපාලනය සම්බන්ධයි, ඒකට කළු සල්ලි සම්බන්ධයි. මේ හතරම එකිනෙකට වෙන් කළ නොහැකි ලෙසට බැඳිලා තමයි දශක ගණනාවක් තිස්සේ පැවතුණේ. ඒක මේ රටේ පුරවැසියන්ගේ ජීවිතවලට තර්ජනයක්. අන්න ඒ තර්ජනයෙන් පුරවැසියා මුදාගෙන මේ රට ලස්සන, නිදහස් තැනක් බවට පත් කරන්නට සහ කොයි පැත්තෙන් දේශපාලනය කළත්, කොයි පැත්තෙන් ව්‍යාපාර කළත්, කුමන වෘත්තියක යෙදුණත්, ඕනෑම කෙනෙකුට නිදහසේ, සාමකාමීව ජීවත් වෙන්න පුළුවන් වාතාවරණයක් හැදීම සඳහා තමයි පාතාලය, මත්ද්‍රව්‍ය ජාවාරම මැඩ පැවැත්වීම සඳහා ආණ්ඩුව කටයුතු කරමින් ඉන්නේ. ඒ නිසා තමයි මේ රටේ පමණක් නොවෙයි, ඉන්දුනීසියානු පොලීසිය, නේපාල පොලීසිය, ඉන්දියානු පොලීසිය, තායිලන්ත පොලීසිය ඇතුළු ජාත්‍යන්තර පොලීසියේ ද සහාය ඇතිව මේ රටේ ප්‍රබල යැයි සැලකෙන, පාතාල නායකයන් අතර ඉහළින්ම සිටින පුද්ගලයන් හඹා ගොස්, ඔවුන් අත්අඩංගුවට අරගෙන රටට ගෙනෙන්නේ. පාතාලය මර්දනය කිරීමට අපට ඇත්ත වුවමනාවක් තිබෙන නිසා සහ ඒක රටේ අවශ්‍යතාවක් නිසා තමයි අපි මේවා කරන්නේ. ඉතින්, මෙවැනි අවස්ථාවකදී අපි බලාපොරොත්තු වෙන්නේ මොකක්ද?

විශේෂයෙන් මම ගරු සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා ප්‍රමුඛ සජබ කණ්ඩායමට කාරණයක් කියන්න කැමැතියි. ඔබතුමන්ලාට අප සමඟ ආර්ථිකය සම්බන්ධ විවිධාකාරයේ විවේචන තිබෙන්න පුළුවන්. අපි කරන ප්‍රතිසංස්කරණ පිළිබඳව, අපි ආර්ථිකය හසුරුවන විධිය පිළිබඳ විවේචන තිබෙන්නට පුළුවන්. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා දැන් මේ සභාවේ ඉන්නවාද දන්නේ නැහැ. එහෙම විවේචන තිබුණාට ප්‍රශ්නයක් නැහැ. නමුත්, මේ ප්‍රශ්නයේදී අපි දෙපැත්තක කියලා එකක් නැහැ. මත්ද්‍රව්‍ය ජාවාරම, පාතාලය, කළු දේශපාලනය, කළු සල්ලි ඇතුළු මේ කළු වළල්ල අඩපණ කරන්න, මර්දනය කරන්න මේ පාර්ලිමේන්තුවේ 225දෙනාම එකට එකතු වෙන්නට ඕනෑ. නමුත් සමහර කෙනෙකුට එකතු වෙන්න බැරි වෙන්නට පුළුවන්, අතීතයේදී ඔවුන් මේ පාතාලයට, මත්ද්‍රව්‍ය ජාවාරමට, කළු දේශපාලනයට සම්බන්ධ වීම නිසා. සමහර කෙනෙකුට මේ පරීක්ෂණ කරගෙන යනකොට ඇත්ත බයක් ඇති වෙන්න පුළුවන්, ඒ අයගේ මොන තරම් දේවල් පරීක්ෂකයන් සොයා ගනිවිද කියලා. අපි ඒ අය පොඩ්ඩක් අතහැරියොත්, මම හිතනවා මේ සජබ කණ්ඩායමට මේකට එකතු වෙන්න පුළුවන් කියලා. අපි කවුරුවත් සජබයේ මන්ත්‍රීතුමන්ලාට කුඩු සම්බන්ධ චෝදනා එල්ල කරන්නේ නැහැ නේ, පාතාලය සම්බන්ධ චෝදනා එල්ල කරන්නේ නැහැ නේ. හැබැයි ඔබතුමන්ලා මේ විවාදයේදී රටට වැදගත් ආදර්ශයක් ලබා දෙන විධියට "ඔව්, අපි ඔක්කොම එකතු වෙලා මේ කුඩු ජාවාරම, පාතාලය මර්දනය කරමු" කියලා එක මිටකට එකතු වෙන්නේ නැත්තේ ඇයි? කොහොම කිව්වත්, ඔබතුමන්ලා උදේ ඉඳලාම කථා කරන්නේ පාතාලය, කුඩු ජාවාරම මර්දනය කිරීමට රටක් හැටියට එකට පෙළ ගැහෙන්න ඕනෑ අවස්ථාව අඩපණ කිරීමේ අරමුණින් කියන එක හොඳටම පැහැදිලියි. ඒ වෙනුවෙන් විවිධ දේවල් කියනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මම තවත් විනාඩි 2ක් ගන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එම අවස්ථාව අඩපණ කිරීමේ අදහසක් තිබෙන බව හොඳටම පැහැදිලියි, ඔබතුමන්ලා කියන කථාවලින්. අනෙක් පැත්තෙන්, පසුගිය කාලය පුරාම මේ විෂය සම්බන්ධයෙන් ආණ්ඩුව වෙනුවෙන් කටයුතු කරන ඉදිරි පෙළ ප්‍රමුඛයන්, එනම් අපේ මහජන ආරක්ෂක ඇමතිතුමා, මහජන ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා, පොලිස්පතිතුමා, පොලිස් ප්‍රධානීන්, අනෙක් පැත්තෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු කණ්ඩායම ඉලක්ක කරගෙන ඔබතුමන්ලා පාර්ලිමේන්තුවේදීත්, සමාජ මාධ්‍යවලිනුත්, සමහර යූ ටියුබ් නාළිකාවලිනුත් පහර පිට පහර එල්ල කළා. ඔය ප්‍රහාරය මේ වෙලාවේ මට එල්ල කරන්නේ නැහැ නේ. එහෙම නැත්නම් වෙනත් කාටවත් එල්ල කරන්නේ නැහැ නේ. ඇයි මෙතුමන්ලාම ඉලක්ක කරගෙන ඔය ප්‍රහාරය එල්ල කරන්නේ? ඒ වෙන මොකුත් නිසා නොවෙයි. මේ වෙලාවේ පාතාලය, කුඩු ජාවාරම මර්දනය කිරීම සඳහා වගකීම භාර අරගෙන ජීවිත තර්ජනය පැත්තක තියලා රට වෙනුවෙන් වැඩ කරන ඒ කණ්ඩායම අඩපණ කිරීමේ කුමක් හෝ වුවමනාවක් ඔබතුමන්ලාට පවතිනවා. ඔබතුමන්ලා මේ වෙලාවේ කල්පනා කරන්න ඕනෑ මොකක්ද? දැන් ඔබතුමන්ලාගේ ප්‍රාදේශීය මන්ත්‍රීවරයෙක් පාතාලයේ සන්නද්ධ කල්ලි අතර ඇති වෙච්ච ගැටුමේ ගොදුරක් බවට පත් වෙලා තිබෙනවා. අපි එහෙම හිතමුකෝ. ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරයෙක් පාතාලයේ සන්නද්ධ කල්ලි අතර ඇති වී තිබෙන ගැටුමේ ගොදුරක් බවට පත් වෙලා තිබෙනවා. එතකොට ඔබතුමන්ලා කල්පනා කරන්න ඕනෑ කුමක්ද? "අපේ මන්ත්‍රීවරයෙකුටත් මෙහෙම වෙලා තිබෙන නිසා ආණ්ඩුවත් එක්ක එකතු වෙලා මේ රට බේරා ගැනීමේ ජාතික ව්‍යාපාරයට රට වෙනුවෙන් සහාය දීලා අපි ඔක්කොම එකතු වෙලා මේ වෙලාවේ කුඩු, පාතාලය රටින් අතුගාලා දමමු" කියන තැන නේද ඔබතුමන්ලා ඉන්න ඕනෑ?

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මොකක්ද ඔබතුමා කියන්න හදන්නේ? ගොඩක් වෙලාව ගන්න එපා.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, ඔබතුමා හරියට හරි. ඒ සාතනය ගැන ඔබතුමා කියන කාරණය මහජන ආරක්ෂක ඇමතිවරයා කිව්වා නම්, අපි මේ විවාදය ඒ පැත්තට ගෙන යන්නේ නැහැ. ඔබතුමා ඒක තේරුම් ගන්න. ඔබතුමා සාධාරණ වෙන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මහජන ආරක්ෂක ඇමතිවරයා කුමක් හෝ වැරැදිසහගත තොරතුරක් කිව්වා නම්, ඔබතුමන්ලාට ඒක challenge කරන්න පුළුවන්. එතුමා කියපු නඩු ගැන හෝ අත් හිටවපු සිරදඬුවම් ගැන හෝ කවරෙකුට වුව එල්ල වන කවර හෝ චෝදනාවක් අසත්‍ය නම් ඔබතුමන්ලාට challenge කරන්න පුළුවන්. පුද්ගලයා කවුද කියන එක සඳහන් කරන්නේ නැතිවයි මා මෙය කියන්නේ. නමුත් එතුමා කිව්වේ තත්ත්වය මෙන්න මේකයි කියලායි.

මා කියන්නේ මේකයි. ඒවා නොවෙයි මේ වෙලාවේ ප්‍රමුඛස්ථානයට ගත යුතුව තිබෙන්නේ. මේ වැදගත් විවාදයේදී ඇත්තටම සජබ කණ්ඩායමට තමන්ගේ දේශපාලනය ඉහළට ඔසවා ගන්න අවස්ථාවක් තිබුණා, "Right, අපි ඔක්කොම එකතු වෙලා මේ ජාතික ව්‍යාපාරය දියත් කරලා කුඩු, පාතාලය රටින් මුලිනුපුටා දමමු" කියලා. හැබැයි, මොකක් හෝ හේතුවක් මත එහෙම වුණේ නැහැ. එහෙම නොකරන්නේ ප්‍රාදේශීය සභාවක බලය පිහිටුවාගන්න කාත් එක්ක හරි එල්ලෙන්න හදන නිසාද, එහෙම නැත්නම් ඉදිරියේදී ආණ්ඩුව වට්ටන්න මොකක් හරි ඒකාබද්ධ සන්ධානයක් හදාගන්න ඕනෑ කියලා හිතන නිසාවත්ද? එහෙම නැත්නම් සමහර විට සමුපකාර ඡන්දයකදී ඔක්කොම එකතු වෙලා බලය පිහිටුවා ගන්න යන අදහසක් තිබෙන නිසාවත්ද කියලා මට තේරෙන්නේ නැහැ. එවැනි නිකම් ළඟ ආසාවක් නිසා ද එහෙම උදවු නොකරන්නේ කියලා මට හරියටම තේරෙන්නේ නැහැ. මේක ඔබතුමන්ලාට චෝදනාවක් එල්ල වෙලා නැති කරුණක්. ආර්ථිකය සම්බන්ධයෙන් නම් චෝදනා එල්ල වෙලා තිබෙනවා. හැබැයි, ඔබතුමන්ලාට චෝදනාවක් එල්ල වෙලා නැති මේ වාගේ කරුණකදී, ඔක්කොම එකතු වෙලා හයිය දීලා යන්න ඕනෑ ගමනකදී මේ තරම් අඳබාල ලෙස හැසිරෙන්නේ ඇයි කියන එක මට තේරෙන්නේ නැහැ. මම මේ වෙලාවේ යළිත් වතාවක් සියලුදෙනාට මේ ආරාධනාව කරන්න කැමැතියි. අපි දන්නවා, මේ රටේ කළු දේශපාලනය, කළු සල්ලි, මත්ද්‍රව්‍ය, පාතාලය ඇතුළු මේ කළු චක්‍රය අඩපණ කිරීම සඳහා විශාල කණ්ඩායමක් තමන්ගේ ජීවිතවලට, තමන්ගේ දරුවන්ගේ ජීවිතවලට, තමන්ගේ පවුල්වල අයගේ ජීවිතවලට තිබෙන අවදානම නොතකා කටයුතු කරමින් සිටින බව. ඒ කටයුතු අඩපණ කරන්න එපා. අපි ඔක්කොම එකතු වෙලා මේ ලැබුණු අවස්ථාවේ පාතාලය, මත්ද්‍රව්‍ය ජාවාරම මර්දනය කරමු කියා ඉල්ලා සිටිමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.

[பி.ப. 5.15]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றையதினம் இச்சபையில் போதைப்பொருள் கடத்தல் மற்றும் ஒழுங்கமைக்கப்பட்ட குற்றச் செயல்களை ஒழிப் பதற்கான தேசிய வேலைத்திட்டம் மற்றும் சட்டரீதியான கட்டமைப்பை வலுப்படுத்தல் சம்பந்தமான ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதம் நடைபெற்றுக்கொண்டு இருக்கின்றது.

போதைப்பொருளை ஒழித்தல் மற்றும் ஒழுங்கமைக் கப்பட்ட குற்றச் செயல்களை இல்லாமல் செய்வதற்கான தேசிய வேலைத்திட்டம் மற்றும் சட்டரீதியான கட்டமைப்பை வலுப்படுத்துதல் என்ற விடயத்தை உண்மையிலேயே இந்த நாட்டிலுள்ள நேர்மறையாகச் சிந்திக்கக்கூடிய எவரும் மறுதலித்து அல்லது எதிர்த்துப் பேசமாட்டார்களென நினைக்கின்றேன். இந்த நாட்டைப் பாதித்திருக்கின்ற, பலவீனப்படுத்தி இருக்கின்ற, அதல பாதாளத்தில் வீழ்த்தி யிருக்கின்ற விடயங்கள் எவையென்றால், போதைவஸ்தும் பாதாள உலகக் கோஷ்டியினரின் செயற்பாடுகளும்தான். இவை இந்த நாட்டில் ஜனநாயகத்தையும் சட்டவாட்சியையும் நீதியையும் கேள்விக்குட்படுத்துகின்ற விடயங்களாகக் காணப்படுகின்றன. போதைப்பொருளை முழுமையாக ஒழித்தல், பாதாள உலகக் குழுவினரின் செயற்பாடுகளை ஸ்தம்பிக்க வைத்தல் என்பன இந்த நாட்டை அழகான நாடாக மாற்றுவதற்குரிய விடயங்களாக இருக்கின்றபடியால், இவற்றை நிச்சயமாக ஆளுங்கட்சி, எதிர்க்கட்சி உறுப்பினர்கள் ஏகமனதாக ஆதரிக்கவேண்டிய தேவை இருக்கின்றது. இந்த நாடு பாதிக்கப்படுவதற்கு போதைவஸ்துப் பாவனை மற்றும் பாதாள உலகக் குழுவினரின் செயற்பாடுகள் மிக முக்கிய காரணிகளாக இருக்கின்றன.

இந்த நாட்டில் 'குடு தெரேசா' என்ற ஒருவர் இருந்தார். அவருக்கு எதிராக நீதிமன்றத்தில் மேல் நீதிமன்ற நீதிபதி சரத் அம்பேபிட்டிய அவர்கள் தீர்ப்பு வழங்க இருந்தபோது, அந்தக் காலத்தில் பாதாள உலக தாதாவாக இருந்த 'பொட்ட' நௌபர் ஒரு கருத்தைச் சொல்லியிருந்தார். அதாவது, "குறித்த தீர்ப்பு அளிக்கப்படுமாக இருந்தால், உமக்கு நாங்கள் வீதியில் வைத்து மரணதண்டனை வழங்குவோம்" என்று அந்த நீதிபதிக்கு கொலை அச்சுறுத்தல் வழங்கியிருந்தார். அதற்குப் பயப்படாமல், 'குடு தெரேசா' என்று சொல்லப்படுகின்ற பெண்ணுக்கு உரிய தண்டனையை விதித்துவிட்டு, வீதிக்குச் சென்றபோது அந்த நீதிபதி சுட்டுக் கொலை செய்யப்பட்டார். அப்படியென்றால், நீதிபதிகள்கூட இந்த விடயத்தில் சுதந்திரமாகத் தீர்ப்பளிக்க முடியாத அளவுக்கு மரண அச்சுறுத்தலுக்கு உள்ளாக்கப்பட்டு மரணத்தைத் தழுவ வேண்டிய உள்ளது.

அந்த வகையில், போதைவஸ்து வியாபாரமும் பாதாள உலக செயற்பாடுகளும் சகல துறைகளையும் ஆட்டிப்படைக் கின்ற மிக மோசமான நாசகார செயற்பாடுகளாக அமைந்திருக் கின்றன. எனவே, அச்செயற்பாடுகளை ஒழிப்பதற்குச் சகலரும் துரிதமாகச் செயற்பட வேண்டும். இந்தோனேசியாவில் இருந்துகொண்டு, காத்மாண்டுவில் இருந்துகொண்டு, டுபாயில் இருந்துகொண்டு இப்படிப்பட்ட பாதாள உலகச் செயற்பாடு களில் ஈடுபடுகின்றவர்களையும் உள்நாட்டில் செயற்படு கின்றவர்களையும் கட்டுப்படுத்துவதற்காக எடுக்கப்படுகின்ற நடவடிக்கைகள் ஒட்டுமொத்தமாக நல்ல விடயங்கள் என்பதைக் கூறிக் கொள்கின்றேன். கறுப்பு இராச்சியம், கறுப்புச் சட்டம், கறுப்பு வணிகம், கறுப்புப் பணத்தை ஆதரிக்கின்ற ஒரு சிலர் இருக்கிறார்கள். அவ்வாறானவர்கள் அரசியல்வாதிகளிலும் இருக்கிறார்கள்; காவல்துறையினரிலும் இருக்கிறார்கள். அதனால்தான் இதனை ஒழிக்க முடியாத நிலைமை காணப்படுகின்றது. எமது நாட்டில் ஒழுக்கத்தையும் பண்பாட்டையும் நாடு தொடர்பான நல்ல அபிப்பிராயத்தையும் கட்டியெழுப்ப வேண்டுமாக இருந்தால், நிச்சயமாக பாதாள உலகக் கோஷ்டியினரையும் போதைவஸ்தையும் நாட்டி லிருந்து முழுமையாக ஒழிக்க வேண்டும். அந்தச் செயற்பாட்டை நாங்கள் மனப்பூர்வமாக ஆதரிக்கின்றோம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Please give me one minute, Sir.

இன்றைய விவாதத் தலைப்புக்கு அப்பாற்பட்ட முக்கிய மானதொரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். ஓய்வூதிய சங்கத்தின் ஒரு பிரதிநிதியாக இருக்கின்ற ஜின் பண்டார அவர்களும் மட்டக்களப்பில் இருக்கின்ற ஓய்வூதிய சங்க உறுப்பினர்களும் தந்த ஒரு விடயத்தை இங்கு முன்வைக்கின்றேன். ஓய்வூதியத்தில் பாரிய முரண்பாடுகள் காணப்படுகின்றன. 1997இல் பி.சி. பெரேரா அவர்கள் சொன்ன விடயத்தில், ஆசிரியர் சேவை, அதிபர் சேவையை ஏற்படுத்தும்போது, அதில் முரண்பாடுகளை ஏற்படுத்தக்கூடிய ஒரு விடயம் இருந்தது. அதனைச் சரி செய்வதற்காக சுபோதினி ஆணைக்குழு ஒரு திட்டத்தை முன்வைத்திருந்தது. இருந்தாலும், அந்த முரண்பாடுகள் நீக்கப்படவில்லை. கௌரவ பிரதீபன் மற்றும் பிரதி அமைச்சராக இருக்கின்ற மஹிந்த ஜயசிங்ஹ போன்றவர்கள் இந்த முரண்பாடுகளை நீக்கி, அவர்களுக்கு முரண்பாடு அற்ற ஓய்வூதியத்தைப் பெற்றுத்தருவதாக அப்போது கூறியிருந்தார்கள். எனவே, அந்தச் செயற்பாட்டை முன்னெடுக்குமாறு ஜின் பண்டார மற்றும் ஓய்வூதிய அமைப்பினர் கேட்டுக் கொள்கின்றார்கள் என்பதைக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දිනයේ වැඩ කටයුතු අවසන් වන තෙක් කාලය ලබා ගැනීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගයාන් ජානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.21]

ගරු ගයාන් ජනක මහතා
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ මේ රටින් තුරන් කිරීම පිළිබඳවත්, කාලීන වශයෙන් එහි තිබෙන වැදගත්කම පිළිබඳවත්, ඒ වෙනුවෙන් නව ජාතික ව්‍යාපාරයක් ගොඩනැඟීම සම්බන්ධවත්, මේ රටේ සියලු ජනතාව ඒක රාශි කරගෙන ඒ වෙනුවෙන් මහා දැවැන්ත මෙහෙයුමක්, කාර්යභාරයක් ඉටු කිරීම සඳහා වන යෝජනාවක් තමයි අද මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා වෙමින් තිබෙන්නේ. ඒ ඉතා වැදගත් මාතෘකාව කොහොමද මේ රටේ උන්නතිය සඳහා, මේ රටේ ඉදිරි ගමන සඳහා පාවිච්චි කර ගන්නේ කියන සංවාදය පෝෂණය කරනවා වෙනුවට, අපි හැමදාමත් දැක්කා වාගේ සජබය ප්‍රමුඛ විපක්ෂය ඉතාම කලබලකාරී හැසිරීමක් තමයි මේ විවාදය පුරාම ඒ පැත්තෙන් ප්‍රදර්ශනය කළේ. අපට හිතා ගන්නත් බැහැ, ඇයි මේ කළු ඇඳගෙන ආවේ කියලා. මොකක්ද අපි මේ කියන්නේ, මොකක්ද රටේ පවතින අවශ්‍යතාව, රට කොතැනටද ඇවිල්ලා තිබෙන්නේ කියන කාරණයට අවධානය යොමු කරන්නේ නැහැ. මේවා වළක්වා ගැනීම සඳහා අපි සාමූහික උත්සාහයක් දරමු කියලා නිතර නිතර සිදු වන මේ සිදුවීම් එක්ක සමාජය තුළ කථාබහක් හදා ගන්නකොට, පාර්ලිමේන්තුවට එවැනි යෝජනාවක් ගෙනෙන්න සිද්ධ වෙලා තිබෙනකොට, අපට තේරුම් ගන්න බැරි කාරණය තමයි ඇයි මේ කළු ඇඳගෙන ඇවිල්ලා තිබෙන්නේ කියන එක. අර හැමදාමත් කලබලකාරී ලෙස හැසිරිලා මේ සභාවේ කටයුතු කඩාකප්පල් කරනවා වාගේ අදත් ඇයි මෙහෙම හැසිරෙන්නේ කියන ප්‍රශ්නය තමයි අපි ඉදිරියේ තිබෙන්නේ, අංක එකට. හැබැයි, ඒ අය කලබල වුණාට අපි කලබල වෙලා නැහැ. අපි ඉතාම සංවේදී වෙලා තිබෙනවා, මේ ප්‍රශ්නය සම්බන්ධයෙන්. ඇයි ඒ? ඒ වෙන මොකක්වත් නිසා නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මට කලින් කථා කළ නලින්ද ජයතිස්ස ඇමතිතුමාත් මේක කිව්වා. 2025 ජනවාරි 1වැනි දා සිට මේ දක්වා අත්අඩංගුවට අරගෙන තිබෙනවා, හෙරොයින් කිලෝග්‍රෑම් 1,481ක්; කොකේන් කිලෝග්‍රෑම් 32ක්; හෂිෂ් කිලෝග්‍රෑම් 552කට වැඩි ප්‍රමාණයක්; ගංජා කිලෝග්‍රෑම් 14,610ක්; අයිස් කිලෝග්‍රෑම් 2,539ක්. මේ හැම එකක්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිලෝ ගණන්. කල්පනා කරලා බලන්න. මත් පෙති සහ මත් කරල් අත්අඩංගුවට අරගෙන තිබෙනවා, 3,595,332ක්. ඒ විතරක් නොවෙයි. නීති විරෝධී ආයුධ 1,947ක් අද දවස වන විට අත්අඩංගුවට අරගෙන තිබෙනවා. මේ රට කොහේටද යන්නේ? මේ රට කොහේටද ගමන් කරමින් තිබෙන්නේ? මේක තමයි අද අපේ රට ඉස්සරහ තිබෙන, අපි ඉස්සරහ තිබෙන ප්‍රධානම අභියෝගය බවට පත්වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි කවුරුත් එකතු වෙලා, සාමූහික ප්‍රයත්නයක් යොදලා, මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ මේ රටින් තුරන් කරන්න, පරාජයට පත් කරන්න කටයුතු කරන්න ඕනෑ වෙලාවක් මේක. අන්න එවැනි තත්ත්වයක මේ රට තිබෙන්නේ. එවැනි අවශ්‍යතාවක් තමයි රට පුරා මේ දැනෙමින් තිබෙන්නේ, මේ දවස ගානේ සිද්ධ වෙන, අපට දැනෙමින් තිබෙන මේ හැම දෙයක් එක්කම. ඊයේ සිද්ධිය ගත්තත්, අපි ඒවා මේ රටින් සහමුලින්ම අතුගාලා දමන්න අධිෂ්ඨාන කර ගන්න ඕනෑ. නමුත් අපි දන්නවා, අපි මොන විධියකට ඒ සම්බන්ධව සංවේදී වුණත්, ඒ සඳහා අපට මොන තරම් අවශ්‍යතාවක් තිබුණත්, ඒවාත් එක්ක සම්බන්ධ අයට, ඒවාට කොතැනකින් හරි සම්බන්ධයක් තිබෙන අයට කලබල වෙන්නේ නැතුව ඉන්න බැරි බව. මොකද අපි දන්නවා, අපේ රටේ ඉතිහාසය පුරාම මේ මත්ද්‍රව්‍ය, මේ සංවිධානාත්මක අපරාධ පිටුපස දේශපාලනයක්, දේශපාලන සම්බන්ධයක් තිබුණු බව. අපි දන්නවා, මේ හැමෝටම නැති වුණත්, මේවා පිටුපස හිටපු, කොහෙන් හරි මේවාට සම්බන්ධයක් තිබෙන, මේ රටේ පසුගිය කාලයේ ආණ්ඩු කරපු අය, මේවායේ බලපෑම තමන් වෙත එනකොට, කලබල වෙලා කටයුතු කරන්න සිද්ධ වෙනවාය කියන එක. ඒ නිසා ඒ කලබලවීම ගැන අපි කලබල වෙන්නේ නැහැ. නමුත්, අපේ රට හමුවේ ඉතාම සංවේදී කාරණයක් තිබෙනවා. ඒ කාරණය ගැන ජනතාව දැනුවත් කරමින් ඒක පරාජයට පත් කරන්න අපට මහා දැවැන්ත කාර්යභාරයක් කරන්න ඉතුරු වෙලා තිබෙනවාය කියන එක ආණ්ඩුවක් විධියට අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක අනාගතය කියන්නේ, රටේ තරුණ පරම්පරාව, දරු දැරියන්. අපේ රටේ ඒ තරුණ පරම්පරාවට, දරු දැරියන්ට අද සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? ඔවුන්ට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ මොන තත්ත්වයකටද? දෙමාපියන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම නිසා අධ්‍යාපනය අහිමිවුණු, අධ්‍යාපනය කඩාකප්පල් කර ගත්ත, ජීවිතය අහිමි වුණු දරුවන්ගේ විලාපය අද අපට ඇහෙන්න තිබෙනවා. ඒ විතරක් නොවෙයි, දරුවන් මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීම නිසා, දෙමාපියන්ට අද මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන පීඩනය කොතරම්ද? දරුවන්ගේ පහරදීම්වලින්, දරුවන්ගේ නොසලකා හැරීම්වලින්, ඔවුන්ට දිගින් දිගටම කරන පහරදීම් නිසා අද දෙමාපියන් මොන තරම් අසරණභාවයට පත් වෙලා තිබෙනවාද? ඒ නිසා අද සමාජය වෙළා ගත්ත මහා දැවැන්ත ව්‍යසනයක් බවට මේ මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ පත් වෙලා තිබෙනවා. අද දරුවෙක් විශ්වවිද්‍යාලයකට යවනවා නම්, ඒ විශ්වවිද්‍යාලයට යවන එක පිළිබඳව දෙවරක් හිතන්න වෙන මට්ටමට විශ්වවිද්‍යාල තුළ මේ මත්ද්‍රව්‍ය ව්‍යසනය ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. අද අපේ සමාජය උසස් ශ්‍රේණි යැයි, උසස් වෘත්තීන් යැයි හඳුනා ගත්ත, සලකන, වෛද්‍ය වෘත්තිය තුළ, නීතිඥ වෘත්තිය තුළ, ආගමික සංස්ථාව තුළ, පොදු මහත් සමාජය තුළ මහා බරපතළ ව්‍යසනයක් බවට මෙය පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒක ඉතා කඩිනමින් මේ රටින් තුරන් කරන්න, ඉතාම ඉක්මනින් මේ රටින් අතුගාලා දමන්න අපට ඒකාබද්ධව මහා දැවැන්ත කාර්යභාරයක් කරන්න තිබෙන වෙලාවක් තමයි මේ උදා වෙලා තිබෙන්නේ. ඒ නිසා මත්ද්‍රව්‍ය සැපයුම අඩාළ කරන්න, මත්ද්‍රව්‍ය ඉල්ලුම අඩු කරන්න, මේ මොහොත වෙනකොටත් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා ඉන්න මේ රටේ තරුණ පරම්පරාව, මේ රටේ දුවා දරුවන් පුනරුත්ථාපනය කරන්න තමයි මේ වෙලාවේ වැඩිපුර අවධානය යොමු කරලා කටයුතු කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

ගරු ගයාන් ජනක මහතා
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසන් කරන්නම්.

අපි අද ආණ්ඩුවක් ලෙස ඒ අභියෝගය හරියට තේරුම් අරගෙන, ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා සෑම දිස්ත්‍රික්කයකටම පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් පිහිටුවන ගමන්ම, මුළු මහත් රටක් ඒකාබද්ධ කරගෙන අපේ ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බිම් මට්ටම දක්වා දිවෙන මහා දැවැන්ත සංවිධාන යන්ත්‍රණයක්, රාජ්‍ය යන්ත්‍රණයත් සකස් කර ගනිමින්, ආගමික නායකයන් සම්බන්ධ කර ගනිමින්, සිවිල් පුරවැසියන් සම්බන්ධ කර ගනිමින් මහා දැවැන්ත මෙහෙයුමක් කරන්න සූදානම් වෙලා ඉන්නවා. ඒ සඳහා මේ රටේ සියලු ජනතාවට, ආගමික නායකයන්ට, සිවිල් සංවිධාන නියෝජිතයන්ට යන සියලුදෙනාට ආරාධනා කරමින්, අපි ඔක්කොම එකතු වෙලා මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ මේ රටින් තුරන් කරමු, ඒ සඳහා අපි ඔක්කොම එකතු වෙලා වැඩ කරමු කියන යෝජනාව කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.29]

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටට ඉතා වැදගත් කටයුත්තක් වන සංවිධානාත්මක අපරාධ හා මත්ද්‍රව්‍ය මේ රටින් තුරන් කිරීම සඳහා ගරු ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමට වේලාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ලෝකයේ තිබෙන එකම පවුල මිනිස් පවුල, ලෝකයේ තිබෙන එකම ජාතිය මිනිස් ජාතිය කියලා. ඒ වාගේම, අපේ දේශපාලන ගුරුවරයා වෙච්ච කාල් මාක්ස් සහෝදරයාත් කියනවා, ලෝකයේ තිබෙන එකම පවුල මිනිස් පවුල, ලෝකයේ තිබෙන එකම ජාතිය මිනිස් ජාතිය කියලා. හැබැයි, අපි දන්නා විධියට ලාංකීය පවුල, ලාංකීය ජාතිය මෙතෙක්දුරක් මිලේච්ඡත්වයේ දිශාවට ඇදගෙන ආවා.

ඒ නිසා ගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ වර්තමාන ආණ්ඩුවට, අපට වුවමනා වෙලා තිබෙනවා, මේ රට මනුෂ්‍යත්වයේ දිශාවට ගෙනියන්න. ඒ මනුෂ්‍යත්වයේ දිශාවට මේ රට ගෙනියන්න තමයි අද අපි මේ කටයුතු කරන්නේ. මේ රට ආර්ථික වශයෙන් බිඳ වැටිටුවා. ඒ විතරක් නොවෙයි. ඉන්දියන් සාගරයේ මුතු ඇටය, පෙරදිග ධාන්‍යාගාරය නමින් හැඳින් වූ අපේ රටට ඉන්දියාවේ දුගී මගී යාචකයෝ එකතු කරන සල්ලිවලින් කන්න දෙන තැනට ඇදවැටිටුවා. ඉන්දියන් සාගරයේ මුතු ඇටය, පෙරදිග ධාන්‍යාගාරය වූ මේ රට එතැනට පත් කළා. ඒ විතරක් නොවෙයි. ඉන්දියන් සාගරයේ මුතු ඇටය, පෙරදිග ධාන්‍යාගාරය, කුඩු පාරාදීසයකට, පාතාලයට, ස්ත්‍රී දූෂකයන් ඉන්න දැවැන්ත ව්‍යසනයකට ඇද වටිටලා දැම්මා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේවා වැඩි වුණා, 1980 සහ 1990 දශකයේ. අපි පාසල් යන කාලයේ පාතාලය ගැන අහලා නැහැ. ඕනෑ නම් ගමක පොඩි රණ්ඩුවක් වුණා. පොඩි morale එකක් තිබෙන මිනිහෙක් හිටියා, ගමක. රටේත් එහෙමයි. 1977න් පස්සේ බල්ලෝ මරලා හරි සල්ලි හොයනවා කියන ආර්ථික system එකක් මේ රටට හඳුන්වා දුන්නා. 1977න් පස්සේ සමාජ ආර්ථිකය විතරක් නොවෙයි, සමස්ත සමාජයම උඩු යටිකුරු වෙන්න ගත්තා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අද වන විට මුළු රටක් ව්‍යසනයට පත් වෙලා තිබෙනවා. 2024 ජනවාරි - ජූනි දක්වා මුල් භාගයේ 43,714දෙනෙක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. ඒකෙන් 10,052ක් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්. ඒකේ විශේෂයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ තමයි, වයස අවුරුදු 20ත් 29ත් අතර තරුණ තරුණියන් 10,052ක් සිටීම. සාමාන්‍යයෙන් ශ්‍රම පැය විධියට ගත්තොත්, ශ්‍රම පැය 80,416ක් හිර ගෙවල්වල හිර කර තිබෙනවා. මෙන්න මේ රටට සිදු වෙලා තිබෙන ව්‍යසනය! 80 දශකය ගත්තොත්, දැන් අවුරුදු 30ක්, 40ක් විතර ගතවෙලා. මේවා පටන් ගත්තේ 70, 80 දශකවල. ඒ කාලය තුළ අපි ආණ්ඩුව කරපු විධියට තමයි මේ මාස 9 ඇතුළත විපක්ෂයේ මන්ත්‍රීවරු එකට එකතු වෙලා කෑගහන්නේ.

අපි ඇත්තටම හිතුවා විපක්ෂය කියන්නේ සජබය විතරයි කියලා. නැහැ, දැන් ඇත්තටම සියලුදෙනා එකට එකතු වෙලා. අද යූඑන්පී ද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ද, පෙරමුණ ද, මාධ්‍ය ආයතනයක් හාර මන්ත්‍රීතුමාගේ පෙරමුණ ද කියන ඒ සියල්ලම එක පෙරමුණකට එකතු වෙලා ඉන්නවා. අද මේ ලාංකීය මාතාව - මුළු රටම - බේරා ගන්න යෝජනාවක් ගෙනාපු වෙලාවේ අද ඒගොල්ලන් එක මීටට එකතු වෙලා කළු ඇඳගෙන ඇවිල්ලා තිබෙනවා. ඒකත් හොඳයි. ඇත්තටම ඒකත් අපි බලාපොරොත්තු වන එකක්. මොකද, ඉතිහාසය පුරා මේ රට මෙතැනට ඇද වැටිටුවේ මේ කළු දේශපාලනය. සුදු ඇඳගෙන හිටියාට යටින් කළු දේශපාලනය කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගහට පොත්ත වාගේ පාතාලයට, කුඩුවලට දේශපාලනය සම්බන්ධයි. දේශපාලනය නැතිව ඒක ඇදෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ දකුණේ තමයි පාතාලය අංක එකට තිබෙන්නේ. හම්බන්තොට ගත්තොත් ජූලම්පිටියේ අමරෙලා, චණ්ඩි මල්ලිලා, මිද්දෙනියේ කජ්ජලා, මනම්පේරිලා, මනෝජ් මෙන්ඩිස්ලා, විනී කාරියවසම්ලා හැදුවේ කවුද? ඒ අය හැදුණේ මහින්ද රාජපක්ෂ යුගයේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසය ගත්තොත් සොත්ති උපාලිලා, ගෝනවල සුනිල්ලා, බැද්දගානේ සංජීවලා හිටියා. ඒගොල්ලන් අපට මතකයි. අද ඒ ක්‍රියා දකුණට ව්‍යාප්ත වෙලා. දකුණේ පාතාල ක්‍රියාකාරකම්, කුඩු අංක එකට ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මතකයි අපි පළාත් සභාවේ හිටපු කාලයේ දකුණු පළාතේ පාතාල නායකයෙක් හික්කඩුව ප්‍රාදේශීය සභාවේ සභික ධුරයට දාලා තිබුණා. යූ.ඩී.ජී. ආරියතිලක කියන්නේ ගාල්ල දිස්ත්‍රික්කයේ හිටපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කළ හොඳ, කීර්තිමත් නායකයෙක්. අපි ආරියතිලක මැතිතුමාගෙන් ඇහුවා, "ඇයි මැතිතුමනි, මේ වාගේ මිනිහෙක් ලැයිස්තුවට දාලා තිබෙන්නේ?" කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

එතුමා කිව්වා, "නිශාන්ත මන්ත්‍රීතුමා, නලින් මන්ත්‍රීතුමා, කරන්න දෙයක් නැහැ. එයා දාලා තිබෙන්නේ අපේ නායකයා" කියලා. නායකයා කියන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයා. මනෝජ් මෙන්ඩිස් කියන්නේ ස්ත්‍රී දූෂකයෙක්. ඒ වාගේම පාතාල නායකයෙක්, කුඩු ජාවාරම්කාරයෙක්. යූඑන්පී, ශ්‍රී ලංකා, සජබය කියන පක්ෂවල හැම ලැයිස්තුවකම පාතාලයේ මිනිහෙක්, මැරයෙක්, අපරාධකාරයෙක් ඉන්නවා කියලා අපි කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒගොල්ලෝ ඒ අය ඇතිදැඩි කරලා, පෝෂණය කරලා, මේ රට බිඳ වටිටලා අද නිකම් සුදනෝ වෙන්න හදනවා.

මම මීට වැඩිය කාලය ගන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ලාංකේය පවුල, ඒ කියන්නේ, සිංහල, දෙමළ, මුස්ලිම්, මැලේ හා බර්ගර් කියන සියලු ජාතීන් එක මීටකට එකතු වෙලා අපේ මවු බිම මුදා ගැනීමේ මෙහෙයුමට ඉදිරිපත් වෙන්න ඕනෑ. මේ රටට ආදරය කරන ලාංකේය පවුලේ සියලු පුරවැසියන්ට අපි ආරාධනා කරනවා, මත්ද්‍රව්‍ය අවසන් කිරීමේ අවසන් සටනට එකතු වෙන්න කියලා. එම ආරාධනාව කරමින්, මට වෙලාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.38]

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා.

ඊයේ උදේ වරුවේ වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති, ලසන්ත වික්‍රමසේකර මහත්මයා ඝාතනය වුණා. කොහොමද එතුමා ඝාතනයට ලක් වුණේ? ඔහු සභාපති ධුරයේ රාජකාරි කිරීම සඳහා නිල කාමරයේ සිටියදී, කිසි කරදරයක් නැතුව දෙදෙනෙක් යතුරුපැදියක ඇවිල්ලා වෙඩි තියලා යනවා. ඊට පස්සේ මේ පාර්ලිමේන්තුවේදී අපේ මහජන ආරක්ෂක ඇමතිතුමා ඒ ඝාතනය වුණු පුද්ගලයාගේ චරිතය ඝාතනය කරනවා. ඒක හරිද? ඒක හරි නැහැ. ඔබතුමන්ලා අද ගෙනැල්ලා තිබෙනවා නේ, යෝජනාවක්. මොනවාද ඒකේ කියන්නේ? "සමාජය වඩා සුරක්ෂිත ස්ථානයක් බවට පත් කිරීමට සියලු පුරවැසියන්ට ද වගකීමක් සහ යුතුකමක් තිබේ" කියලා ඒකෙන් කියනවා. සමාජය වඩා සුරක්ෂිත ස්ථානයක් බවට පත් කරන්න මෙවැනි යෝජනාවක් ගෙනෙනවා. හැබැයි, මේ රටේ මහජන නියෝජිතයෙක් රාජකාරි කරන නිල කාමරයේ කිසිම ආරක්ෂාවක් නැහැ. ඒකට සුරක්ෂිතභාවයක් ලබා දීලා නැහැ. කාගේද ඒ වගකීම? ඒක සමාජයේ වගකීම. ඒ ප්‍රධාන වගකීම තිබෙන්නේ කාටද? රජයට. රජයේ වගකීම තිබෙන්නේ කාටද? නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට. එතකොට පාර්ලිමේන්තුව එයට සම්බන්ධ වෙන්නේ කොහොමද? පාර්ලිමේන්තුව සම්බන්ධ වන්නේ නීතිය ක්‍රියාත්මක කිරීමේ ඇමතිතුමා හරහා. ඒ නිසා එතුමා ඒ කරපු දේ සම්පූර්ණයෙන් වැරදියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. යම්කිසි ඝාතනයක් වුණොත්, ඒක මිනී මැරුමක් නම්, ඒ මිනී මැරුම පිටුපස තිබෙන චේතනාව ඉස්මතු කර ගැනීම සඳහා පමණක් ඒ චරිතය අදාළ කර ගන්න පුළුවන්. ඒක තමයි නීතිය. වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ මරණය සිදු කළ අවස්ථාවේ චේතනා 10ක් මුල් වී තිබිය හැකියි, දේශපාලන චේතනාවක්, එහෙමත් නැත්නම් ඔහු ගනුදෙනු කරන ලද අනෙකුත් හේතු නිසා ඇති වුණු චේතනාවක්, පවුල් ප්‍රශ්නයක් සම්බන්ධ චේතනාවක් ආදී වශයෙන්. ගරු ඇමතිතුමනි, ඔබතුමා කොහොමද පූර්ව නිගමනයකට එන්නේ, ඒ මහත්මයා - මරණයට පත් වුණු ඒ පුද්ගලයා - ජීවතුන් අතර සිටි කාලයේදී යම් යම් අපරාධවලට සම්බන්ධ කල්ලි සමඟ කරපු ගනුදෙනුවලට පළිගැනීමක් හැටියට මේ ඝාතනය වුණා කියලා? ඒක වැරදියි. එහෙම කරන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නලින්ද ජයතිස්ස ඇමතිතුමා ඉතා හොඳ කථාවක් කරලා කිව්වා, අපි එකට යමු කියලා. ඒ ගැන අපට කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි ඝාතනයට ලක් වුණු පුද්ගලයාගේ චරිතයත් ඝාතනය කරමින් මහජන ආරක්ෂක ඇමතිතුමා කරන ලද කථාව හැන්සාඩ් වාර්තාවෙන් කපා හරින්න ඕනෑ. ඒක ඉස්සෙල්ලාම කරන්න ඕනෑ. කථානායකතුමා සභාවේ ඉන්න අවස්ථාවක මම ඒක අහන්නම්. ඒක වැරදියි, එහෙම කරන්න එපා, ඒක අශීලාචාරයි. එහෙම කරන්න අපට කිසිම අයිතියක් නැහැ. මොන වර්ගයේ මනුස්සයෙක් වුණත් මැරුණාට පස්සේ අවසන් ගෞරවයක් දක්වනවා නේ. එල්ලුම් ගහට නියම වුණු පුද්ගලයකු පවා එල්ලුම් ගහට යවලා, ඒ දඬුවම ලබා දුන්නාට පස්සේ ඒ මනුස්සයා පිළිබඳව එහෙම ජරා කථාවක්, අශීලාචාර කථාවක්, පහත් ගණයේ කථාවක් කරන්නේ නැහැ.

මේ ඝාතනයට ලක් වෙලා තිබෙන්නේ කවුද? මහජන නියෝජිතයෙක්. මේ විධියට වරප්‍රසාදවලට මුවාවෙලා එතුමාගේ චරිතය ඝාතනය කළොත් එතුමාගේ පවුලේ සාමාජිකයන්ට සිදු වන වේදනාව ගැන ටිකක්වත් හිතලා බැලුවාද? ඒ මහත්මයාට ඡන්දය දීලා වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිකම ලබා දුන් ඡන්ද දායකයන්ට සිදු වන අවනම්බුව ගැනවත් හිතලා බැලුවාද? ඔබතුමන්ලා දිගින් දිගටම අහනවා, ඇයි අපි කළු ඇඳගෙන ඇවිල්ලා ඉන්නේ කියලා. ඊයේ සිදු වුණේ මිනී මැරුමක්. ඒ පුද්ගලයාගේ මරණයට පසුබිම් වුණු ප්‍රධාන හේතුව තවමත් නීතිය ඉදිරියේ අනාවරණ වෙලා නැහැ. ඔහු කුමන ගණයේ පුද්ගලයෙක් වුණත්, අපි වාගේම මහජන නියෝජිතයෙක්. මහ දවාලේ තමන්ගේ නිල කාර්යය සිදු කරමින් සිටින අවස්ථාවේ මහජන නියෝජිතයකු ඝාතනය කළාම, ඒකට අපගේ ශෝකය දක්වන්න අපි කළු ඇඳගෙන ඇවිල්ලා සිටිනවා.

ඒ විතරක් නොවෙයි. ඒක තවත් තීව්‍ර වුණේ ඒ ඝාතනයට ලක් වුණු පුද්ගලයාගේ චරිතය ගරු මහජන ආරක්ෂක ඇමතිතුමා විසින් ඝාතනය කිරීමයි. ඒ සම්බන්ධයෙන් ඔබතුමා ඒ පවුලෙන්, ඒ ඡන්ද දායකයන්ගෙන් සමාව ගත යුතුයි. ඒ වාගේම අනිවාර්යයෙන් ඒ කොටස හැන්සාඩ් වාර්තාවෙන් කපා හරින්න ඕනෑය කියා අවධාරණය කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.43]

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ නැති කිරීමේ නෛතික රාමුව පිළිබඳව අද දින ආණ්ඩු පක්ෂය විසින් ගෙනා සභාව කල්තැබීමේ යෝජනාවේදී කළ කථා අහගෙන සිටියදීත්, ඊයේ විවාදයට ලක් කළ මාතෘකාව කුමක් වුණත්, ඊයේ පැවති විවාදයේදීත් දිගින් දිගටම වැඩිපුර සාකච්ඡාවට බඳුන් වූ කාරණය වුණේ ඊයේ දවසේ ඛේදවාචකයක් වූ වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ ඝාතන සිද්ධියයි. අද උදේ කථා වුණා, මේක ලංකා ඉතිහාසයට එක් වූ කළු පැල්ලමක් කියලා. ඔව්, ලංකා ඉතිහාසයේ එවැනි කළු පැල්ලම් ගණනාවක් තිබෙනවා. ඕනෑ නම් කාට හරි මේකත් එහෙම එකක් කියලා කියන්න පුළුවන්. මොකද, මේක ටිකක් කළු රාජ්‍යයක්. එහෙම තමයි මේ රාජ්‍යය ඉස්සරහට ගියේ. අපේ ජාතික ආරක්ෂාව අනතුරේ කියලාත් අද කිව්වා. ඒ සියල්ල තිබියදී, පළමුවෙන්ම මම එතුමාගේ ඝාතනය ගැන කනගාටු වෙනවා සහ එතුමාගේ පවුලේ සියලුදෙනාට ශෝකය පළ කරනවා. අපි හිතනවා, ලසන්ත වික්‍රමසේකර වුණත්, "මිදිගම ලසා" වුණත්, කවුරු වුණත්, කවුරු කොහොම හැඳින්වූවත් ලංකාවේ කිසිම තරුණයෙකුට, ලංකාවේ කිසිම කෙනෙකුට එවැනි ඝාතනයක් හිමි නොවිය යුතුයි, එවැනි ඉරණමක් අත් නොවිය යුතුයි, මිනිසුන් ලෙස අපි ඒකට විරුද්ධ විය යුතුයි කියලා. ඒවා නැති කරන්න තමයි අපි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ.

අද වාගේම ඊයේත් මේ ඝාතනය ගැන සාකච්ඡා වුණා. ඊයේ උදේ ඉඳන් පැවති විවාදය ගැන මතක් කරලා බලන්න. දිගින් දිගටම, එකිනෙකාට පස්සේ, එකිනෙකාට පස්සේ, එකිනෙකා බැගින් නැඟිට නැඟිට මොකක්ද ඉදිරිපත් කරපු අදහස? මේ සිද්ධිය ආණ්ඩුව වගකිව යුතු දෙයක් බවට පත් කරලා, ආණ්ඩුවට සම්බන්ධ කරලා කථා කළා. මෙහෙම වුණේ දැන් විතරක්

නොවෙයි. මීට මාස දහයකට විතර කලින් සංවිධානාත්මක අපරාධවලට සම්බන්ධයි කියලා හඳුන්වන "මීගස්ආරේ කජ්ජා" කියන පුද්ගලයා සාතනය වුණු වෙලාවේ මේ පාර්ලිමේන්තුවේ සිටින විපක්ෂයේ මන්ත්‍රීවරුන් නැඟිටලා කිව්වා, මේකට ආණ්ඩුව සම්බන්ධයි, මේගොල්ලන් අරගොල්ලන් එක්ක වැඩ කරලා තිබෙනවා කියලා. මේ විධියට ඒ සිද්ධියටත් ආණ්ඩුව සම්බන්ධ කරන්න මේ අය උත්සාහ කළා. හැබැයි, මොකක්ද වුණේ? මාස කිහිපයකට පස්සේ අපරාධකරුවන් අහු වුණා. ළඟදී අහු වෙච්ච තවත් සැකකරුවෙක් කිව්වා, තුවක්කුව ලබා දුන්නේ ඔහු කියලා. දැන් විපක්ෂයේ අය ශබ්දයක් නැහැ. එහෙම දෙයක් කිව්වා කියලාවත් මේ මහත්වරු කවුරුවත් ඔළුවට ගන්නේවත් නැහැ. හැබැයි ඊයේ නැවත වතාවක් කියන්න පටන් ගත්තා, මේ සාතනයටත් මේ ආණ්ඩුව සම්බන්ධයි කියලා.

මේකේ පරස්පරය ගැන හිතන්න. ඊයේ මහජන ආරක්ෂක ඇමතිතුමා කරපු ප්‍රකාශයක් ගැන විපක්ෂයේ අය අද උදේ ඉඳන් කියනවා. මේ අයට සංවිධානාත්මක අපරාධ ගැන ප්‍රශ්නයකුත් නැහැ, මත්ද්‍රව්‍ය ගැන ප්‍රශ්නයකුත් නැහැ. මම මේ කථා කරන්නේ දෙමළ සන්ධානයේ මන්ත්‍රීවරුන් කිහිපදෙනා ගැන නොවෙයි. ඔවුන් මේ සම්බන්ධව ඉතා පැහැදිලි අදහස් දැක්වීමක් කළා. ඇමතිතුමා කිව්වේ මොකක්ද? ඊයේ ඇමතිතුමා ප්‍රකාශයක් නිකුත් කරන්න මොහොතකට කලින් සමගි ජන බලවේගයේ මහලේකම්තුමා නැඟිටලා මේ සිද්ධිය ආණ්ඩුවට සම්බන්ධ කරලා ඍජුව අදහස් දැක්වුවා. මේ සිද්ධිය ආණ්ඩුවට සම්බන්ධ කරලා, මේ සාතනයට ආණ්ඩුව වගකිව යුතුයි, ආණ්ඩුව තමයි මෙහෙම දේවල් කරන්නේ කියලා අදහස් දක්වලා ඔවුන් පූර්ව නිගමනයකට ඇවිල්ලා තිබුණා, ඒක දේශපාලන සාතනයක් බවට පත් කරලා.

නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා මීට පොඩ්ඩකට කලින් කිව්වා, තවම සාතකයෝ හොයාගෙන නැහැ, එහෙම තත්ත්වයකදී තමයි මේ සභාපතිවරයා සංවිධානාත්මක අපරාධ කල්ලියක සාමාජිකයෙක් බව කියන්නේ, ඒක හරි නරකයි කියලා. එහෙම හිතුවත් ඊයේ මොකක්ද කළේ? ඊයේත් මේ කරුණු හොයාගෙන තිබුණේ නැහැ නේ. හැබැයි, ඊයේ ඒ සිද්ධිය ආණ්ඩුවට සම්බන්ධ කරලා දිගින් දිගටම අදහස් දක්වන්න කටයුතු කළා. වගකිව යුතු ඇමතිවරයෙකු විධියට ඒ අවස්ථාවේ මහජන ආරක්ෂක ඇමතිතුමා නැඟිටලා කිව්වා, "නැහැ, මේක දේශපාලන සාතනයක් කියලා කියන්න එපා. ඒ පුද්ගලයාට මෙහෙම පසුබිමකුත් තිබෙනවා" කියලා. ඒ සාතනය වෙනුවෙන් ශෝකය පළ කරන ගමන්, කනගාටුව ප්‍රකාශ කරන ගමන්, ඒ පිළිබඳ පරීක්ෂණ කරන බව සහ ඒවායේ සාර්ථකත්වය රට හමුවට ගෙනෙන බව තහවුරු කරන බව පවසමින් තමයි එතුමා එහෙම කිව්වේ. ඒ ගැන නේ ඔය කියවන්නේ. ඒක කිව්වේ නැත්නම් මොකක්ද වෙන්නේ? ඒක කිව්වේ නැත්නම් අදත් මහජන ආරක්ෂක ඇමතිතුමාගේ ප්‍රකාශය ගැන නොවෙයි කියවන්නේ. ඒ සාතනය ආණ්ඩුව කළා කියලා අදත් මෙතැන වැලපෙන්න පටන් ගන්නවා. මේ සංවාදය, මේ විවාදය ඒ තැනට ගෙන යන්න එපා.

මේ විවාදය ගෙන ඒමේ අරමුණු වන්නේ, මේ රටේ සංවිධානාත්මක අපරාධ සහ මත්ද්‍රව්‍ය, විෂ මත්ද්‍රව්‍ය ව්‍යසනය නැවැත්වීම, ඒ සම්බන්ධයෙන් ජාතික වැඩ පිළිවෙළක් සකස් කිරීම, දශක ගණනාවක් පහුවෙලා හරි එවැනි ජාතික වැඩසටහනකට මුල පිරීම අලුත් පියවරකින් ඉස්සරට යන්නයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක ආණ්ඩුවේ වැඩක් නොවෙයි, ඒක ජාතික ජන බලවේගයේ වැඩක් නොවෙයි, ඒක අනුර කුමාර දිසානායකගේ වැඩක් නොවෙයි. ඒක මේ රටේ සියලුදෙනාගේ වැඩක්. ඒක මේ රටේ සියලුදෙනා වගකිව යුතු වැඩක්. මේ ව්‍යසනය කියන්නේ, එහෙම ව්‍යසනයක්. මේ රටේ තරුණ තරුණියන් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා තිබෙන විධිය, මේ රටේ ගම්දනව් සිසාරා මේ උවදුර ගිහිල්ලා තිබෙන විධිය බලන්න. පසුගිය දශක ගණනාවක් තිස්සේ රට පුරා මත්ද්‍රව්‍ය ව්‍යාප්ත වෙලා තිබෙනවා. ඒ හරහා අපේ රටේ තරුණ පරපුර විනාශ වෙලා තිබෙනවා. බස් එකක් යන්නේ නැති ගමට කුඩු ටික ගියා. විදුලිය නැති ගමට කුඩු ටික ගියා. මේ රටේ තිබෙන දුෂ්කරතා සියල්ල අබිබවා මත්ද්‍රව්‍ය යන්ත්‍රණය පැතිරුණා. ඒ පැතිරුණු නිසා තමයි මේ රටේ තරුණ තරුණියන් ඒ සඳහා යොමු වුණේ. ඔවුන් ඒකේ වින්දිතයන් බවට පත් වුණා.

කවුරුවත් කුඩු ගහන්න බලාගෙන ඉපදිලා නැහැ. කවුරුවත් අයිස් ගහන්න බලාගෙන ඉපදිලා නැහැ. කවුරුවත් අයිස් ගස්සවන්න බලාගෙන ළමයි හදලා නැහැ. මෙහෙම සංවිධානාත්මක ව්‍යාපාරික ජාලයක් මෙතුමන්ලාගේ පූර්වගාමීන් ඇතුළුව මේ රටේ දේශපාලන යාන්ත්‍රණය අනුග්‍රහයෙන් පැවතුණු නිසා තමයි මේ බේදවාචකය මේ රටට අත්වුණේ. දැන් ටොන් ගණන්වලින් මත්ද්‍රව්‍ය අහුවෙනවා. එම බේදවාචකය තමයි අපි දැන් නැවත ආපසු හැරවිය යුතුව තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි තත්ත්වයක් තුළ අපි ඉටු කරන්නේ ජාතික වගකීමක්. මේක මෙතැනින් එහාට යන්නේ කොතැනකටද? අපි දැන් ඇවිල්ලා තිබෙන්නේ සන්ධිස්ථානයකට. හවස් වරුවේ කොළඹ නගරයේ පාරවල් අයිනේ අවුරුදු 13, 14 ගැහැනු ළමයි, පිරිමි ළමයි මත්ද්‍රව්‍ය හොයාගෙන ඇවිදින හැටි දකින්න පුළුවන් නම්, ඒ තරමට මේ රට කඩා වැටිලා තිබෙනවා නම්, ඈත ගම්දනව්වල පවා කුඩු ටික, අයිස් ටික තිබෙනවා නම් මෙතැනින් එහාට යන්න තැනක් නැහැ. හිරකරුවන් 10,500ක් ඉන්න පුළුවන් හිරගෙවල්වල හිරකරුවන් 35,000ක් ඉන්නවා කියලා බන්ධනාගාර කොමසාරිස්තුමා ඊයේ කියලා තිබෙනවා මම දැක්කා. රටේ තරුණ පරම්පරාව හිරගෙවල්වල පුරවමින්, තරුණ පරම්පරාව සංවිධානාත්මක අපරාධවලට යොමු කරමින් සංවිධානාත්මක පාතාල කල්ලි හදමින් තිබෙනවා. සාතනය වූ සභාපතිතුමා ඇතුළු පිට රට ඉඳන් අල්ලාගෙන ආපු සැකකරුවන් සියලුදෙනාගේ වයස බලන්න. මම හිතන්නේ ඔවුන් මටත් වඩා ළාබාලයි කියලා. මේ රටේ තරුණ පරපුර එක පැත්තකින් කුඩුකාරයෝ, අයිස්කාරයෝ බවට පත් කරලා තිබෙනවා. අනෙක් පැත්තෙන් සංවිධානාත්මක අපරාධකාරයෝ බවට පත් කරලා තිබෙනවා. මේක සංවිධානාත්මක යන්ත්‍රණයක්; මේක දේශපාලනයත් එක්ක බැඳුණු යන්ත්‍රණයක්. අපි හැම දාම කියනවා වාගේ ජාතික ජන බලවේගය ආණ්ඩුව පත් වෙලා බින්දේ, අපි කැඩුවේ අන්න ඒ හුය, ඒ සම්බන්ධය. දැන් අපි ගමනක් යන්න පටන් අරගෙන තිබෙනවා. මේ රටේ කාටවත් කියන්න බැහැ, ජාතික ජන බලවේගය ආණ්ඩුව මත් ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ සම්බන්ධයෙන් සාර්ථකව වැඩ නොකරනවා කියලා. තවම වෙඩි තැබීම් ගැන කියනවා. මම හොයා බැලුවා, පසුගිය මාස 2 තුළ සිදු වූ වෙඩි තැබීම් ගැන. මොකද, දැන් දවසේ වෙඩිල්ල ගැන කිව්වා නේ. පසුගිය මාස 2 ඇතුළත වෙඩි තැබීම් 10ක් පමණයි සිද්ධ වෙලා තිබෙන්නේ. මේක බින්දුව කළ යුතුයි. ඒක ඇත්ත. හැබැයි, අපි පටන් ගත්ත තැනක් තිබෙනවා. ඔබතුමන්ලා මේ රට ගෙනාපු තැනක් තිබෙනවා. එතැන් සිට තමයි ඉස්සරහට යන්නේ. ඒ නිසා මේ බලාපොරොත්තුව ඔබතුමන්ලාට විරුද්ධ දෙයක් නොවෙයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මට තව තත්පර 30ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේක විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට විරුද්ධ දෙයක් නොවෙයි, යම් කිසි පක්ෂයකට විරුද්ධ දෙයක් නොවෙයි. මේක මේ රටේ ජාතික වැඩක්. අපි මේක තේරුම් ගන්නේ එහෙමයි. ගනේමුල්ලේ සංජීව වෙන්න පුළුවන්, ලසන්ත වික්‍රමසේකර වෙන්න පුළුවන්, තවත් කෙනෙක් වෙන්න පුළුවන්, ඒ කවර කෙනෙකුට වුණත් මේ ආකාරයේ බේදජනක මරණයක්, ඉරණමක් අත් නොවෙන්න

[ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා]

තමයි මේ ආණ්ඩුව වැඩ කරන්නේ. සංවිධානාත්මක අපරාධ කල්ලිවලට ඔවුන් ගියා විතරක් නොවෙයි, ඔවුන් දේශපාලනයට පාවිච්චි කළා විතරක් නොවෙයි, අවසානයේ ඔවුන් ඝාතනය වුණාට පසුවත් සැබෑ ඝාතකයන් හොයනවා වෙනුවට උදේ ඉඳලා ආණ්ඩුවට ඇඟිල්ල දිගු කරන එකෙන්ම පෙනෙනවා, තිබෙන වුවමනාව මොකක්ද කියලා. තවදුරටත් එහෙම තැනකට මේ රටේ තරුණයෝ යොමු නොවෙන්න, මේ රටේ තරුණයෝ පාවිච්චි නොවෙන්න, මේ රටේ තරුණ ප්‍රජාවට පැහැදිලි අනාගතයක් හොයන්න තමයි මේ වැඩ පිළිවෙළ හරහා කටයුතු කරන්නේ. එම නිසා ඒ වැඩසටහනට කිසිදු භේදයකින් තොරව ඔබ සියලුදෙනා සහයෝගය දිය යුතුයි කියා අපි විශ්වාස කරනවා. මේ රටේ සියලු මිනිසුන් ඒ සඳහා සහයෝගය ලබා දෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම මෙම වැඩසටහන අනිවාර්යයෙන්ම සාර්ථක කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තූතියි.

එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවීමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.51ට, 2025 ඔක්තෝබර් 24වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.

අප්පොழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 5.51க்கு, பாராளுமன்றம் 2025 ஒக்ரோபர் 24, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 5.51 p.m. until 9.30 a.m. on Friday, 24h October, 2025.

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
WRITTEN ANSWERS TO QUESTIONS

ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම: ස්වේච්ඡා විශ්‍රාම ගැනීම සඳහා ඉල්ලුම් කළ සේවකයින්
இலங்கை மின்சார சபையை மறுசீரமைத்தல்: சுய விருப்பத்தின் அடிப்படையில் ஓய்வுபெறுவதற்குக் கோரியுள்ள ஊழியர்கள்
RESTRUCTURE OF CEYLON ELECTRICITY BOARD: EMPLOYEES APPLIED FOR VOLUNTARY RETIREMENT

1460/2025

1. ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2025 අංක 14 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත සමඟ කියවිය යුතු 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ විධිවිධාන ප්‍රකාරව ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේදී ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීම සඳහා ඉල්ලා ඇති ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීම සඳහා ඉල්ලා නොමැති නම්, ඊට හේතු කවරේද;

(iii) ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමට නියමිත සේවකයන්ට වන්දි ගෙවීම සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iv) එම මුදල සපයා ගැනීමට යෝජිත මූලාශ්‍ර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2025ஆம் ஆண்டின் 14ஆம் இலக்க இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டத்துடன் சேர்த்து வாசிக்கப்பட வேண்டிய 2024ஆம் ஆண்டின் 36ஆம் இலக்க இலங்கை மின்சாரம் சட்டத்தின் ஏற்பாடுகளுக்கு அமைவாக இலங்கை மின்சார சபையை மறுசீரமைக்கும் செயன்முறையின்போது, சுய விருப்பத்தின் அடிப்படையில் ஓய்வுபெறுவதற்குக் கோரியுள்ள இலங்கை மின்சார சபை ஊழியர்களின் எண்ணிக்கை ஒவ்வொரு பதவி வாரியாக வெவ்வேறாக எத்தனை என்பதையும்;

(ii) சுய விருப்பத்தின் அடிப்படையில் ஓய்வுபெறுவதற்குக் கோரவில்லை எனின், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) சுய விருப்பத்தின் அடிப்படையில் ஓய்வுபெறவுள்ள ஊழியர்களுக்கு இழப்பீடுகளைச் செலுத்துவதற்காக ஒதுக்கப்பட்டுள்ள தொகை எவ்வளவு என்பதையும்;

(iv) மேற்படி நிதியைப் பெற்றுக்கொள்வதற்கு உத்தேசிக்கப்பட்டுள்ள நிதி மூலங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) the number employees of the Ceylon Electricity Board who have requested for voluntary retirement as part of the restructuring process of the Ceylon Electricity Board in terms of the provisions of the Sri Lanka Electricity Act, No. 36 of 2024 read with the Sri Lanka Electricity (Amendment) Act, No. 14 of 2025, separately for each post;

(ii) if voluntary retirement has not been applied for, the reasons for that;

(iii) the sum allocated to compensate the employees who are to retire voluntarily; and

(iv) the proposed sources from which the said funds will be raised?

(b) If not, why?

ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

(අ) (i) 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 18 (ඊ) වගන්තියට අනුව, අනුප්‍රාප්තික සමාගම්වලට අනුයුක්ත වීමට සේවකයින් තෝරා ගන්නේද, නැතිද යන වග ලංවිමට දැනුම් දීම සඳහා 2025 ඔක්තෝබර් 27 දක්වා මාස 2ක කාලයක් ලබා දී ඇති අතර එම නිසා ක්‍රියාවලිය තවමත් අවසන් වී නොමැත. එබැවින්, නියමිත සංඛ්‍යාව මෙම අවස්ථාවේ ලබා දිය නොහැක.

(ii) මෙය සේවකයාගේ අභිමතය පරිදි සිදු වන බැවින් නිශ්චිතව හේතු දැක්වීම කළ නොහැක.

(iii) ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමට ඉල්ලා ඇති සේවක සංඛ්‍යාව තවම නිශ්චිත නොමැති බැවින්, මේ මොහොතේ ඒ පිළිබඳ නිවැරදි මුදලක් සඳහන් කළ නොහැක. නමුත් සත්‍ය දත්ත ලැබුණු පසු ඉතා ඉක්මනින් එම මුදල ගණනය කර ඉදිරිපත් කළ හැක.

(iv) 2026 වසරේ පළමු විදුලි අයක්‍රම සංශෝධනයට මෙම ස්වේච්ඡා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ පිරිවැය ඇතුළත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත.

(ආ) අදාළ නොවේ.

(அ) (i) 2024ஆம் ஆண்டின் 36ஆம் இலக்க மின்சாரம் (திருத்தம்) சட்டத்தின் பிரிவு 18(ஊ)இன் பிரகாரம், பதிலீட்டு நிறுவனங்களில் பணியமர்த்தப்படுவதற்கு ஊழியர்களைத் தேர்ந்தெடுக்கலாமா, வேண்டாமா என்பதை இலங்கை மின்சார சபைக்குத் தெரிவிக்க 27 ஒக்ரோபர் 2025 வரை 2 மாத கால அவகாசம் வழங்கப்பட்டுள்ளது, எனவே, செயல்முறை இன்னும் முடிவடையவில்லை. ஆகையால், இந்த நேரத்தில் பரிந்துரைக்கப்பட்ட எண்ணிக்கையை வழங்க முடியாது.

(ii) இது ஊழியரின் விருப்பப்படி இருப்பதால், குறிப்பிட்ட காரணங்களைக் குறிப்பிட முடியாது.

(iii) தன்னார்வ ஓய்வு கோரிய ஊழியர்களின் எண்ணிக்கை இன்னும் உறுதியாகத் தெரியாததால், இந்த நேரத்தில் சரியான எண்ணிக்கையைக் கூற முடியாது. இருப்பினும், உண்மையான தரவு கிடைத்தவுடன், தொகையை மிக விரைவில் கணக்கிட்டு வழங்க முடியும்.

(iv) 2026ஆம் ஆண்டின் முதல் மின் கட்டணத் திருத்தத்தில் இந்த தன்னார்வ ஓய்வூதியத் திட்டத்தின் செலவைச் சேர்க்க அமைச்சரவை ஒப்புதல் பெறப்பட்டுள்ளது.

(ஆ) ஏற்புடையதன்று.

(a) (i) A period of two months has been given until 27th of October, 2025 for the employees to notify the Ceylon Electricity Board whether they opt to be assigned to the successor companies or not, as per Section 18(f) of the Sri Lanka Electricity Act, No. 36 of 2024 and the process is not yet complete. Therefore, it is not possible to provide the figures at this time.

(ii) As this decision lies with the employees, it is unable to specify the reasons.

(iii) Since the exact number of employees who have applied for voluntary retirement has not been finalized, it is not possible to specify the allocation. However, this allocation can be presented after the calculation is done, once the actual data is received.

(iv) The approval of the Cabinet of Ministers has been obtained to incorporate the cost of the voluntary retirement scheme in the first electricity tariff revision in 2026.

(b) Not relevant.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත: පුරවැසි අයිතිවාසිකම් ශක්තිමත් කිරීම
தகவலுக்கான உரிமைச் சட்டம்: பிரசைகளின் உரிமைகளை வலுப்படுத்தல்
RIGHT TO INFORMATION ACT: STRENGTHENING OF CITIZENS' RIGHTS

1461/2025

2. ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ශ්‍රී ලංකා පුරවැසියන් වෙත ලබා දී ඇති හිමිකම් තහවුරු කිරීම සඳහා 2016 වර්ෂයේ සිට මේ දක්වා වෙන් කර ඇති මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත පනත ශක්තිමත් කිරීම සඳහා ඉදිරියේදී ගැනීමට නියමිත පියවර කවරේද;

(iii) ඉහත පනත මඟින් ශ්‍රී ලංකා පුරවැසියන් වෙත ලබා දී ඇති හිමිකම් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ඉදිරියේදී සිදු කිරීමට නියමිත නීතිමය ප්‍රතිසංස්කරණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2017 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට ලැබුණු අභියාචනා සංඛ්‍යාව සහ ඒ අතරින් කොමිෂන් සභාව විසඳා ඇති අභියාචනා සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත අභියාචනා අතරින් මේ දක්වා විභාග කර අවසන් කිරීමට නොහැකි වූ අභියාචනා සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016ஆம் ஆண்டின் 12ஆம் இலக்க தகவலுக்கான உரிமைச் சட்டத்தின்கீழ் இலங்கைப் பிரசைகளுக்கு வழங்கப்பட்டுள்ள உரிமைகளை உறுதிப்படுத்துவதற்காக 2016 ஆம் ஆண்டு தொடக்கம் இதுவரை ஒதுக்கப்பட்டுள்ள நிதி ஆண்டு வாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி சட்டத்தை வலுவூட்டுவதற்கு எதிர்காலத்தில் மேற்கொள்ளப்படவுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) மேற்படி சட்டத்தின்மூலம் இலங்கைப் பிரசைகளுக்கு வழங்கப்பட்டுள்ள உரிமைகளை மேலும் வலுவூட்டுவதற்காக எதிர்காலத்தில் மேற்கொள்ளப்படவுள்ள சட்டரீதியான திருத்தங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2017ஆம் ஆண்டு தொடக்கம் இதுவரை இலங்கை தகவலறியும் உரிமைக்கான ஆணைக்குழுவுக்கு கிடைத்துள்ள மேன்முறையீடுகளின் எண்ணிக்கையும், அவற்றில் ஆணைக்குழுவினால் தீர்க்கப்பட்டுள்ள மேன்முறையீடுகளின் எண்ணிக்கையும் ஆண்டுவாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி மேன்முறையீடுகளில் இதுவரை விசாரணை செய்யப்பட்டு நிறைவுசெய்ய முடியாதுபோன மேன்முறையீடுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the amounts of money that have been allocated from the year 2016 to the present to ensure the rights granted to the citizens of Sri Lanka under the Right to Information Act, No. 12 of 2016, separately for each year;

(ii) the steps that will be taken in future to strengthen the said Act; and

(iii) the legal reforms that will be made in future to further strengthen the rights granted to the citizens of Sri Lanka by the said Act?

(b) Will he also inform this House -

(i) the number of appeals received by the Right to Information Commission of Sri Lanka from the year 2017 to the present and the number of appeals resolved by the Commission in each year during that period, separately; and

(ii) the number of appeals that have not been heard and concluded so far, out of the said number of appeals?

(c) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)

(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

(අ) (i)

වර්ෂය	වෙන් කරන ලද ප්‍රතිපාදන (රුපියල්)
2016	-
2017	10,000,000.00
2018	30,000,000.00
2019	1,100,000.00
2020	7,152,000.00
2021	13,000,000.00
2022	-
2023	2,000,000.00
2024	2,000,000.00
2025	5,000,000.00

(ii)
- රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තොරතුරු නිලධාරීන්, විෂය නිලධාරීන් හා අනෙකුත් අදාළ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩසටහන්, වැඩමුළු සංවිධානය, සම්පත් දායකත්වය සැපයීම, ලිපි ද්‍රව්‍ය, පනත් ආදිය සැපයීම.
- ප්‍රජා සංවිධාන, ග්‍රාම නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන් සහ ප්‍රජා මූල නායකයින් සඳහා මෙම පනත සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පැවැත්වීම.
- තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පුරවැසියන් දැනුවත් කිරීම සම්බන්ධව විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මඟින් පුළුල් ප්‍රචාරයක් ලබා දීම.
- 9, 10, 11 සහ උසස් පෙළ ශ්‍රේණින්හි විෂයයන් ආවරණය වන පරිදි පාසල් දරුවන් අතර පුහුණු සංචිතයක් හා විශ්වවිද්‍යාල සිසුන් දැනුවත් කිරීමට පියවර ගැනීම.
- තොරතුරු පනතට අදාළ තොරතුරු ලබා ගැනීමේ ඉල්ලුම් පත් විද්‍යුත් මාර්ගයෙන් ලබා ගැනීමට කටයුතු කිරීම.
- රාජ්‍ය නිලධාරීන් තොරතුරු පනත පිළිබඳව පුහුණු වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීම හා සම්පත්දායක සංචිතයක් පවත්වාගෙන යාම.
- තොරතුරු නිලධාරි අත්පොත, පුහුණු ක්‍රමවේද සහ පුහුණුකරුවන් සඳහා වූ පුහුණු මොඩියුල, තොරතුරු පනත මාර්ගෝපදේශ සංග්‍රහය යන තොරතුරු පනතට අදාළ ග්‍රන්ථ සහ පුරවැසියන් දැනුවත් කිරීමේ අත්පත්‍රිකා මුද්‍රණය කිරීම.

- තොරතුරු පනත සම්බන්ධව සියලුම පළාත් සභාවන්හි වැඩමුළු සංවිධානය කිරීම.

(iii)
- පනත සම්බන්ධව කොමිෂන් සභා රීති කෙටුම්පත් කර ඇති අතර, එය කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. අනුමැතිය ලද පසු ගැසට් කිරීමට නියමිතය.
- තොරතුරු ලබා ගැනීම වෙනුවෙන් සිදු කරන ගෙවීම්වලට අදාළ මිල ගණන් යාවත්කාලීන කිරීම.
- පනතට අදාළ නියෝග හා රෙගුලාසි යාවත්කාලීන කිරීම.
- තොරතුරු පනතට අදාළව ප්‍රකාශයට පත් කර ඇති 2004/66 දරන නියෝග හා රීති අවශ්‍ය නෛතික අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත යොමු කර නොමැති බව නිරීක්ෂණය වූ අතර, ඒ අනුව අදාළ නියෝග හා රීති යළි සමාලෝචනය කර ප්‍රකාශයට පත්කොට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

(ආ) (i)

වර්ෂය	කොමිෂන් සභාව වෙත ලැබුණු මුළු අභියාචනා සංඛ්‍යාව	කොමිෂන් සභාව විසින් විසඳා අවසන් නියෝග නිකුත් කර ඇති අභියාචනා සංඛ්‍යාව
2017	630	57
2018	1441	549
2019	1620	709
2020	1005	527
2021	1054	475
2022	1525	1451
2023	1688	1500
2024	1852	1837
2025 (2025.01.01 දින සිට 2025.09.30 දක්වා)	1306	1157

(ii)

වර්ෂය	විභාග කර අවසන් කිරීමට නොහැකි වූ අභියාචනා සංඛ්‍යාව
2017	147
2018	251
2019	380
2020	472
2021	495
2022	124
2023	64
2024	112
2025 (2025.01.01 දින සිට 2025.09.30 දක්වා)	308

(ඇ) අදාළ නොවේ.

(அ) (i)

ஆண்டு	ஒதுக்கப்பட்டுள்ள ஒதுக்கீடுகள் (ரூ.)
2016	-
2017	10,000,000.00
2018	30,000,000.00
2019	1,100,000.00
2020	7,152,000.00
2021	13,000,000.00
2022	-
2023	2,000,000.00
2024	2,000,000.00
2025	5,000,000.00

(ii)
- அமைச்சுகள், திணைக்களங்கள், மாவட்ட செயலாளர் அலுவலகம் மற்றும் பிரதேச செயலக அலுவலகங்களில் தகவல் அதிகாரிகள், விடயத்துக்குப் பொறுப்பான அதிகாரிகள் மற்றும் பிற தொடர்புடைய அதிகாரிகளை விழிப்புணர்வூட்டுவதற்காக வேண்டி பயிற்சி நிகழ்ச்சிகள், செயலமர்வுகளை ஒழுங்கு செய்தல், வளவாளர்களை வழங்குதல், பயிற்சிகளுக்கான காகிதாதிகள், சட்டங்கள் போன்றவற்றை வழங்குதல்.
- சமூக அமைப்புகள், கிராம அலுவலர்கள், கள அலுவலர்கள் மற்றும் சமூகத் தலைவர்களுக்கு இந்தச் சட்டம் தொடர்பான விழிப்புணர்வு நிகழ்ச்சித்திட்டங்களைப் பிரதேச செயலக மட்டத்தில் நடத்துதல்.
- தகவல் அறியும் உரிமை குறித்து குடிமக்களுக்கு விழிப்புணர்வை ஏற்படுத்த இலத்திரனியல் மற்றும் ஊடகங்கள்மூலம் பரந்தளவில் விளம்பரம் செய்தல்.
- 9,10,11, மற்றும் உயர் தரப் பாடங்களை உள்ளடக்கிய பாடசாலை மாணவர்களிடையே பயிற்சி அமைப்பு மற்றும் பல்கலைக்கழக மாணவர்களுக்கு விழிப்புணர்வூட்ட நடவடிக்கைகளை எடுத்தல்.
- தகவல் சட்டத்துக்கான தகவல்களைப் பெற்றுக்கொள்ளும் விண்ணப்பங்களை இலத்திரனியல்மூலம் பெற்றுக்கொள்ள நடவடிக்கை எடுத்தல்.
- அரச அதிகாரிகளுக்குத் தகவல் சட்டம் குறித்த பயிற்சித் திட்டங்களை நடத்துவதற்கான பயிற்சியாளர்களாகப் பயிற்றுவித்தல் மற்றும் வளவாளர் அமைப்பொன்றைப் பராமரித்தல்.
- தகவல் அலுவலர் கையேடு, பயிற்சி முறைகள் மற்றும் பயிற்சியாளர்களுக்கான பயிற்சி (மொடியூல்கள்) தொகுதிகள், தகவல் சட்ட வழிகாட்டுதல்கள் மற்றும் தகவல் சட்டம் தொடர்பான கிரந்தங்கள் மற்றும் குடிமக்கள் விழிப்புணர்வுத் துண்டுப் பிரசுரங்களை அச்சிடுதல்.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

- தகவல் சட்டம் தொடர்பாக அனைத்து மாகாண சபைகளிலும் செயலமர்வுகளை ஏற்பாடு செய்தல்.

(iii)
- சட்டம் தொடர்பான ஆணைக்குழு விதிகள் வரைவு செய்யப்பட்டுள்ளதுடன், அது ஆணைக்குழுவின் அனுமதிக்காகச் சமர்ப்பிக்கப்பட்டுள்ளன. அங்கீகரிக்கப் பட்டவுடன் அவை வர்த்தமானியில் வெளியிடப்படும்.
- தகவல்களைப் பெறுவதற்காகச் செய்யப்படும் கொடுப்பனவுகள் தொடர்பான விலைகளைப் புதுப்பித்தல்.
- சட்டம் தொடர்பான உத்தரவுகள் மற்றும் விதிமுறைகளைப் புதுப்பித்தல்.
- தகவல் சட்டம் தொடர்பாக பத்திரிகைகளில் வெளியிடப்பட்ட 2004/66ஆம் ஆண்டின் விதிமுறைகள் மற்றும் விதிகள், தேவையான சட்ட அனுமதிக்காகப் பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்படவில்லை என்பது கவனத்திற்கொள்ளப்பட்டது. அதன்படி, தொடர்புடைய விதிமுறைகள் மற்றும் விதிகள் மதிப்பாய்வு செய்யப்பட்டு, வெளியிடப்பட்டு பாராளுமன்றத்தில் சமர்ப்பித்தல்.

(ஆ) (i)

ஆண்டு	ஆணையகத்திற்குப் பெறப்பட்ட மொத்த மேல்முறையீடுகளின் எண்ணிக்கை	ஆணையகத்தால் தீர்க்கப்பட்ட, இறுதி உத்தரவுகள் வழங்கப்பட்ட முறையீடுகளின் எண்ணிக்கை
2017	630	57
2018	1441	549
2019	1620	709
2020	1005	527
2021	1054	475
2022	1525	1451
2023	1688	1500
2024	1852	1837
2025 (2025.01.01ஆந் திகதி முதல் 2025.09.30 ஆந் திகதி வரை)	1306	1157

(ii)

ஆண்டு	பரிசோதித்து முடிக்க முடியாத முறையீடுகளின் எண்ணிக்கை
2017	147
2018	251
2019	380
2020	472
2021	495
2022	124
2023	64
2024	112
2025 (2025.01.01ஆந் திகதி முதல் 2025.09.30ஆந் திகதி வரை)	308

(இ) ஏற்புடையதன்று.

(a) (i)

Year	Allocated provisions (Rs.)
2016	-
2017	10,000,000.00
2018	30,000,000.00
2019	1,100,000.00
2020	7,152,000.00
2021	13,000,000.00
2022	-
2023	2,000,000.00
2024	2,000,000.00
2025	5,000,000.00

(ii) · Implementing training programmes, organizing workshops and providing resource persons, training materials, Acts et cetera to educate information officers, subject officers and other relevant officials of State Ministries, departments, District Secretariats and Divisional Secretariats.

- Conducting awareness programmes for community organizations, Grama Niladharis, field officers and community-based leaders regarding this Act at the Divisional Secretariat level.
- Conducting a wide publicity campaign through electronic and print media to raise awareness among citizens in regard to the right to information.
- Creating a training pool among school children covering subjects in Grades 9, 10 and 11, covering Advanced Level subjects and making university student aware.
- Taking action to obtain information applications relevant to the Right to Information Act via email.
- Training public officials as trainers and maintaining a resource pool to conduct training programmes on the Right to Information Act.
- Printing of books related to the Right to Information Act such as the Information Officer's Manual, Training Methods and Training Modules for Trainers, Information Act Guide and citizen awareness leaflets.
- Organizing workshops in all the provincial councils in relation to the Right to Information Act.

(iii)
- Commission's rules relating to the Act had been drafted and forwarded for approval of the Commission. They are scheduled to be gazetted once approval is granted.
- Updating the prices applicable to payments made for obtaining information.
- Updating the rules and regulations applicable to the Act.
- Since it was observed that the Rules and Regulations No. 2004/66 published under the Right to Information Act have not been forwarded to Parliament for its concurrence, action is to be taken to review and publish the relevant Rules and Regulations and to submit them to Parliament.

(b) (i)

Year	The total no. of appeals received by the Commission	No. of appeals that have been solved by the Commission and issued final orders
2017	630	57
2018	1441	549
2019	1620	709
2020	1005	527
2021	1054	475
2022	1525	1451
2023	1688	1500
2024	1852	1837
2025 (From 2025.01.01 to 2025.09.30) 1306	1306	1157

(ii)

Year	No. of appeals that has not been concluded
2017	147
2018	251
2019	380
2020	472
2021	495
2022	124
2023	64
2024	112
2025 (From 2025.01.01 to 2025.09.30) 308	308

(c) Not applicable.

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 3වන ප්‍රශ්නයට - 1462/2025 - පිළිතුර දීමට තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය ගරු සුනිල් කුමාර ගමගේ මහතා සති දෙකක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு அஜித் பீ. பெரேரா அவர்களால் கேட்கப்பட்ட, இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 3ஆம் இலக்க வினாவுக்கு - 1462/2025 - விடையளிப்பதற்கு, இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர் மாண்புமிகு சுனில் குமார கமகே அவர்கள் இரண்டு வார கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. Sunil Kumara Gamage, Minister of Youth Affairs and Sports, has requested for two weeks' time to reply to Question No. 3 - 1462/2025 - raised by the Hon. Ajith P. Perera appearing in today's Order Paper.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.